324 වන කාණ්ඩය - 06 වන කලාපය
தொகுதி 324 - இல. 06
Volume 324 - No. 06

2026 ජනවාරි 21වන බදාදා
2026 சனவரி 21, புதன்கிழமை
Wednesday, 21st January, 2026

# පාර්ලිමේන්තු විවාද
(හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்
(ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES
(HANSARD)

නිල වාර්තාව
அதிகார அறிக்கை
OFFICIAL REPORT

# අන්තර්ගත ප්‍රධාන කරුණු

**නිවේදන:**
කථානායකතුමාගේ සහතිකය [තීරුව 975]
පාර්ලිමේන්තු විශ්‍රාම වැටුප් (ඉවත් කිරීමේ) පනත්කෙටුම්පත: ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සමක් [තීරුව 975]

**විගණකාධිපතිවරයාගේ වාර්තාව** [තීරුව 976]

**ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තා** [තීරුව 976]

**ප්‍රශ්නවලට වාචික පිළිතුරු** [තීරු 978-1017]

**පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය:**
නිදහස් අරගළයේ මුස්ලිම් නායකයින් දේශප්‍රේමීන් ලෙස ප්‍රකාශයට පත් කිරීම [තීරුව 1018]
අක්කරෙයිපත්තු, චාවකච්චේරි සහ තෙලිප්පලෙයි මූලික රෝහල්වල සිදු වූ අසාධාරණකම් [තීරුව 1023]

**දිට්වා සුළි කුණාටුවට මුහුණ දීම සඳහා පූර්ව සූදානමක් නොමැති වීම සම්බන්ධයෙන් පූර්ණ අධ්‍යයනයක් සිදු කර වාර්තා කිරීමටත්, ඒ පිළිබඳව සිය යෝජනා සහ නිර්දේශ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමටත් වන විශේෂ කාරක සභාව** [තීරුව 1029]

**කල්තැබීමේ යෝජනාව:**
"දිට්වා" සුළි කුණාටුවෙන් පසු රටේ තත්ත්වය [තීරු 1032-1152]

---

# பிரதான உள்ளடக்கம்

**அறிவிப்புகள்:**
சபாநாயகரது சான்றுரை [ப: 975]
பாராளுமன்ற ஓய்வூதியம் (நீக்குதல்) சட்டமூலம்: உயர் நீதிமன்றுக்கு மனு [ப: 975]

**கணக்காய்வாளர் அதிபதியினது அறிக்கை** [ப: 976]

**துறைசார் மேற்பார்வைக் குழு அறிக்கைகள்** [ப: 976]

**வினாக்களுக்கு வாய்மூல விடைகள்** [ப: 978-1017]

**தனி அறிவித்தல் மூல வினா:**
சுதந்திரப் போராட்ட முஸ்லிம் தலைவர்களைத் தேசப்பற்றாளர்களாகப் பிரகடனப்படுத்தல் [ப: 1018]
அக்கரைப்பற்று, சாவகச்சேரி, தெல்லிப்பளை ஆதார வைத்தியசாலைகளில் நடைபெற்ற அநீதிகள் [ப: 1023]

**தித்வா புயலை எதிர்கொள்வதற்காக முன்னாயத்தத்துடன் இருக்கவில்லை என்பது தொடர்பில் முழுமையாக ஆராய்ந்து அறிக்கையிடுவதற்கும், அது தொடர்பிலான முன்மொழிவுகளையும் விதப்புரைகளையும் பாராளுமன்றத்துக்குச் சமர்ப்பிப்பதற்குமான தெரிகுழு** [ப: 1029]

**ஒத்திவைப்புப் பிரேரணை:**
"தித்வா" புயலுக்குப் பின்னரான நாட்டின் நிலைமை [ப: 1032-1152]

---

# PRINCIPAL CONTENTS

ANNOUNCEMENTS:
Speaker's Certificate [Col. 975]
Parliamentary Pensions (Repeal) Bill: Petition to the Supreme Court [Col. 975]

AUDITOR-GENERAL'S REPORT [Col. 976]

SECTORAL OVERSIGHT COMMITTEE REPORTS [Col. 976]

ORAL ANSWERS TO QUESTIONS [Cols. 978-1017]

QUESTION BY PRIVATE NOTICE:
Declaration of Muslim Leaders of Freedom Struggle as Patriots [Col. 1018]
Injustices Committed at Akkaraipattu, Chavakachcheri and Tellippallai Base Hospitals [Col. 1023]

SELECT COMMITTEE TO CONDUCT A COMPREHENSIVE STUDY ON THE LACK OF PREPAREDNESS TO FACE CYCLONE DITWAH AND REPORT TO PARLIAMENT AND SUBMIT ITS PROPOSALS AND RECOMMENDATIONS IN THAT REGARD [Col. 1029]

ADJOURNMENT MOTION:
Post-cyclone "Ditwah" Situation in the Country [Cols. 1032-1152]

# පාර්ලිමේන්තුව
# பாராளுமன்றம்
# PARLIAMENT

***2026 ජනවාරි 21වන බදාදා***
*2026 சனவரி 21, புதன்கிழமை*
*Wednesday, 21st January, 2026*

**පූ.භා. 9.30ට පාර්ලිමේන්තුව රැස් විය.**
**කථානායකතුමා [ගරු (වෛද්‍ය) ජගත් වික්‍රමරත්න මහතා] මූලාසනාරූඪ විය.**

பாராளுமன்றம் மு.ப. 9.30 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ஜகத் விக்கிரமரத்ன] தலைமை வகித்தார்கள்.

The Parliament met at 9.30 a.m.,
MR. SPEAKER [THE HON. (DR.) JAGATH WICKRAMARATNE] in the Chair.

## නිවේදන
## அறிவிப்புகள்
## ANNOUNCEMENTS

### කථානායකතුමාගේ සහතිකය
### சபாநாயகரது சான்றுரை
### SPEAKER'S CERTIFICATE

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 79 ව්‍යවස්ථාව ප්‍රකාරව, මවිසින් 2026 ජනවාරි 20 දින "කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව ) සංශෝධන) "නමැති පනත් කෙටුම්පතෙහි සහතිකය සටහන් කරන ලද බව දන්වනු කැමැත්තෙමි.

## II

### පාර්ලිමේන්තු විශ්‍රාම වැටුප් (ඉවත් කිරීමේ) පනත් කෙටුම්පත: ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සමක්
### பாராளுமன்ற ஓய்வூதியம் (நீக்குதல்) சட்டமூலம்: உயர் நீதிமன்றுக்கு மனு
### PARLIAMENTARY PENSIONS (REPEAL) BILL: PETITION TO THE SUPREME COURT

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

2026 ජනවාරි 20 දින මාගේ නිවේදනයෙහි සඳහන් පෙත්සම් තුනට අමතරව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 121(1) ව්‍යවස්ථාව ප්‍රකාරව, "පාර්ලිමේන්තු විශ්‍රාම වැටුප් (ඉවත් කිරීමේ)" නමැති පනත් කෙටුම්පත සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ඉදිරිපත් කරන ලද තවත් පෙත්සමක පිටපතක් මා වෙත ලැබී ඇති බව පාර්ලිමේන්තුවට දැනුම් දීමට කැමැත්තෙමි.



## විගණකාධිපතිවරයාගේ වාර්තාව
## கணக்காய்வாளர் அதிபதியினது அறிக்கை
## AUDITOR-GENERAL'S REPORT

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව 2024 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ පළමුවැනි කාණ්ඩයේ XXXIII, XXXIV, XXXV සහ XXXVI කොටස්, සිව්වැනි කාණ්ඩයේ XIX සහ XX කොටස්, පස්වැනි කාණ්ඩයේ VIII සහ IX කොටස් සහ හයවැනි කාණ්ඩයේ XXV කොටස මම ඉදිරිපත් කරමි.

**ගරු බිමල් රත්නායක මහතා (ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க - போக்குவரத்து, நெடுஞ்சாலைகள் மற்றும் நகர அபிவிருத்தி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Bimal Rathnayake - Minister of Transport, Highways and Urban Development and the Leader of the House of Parliament)

ගරු කථානායකතුමනි, "එකී වාර්තාව මුද්‍රණය කළ යුතුය" යි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

*වාර්තාව මුද්‍රණය කළ යුතුයයි නියෝග කරන ලදී.*
*அறிக்கை அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.*
*Ordered that the Report be printed.*

## ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තා
## துறைசார் மேற்பார்வைக் குழு அறிக்கைகள்
## SECTORAL OVERSIGHT COMMITTEE REPORTS

**ගරු (වෛද්‍ය) නිහාල් අබේසිංහ මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நிஹால் அபேசிங்ஹ)
(The Hon. (Dr.) Nihal Abeysinghe)

Hon. Speaker, I present the Report of the Sectoral Oversight Committee on Health, Media and Women's Empowerment on the -

Report 1

(i) Annual Report of the Sri Lanka Broadcasting Corporation for the year 2022;

(ii) Annual Performance Reports of the Department of Government Information for the years 2022 and 2024; and

(iii) Annual Performance Report of the Mass Media Division of the Ministry of Health and Mass Media for the year 2024,

Report 2

(i) Annual Performance Report of the Department of Probation and Child Care Services for the year 2024; and

(ii) Annual Reports of the Sri Lanka Thriposha Limited for the years 2021 and 2023,

which were referred to the Committee.

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

## පෙත්සම්
## மனுக்கள்
## PETITIONS

**ගරු ලුතිනන් කමාන්ඩර් (විශ්‍රාමික) ප්‍රගීත් මධුරංග මහතා**
(மாண்புமிகு லெப்டினன் கமாண்டர் (ஓய்வுபெற்ற) பிரகீத் மதுரங்க)
(The Hon. Lieutenant Commander (Rtd.) Prageeth Madhuranga)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් දෙක පිළිගන්වමි.

(1) නිට්ටඹුව, කෝන්ගස්දෙණිය, පනාවල පාර, අංක 88/ඒ/1 යන ලිපිනයෙහි පදිංචි ආර්.පී.එන්.ආර්. ගුණවර්ධන මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(2) වැලිවේරිය, ඇටිකෙහෙල්ගල්ල, අංක 137/1/1 යන ලිපිනයෙහි පදිංචි ඩබ්ලිව්.පී. විමලරත්න මහතාගෙන් ලැබුණු පෙත්සම.

**ගරු (වෛද්‍ය) නිශාන්ත සමරවීර මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நிஷாந்த சமரவீர)
(The Hon. (Dr.) Nishantha Samaraweera)

ගරු කථානායකතුමනි, හුංගම, මුලන, 'පියුමි' යන ලිපිනයෙහි පදිංචි එම්.කේ. ආනන්ද මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු නීතිඥ භාග්‍ය ශ්‍රී හේරත් මහතා**
(மாண்புமிகு சட்டத்தரணி பாக்ய ஸ்ரீ ஹேரத்)
(The Hon. Bhagya Sri Herath, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, තලවකැලේ, ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනයේ සේවයේ නියුතු රාජික නිරෝෂන් ගමගේ මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.***
*சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.*
*Petitions ordered to be referred to the Committee on Public Petitions.*

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## வினாக்களுக்கு வாய்மூல விடைகள்
## ORAL ANSWERS TO QUESTIONS

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 1 -741/2025- (1), ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 32 යටතේ මම මේ කාරණය ඉදිරිපත් කරන්නේ. ගරු කථානායකතුමනි, අටවැනි පාර්ලිමේන්තුවේ ආණ්ඩුවේ ඉන්නකොට වැඩිම ප්‍රශ්න ගණනක් ඇහුවේ මම. මට ලොකු අසාධාරණයක් වනවා, ගරු කථානායකතුමනි. මම ඉදිරිපත් කරන ප්‍රශ්න ඇත්තටම න්‍යාය පත්‍රයට ඇතුළත් වෙන්නේ නැහැ. ගරු සභානායකතුමනි, ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමනි, න්‍යාය පත්‍රයට ඇතුළත් වෙන්නේ මම දෙවැනි වටයේ අහන ප්‍රශ්න. නමුත්, මම ක්‍රමවේදයට අනුව ප්‍රශ්න භාර දීලා තිබෙනවා. ඔබතුමා කිව්වා, ඒක එහෙම වෙලා නැහැ කියලා. නමුත් ගරු කථානායකතුමනි, මම පැහැදිලිව කියනවා, න්‍යාය පත්‍රයට මේ මාසයෙත් මගේ ප්‍රශ්නයක් ඇතුළත් වෙලා නැහැ, ගිය මාසයෙත් මගේ ප්‍රශ්නයක් ඇතුළත් වුණේ නැහැ කියලා. කල් ලබා ගත් ප්‍රශ්නයක් තමයි න්‍යාය පත්‍රයට ඇතුළත් වුණේ. මම අලුතින් ඉදිරිපත් කරපු ප්‍රශ්නයක් කිසි දවසක න්‍යාය පත්‍රයට ඇතුළත් වෙන්නේ නැහැ. ඒකට හේතුව මොකක්ද? මම ඇත්තටම අහන්නේ කාලීන ප්‍රශ්න. ඔබතුමා පෞද්ගලිකව මේ ගැන සොයා බලන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

අදාළ ක්‍රමවේදය නිසි පරිදි සිදු වනවාද කියලා මම සොයා බලන්නම්, ගරු මන්ත්‍රීතුමා.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

හැම දාම හොයනවා, නමුත් සාධාරණයක් නම් වෙන්නේ නැහැ, ගරු කථානායකතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

හොඳයි. ඒ ගැන මම සොයා බලන්නම්, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු සභානායකතුමා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු මන්ත්‍රීතුමනි, Parliamentary Business Committee එකේදි මේ ප්‍රශ්නය ඉදිරිපත් වුණා. ඊට පස්සේ ලේකම් මණ්ඩලයෙන් මේ පිළිබඳව වාර්තාවක් ඉදිරිපත් කර තිබෙනවා. ඒ වාර්තාව අධ්‍යයනය කිරීම සඳහා විපක්ෂයේ සහ ආණ්ඩු පක්ෂයේ නායකයින් කාලය ඉල්ලා තිබෙනවා. විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා ළඟ ඒ වාර්තාව තිබෙනවා. ඉදිරියේදී පවත්වන Parliamentary Business Committee එකේදි ඒ ගැන සාකච්ඡා කරලා තීරණයක් ගන්න පුළුවන්.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
ගරු කථානායකතුමනි, -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
මට විනාඩියක් දෙන්න, ගරු කථානායකතුමනි. අපි Parliamentary Business Committee එකේදි ඉල්ලා සිටියා, ඒ වාර්තාව පසුපෙළ මන්ත්‍රීවරයන්ගේ කාරක සභාවට ඉදිරිපත් කරලා ඒ නිර්දේශත් ලබා ගන්න කියලා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, එහෙම තීරණයක් ගත්තා. ඒ නිසා එතැනටත් යොමු කරලා එතැනින් ලැබෙන නිර්දේශ මත Parliamentary Business Committee එකෙන් තමයි ඒ guidelines පිළිබඳ අවසාන අදහස ගන්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි. අපි ඒ විධියට ඉදිරියට වැඩ කටයුතු කරමු.

## බන්ධනාගාරවල තදබදය අධ්‍යයනය කිරීම සඳහා පත් කරන ලද කමිටුව: නිර්දේශ
## சிறைச்சாலைகளில் காணப்படுகின்ற நெரிசல் குறித்து ஆராய்வதற்காக நியமிக்கப்பட்ட குழு: சிபாரிசுகள்
## COMMITTEE APPOINTED TO STUDY OVERCROWDING IN PRISONS: RECOMMENDATIONS

812/2025

**2. ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) ශ්‍රී ලංකාවේ බන්ධනාගාරවල පවතින තදබදය සම්බන්ධයෙන් අධ්‍යයනය කිරීම සඳහා අවසන් වරට කමිටුවක් පත් කරන ලද දිනය කවරේද;

(ii) එම කමිටුවේ සාමාජිකයින්ගේ නම් කවරේද;

(iii) බන්ධනාගාරවල පවතින තදබදය අවම කිරීම සඳහා එම කමිටුව විසින් ලබා දෙන ලද නිර්දේශ කවරේද;

(iv) එම නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சரைக் கேட்ட வினா

(அ) (i) இலங்கையிலுள்ள சிறைச்சாலைகளில் காணப்படுகின்ற நெரிசல் குறித்து ஆராய்வதற்காக, இறுதியாக குழுவொன்று நியமிக்கப்பட்ட திகதி யாது என்பதையும்;

(ii) அக்குழுவைச் சேர்ந்த உறுப்பினர்களின் பெயர்கள் யாவை என்பதையும்;

(iii) சிறைச்சாலைகளில் காணப்படுகின்ற நெரிசலைக் குறைப்பதற்காகச் சம்பந்தப்பட்ட குழுவால் வழங்கப்பட்டுள்ள சிபாரிசுகள் யாவை என்பதையும்;

(iv) அந்தச் சிபாரிசுகளை நடைமுறைப்படுத்த எடுக்கப்படும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Justice and National Integration:

(a) Will he inform this House the -

(i) date on which a committee was last appointed to study the issue of overcrowding in prisons in Sri Lanka;

(ii) names of the members of that committee;

(iii) recommendations made by that committee to reduce overcrowding in prisons; and

(iv) measures that will be taken to implement those recommendations?

(b) If not, why?

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා (අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා)**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார - நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சர்)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law - Minister of Justice and National Integration)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) 2025.05.14වන දින සමාලෝචන ක්‍රියාවලියක් හරහා දඬුවම් ලිහිල් කිරීම පිණිස යන්ත්‍රණයක් සකස් කිරීමට කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කළ අතර, ඒ සඳහා 2025 ජූනි මස 02වන දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇත.

මෙම කමිටුව 2025.07.18වන දින මුල් වතාවට රැස් විය.

(ii)
- ගරු ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු, ජනාධිපති නීතිඥ එස්. තුරෙයිරාජා මැතිතුමා
- ගරු ආචාර්ය කෞශල්‍යා ආරියරත්න, නීතිඥ සහ පාර්ලිමේන්තු මන්ත්‍රී

[ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා]

- නෙරින් පුල්ලේ මහතා, ජනාධිපති නීතිඥ, අතිරේක සොලිසිටර් ජෙනරාල්, නීතිපති දෙපාර්තමේන්තුව
- මහාචාර්ය වසන්තා සුබසිංහ මහත්මිය, සමාජ විද්‍යාඥ, කැලණිය විශ්වවිද්‍යාලය
- අසංක කරවිට මහතා, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති, ශ්‍රී ලංකා පොලීසිය
- වෛද්‍ය චිත්තහාරි අභයනායක මහත්මිය, ව්‍යවහාරික (අධිකරණ), විශේෂඥ මනෝ වෛද්‍ය, ජාතික රෝහල
- නිෂාන් ධනසිංහ මහතා, අතිරේක ලේකම් (බන්ධනාගාර කටයුතු සහ පුනරුත්ථාපන), අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය
- පියුමන්ති පීරිස් මහත්මිය, අතිරේක ලේකම් (නීති), අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය
- රෝෂිණී හෙට්ටිගේ මහත්මිය, ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (නීති), අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය
- ජී.සී. වැලිකල මහත්මිය, ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (නීති), අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය

(iii) මේ වනවිටත් කමිටුව ක්‍රියාත්මක වන බැවින් නිර්දේශ මේ දක්වා ඉදිරිපත් කර නොමැත.

(iv) පැන නොනඟී.

(ආ) පැන නොනඟී.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)

ගරු කථානායකතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු ඇමතිතුමනි, ලංකාවේ බන්ධනාගාර පද්ධතිය තුළ සිරකරුවන්, එහෙම නැත්නම් සැකකරුවන් රඳවා ගන්න තිබෙන ඉඩකඩ ප්‍රමාණය බැලුවොත් 10,500ක වාගේ ප්‍රමාණයක් තමයි රඳවා ගන්න පුළුවන් වන්නේ. නමුත්, මේ වනවිට 38,500කට වැඩි ප්‍රමාණයක් බන්ධනාගාරවල රඳවා ගෙන ඉන්නවා. ඒක විශාල ප්‍රමාණයක්. ඒ කියන්නේ, 1:4ක් වාගේ ප්‍රමාණයක් දැන් මේ බන්ධනාගාරවල ඉන්නවා.

මේ නිසාම බන්ධනාගාරවල විශාල තදබදයක් තිබෙනවා. ඒ තදබදය නිසාම බන්ධනාගාරවල තිබෙන යටිතල පහසුකම් සම්බන්ධයෙන් පවා විශාල අර්බුදයක් මතු වෙලා තිබෙනවා. ඒ වාගේම, වෛද්‍ය පහසුකම් ඇතුළු සිරකරුවන්ට ලබා දෙන අනෙකුත් දේවල් සම්බන්ධයෙනුත් විශාල අර්බුදයක් ඇති වෙලා තිබෙනවා. රැඳවියන් 10,500ක් වාගේ ප්‍රමාණයක් රඳවා ගන්න පුළුවන් බන්ධනාගාර පද්ධතිය තුළ 38,500ක් වැනි ප්‍රමාණයක් රඳවා ගැනීම නිසා තමයි මෙවැනි අර්බුදයක් ඇති වෙලා තිබෙන්නේ. මේ තදබදය අවම කර ගැනීම වෙනුවෙන් ඉදිරියේදී ඔබතුමන්ලා යම් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න බලාපොරොත්තු වෙනවාද?

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කියන එක හරි. මේ වනවිටත් බන්ධනාගාර තුළ තදබදයක් තිබෙනවා. ඒ තදබදය මැඬලන්න අවශ්‍ය කරුණු කිහිපයක් තෝරාගෙන ඒ හරහා අපි කටයුතු කරනවා. පළමුවන කාරණය තමයි, සමස්ත පද්ධතියේම බිල්ඩින්වල ධාරිතාව වැඩි කිරීම සහ තිබෙන බිල්ඩින්වල නැවත ඉක්මනින්ම අලුත් කොටස් හදන එක. දෙවන කාරණය තමයි, රජයට අයත් බිල්ඩින් කිහිපයක් ඉඩම් සහිතව ලබා ගැනීම. මොකද, මේක හදන්න පටන් අරගෙන අවුරුද්දක් ගත වෙලා වැඩක් නැහැ නේ. මේක දැන් ඕනෑ කරන දෙයක් නේ. ඒ නිසා මහ මෝදර රෝහල වාගේ තැන් කිහිපයක් අපි අරගෙන තිබෙනවා. ඇත්තෙන්ම මේ බන්ධනාගාර තුළ වැඩියෙන්ම ඉන්නේ රිමාන්ඩ් රැඳවියන්, ගරු මන්ත්‍රීතුමනි. රිමාන්ඩ් රැඳවියන් ඉන්න මූලික හේතුවක් වෙන්නේ රස පරීක්ෂක වාර්තා ලැබීම ප්‍රමාද වීමයි. එම වාර්තා ප්‍රමාද වෙන්නේ එහි කාර්ය මණ්ඩලයේ හිඟයක් තිබෙන නිසායි. මේ වනවිට ඒ කාර්ය මණ්ඩල සියල්ල බඳවා ගන්න අපි කටයුතු කරමින් සිටිනවා. මම විශ්වාස කරනවා, තව මාස කිහිපයකින් ඉතා ඉක්මනින් ඒ රස පරීක්ෂක වාර්තා ලබා දීලා ඇප ඉල්ලුම් පත්‍ර ලබා ගැනීමේ හැකියාව ලැබෙයි කියලා. ඒ වාගේම, මේ ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුව විසින් පසුගිය වසරේ 16,000ක හෝ 17,000ක ප්‍රමාණයක් සිර මැදිරිවලට නොයවා ප්‍රජා විශෝධනයට යවා තිබෙනවා. මේ අවුරුද්දේ ඒ ධාරිතාව වැඩි කරන්න අපි කටයුතු කරනවා. ඊට අමතරව, එක පනතක සඳහන් ආකාරයට සමහර මත්ද්‍රව්‍ය නඩුවලට bail ගන්න Court of Appeal එකටම යන්න අවශ්‍යයි. ඒ පනතත් සංශෝධනය කරන්න අපි බලාපොරොත්තු වෙනවා. එතකොට High Court එකෙන් ඇප ගන්න පුළුවන් තත්ත්වයක් නිර්මාණය වෙනවා. ඒ වාගේ වැඩ කටයුතු කිහිපයක් අපි කරගෙන යනවා, මේ තදබදය අඩු කරන්න.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)

ගරු කථානායකතුමනි, විශේෂයෙන්ම ගරු ඇමතිතුමා කිව්ව කාරණය ඉතා වැදගත්. ඉතා ඉක්මනින් ඒ තදබදය අඩු කරන්න ක්‍රියාත්මක වෙනවා නම් හුඟක් හොඳයි. මොකද, රැඳවියන් 10,500ක් වාගේ ප්‍රමාණයක් රඳවා ගන්න පුළුවන් තැනක අද වෙනකොට රැඳවියන් 38,500ක් පමණ රඳවා ගෙන ඉන්නවා.

ඊළඟ කාරණය මෙයයි. ගරු ඇමතිතුමනි, විශේෂයෙන්ම ඔබතුමා රස පරීක්ෂක වාර්තා ගැන කිව්වා. රස පරීක්ෂක වාර්තා නැතුව අවුරුදු ගණන් රඳවාගෙන ඉන්න පුද්ගලයින් ඉන්නවා. ඒ පුද්ගලයින්ට ඇප ලබා දෙන්නේ නැහැ, රස පරීක්ෂක වාර්තාව නැති හින්දා. අද වෙනකොට බන්ධනාගාර තදබදය වැඩිවීමට ඒක ප්‍රධාන කාරණාවක් හැටියට බලපා තිබෙනවා. රස පරීක්ෂක වාර්තා නැතුව අවුරුද්දක්, අවුරුදු එකහමාරක් වාගේ කාලයක් රිමාන්ඩ් බන්ධනාගාරයේ සමහර සිරකරුවන්ට ඉන්න සිදු වෙලා තිබෙනවා. නමුත් ගරු ඇමතිතුමනි, ඒ රස පරීක්ෂක වාර්තා ඉක්මන් කරන්නා වූ යම් ක්‍රියාදාමයක් ප්‍රායෝගිකව වෙනවා කියන එක තවම පෙනෙන්නේ නැහැ. ඔබතුමා කිව්වා, ඒක ඉක්මනට ක්‍රියාත්මක කරනවා කියලා. ඒක හොඳයි.

විශේෂයෙන්ම මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වුණු තරුණ තරුණියෝ විශාල ප්‍රමාණයකුත් බන්ධනාගාරගත වෙනවා. මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වෙලා ඉන්න අය බන්ධනාගාරගත කළත් ඔවුන් නැවත පුනරුත්ථාපනය කිරීමේ වැඩ පිළිවෙළක් බන්ධනාගාරය තුළ ක්‍රියාත්මක වෙන්නේ නැහැ. එම නිසා ඒ සම්බන්ධව මොකක් හරි වැඩ පිළිවෙළක් ඉතා ඉක්මනින් ක්‍රියාත්මක වෙන්න ඕනෑ. මොකද, කෙනෙක් බන්ධනාගාරගත කරන්නේම නැවත වතාවක් ඔහු නිවැරදි වෙලා සමාජයට එන්න අවශ්‍ය නිසායි. නමුත්, අවාසනාවන්ත තත්ත්වය මේකයි. බන්ධනාගාරගත වෙලා නැවත සමාජයට එන පුද්ගලයා නැවත නැවතත් වැරදි කිරීම සඳහා පෙලඹීම හා ඔහු බන්ධනාගාරය තුළ ඇති කර ගන්නා වූ නොයෙකුත් සම්බන්ධතා මත පාතාල නායකයෙක්, එහෙම නැත්නම් තව අපරාධකාරයෙක් බවට පත් වනවා.

බන්ධනාගාරගත කිරීමේ චේතනාව තමයි ඔහු නිවැරදි පුද්ගලයෙකු හැටියට නැවත සමාජගත කිරීම. නමුත්, අපට දැනට පෙනෙන්න තිබෙන තත්ත්වය තමයි,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ ප්‍රශ්නය,-

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
මම කෙටි කරන්නම්. විශේෂයෙන්ම අපි ගත්තොත්, මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වෙලා බන්ධනාගාරගත කරන පුද්ගලයෝ විශාල සංඛ්‍යාවක් ඉන්නවා. නමුත්, ඔවුන් නැවත එළියට එනකොට නිවැරදි වෙලා එළියට එන්නේ නැහැ, ගරු ඇමතිතුමනි. මම අහන්න කැමැතියි, ඔබතුමන්ලා ඒ සඳහා යම්කිසි ආකාරයක වැඩ පිළිවෙළක්, වැඩසටහනක් සකස් කර තිබෙනවාද කියලා.

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා ඔය ඉස්මතු කරන ප්‍රශ්නය පසුගිය වසරේ ඇති වුණු එකක් නොවෙයි. 2005 කාලයේ සිට වාගේ පෙර දැක්මක් නොමැතිව, ප්‍රතිපත්තියක් නොමැතිව ඔහේ යන්න ඇරීම හරහා ඇති වුණු තදබදයක්, ඒක. අපි මේ රජය භාර ගන්නකොටත් -ආරම්භයේදී- රැඳවියන් 10,500ක් ඉන්න ඕනෑ තැන 28,000ක් හිටියා. නමුත් අපි මත්ද්‍රව්‍ය නිවාරණය සම්බන්ධයෙන් දිගින් දිගටම කටයුතු කරන හින්දා අත්අඩංගුවට ගැනීම් යම් ප්‍රමාණයකට වැඩි වෙලා තිබෙනවා. ගරු මන්ත්‍රීතුමනි, අපි පටන් ගත් දවසේ ඉඳලාම රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ ප්‍රශ්නය මතු වෙන්නේ මෙහෙමයි. 2022න් පසුව රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ කිසි පුරප්පාඩුවක් පුරවලා නැහැ, වාහන නැහැ, සම්පත් නැහැ. ඒගොල්ලන්ට ඒවා දීලා නැහැ. 2022න් පසුව දැන් තමයි අපි අලුතින් නිලධාරින් 50ක් recruit කිරීමට Public Service Commission එක හරහා අවසර අරගෙන වැඩකටයුතු කරගෙන යන්නේ. අවශ්‍ය සම්පූර්ණ කාර්ය මණ්ඩලය නැතත් අපට හැකියාව ලැබෙනවා, ඒ පුද්ගලයින් ප්‍රමාණය බඳවා ගන්න. ගරු මන්ත්‍රීතුමනි, කලින් හිටපු ආණ්ඩු මේ පුරප්පාඩු ටික පුවරලා තිබුණා නම් අපට තිබුණේ වැඩේ කරගෙන යන්නයි. නමුත් අපට ඉස්සෙල්ලා සිද්ධ වෙනවා, මේ පුරප්පාඩු ටික පුරවන්න. ඊට පසුව අපි බලාපොරොත්තු වනවා ඉක්මනින් ඒ අවශ්‍ය කාරණා ඉටු කර දෙන්න. ඔබතුමා කියන එක හරි. සමහර විට රස පරීක්ෂක වාර්තාව දෙන්න අවුරුද්ද පනිනවා. නමුත්, අපේ සැලැස්ම වෙන්නේ මේ පිරිස ගත්ත ගමන්ම රස පරීක්ෂක වාර්තාව මාස තුනක් ඇතුළත දීමයි. අපි ඒක මාස තුනෙන් වාගේ දෙන්න තමයි උත්සාහ දරන්නේ. ඒකට plan එකක් හදලා තිබෙන්නේ.

ගරු මන්ත්‍රීතුමනි, තදබදය ඇති වෙන්න අනෙක් හේතුව තමයි පෙර රජයන් ගෙනාපු නීති. අපි දන්නවා, විෂ වර්ග, අබිං සහ අන්තරායදායක ඖෂධ වර්ග (සංශෝධන) පනතට අනුව High Court එකේ ඇප දෙන්න පුළුවන්කම තියෙද්දි කළින් ආණ්ඩුවෙන් සංශෝධනයක් ගෙනාවා, ග්‍රෑම් 10කට වඩා වැඩි නම් ඇප දෙන්න ඕනෑ Court of Appeal එකෙන් කියලා.

දැන් වෙලා තිබෙන ප්‍රශ්නය තමයි, රස පරීක්ෂක වාර්තාව එනකල් ඇපය ගොනු කරන්න ඕනෑ කොයි උසාවියේද කියලාවත් නීතිඥවරයාට හිතා ගන්න බැහැ. රස පරීක්ෂක වාර්තාව මාස 6ක්, අවුරුද්දක් පරක්කු වුණාම, ඇප ගන්න එක තව අවුරුද්දකින් පරක්කු වෙනවා. ඒක නිසා රිමාන්ඩ් තදබදයට කරුණු කිහිපයක් බලපාලා තිබෙනවා. එකක් තමයි, පෙර රජයන් විසින් මේ සඳහා අවධානයක් යොමු නොකොට, ප්‍රතිපත්තිමය තීන්දු ගන්නේ නැතුව ඇල් මැරුණු ස්වභාවයෙන් හිටපු එක. දෙවැනි එක තමයි, පුරප්පාඩු පුරවන්නේ නැතුව සිටීම, උගත්, බුද්ධිමත් පුද්ගලයින් රජයේ සේවය හැර යෑම සහ මේ අණපනත් සහ නීති. ගරු මන්ත්‍රීතුමනි, දැන් මේ සියල්ලම වෙනස් කිරීමේ වැඩ පිළිවෙළක තමයි අපි මේ මොහොතේ ඉන්නේ. ඒ වාගේම ඔබතුමා කියන එක හරි; මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වුණු කට්ටිය රිමාන්ඩ් එක ඇතුළේ තියලා වැඩක් වෙන්නේ නැහැ. නමුත්, මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වුණු කට්ටියට ස්වේච්ඡාවෙන් පුනරුත්ථාපනය වෙන්න අවශ්‍ය කඳවුරු දැන් පිහිටුවලා තිබෙනවා. මහජන ආරක්ෂක අමාත්‍යාංශය යටතේ තමයි ඒ පුනරුත්ථාපන මණ්ඩලය තිබෙන්නේ. ඒගොල්ලන් ඒ වැඩේ කරගෙන යනවා. ඊට අමතරව ඔවුන්ගේ සන්තකයේත් බඩු තිබෙනවා. ඒක නිසා එතැන පොඩි ගැටලුවක් තිබෙනවා. අපි ඒ සියල්ලටම අවධානය යොමු කරලා තිබෙන්නේ. මේ තදබදය නිසා ජනතාවට හානි වෙනවාය කියන එක මම පිළිගන්නවා. ඒක වෙනස් කරන්න අවශ්‍ය කටයුතු අපි කරනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 3, ගරු රජීවන් ජෙයවන්ද්‍රමූර්ති මහතා.

**ගරු ජේ.සී. අලවතුවල මහතා**
(மாண்புமிகு ஜே.சீ. அலவத்துவல)
(The Hon. J.C. Alawathuwala)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

**ගරු ජේ.සී. අලවතුවල මහතා**
(மாண்புமிகு ஜே.சீ. அலவத்துவல)
(The Hon. J.C. Alawathuwala)
ගරු කථානායකතුමනි, ගරු ඇමතිතුමා ලබා දුන් පිළිතුරට අදාළව පොඩි පැහැදිලි කර ගැනීමක් කර ගන්න අවශ්‍යයි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා,-

**ගරු ජේ.සී. අලවතුවල මහතා**
(மாண்புமிகு ஜே.சீ. அலவத்துவல)
(The Hon. J.C. Alawathuwala)
කෙටියෙන් අහන්නම්. මට තත්පර 30ක කාලයක් ඇති.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමාට කාලය ලබා දෙන්න බැහැ, ගරු මන්ත්‍රීතුමා.

**ගරු ජේ.සී. අලවතුවල මහතා**
(மாண்புமிகு ஜே.சீ. அலவத்துவல)
(The Hon. J.C. Alawathuwala)
මට තත්පර 30ක කාලයක් ඇති.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු රජීවන් ජෙයවන්ද්‍රමූර්ති මන්ත්‍රීතුමා, ඔබතුමාගේ ප්‍රශ්නය අහන්න.

## මැර ප්‍රචණ්ඩත්වයේ වින්දිතයින් : ආධාර යෝජනා ක්‍රම
## கும்பல் வன்முறையால் பாதிக்கப்பட்டவர்கள்: ஒத்துழைப்புத் திட்டங்கள்
## VICTIMS OF MOB VIOLENCE : SUPPORT SCHEMES

1009/2025

**3. ගරු රජීවන් ජෙයචන්ද්‍රමූර්ති මහතා**
(மாண்புமிகு றஜீவன் ஜெயச்சந்திரமூர்த்தி)
(The Hon. Rajeevan Jeyachandramoorthy)
අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) මැර කණ්ඩායම්වල ප්‍රචණ්ඩත්වයට ගොදුරු වූවන්ට සහ ඔවුන්ගේ පවුල්වලට රජය විසින් මූල්‍ය වන්දි, වෛද්‍ය ආධාර හෝ පුනරුත්ථාපන වැඩසටහන් වැනි නිශ්චිත ස්වරූපයේ ආධාර හඳුන්වාදී හෝ හඳුන්වා දීමට අදහස් කර තිබේද;

(ii) මැර කණ්ඩායම්වල ප්‍රචණ්ඩකාරී සිද්ධීන් ඇතිවූ දිස්ත්‍රික්ක හෝ පළාත් තුළ, එවැනි ආධාර යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීමේ වත්මන් තත්ත්වය කවරේද;

(iii) එවැනි වින්දිතයින්ට නිසි කලට සහයෝගය සහ දිගු කාලීන සහාය ලබා දීම සහතික කිරීම සඳහා, පළාත් සභා හෝ දිස්ත්‍රික් ලේකම් කාර්යාල වෙත කිසියම් චක්‍රලේඛ, මාර්ගෝපදේශ හෝ ප්‍රතිපත්ති රාමු නිකුත් කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கையில் கும்பல் வன்முறையால் பாதிக்கப் பட்டவர்களுக்கும் அவர்களது குடும்பங்களுக்கும் நிதி இழப்பீடு, மருத்துவ உதவி அல்லது புனர்வாழ்வுத் திட்டங்கள் போன்ற ஏதேனும் குறிப்பிட்ட உதவிகளை அரசாங்கம் அறிமுகப் படுத்தியுள்ளதா அல்லது அறிமுகப்படுத்த எண்ணியுள்ளதா என்பதையும்;

(ii) கும்பல் வன்முறைச் சம்பவங்கள் இடம்பெற்ற மாவட்டங்கள் அல்லது மாகாணங்களில் இதுபோன்ற எந்தவோர் ஒத்துழைப்புத் திட்டங் களினதும் தற்போதைய நடைமுறைப் படுத்தலினதும் நிலை என்ன என்பதையும்;

(iii) இத்தகைய பாதிக்கப்பட்டவர்களுக்குச் சரியான நேரத்தில் ஒத்துழைப்பு மற்றும் நீண்டகால உதவி கிடைப்பதை உறுதி செய்வதற்காக மாகாண சபைகள் அல்லது மாவட்டச் செயலகங்களுக்கு ஏதேனும் சுற்றறிக்கைகள், வழிகாட்டுதல்கள் அல்லது கொள்கைச் சட்டகங்கள் வெளியிடப் பட்டுள்ளதா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Justice and National Integration:

(a) Will he inform this House -

(i) whether the Government has introduced or intends to introduce any specific forms of assistance such as financial compensation, medical support or rehabilitation programmes for victims of mob violence and their families in Sri Lanka;

(ii) the current status of implementation of any such support schemes across the districts or provinces where incidents of mob violence have occured; and

(iii) whether any circulars, guidelines or policy frameworks have been issued to provincial councils or District Secretariats to ensure timely support and long-term assistance to such victims?

(b) If not, why?

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) 2018 අංක 34 දරන හානිපූරණය සඳහා වන කාර්යාලය පනතේ අංක 27 පරිච්ඡේදය පරිදි වන්දි ඇතුළු හානිපූරණයන් ලබා දෙනු ලබන්නේ පහත සිද්ධීන් මඟින් පීඩාවට පත් තැනැත්තන් වෙතය.

I. උතුරු නැඟෙනහිර පළාත්වල සිදු වූ සන්නද්ධ ගැටුම් අතරතුර එහි ප්‍රතිඵලයක් වශයෙන් හෝ ඊට සම්බන්ධව හෝ එහි පසු විපාකයක් ලෙස හෝ

II. දේශපාලන නොසන්සුන්තාවක් හෝ සිවිල් කැලඹීම් හේතුවෙන් හෝ

III. ශ්‍රී ලංකාවේ පුද්ගලයන්ට, කණ්ඩායම්වලට හෝ ජන කොට්ඨාසවලට සිදු වූ හානිය දීර්ඝ සහ බරපතළ ස්වභාවයේ හානියක් වීම හේතුවෙන් හෝ

IV. බලහත්කාරයෙන් අතුරුදහන් වීමක් හේතුවෙන් ජීවිතය අහිමිවීම හෝ ඔවුන්ට හෝ ඔවුන්ගේ දේපළවලට හෝ හානිවීම හේතුවෙන් පීඩාවට පත් වූ තැනැත්තන් වෙත දැනට හානිපූරණය නීතිය අනුව එහෙම තමයි දෙන්නේ. ඔබතුමාගේ ප්‍රශ්නයේ තිබෙන වචනයක් තමයි අපට ගැටලුව මතු කරන්නේ. ඒ "මැර කණ්ඩායම්" කියන වචනය. "මැර කණ්ඩායම්" කියන වචනයට දෙන නිර්වචනය පිළිබඳ ගැටලුවක් තිබෙනවා.

"මැර කණ්ඩායම්" යනුවෙන් ඔබ සඳහන් කර ඇති කාණ්ඩය ඉහත පනත ප්‍රකාරව දේශපාලන නොසන්සුන්තාව හෝ සිවිල් කැලඹීම් වැනි ඉහත I, II, III හා IV සිද්ධීන් යටතට ගැනෙන්නේ නම් එවැනි ගැටුම්වලින් පීඩාවන්ට හෝ ප්‍රචණ්ඩත්වයට ගොදුරුවූවන්ට 2022 මාර්තු 03 දින රජයේ අතිවිශේෂ ගැසට් පත්‍රයෙන් ප්‍රකාශිත හානිපූරණ ප්‍රතිපත්ති හා මාර්ගෝපදේශයන් ප්‍රකාරව නිශ්චිත හානිපූරණයන් හඳුන්වා දී ඇති අතර එම හානිපූරණයන්, එනම් මූල්‍යමය සහන, ජීවනෝපාය ආධාර ලබාදීම, මනෝසමාජයීය ආධාර වැනි සහන ලබාදීම දැනටමත් සිදුකරනු ලබයි.

(ii) ඉහත සඳහන් සිද්ධීන්ගෙන් විපතට පත් වූවන්ට හානිපූරණය සඳහා වන කාර්යාලය මඟින් වන්දි යෝජනා ක්‍රම ක්‍රියාත්මක කරනු ලබන අතර, දිස්ත්‍රික්ක හෝ පළාත් වශයෙන් විශේෂකොට සලකා ක්‍රියාත්මක නොකරන බව දන්වමි.

(iii) ඔව්.

(ආ) පැන නොනඟී.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 4 -1088/2025- (1), ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා. *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 5 -1174/2025- (2), ගරු සුනිල් රත්නසිරි මහතා.

**ගරු සුනිල් රත්නසිරි මහතා**
(மாண்புமிகு சுனில் ரத்னசிறி)
(The Hon. Sunil Rathnasiri)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා (සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍ය සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ - சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. (Dr.) Nalinda Jayatissa - Minister of Health and Mass Media and Chief Government Whip)
ගරු කථානායකතුමනි, මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

*ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.*
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## "අස්වැසුම" සුබසාධක ප්‍රතිලාභ ප්‍රදානය: විස්තර
## 'அஸ்வெசும' நலன்புரி நன்மைகள் வழங்கல்: விபரம்
## GRANT OF "ASWESUMA" WELFARE BENEFIT: DETAILS

1222/2025

**6. ගරු සුරංග රත්නායක මහතා**
(மாண்புமிகு சுரங்க ரத்நாயக்க)
(The Hon. Suranga Rathnayaka)
මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) මේ වන විට ශ්‍රී ලංකාවේ 'අස්වැසුම' ප්‍රතිලාභීන් සංඛ්‍යාව කොපමණද;

(ii) ලැබිය යුතු සියලුම පුද්ගලයන්ට 'අස්වැසුම' ප්‍රතිලාභය ලබා දෙන්නේද;

(iii) මේ වන විට එම ප්‍රතිලාභය නොලැබෙන, එහෙත් සුදුසුකම් සහිත පුද්ගලයන්ට එම ප්‍රතිලාභය ලබා දීමට කටයුතු කරන්නේද;

(iv) එසේ නම්, ඔවුන්ට එම ප්‍රතිලාභය ලබා දෙන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

நிதி, திட்டமிடல் மற்றும் பொருளாதார அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இன்றளவில் இலங்கையிலுள்ள 'அஸ்வெசும' பயனாளிகளின் எண்ணிக்கை யாது என்பதையும்;

(ii) நலன்புரி நன்மைகள் கிடைக்கப்பெற வேண்டிய அனைத்து நபர்களுக்கும் 'அஸ்வெசும' நலன்புரி நன்மைகள் வழங்கப்படுகின்றதா என்பதையும்;

(iii) இன்றளவில் மேற்படி நன்மைகள் கிடைக்காத போதிலும், அத்தகைய நன்மைகளைப் பெற்றுக் கொள்வதற்குத் தகைமையுடைய ஆட்களுக்கு அந்நன்மைகளை வழங்க நடவடிக்கை எடுக்கப் படுமா என்பதையும்;

(iv) ஆமெனில், அவர்களுக்கு மேற்படி நன்மைகள் வழங்கப்படும் திகதி யாது என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Finance, Planning and Economic Development:

(a) Will he inform this House -

(i) the number of "Aswesuma" beneficiaries in Sri Lanka at present;

(ii) whether the "Aswesuma" benefit is provided to all persons who are eligible to it;

(iii) whether steps are being taken to grant the benefit to those eligible persons who are not yet receiving it; and

(iv) if so, the date from which the benefit will be provided to them?

(b) If not, why?

**ගරු නිශාන්ත ජයවීර මහතා (ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு நிசாந்த ஜயவீர - பொருளாதார அபிவிருத்தி பிரதி அமைச்சர்)
(The Hon. Nishantha Jayaweera - Deputy Minister of Economic Development)
ගරු කථානායකතුමනි, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) මේ වන විට "අස්වැසුම" ප්‍රතිලාභීන් සංඛ්‍යාව 1,657,621යි.(ii) ඔව්. සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය විසින් අනුමැතිය ලබා දුන්, සුදුසුකම් සම්පූර්ණ කරනු ලැබූ ප්‍රතිලාභීන් සියලුදෙනාට ඉදිරියේදී ප්‍රතිලාභ ගෙවීමේ හැකියාව තිබෙනවා.

(iii) ඔව්. මේ වනකොට ප්‍රතිලාභ ඉල්ලා තිබෙන අය අතුරින් තෝරා ගත්තේ නැති තව පිරිසක් ඉන්නවා. මේ වන විට ඒ පිරිස තේරීම් ක්‍රියාවලියට ලක් වෙමින් පවතිනවා.

දැනට ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලින් සත්‍යාපනය කරන්න එවපු අයදුම්කරුවන් 97දෙනෙක් ඉන්නවා. සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය විසින් අනුමැතිය ලබා දෙන්න නියමිත 4,228දෙනෙක් ඉන්නවා. ඒ අනුමැතිය ලැබිලා බැංකු ගිණුම් විවෘත කරගත්තේ නැති ප්‍රතිලාභීන් පළමුවැනි වටයට අදාළව 33,513දෙනෙක් සහ දෙවැනි වටයට අදාළව 28,985දෙනෙක් ඉන්නවා. මීටත් අමතරව, අභියාචන හා විරෝධතා හේතුවෙන් අවසන් තීරණ ලබා දීමට ඇති සංඛ්‍යාව 67,531ක් වනවා.

එතකොට මෙන්න මේ කියපු පිරිසත් අභියාචනා සහ විරෝධතා පරීක්ෂණ අවසන් වුණාට පසුව ප්‍රතිලාභ ලබන්න සුදුසුකම් සහිත අය බවට පත් වුණොත් ඒගොල්ලන්ටත් ඒ ප්‍රතිලාභය ලැබෙනවා. ඊටත් අමතරව, මා කලින් සඳහන්

[ගරු නිශාන්ත ජයවීර මහතා]

කළ, "බැංකු ගිණුම් විවෘත නොකළ ප්‍රමාණය" යටතේ සඳහන් කර තිබෙන පිරිසටත් බැංකු ගිණුම් විවෘත කළාට පසුව එම ප්‍රතිලාභය ලැබෙනවා.

(iv) 2026 ජනවාරි 28

අභියාචනා හා විරෝධතා පරීක්ෂණ අවසන් කර මණ්ඩලයේ අනුමැතිය ලැබී ඇති නාම ලේඛන සඳහා මණ්ඩලය විසින් මේ වන කොට අනුමැතිය ලබා දෙමින් පවතිනවා. ප්‍රතිලාභීන් විසින් බැංකු ගිණුම් විවෘත කර මණ්ඩලය වෙත දැනුම් දුන් පසු එම ගිණුම්වලට ඒ මුදල් බැර කරනු ලබනවා.

(ආ) පැන නොනඟී.

**ගරු සුරංග රත්නායක මහතා**
(மாண்புமிகு சுரங்க ரத்நாயக்க)
(The Hon. Suranga Rathnayaka)
ගරු කථානායකතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, 2022 අවුරුද්දේ සිට අවුරුදු 3ක කාල සීමාවක් සඳහා "අස්වැසුම" ප්‍රතිලාභ ලබා දුන් ලක්ෂ 20ක වාගේ පිරිසකගේ ප්‍රතිලාභ ගෙවනු ලබන කාල සීමාව පසුගිය දෙසැම්බර්වලින් අවසන් වුණා. එසේ ප්‍රතිලාභ ගෙවනු ලබන කාල සීමාව අවසන් වූ අයට අදාළව ප්‍රතිලාභ කාලය නැවත දීර්ඝ කිරීමක් කරනවාද? ඒ වාගේම අස්වැසුම ප්‍රතිලාභය ලබා දීමට යෝජනා කර, 2022 වසරේ සිට එම දීමනාව ලබා දුන් පිරිසට අමතරව මේ ආණ්ඩුව යටතේ අලුතින් තවත් පිරිසක් අස්වැසුම ප්‍රතිලාභීන් විධියට තෝරාගෙන එම දීමනාව දෙන්න පටන් ගෙන තිබෙනවාද? ඒ කොපමණ ප්‍රමාණයකටද?

**ගරු නිශාන්ත ජයවීර මහතා**
(மாண்புமிகு நிசாந்த ஜயவீர)
(The Hon. Nishantha Jayaweera)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා අහපු පළමු කරුණට අදාළව සඳහන් කරනවා නම්, "සංක්‍රාන්තික" කියලා හඳුනා ගෙන තිබුණු පිරිසට අස්වැසුම ප්‍රතිලාභය ගෙවනු ලබන කාල සීමාව 2025.12.31 දිනෙන් අවසන් වෙනවා. ඒ නිසා තමයි සුබසාධක ප්‍රතිලාභ පනත යටතේ ගැසට් පත්‍රයක් මඟින් ඉදිරිපත් කරන ලද යෝජනාවක් අපි මේ පාර්ලිමේන්තුවේදී ඊයේ සම්මත කර ගත්තේ.

ඒ අනුව, එම පිරිසට 2026 ජුනි 30 වනකල් ඒ ප්‍රතිලාභය ලබා දෙන්න කටයුතු කරනවා.

ඔබතුමා අහපු අනෙක් ප්‍රශ්නයට පිළිතුර මේකයි. මේ ආණ්ඩුව පත් වුණාට පස්සේ, නැවත වතාවක් අස්වැසුම ප්‍රතිලාභ ලබා දීම සඳහා සුදුසුකම් තිබෙන අය ඉන්නවා නම් ඉදිරිපත් වෙන්න කියලා අයදුම්පත් කැඳෙව්වා. එතැනදී ලක්ෂ 8කට වැඩි පිරිසක් අයදුම්පත් ඉදිරිපත් කරලා තිබුණා. ඒ ලක්ෂ 8 අතරින් 287,000ක් පමණ තෝරාගෙන; දෙවැනි වටයේදීත් ඔවුන් සුදුසුකම් ලබා මේ වන විට ප්‍රතිලාභීන් බවට පත් වෙලා ඉන්නවා; ඔවුන්ට ප්‍රතිලාභ හිමිකම තිබෙනවා. ඊටත් අමතරව කියනවා නම්, මා දීපු උත්තරයේ සඳහන් පිරිස අතර බැංකු ගිණුම් විවෘත නොකළ පිරිසක් ඉන්නවා. ඒගොල්ලන් බැංකු ගිණුම් විවෘත කළාට පස්සේ ප්‍රතිලාභ හිමිකම ලැබෙනවා. ඒ වාගේම, විරෝධතා සහ අභියාචනා තිබෙන පිරිසකුත් ඉන්නවා. ඒ අභියාචනා සහ විරෝධතා සලකා බැලීමෙන් අනතුරුව ඔවුන් ප්‍රතිලාභ ලැබීමට සුදුසුකම් ලබනවා නම්, ඔවුන්ටත් ප්‍රතිලාභ හිමි වෙනවා.

**ගරු සුරංග රත්නායක මහතා**
(மாண்புமிகு சுரங்க ரத்நாயக்க)
(The Hon. Suranga Rathnayaka)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. ඔබතුමන්ලා "සමෘද්ධි" සහ "අස්වැසුම" ප්‍රජා ශක්ති වැඩසටහන බවට convert කරන්න හිතාගෙන ඉන්නවාද? මේ වන විට ඔබතුමන්ලා ප්‍රජා ශක්ති වැඩසටහන කියලා සංවර්ධන නිලධාරි ඇතුළු නිලධාරින් හතරදෙනාත් සමඟ ඒ ඒ තුලානට අදාළව විසිපස්දෙනෙකුගේ පමණ කමිටුවක් පත් කරගෙන ඉන්නවා. ඉදිරියේදී ඔබතුමන්ලා බලාපොරොත්තු වෙනවාද, "සමෘද්ධි" හෝ "අස්වැසුම" කියන නම වෙනස් කිරීමට හෝ සමෘද්ධි බැංකු, ප්‍රජා ශක්ති බැංකු කියලා වෙනස් කිරීමට? දේශපාලනය මත තමයි ඔබතුමන්ලා ඒ විසිපස්දෙනෙකු පමණ වන කණ්ඩායම තෝරාගෙන තිබෙන්නේ. අස්වැසුම හෝ ප්‍රජා ශක්ති වැඩ පිළිවෙළ යටතේ ඒ අයගේ කාර්යභාරය මොකක්ද කියලා මට දැන ගන්න අවශ්‍යයි.

**ගරු නිශාන්ත ජයවීර මහතා**
(மாண்புமிகு நிசாந்த ஜயவீர)
(The Hon. Nishantha Jayaweera)
ගරු මන්ත්‍රීතුමනි, එහෙම නම වෙනස් කරන්න රජයේ කිසිම බලාපොරොත්තුවක් නැහැ. මොකද, ප්‍රජා ශක්ති සභා පිහිටුවීම දේශපාලනික අරමුණක් නොවෙයි. ප්‍රජා ශක්ති සභාවේ සභාපති වටා ගමේ ග්‍රාම නිලධාරි, සංවර්ධන නිලධාරි, සමෘද්ධි නිලධාරි, කෘෂිකර්ම පර්යේෂණ නිෂ්පාදන සහකාර නිලධාරි යන සියලුදෙනා ඉන්නවා.

එතකොට, ඒ තීන්දු තීරණ ගන්නේ ඒ නිලධාරින් සියලුදෙනා එක්කාසු වෙලා. ගමේ ඉන්න විද්වතුන් ඇතුළු කමිටුවේ නිලධාරින් සියලුදෙනා ගමේ අවශ්‍යතා හඳුනාගෙන, කිසිම දේශපාලන සම්බන්ධයකින් තොරව තමයි තීරණය කරන්නේ. ඒ කියන්නේ, ගමේ සංවර්ධනය කරන්න ඕනෑ මොනවාද කියලා නිවැරදිව අවබෝධ කරගෙන ප්‍රතිලාභ ලබන ජනතාව නඟා සිටුවන්න ඉතාම විධිමත් වැඩ පිළිවෙළක් සකස් කරන්න තමයි ප්‍රජා සංවර්ධන සමිති සකස් කරලා තිබෙන්නේ. එහි කිසිම දේශපාලන අරමුණක් නැහැ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
7වන ප්‍රශ්නය, ගරු එම්.එස්. උදුමාලෙබ්බෙ මන්ත්‍රීතුමා.

**ගරු සුරංග රත්නායක මහතා**
(மாண்புமிகு சுரங்க ரத்நாயக்க)
(The Hon. Suranga Rathnayaka)
ගරු කථානායකතුමනි, ඊට පෙර මගේ ප්‍රශ්නයට ඇමතිතුමා ලබා දුන් පිළිතුර අනුව පැහැදිලි කිරීමකට ඉඩ දෙන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ දෙවැනි අතුරු ප්‍රශ්නයටත් පිළිතුරු ලැබුණාට පසු නැවත අවස්ථාවක් ලබා දිය නොහැකියි.

**ගරු සුරංග රත්නායක මහතා**
(மாண்புமிகு சுரங்க ரத்நாயக்க)
(The Hon. Suranga Rathnayaka)
Sir, I rise to a point of Order.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු කථානායකතුමනි,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු සුරංග රත්නායක මන්ත්‍රීතුමා, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

**ගරු සුරංග රත්නායක මහතා**
(மாண்புமிகு சுரங்க ரத்நாயக்க)
(The Hon. Suranga Rathnayaka)
ස්ථාවර නියෝග 33 (1) යටතේ මම අහන්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ ප්‍රශ්නයට ලබා දුන් පිළිතුරෙන් මතුවන කරුණු පැහැදිලි කර ගැනීමට අතුරු ප්‍රශ්න දෙකක් අහන්න පුළුවන්. ඔබතුමා ඒ අතුරු ප්‍රශ්න දෙක ඇහුවා. ඊට වඩා අවස්ථාව දෙන්න බැහැ.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
ගරු කථානායකතුමනි, නමුත් ඉල්ලීමක් කරන්න පුළුවන්. ස්ථාවර නියෝග 33 (1)- *[බාධා කිරීම්]*

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝගය පැහැදිලිව කියවන්න. ලබා දෙන උත්තරේ-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
නැහැ, අවසානයි. ගරු මන්ත්‍රීතුමා, 7වන ප්‍රශ්නය අහනවාද? *[බාධා කිරීම්]*

ගරු ඉඩම් සහ වාරිමාර්ග නියෝජ්‍ය ඇමතිතුමා, 7වන ප්‍රශ්නයට පිළිතුර සපයන්න.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු කථානායකතුමනි, මට අවස්ථාවක් දෙන්න. *[බාධා කිරීම්]*
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අදාළ නැහැ. ගරු මන්ත්‍රීතුමා ඒක point of Order එකක් නොවෙයි. මූලික ප්‍රශ්නය ඇහුවාට පසු අතුරු ප්‍රශ්න දෙකක් අහන්න පුළුවන්. පළමුවන අතුරු ප්‍රශ්නය ඇහුවා; දෙවැනි අතුරු ප්‍රශ්නයත් ඇහුවා; උත්තර ලබා දුන්නා.

## ඉඩම් හිමිකම් ඔප්පු නිකුත් කිරීම: නැඟෙනහිර පළාත
### உரித்து உறுதிகளை வழங்குதல்: கிழக்கு மாகாணம்
### ISSUANCE OF TITLE DEEDS: EASTERN PROVINCE

1267/2025

**7. ගරු එම්.එස්. උදුමාලෙබ්බෙ මහතා**
(மாண்புமிகு எம்.எஸ். உதுமாலெப்பை)
(The Hon. M.S. Uthumalebbe)
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) පසුගිය රජය විසින් නැඟෙනහිර පළාතේ අම්පාර, මඩකලපුව සහ ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කවල ඉඩම් බලපත්‍ර සඳහා හිමිකම් ඔප්පු ලබා දීමේ වැඩසටහන යටතේ මහ ජනතාවගෙන් ලබා ගන්නා ලද ඉඩම් බලපත්‍ර සංඛ්‍යාව එක් එක් දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම දිස්ත්‍රික්ක සඳහා නිකුත් කර ඇති හිමිකම් ඔප්පු සංඛ්‍යාව එක් එක් දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) තවදුරටත් නිකුත් කිරීමට ඇති හිමිකම් ඔප්පු සංඛ්‍යාව එක් එක් දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එම හිමිකම් ඔප්පු කඩිනමින් ලබා දීම සඳහා අමාත්‍යාංශය විසින් ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) கடந்த அரசாங்கத்தால் கிழக்கு மாகாணத்தின் அம்பாறை, மட்டக்களப்பு மற்றும் திருகோண மலை மாவட்டங்களில் காணி அனுமதிப் பத்திரங்களுக்கான உரித்து உறுதிகளை வழங்கும் நிகழ்ச்சித்திட்டத்தின்கீழ் பொது மக்களிடமிருந்து பெறப்பட்ட காணி அனுமதிப் பத்திரங்களின் எண்ணிக்கை, ஒவ்வொரு மாவட்டத்துக்கும் ஏற்ப வெவ்வேறாக யாது என்பதையும்;

(ii) அம்மாவட்டங்களுக்கு வழங்கப்பட்டுள்ள உரித்து உறுதிகளின் எண்ணிக்கை ஒவ்வொரு மாவட்டத் துக்கும் ஏற்ப வெவ்வேறாக யாது என்பதையும்;

(iii) மேலும் வழங்கப்பட வேண்டிய உரித்து உறுதி களின் எண்ணிக்கை ஒவ்வொரு மாவட்டத் துக்கும் ஏற்ப வெவ்வேறாக யாது என்பதையும்;

(iv) மேற்படி உரித்து உறுதிகளை விரைவாக வழங்கு வதற்கு அமைச்சின்மூலம் மேற்கொள்ளப்படும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Agriculture, Livestock, Land and Irrigation:

(a) Will he inform this House -

(i) separately, for each District, the number of land permits obtained from the public, under the programme implemented by the previous Government to issue title deeds for land permits in the Ampara, Batticaloa and Trincomalee Districts of the Eastern Province;

(ii) separately for each district, the number of Title Deeds that have been issued for the aforesaid districts;

(iii) separately, for each district, the number of Title Deeds that are yet to be issued; and

(iv) the steps that will be taken by the Ministry to expedite the issuance of the aforementioned Title Deeds?

(b) If not, why?

**ගරු අරවින්ද සෙනරත් මහතා (ඉඩම් සහ වාරිමාර්ග නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு அரவிந்த செனரத் - காணி மற்றும் நீர்ப்பாசன பிரதி அமைச்சர்)
(The Hon. Aravinda Senarath - Deputy Minister of Land and Irrigation)
ගරු කථානායකතුමනි, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) අම්පාර - 3779
ත්‍රිකුණාමලය - 1469
මඩකලපුව - 3620

(ii) අම්පාර - 2245
ත්‍රිකුණාමලය - 292
මඩකලපුව - 1144

(iii) අම්පාර - 1534
ත්‍රිකුණාමලය - 1177
මඩකලපුව - 2476

(iv) ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංක 2025/02 චක්‍රලේඛය මඟින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල හා අදාළ අනෙකුත් ආයතනවලට මේ සම්බන්ධව කඩිනමින් ක්‍රියා කිරීමට අවශ්‍ය උපදෙස් ලබා දී ඇත.

(ආ) අදාළ නොවේ.

**ගරු එම්.එස්. උදූමාලෙබ්බේ මහතා**
(மாண்புமிகு எம்.எஸ். உதுமாலெப்பை)
(The Hon. M.S. Uthumalebbe)
கௌரவ சபாநாயகர் அவர்களே, கௌரவ பிரதி அமைச்சர் அவர்களிடம் எனது முதலாவது மேலதிகக் கேள்வியைக் கேட்கின்றேன்.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
Sir, I rise to a point of Order. මේ ලියලා තිබෙන එක ඔබතුමා කියන්න දෙන්නේ නෑ නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු සුරංග රත්නායක මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ ප්‍රශ්නයට පිළිතුරු ලබා දුන්නා.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
එතුමාට කියන්න තිබෙන දේ ඔබතුමා කියන්න දෙන්නේ නැහැ නේ. *[බාධා කිරීම්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, මගේ අදහස ප්‍රකාශ කළාට පසු ඔබතුමා වාඩිවෙන්න ඕනෑ, මේ සභාවේ කටයුතු පවත්වාගෙන යන්න.

ගරු උදූමාලෙබ්බේ මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ අතුරු ප්‍රශ්න අහන්න. *[බාධා කිරීම්]*

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
මට Point of Order එක ඉදිරිපත් කරන්න ඉඩ දෙන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Point of Order එක ගැන තමයි මම දැන් එතුමාට පැහැදිලි කරලා දුන්නේ. තවත් අහන්නේ මොකක්ද ඒ ගැන? *[බාධා කිරීම්]* ඔබතුමාගේ point of Order එක කියන්න. මොකක්ද, point of Order එක, චමින්ද විජේසිරි මන්ත්‍රීතුමා?

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
බොහොම ස්තුතියි, ගරු කථානායකතුමනි.

මේකේ සඳහන්ව තිබෙන හැටියට පිළිතුර දුන්නාට පස්සේ, පිළිතුරෙන් නැඟෙන කාරණයක් පැහැදිලි කර ගැනීමට ඒ ප්‍රශ්නය අසනු ලබන මන්ත්‍රීවරයාට අයිතියක් තිබෙනවා. මේක දිගින් දිගටම කළා එතුමන්ලා විපක්ෂයේ ඉද්දී. ඔබතුමා ඒක අහිමි කිරීම බරපතළ අසාධාරණයක්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, ප්‍රශ්නයක් ඇහුවාම ඒ ප්‍රශ්නයට අදාළව අතුරු ප්‍රශ්න දෙකක් විතරයි අහන්න පුළුවන්. ඔබතුමා තනිකර නොමග යැවීමක් මේ කරන්නේ. මොනවා කියවනවාද මම දන්නේ නැහැ.

ගරු උදූමාලෙබ්බේ මන්ත්‍රීතුමා, ඔබතුමාගේ අතුරු ප්‍රශ්නය අහන්න. *[බාධා කිරීමක්]* ගරු චමින්ද විජේසිරි මන්ත්‍රීතුමා, ගෙදර ගිහිල්ලා ස්ථාවර නියෝග පොත කියවන්නකෝ. මෙලෝ දෙයක් තේරෙන්නේ නැහැ.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
අපට නොවෙයි ඔබතුමාට තේරෙන්නේ නැත්තේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමාට මම වැඩි යමක් කියන්නේ නැහැ. ගරු උදූමාලෙබ්බේ මන්ත්‍රීතුමා, අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු එම්.එස්. උදූමාලෙබ්බේ මහතා**
(மாண்புமிகு எம்.எஸ். உதுமாலெப்பை)
(The Hon. M.S. Uthumalebbe)
கௌரவ பிரதி அமைச்சர் அவர்களே, முன்னாள் சனாதிபதி ரணில் விக்கிரமசிங்ஹ அவர்கள் சனாதிபதியாக பதவிவகித்த காலத்தில் அப்போதைய அரசாங்கத்தால் காணி உறுதிப் பத்திரங்கள் வழங்கும் 'உறுமய' வேலைத்திட்டம் முன்னெடுக் கப்பட்டது. இதன்போது காணி உரிமையாளர்களிடம் இருக்கும் காணி தொடர்பான அனைத்து ஆவணங்களையும் பிரதேச செயலகங்களில் ஒப்படைக்குமாறு அப்போதைய அரசாங்கத்தால் அறிவிக்கப்பட்டது. அதன் அடிப்படையில் காணி உரிமையாளர்கள் தங்களிடம் இருந்த ஆவணங்களைப் பிரதேச செயலகத்திடம் கையளித்தனர். சனாதிபதித் தேர்தல் அறிவிக்கப்பட்டதன் பின்னர், இவ்வேலைத்திட்டம் இடை நிறுத்தப்பட்டது. இடைநிறுத்தப்பட்டுள்ள இத்திட்டத்தை நிறைவுசெய்வதற்கான செயற்பாடுகளை தற்போதைய அரசாங்கமும் காணி அமைச்சும் முன்னெடுக்க வேண்டும்.

நான் இங்கு ஒரு விடயத்தைக் குறிப்பிட்டுச் சொல்கிறேன். அதாவது, இந்தக் காணி உரிமையாளர்கள் பிரதேச செயலகத் துக்குச் சென்று தாங்கள் கொடுத்த மூலப் பிரதிகளைக் கேட்கும்போது, கொழும்பிலுள்ள காணி ஆணையாளர் அலுவலகத்துக்குச் சென்று அவற்றைப் பெற்றுக்கொள்ளுமாறு சொல்கிறார்கள். அம்பாறை, மட்டக்களப்பு, திருகோணமலை மாவட்டங்களிலுள்ள இந்தக் காணி உரிமையாளர்கள் காணி ஆணையாளர் அலுவலகத்துக்குச் சென்று அவற்றைக் கேட்டால், சனாதிபதி அலுவலகத்தில் இருக்கின்ற காணிப் பிரிவுக்குச் சென்று அவற்றைப் பெற்றுக்கொள்ளுமாறு சொல்கின்றார்கள். எங்களுடைய பகுதியில் சொல்வார்கள், பிச்சை -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු එම්.එස්. උදුමාලෙබ්බේ මහතා**
(மாண்புமிகு எம்.எஸ். உதுமாலெப்பை)
(The Hon. M.S. Uthumalebbe)
ගරු කථානායකතුමනි, මම මේ කථා කරන්නේ ඉඩම් සම්බන්ධව. ඒ නිසා මට වේලාව දෙන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, විනාඩි දෙකක් අතුළත ප්‍රශ්නය අහන්න. ඊට වැඩිය කාලය ගන්න එපා. විනාඩි දෙකට වැඩිය දෙන්න බැහැ. අතුරු ප්‍රශ්නයක් අහන්න.

**ගරු එම්.එස්. උදුමාලෙබ්බේ මහතා**
(மாண்புமிகு எம்.எஸ். உதுமாலெப்பை)
(The Hon. M.S. Uthumalebbe)
ගරු ඇමතිතුමනි, බලපත්‍රයක් දුන්නා. දැන් බලපත්‍රයත් නැහැ, "Urumaya" deed එකත් නැහැ. ඒකට ඔබතුමන්ලා මොනවා හරි පියවරක් ගන්නවාද කියලා මට කියන්න.

**ගරු අරවින්ද සෙනරත් මහතා**
(மாண்புமிகு அரவிந்த செனரத்)
(The Hon. Aravinda Senarath)
ගරු කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමා නඟපු අතුරු ප්‍රශ්නය සමාජයේ කථා බහට ලක් වෙන, ඒ වාගේම මීට පෙරත් පාර්ලිමේන්තුවේදී පිළිතුරු ලබා දුන් ප්‍රශ්නයක්. පසුගිය ජනාධිපතිවරණයට පෙර පැවති රජය සහ එවකට හිටපු ජනාධිපතිවරයා මැතිවරණය ඉලක්ක කරගෙන, රටේ ජනතාවට ඔප්පු ලක්ෂ 20ක් දෙන්න වැඩ පිළිවෙළ සකස් කරලා, ඒකට "උරුමය" කියලා නමක් දැම්මා. හැබැයි, ඒ සඳහා වූ හැකියාවන්, ධාරිතාවන් පිළිබඳ අධ්‍යයනයකින් තොරව, රටේ ඒ වාගේ තීන්දුවක් ගත්තාට පස්සේ, ඒක හරි සංකීර්ණ ක්‍රියාවලියක්. ඒ වෙනකොටත් ඉතා සුළු ප්‍රමාණයක් ඔප්පු නිදහස් කරලා තිබුණා. අපේ ආණ්ඩුව බලයට පත් වුණාට පස්සේ, ඒ අවිධිමත් ක්‍රියාවලිය නතර කරලා, ඒක විධිමත් කරලා, නිලධාරින් සමඟ සාකච්ඡා කරලා, දිස්ත්‍රික්ක මට්ටමින් සියලු තොරතුරු එක්රැස් කරලා, දැනට "හිමිකම" වැඩසටහන යටතේ ඔප්පු ලබා දෙන්න කටයුතු කරලා තිබෙනවා. මේ වසරේ මැයි මාසය වෙනකොට අපි ඔප්පු 65,000ක වාගේ ප්‍රමාණයක් ලබා දෙන්න කටයුතු සූදානම් කරලා තිබෙනවා. ගරු මන්ත්‍රීතුමා නඟපු ප්‍රශ්නයෙන් කියපු ආකාරයට, ජනතාව අපහසුතාවට පත් වෙනවා. ගරු කථානායකතුමනි, ඒ අවිධිමත් ක්‍රමය ඇතුළේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට ඔප්පු එකතු කළා. ඒ තොරතුරු අමාත්‍යාංශයට ලබා දෙන්න වැඩ පිළිවෙළක් තිබුණේ නැහැ. තවම system එකට ඇතුළත් කළේ නැති ප්‍රමාණයකුත් තිබෙනවා. ඒ නිසා අපි මේ සියල්ල සලකා බලා, ජනතාවට වග කියන ආණ්ඩුවක් විධියට "හිමිකම" ඔප්පු ලබා දෙන්න කටයුතු කරමින් ඉන්නවා. System එකට ඇතුළත් නොවුණු ඔප්පු පිළිබඳව නිලධාරින් එක්ක සාකච්ඡා කරමින්, ඒ සඳහා වූ විධිමත් වැඩ පිළිවෙළක් සකස් කරමින් ඉන්නවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, දෙවැනි අතුරු ප්‍රශ්නයත් අහන්න.

**ගරු එම්.එස්. උදුමාලෙබ්බේ මහතා**
(மாண்புமிகு எம்.எஸ். உதுமாலெப்பை)
(The Hon. M.S. Uthumalebbe)
எங்களுடைய கிழக்கு மாகாண மக்களுடைய காணி உறுதிகளை வழங்குவதற்கு அவசர ஏற்பாடுகளை அமைச்சு செய்ய வேண்டுமெனக் கேட்டுக்கொண்டு, எனது இரண்டாவது மேலதிக வினாவைக் கேட்கின்றேன்.

யுத்தம் காரணமாக வெளியேறிய முஸ்லிம் குடும்பங்கள் மட்டக்களப்பு மாவட்டத்தில் புனானை அணைக்கட்டு, பொத்தானைக் கிராமத்தில் மீள்குடியேறி வாழ்ந்து வருகின்றார்கள். குறித்த கிராம சேவகர் பிரிவில் புனானை அணைக்கட்டு, பொத்தானையில் மீள்குடியேறிய முஸ்லிம் குடும்பங்களைத் தவிர்த்து, இறுதியாக 2014ஆம் ஆண்டு அங்குள்ள தமிழ் மக்களுக்குக் காணி ஆவணங்களை கிரான் பிரதேச செயலகம் வழங்கியுள்ளது. அலுவலக ஆவணங்களின் பிரகாரம், கோரளைப்பற்று தெற்குப் பிரதேச செயலகப் பிரிவுக்குட்பட்ட புனானை மேற்கு கிராம உத்தியோகத்தர் பிரிவிலுள்ள மயிலந்தனை, புனானை, முள்ளிவட்டவான், புனானை அணைக்கட்டு, பொத்தானை போன்ற கிராம மக்களுக்கு இறுதியாக 2014ஆம் ஆண்டு காலப்பகுதியில் அனுமதிப்பத்திரம் வழங்கப்பட்டுள்ளதாக தகவலறியும் சட்டத்தின் ஊடாகக் கேட்கப்பட்ட கேள்விக்கான பதிலில் குறிப்பிடப்பட்டுள்ளது.

கிரான் பிரதேச செயலகத்தில் முஸ்லிம்கள் தங்களுக்கான காணி அனுமதிப் பத்திரங்களைக் கோரியபோது, கிரான் பிரதேச செயலகம் குறித்த காணி மகாவலிக்குரிய காணியென பதில் சொல்லி தவிர்ந்துகொண்டது. 2014இல் பொத்தானைக் குடியிருப்பு முஸ்லிம்கள் எவரும் உள்வாங்கப்படவில்லை. முஸ்லிம்களைத் தவிர்த்து எவ்வாறு மற்றவர்களுக்கு அனுமதிப்பத்திரங்களை பிரதேச செயலகம் வழங்கியது? என்ற நியாயமான கேள்வி இங்கு எழுகின்றது. புனானை அணைக்கட்டு, பொத்தானையில் மீள்குடியேறிய முஸ்லிம்கள் 2011, 2012, 2017, 2023ஆம் ஆண்டுகளில் காணிக் கச்சேரிக்கு விண்ணப்பித்துள்ளனர். அவர்கள் விண்ணப்பித்த பின்னர், அது மகாவலிக்குரிய காணியெனக் காரணம் சொல்லி, காணி ஆவணங்களை வழங்க மறுத்து நிராகரிப்பது கோரளைப்பற்று தெற்கு - கிரான் பிரதேச செயலகத்தின் தொடர் கதையாகப் போய்விட்டது. இவ்வாறு இழுத்தடிப்புச் செய்து, பூர்வீகமாக வாழ்ந்த முஸ்லிம்களை அலைக்கழிப்புச் செய்கின்றது கிரான் பிரதேச செயலகம்!

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, -

**ගරු එම්.එස්. උදුමාලෙබ්බෙ මහතා**
(மாண்புமிகு எம்.எஸ். உதுமாலெப்பை)
(The Hon. M.S. Uthumalebbe)
මට විනාඩි 2ක් දෙන්න, ගරු කථානායකතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ අතුරු ප්‍රශ්නය ඇසීම විනාඩි දෙකකට සීමා කරන්න.

**ගරු එම්.එස්. උදුමාලෙබ්බෙ මහතා**
(மாண்புமிகு எம்.எஸ். உதுமாலெப்பை)
(The Hon. M.S. Uthumalebbe)
மகாவலி "B" வலயத்துக்கான வெலிக்கந்தை பிரதேச செயலகத்தைத் தொடர்புகொண்டு மக்கள் வினவியபோது, தமது நிருவாகப் பிரிவுக்குள் மட்டக்களப்பு மாவட்டம் சட்டபூர்வமாக உள்வாங்கப்படவில்லை எனக் கூறப்பட்டுள்ளது.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මට ඔබතුමාගේ ඔය කථාව නතර කරන්න සිද්ධ වෙනවා.

**ගරු එම්.එස්. උදුමාලෙබ්බෙ මහතා**
(மாண்புமிகு எம்.எஸ். உதுமாலெப்பை)
(The Hon. M.S. Uthumalebbe)
எனவே, புனானை அணைக்கட்டு, பொத்தானையில் மீளக்குடியேறிய மக்களுக்குக் காணி உறுதிகளை வழங்குவதற்கு நடவடிக்கை எடுப்பீர்களா? என நான் கௌரவ பிரதி அமைச்சர் அவர்களைக் கேட்கின்றேன்.

**ගරු අරවින්ද සෙනරත් මහතා**
(மாண்புமிகு அரவிந்த செனரத்)
(The Hon. Aravinda Senarath)
ගරු කථානායකතුමනි, දෙවැනි අතුරු ප්‍රශ්නය තුළින් ගරු මන්ත්‍රීතුමා යම් උත්සාහයක් ගත්තා, මුස්ලිම් වීම නිසා ඔප්පු ලබා දෙන්නේ නැහැ කියන කාරණය මතු කරන්න. ඒ පිළිබඳවයි ප්‍රශ්න කිරීම කළේ. මීට පෙර පැවැති ආණ්ඩු අනුගමනය කරපු ප්‍රතිපත්තිය පිළිබඳව අපි වෙනම සාකච්ඡා කරමු. හැබැයි, වර්තමාන ආණ්ඩුව ඔප්පු ලබා දීම හෝ වෙනයම් හෝ කටයුත්තක් සිංහලද, දෙමළද, මුස්ලිම්ද කියලා ජන වර්ග අනුව සිදු කරන්නේ නැහැ. සියලුදෙනාම රටේ පුරවැසියන් සේ සලකා තමයි අපි සියලු ක්‍රියාමාර්ග ගන්නේ. ඔබතුමාගේ ඔය ප්‍රශ්නයට අදාළව ප්‍රදේශයේ ඇති ඉඩම්, මහවැලි ඉඩම් - රජයේ වෙනත් ඉඩම් ද තිබෙන්න පුළුවන් - පිළිබඳව විධිමත් පරීක්ෂණයක් කරලා ඒවා ජනතාවට හිමි විය යුතු ඉඩම් නම් ඒ සඳහා ඔප්පු ලබා දීමට ආණ්ඩුවක් විධියට අපි කටයුතු කරනවා. ඔබතුමා අදාළ තොරතුරු ඉදිරිපත් කරනවා නම්, ඒ ඒ ආයතනවලට දැනුම් දීලා ඒ කටයුත්ත විධිමත් කරන්න අපට පුළුවන්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 8 -1269/2025- (2), ගරු තුරෙයිරාසා රවිකරන් මහතා.

**ගරු තුරෙයිරාසා රවිකරන් මහතා**
(மாண்புமிகு துரைராசா ரவிகரன்)
| Hitty Arfafchige Don Bastian | Commissioner | Bentolta |
| **MATURA.** | | |
| Peddigodde Mohantimoelle Arratche | Arratchy | Pedigod... |
| Baloekawille Duntoednewe Hitte Atchigey Loese | | Baloeke... |
| Don Alvis Wierasinhe Dissanaike Appochamy | | Kaddev... |
| Hakmene Appoo | | Kappoe... |
| Roepesinhe Mohandiram | Mohandram | Parredo... |
| Roepesinhe Arratchy | Arratchy | do |
| Wieregoeneratne Sabandar | Late Sabandar | Moedoe... |
| Hewagey Naydappoo | | do |
| Ameerewickreme Vidagn Aratchy | Vidahn Arratchy | Konank... |
| Munddoegodde Appoo | | Katdoe... |
| Weddikkare Cangan | Cangan | Waraka... |
| Ranlandoenegey Babe | | do |
| Tottemony Arratchy | Arratchy | Belligan... |
| Lienne Watte Poentche | | do |
| Halickoedoegey Sime | | Kohoe... |
| Lienne Arratchey | Writer Arratchy | Morru... |
| Catoene Arratchy | Arratchy | Catoen... |
| Don Simon Abewickreme Jasinhe | Pattoe Arratchy | Wehen... |
| Dahanaike Koddituekkoe Arratchy | Vidahn Arratchy | Kundepi... |
| Gallegodde Bandaremahatmea | | Hakoe... |
| Abewickreme Goenesegere | Arratchy | Aranw... |
| Wickremeratne Goenesegere Galle Arratchy | do. | Pallatt... |
| Abewickreme Dissanaike | do. | Oedoe... |
| Koddipilie Vidan Arratchy | Vidahn Arratchy | Tangal... |
| Don Abraham Dissanaike Wijesinhe | Late Modeliar | Gabith... |
| Waangiegey Abere | Lascoryn | d... |
| Do. Wattoewe | do. | d... |
| **MAHAGAMPATTOO.** | | |
| Samurah Ratnah Jeyah Sekerah | Arratchy | Urgub... |
| Rajuh Poxah Ratnaike | Vidahn Arratchy | Magun... |
| Wannagee Ratnah Munamperee | do. | do. |
| Vidic Wardenah Lecinah Atchillah | Commistier Appoo | |
| Pahatigam Moonesingegee Appoo | Lecinah Arratchy | |
| Gallehetty Cungany | | |
| **BATTICALOA.** | | |
| Monde Podie | Headman of Carewaw | Saanj... |
| Pandarie Wela Podie | 2d. Headm. of Erroar | Kirie |
| Caden Wela Podie | Headman of Errovil | Codoe |
| Pitti Podie Wayen | Formerly acted as headm. of Manmone | Carriv... |
| Koenen Kannen | Adigary | Cattal... |
| Pattenien | do. | |
| Naganda Podie | Headm. of Erraor | Errao... |
| Canda Podie | Headm. of Manmonne | Poede... |
| Cunjie Canda Podie | Headm. of Poretivoe | Kaaan... |
| Widdiarese Cadrama Podie | 1st Headm. of Ackarepattoe | Cale |
| Caderame Podie | 1st Headm. of Nadoecadoe | Potte... |
| Canda Podie | 2d Headman of Nadoecadoe | Weren... |
| Silla Pandare Welayden | Formerly Vidaan | Caym... |
| Ambaga Pandara Wannien | Head of the Vedas | Nade... |
| Mylie Podie | Formerly Headm. of Samartore | Carat... |
| Cadramale Tayngapen | Formerly store Cenecopl of Naypatmone | Kayn... |
| Caderamen Velaatje | Re...pidoor | Cattoe... |
| Meera Oessen Auwakker | Formly Karinpeer | Kaym... |
| Oessen Elebe Ordoema Elebe | do. do. | do. |
| Kanne Kapoewe | Land Conicoply of Panoa | Watte... |
| Auwaker Isse | Mohandram | Samat... |
| Widiarese Kandapodie | 2d Head podie of Ackarapatoe | Karoe... |
| Maylen Oemeyen | Adigary | Amoc... |
| Annies Lebbe | Formerly Malay Officer in the Dutch Service | Maro... |
| Oeleghe Podie | Fieldowner | Pandari... |
| Sinnepoelle | do. | Kottane... |
| Tambapoelle | do. | do. |
| Ratterale | Formerly 2d Vidaan of Panoa | Oelle |
| Koenjilia Podie | Formerly head man of Ackerrapattoe | Caroen... |
| **TRINCOMALIE.** | | |
| Mapana Vannia | Headmen of Cotiar | |
| Sammatte Moodlier | 2d Headmen of Cotiar | |
| Canda Odear | An Inhabitant, and son in law to Sammate Moodliar | |

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු කථානායකතුමනි, එතුමාගේ ප්‍රශ්නයට පිළිතුරු ලබා දීම සඳහා මා කල් ඉල්ලා සිටිනවා.

## II

## අක්කරෙයිපත්තු, චාවකච්චේරි සහ තෙලිප්පලෙයි මූලික රෝහල්වල සිදු වූ අසාධාරණකම්
### அக்கரைப்பற்று, சாவகச்சேரி, தெல்லிப்பளை ஆதார வைத்தியசாலைகளில் நடைபெற்ற அநீதிகள்
### INJUSTICES COMMITTED AT AKKARAIPATTU, CHAVAKACHCHERI AND TELLIPPALLAI BASE HOSPITALS

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Good morning to you, Hon. Speaker!

கௌரவ சபாநாயகர் அவர்களே, பாராளுமன்ற நிலையியற் கட்டளை 27(2) இன்கீழ் சுகாதார அமைச்சரிடம் எனது கேள்வியைக் கேட்க விரும்புகிறேன்.

அன்புக்கும் மதிப்புக்குமுரிய அமைச்சர் அவர்களே, கிழக்கு மாகாணத்தில் இன்று மூன்றாவது நாளாகத் தொடர்ச்சியாகப் பொதுமக்களுக்குப் பாதிப்பை ஏற்படுத்தக்கூடிய விதத்தில் நடைபெறும் அரச வைத்திய அதிகாரிகள் சங்கத்தின் செயற்பாடுகள் தொடர்பாகத் தாங்கள் அறிந்திருப்பீர்கள். அங்குள்ள அக்கரைப்பற்று ஆதார வைத்தியசாலையிலும், நேற்றைய தினம் தெல்லிப்பளை ஆதார வைத்தியசாலையிலும் மற்றும் 2024ஆம் ஆண்டு சாவகச்சேரி ஆதார வைத்திய சாலையிலும் நடைபெற்ற அநீதிகள் தொடர்பாகப் பின்வரும் வினாக்களுக்குத் தங்களால் பதிலளிக்க முடியுமா?

A. அக்கரைப்பற்று ஆதார வைத்தியசாலையில் நடைபெற்றுவரும் மக்கள் விரோத வைத்திய அதிகாரிகள் சங்கத்தின் வேலை நிறுத்தப் போராட்டம் தொடர்பாக ஆறு கேள்விகளைக் கேட்கின்றேன்:

1. அக்கரைப்பற்று ஆதார வைத்தியசாலையின் தற்போதைய வைத்திய அத்தியட்சகர் யார்?
2. அவருடைய நியமனம் எப்போது வழங்கப் பட்டது? அவர் வைத்திய நிர்வாகப் பதவியில் எந்தப் பதவி நிலையில் இருக்கின்றார்? Deputy Administratorஆ அல்லது Senior Administratorஆ? என்றுதான் கேட்கின்றேன். அவருடைய நியமனம் சட்டரீதியானதா?
3. மேற்படி வைத்திய அதிகாரிக்கு எதிராகச் செய்யப்பட்ட முறைப்பாடு தொடர்பான விசாரணை, இதுவரை சுகாதார அமைச்சினால் ஆரம்பிக்கப்பட்டுள்ளதா?
4. ஆமெனில், விசாரணைகளின் விபரத்தை விளங்கப்படுத்த முடியுமா?
5. அந்த வைத்தியசாலையில் GMOA - அரச வைத்திய அதிகாரிகள் சங்கம் என்று சொல்லப் படுகின்ற தொழிற்சங்கம் தொடங்கியிருக்கின்ற வேலை நிறுத்தப் போராட்டத்தின் கோரிக்கைகள் என்னென்ன?
6. அந்தக் கோரிக்கைகள் நியாயமானவையா? இல்லையாயின் இது தொடர்பாகச் சுகாதார அமைச்சர் என்ற ரீதியில் தாங்கள் எடுத்திருக்கும் நடவடிக்கை என்ன?

B. தெல்லிப்பளை ஆதார வைத்தியசாலையின் வைத்திய அத்தியட்சகருக்கு எதிராக இன்றைய தினம் ஒழுக்காற்று விசாரணையொன்று Governorஆல் ஆரம்பிக்கப்பட்டுள்ளதாக அறியக் கிடைத்துள்ளது.

1. அவ்வாறாயின் அந்த விசாரணை தொடர்பாகத் தங்களுக்கு அறிவிக்கப்பட்டிருக்கிறதா?
2. தெல்லிப்பளை ஆதார வைத்தியசாலையின் வைத்திய அத்தியட்சகருக்கு எதிராக இதுவரை சுகாதார அமைச்சில் முறைப்பாடுகள் ஏதும் செய்யப்பட்டிருக்கிறதா?
3. ஆமெனில், அந்த முறைப்பாடு தொடர்பாகத் தாங்கள் இதுவரை எடுத்த நடவடிக்கைகள் என்ன?
4. தெல்லிப்பளை ஆதார வைத்தியசாலையில் வைத்திய அத்தியட்சகருக்கு எதிராகச் செய்யப் பட்ட முறைப்பாட்டை ஆளுநர் விசாரணை செய்ய முடியுமா?
5. ஆமெனில் அவ்வாறான விசாரணைகள் சுகாதார அமைச்சின்கீழா முன்னெடுக்கப்படுகின்றன?
6. மேற்படி வைத்தியசாலையில் உள்ள புற்றுநோய் பிரிவில் தனியார் வங்கிக் கணக்கு ஆரம்பிக்கப் பட்டு, மில்லியன் கணக்கான - கிட்டத்தட்ட 38 மில்லியன் ரூபாய் - பணம் சூறையாடப் பட்டுள்ளது. இது தொடர்பாகத் தாங்கள் அறிந்திருக்கின்றீர்களா? அது தொடர்பாகத் தாங்கள் எடுத்த நடவடிக்கை என்ன?

C. யாழ்ப்பாணம் போதனா வைத்தியசாலை தொடர்பாக:

1. இன்றைய நிலையில் அங்குள்ள இரண்டு CT scanner இயந்திரங்களும் இயங்குநிலையில் இல்லை என்பதைத் தாங்கள் அறிவீர்களா?
2. அப்படியாயின் முதலாவது CT scanner இயந்திரம் பழுதாகியபோது, ஏன் வைத்தியர் சத்தியமூர்த்தி அவர்களால் அது தொடர்பாக நடவடிக்கை எடுக்க முடியவில்லை?
3. அந்த வைத்தியசாலையிலிருந்து பொதுமக்கள் தனியார் வைத்தியசாலையான Northern Central Hospitalக்கு அனுப்பப்பட்டு, CT பரிசோதனைகள் செய்யப்படுவது தங்களுக்குத் தெரியுமா?
4. பொது மக்களின் பணம் திட்டமிட்ட ரீதியில் தனியார் வைத்தியசாலையான Northern Central Hospitalக்கு திசை திருப்பப்படுகின்றது என்பதைத் தாங்கள் ஏற்றுக் கொள்கின்றீர்களா?

நன்றி.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 27 (2) යටතේ ගරු අර්චුනා මන්ත්‍රීතුමා විසින් අසන ලද ප්‍රශ්නයට මම පිළිතුරක් ලබා දෙන්නම්. නමුත්, මම මේ කාරණය ඔබතුමාගේ අවධානයට යොමු කරනවා. අක්කරෙයිපත්තුව මූලික රෝහලයි, තෙලිප්පලෙයි රෝහලයි, යාපනය ශික්ෂණ රෝහලයි කියන රෝහල් තුන සම්බන්ධව එක ප්‍රශ්නයක් අහලා තිබෙන්නේ. සාමාන්‍යයෙන් ස්ථාවර නියෝග 27 (2) යටතේ ප්‍රශ්න ඉදිරිපත් කරන කොට මේ තරම් පරාසයකින් ප්‍රශ්න ඉදිරිපත් කරන්නේ

[ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා]

නැහැ. මම අද මේ ප්‍රශ්නයට උත්තර දෙන්නම්. හැබැයි, මේක පූර්වාදර්ශයක් වුණොත් අපට ඉදිරියේදී කාලය කළමනාකරණය කර ගන්න බැරි වේවි.

A 1. අක්කරෙයිපත්තුව මූලික රෝහලේ දැනට සේවය කරන වෛද්‍ය අධිකාරි වෛද්‍ය අයි.එම්. ජවාහිර්.

2. ඔහුට පත්වීම් දෙනු ලැබුවේ 2024.06.03වන දින. ඒක රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය සහිතව ලබා දුන් පත්වීමක්.

3. මේ වෛද්‍ය අධිකාරිවරයා සම්බන්ධයෙන් ලැබුණු පැමිණිලි ගැන පරීක්ෂණ ආරම්භ කර තිබෙනවාද කියා අසා තිබෙනවා. ඔව්. විධිමත් විනය පරීක්ෂණ සිදු කර ඇති අතර අවවාද කර සමහර ගොනු අවසන් කරලා තිබෙනවා. මූලික විමර්ශන තුනක් සිදු කරලා තිබෙනවා. පරීක්ෂණ දෙකක මූලික විමර්ශන වාර්තා සෞඛ්‍ය ලේකම් වෙත අනුමැතිය සඳහා ඉදිරිපත් කරලා තිබෙනවා. එක් මූලික විමර්ශනයක් මේ වනවිටත් පැවැත්වෙනවා.

4. ඒ පරීක්ෂණ ගැන අසා තිබෙනවා. මම ඒ ගැනත් කෙටියෙන් සඳහන් කරන්නම්. මොකද, මේ සමස්ත වැඩ වර්ජනයට හේතු වෙලා තිබෙන්නේ මේ වෛද්‍ය අධිකාරිවරයාට එරෙහිව යම් යම් පාර්ශ්ව විසින් විටින් විට එල්ල කරන චෝදනා සහ පැමිණිලි.

2021දී අයි.එම්. ජවාහිර් මහතා වෛද්‍ය අධිකාරි ලෙස අක්කරෙයිපත්තුව මූලික රෝහලේ රාජකාරි සිදු කරමින් සිටියදී එම රෝහලේ සේවය කළ වෛද්‍ය එම්.එම්. තාසීම් මහතාට සේවය හැර යෑමේ නිවේදන නිකුත් නොකිරීම සම්බන්ධයෙන් 2021.12.27 දින නිදහසට කරුණු විමසලා තිබෙනවා. ඒ සම්බන්ධයෙන් පරීක්ෂණයක් කරලා 2022.07.12 දිනැතිව අවවාද කරලා තිබෙනවා. ගොනුව නිම කරලා තිබෙන්නේ.

ඊළඟ පැමිණිල්ල අයි.එම්. ජවාහිර් මහතා වෛද්‍ය අධිකාරි ලෙස අක්කරෙයිපත්තුව මූලික රෝහලේ රාජකාරි සිදු කරමින් සිටියදී එම රෝහලේ සේවය කළ වෛද්‍ය එස්.එල්. සැමෝන් මහතාට 2018.09.15 දින සේවයට වාර්තා කර තිබියදී එදින ඔහුගේ වැටුප් රහිත දිනයක් සේ සලකා කටයුතු කිරීම සම්බන්ධයෙන් 2023.11.17 දිනැතිව නිදහසට කරුණු විමසලා තිබෙනවා. සිදුවීම වෙලා අවුරුදු පහකට පස්සේ තමයි අහලා තිබෙන්නේ. ඒකත් විමර්ශනය කරලා 2024.01.21 අවවාද කරලා තිබෙනවා. ගොනුව නිම කරලා තිබෙන්නේ.

ඊළඟට, අයි.එම්. ජවාහිර් මහතා වෛද්‍ය අධිකාරි ලෙස අක්කරෙයිපත්තුව මූලික රෝහලේ රාජකාරි කරමින් සිටියදී අලුත් රාජකාරි දින පොත් ලබා ගැනීමෙන් පසු මීට පෙර භාවිත කළ අංක 01 සහ 02 දරන දින සටහන් රාජකාරි දින පොත් විෂය භාර සංවර්ධන නිලධාරි එම්.අයි.එම්. සියාද් මහතා වෙත ඉදිරිපත් නොකිරීම සම්බන්ධව 2022.09.02 දිනැතිව නිදහසට කරුණු විමසලා තිබෙනවා. ඒ සම්බන්ධයෙන් 2023.01.04 දිනැතිව අවවාද කරලා ගොනුව නිම කරලා තිබෙනවා. මේවා තමයි දැනට අවසන් කරලා තිබෙන්නේ. ඊට අමතරව අලුත් විමර්ශන තුනක් ක්‍රියාත්මක වෙනවා. ඒවා මෙසේයි.

I. අක්කරෙයිපත්තුව මූලික රෝහලේ ව්‍යාපෘතිවල මූල්‍ය වංචාවක් හා අක්‍රමිකතාවක් සිදු වූ බවට සඳහන් කරමින් සමහර පාර්ශ්ව පැමිණිලි කරලා තිබෙනවා. ඒ සඳහා අංක MH/FS/PI/32/2021/B-233/426 යටතේ මූලික විමර්ශනයක් සිදු කර සෞඛ්‍ය ලේකම්ගේ අනුමැතියට ඉදිරිපත් කරලා තිබෙනවා.

II. අක්කරෙයිපත්තුව මූලික රෝහලේදී තම පියාට ප්‍රතිකාර කර ගැනීමට පැමිණි අවස්ථාවේ ප්‍රමාදයක් සිදු වූ බවටත්, ඒ සඳහා රෝහල් වෛද්‍ය අධිකාරීගේ උපදෙස් හේතු වූ බවටත් වෛද්‍ය එම්.ඒ. සුහයිල් අහමඩ් මහතා විසින් සිදු කළ පැමිණිල්ල යටතේ මූලික විමර්ශනයක් සිදු කර සෞඛ්‍ය ලේකම්ගේ අනුමැතියට ඉදිරිපත් කරලා තිබෙනවා.

III. අක්කරෙයිපත්තුව මූලික රෝහලේ කාර්ය මණ්ඩලය 2025.05.21 දින මාධ්‍ය සාකච්ඡාවක් නීති විරෝධීව පවත්වා වෛද්‍ය එම්.ඒ. සුහයිල් අහමඩ් මහතාට -මම කළින් සඳහන් කරපු වෛද්‍යවරයා- අසත්‍ය හා පදනම් විරහිත චෝදනා එල්ල කරන ලද බව හා ඊට රෝහල් පරිශ්‍රය යොදා ගැනීම නීති විරෝධී බවට පැමිණිල්ලක් ඉදිරිපත් වෙලා තිබෙනවා. ඒ සඳහාත් මූලික විමර්ශනයක් සිදු කරමින් පවතිනවා.

5. රජයේ වෛද්‍ය නිලධාරින්ගේ සංගමය ආරම්භ කර තිබෙන වැඩ වර්ජනයේ ඉල්ලීම මොකක්ද කියා අසා තිබෙනවා. දැනට අක්කරෙයිපත්තුව මූලික රෝහලේ වෛද්‍ය අධිකාරි ලෙස කටයුතු කරන වෛද්‍ය අයි.එම්. ජවාහිර් මහතා තනතුරෙන් ඉවත් කරන්න කියන එක තමයි තිබෙන්නේ.

6. එම ඉල්ලීම සාධාරණද කියා අසා තිබෙනවා. ඇත්තටම ගරු කථානායකතුමනි, අපි දැන් විමර්ශන කටයුතු කරගෙන යනවා. මේ පත්වීම ලබා දීලා තිබෙන්නේ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය සහිතව. විමර්ශනවලින් ඔහු වැරැදිකරුවෙක් බවට පත් වුණොත් අමාත්‍යාංශයට තීන්දු ගන්න පුළුවන්. නමුත්, එතෙක් -විමර්ශන පවතින කාලය තුළදී- අමාත්‍යාංශයට ඔහු සම්බන්ධයෙන් තීන්දුවක් ගන්න හැකියාවක් නැහැ. මොකද, ඊට පස්සේ මේ අමාත්‍යාංශයේ තීන්දුව ගත් නිලධාරින්ට විරුද්ධව අධිකරණ ක්‍රියාමාර්ගවලට යනවා. එම නිසා අපි මේ සම්බන්ධයෙන් කටයුතු කරමින් ඉන්නවා. සමහර විමර්ශන ගොනු මීට අවුරුදු ගණනාවකට කලින් වසා දමා තිබෙනවා, ඔහුට අවවාද කරලා. ඇත්තටම නැඟෙනහිර පළාතේ ඒ ජනතාව පීඩාවට පත් කරමින් මේ වෛද්‍ය අධිකාරිවරයා ඉවත් කිරීමට කරන වැඩ වර්ජනය අසාධාරණයි කියන එක තමයි මට කියන්න තිබෙන්නේ.

B. 1. මේ යටතේ අසා තිබෙන්නේ තෙලිප්පලෙයි වෛද්‍ය අධිකාරිවරයා සම්බන්ධව. ඔහුට එරෙහිව විනය පරීක්ෂණයක් පැවැත්වෙනවාද කියා අසා තිබෙනවා. ඔව්. එවැන්නක් සිදු වෙමින් පවතිනවා.

2. පැමිණිල්ලක් ලැබී තිබෙනවාද කියා අසා තිබෙනවා; ඔව්.

3. විමර්ශන ක්‍රියාත්මක වේ.

4. තොරතුරු සොයා බැලීමේ කමිටුවක් ආණ්ඩුකාරතුමා විසින් පත් කර ඇත. එම කමිටුවේ නිර්දේශ මත අදාළ ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම් වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව වාර්තා කර ඇත.

5. අමාත්‍යාංශයේ හදිසි වැටලීම් අංශය මඟින්ද මූලික විමර්ශනයක් ආරම්භ කර ඇත.

6. පෞද්ගලික ගිණුමකට මුදල් ආධාර එක්රැස් කර ඇති බවට වන පැමිණිලි අනුව විමර්ශන සිදු කරමින් පවතී.

විමර්ශන කටයුතු අවසානයේදී ඒ සම්බන්ධයෙන් අදාළ ක්‍රියාමාර්ග ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව සිදු කළ හැක.

C. 1. මේ යටතේ අසා තිබෙනවා, යාපනය ශික්ෂණ රෝහලේ CT scan යන්ත්‍ර දෙකක් පිළිබඳව.

මෙම රෝහලේ CT scan යන්ත්‍ර දෙකක් පවතින අතර, එම යන්ත්‍ර දෙකම 2025.12.30 දින දක්වා ක්‍රියාත්මක තත්ත්වයේ පැවතුණා. එක් යන්ත්‍රයක් 2025.12.31 දිනත්, අනෙක් යන්ත්‍රය 2026 ජනවාරි 9වැනිදාත් අක්‍රිය වුණා. ඊයේ උදෑසන ඉඳලා එක් යන්ත්‍රයක් ක්‍රියාත්මක තත්ත්වයේ පවතිනවා.

2. රෝහල් අධ්‍යක්ෂක ඇතුළු කාර්ය මණ්ඩලය අදාළ සේවා සපයන සමාගම දැනුවත් කර නැවත එම යන්ත්‍ර ක්‍රියාත්මක තත්ත්වයට පත් කිරීමට අවශ්‍ය පියවර ගනිමින් සිටී.

3. මෙම කාල සීමාව තුළ රෝගී ජීවිත ආරක්ෂා කර ගැනීම සඳහා රෝගීන් තිදෙනෙකු වෙනත් රෝහල් වෙත යොමු කර තිබෙනවා.

4. දුරස්ථ රජයේ රෝහලකට රෝගීන් යොමු කිරීමෙන් ඇති වන ජීවිත අවදානම වළක්වා ගැනීම සඳහා ආසන්න පෞද්ගලික රෝහල් වෙත රෝගීන් යොමු කර තිබෙනවා.

ගරු කථානායකතුමනි, ඔබතුමාත් දන්නවා, සාමාන්‍යයෙන් මෙවැනි CT, MRI ඇතුළු මැෂින් හදිසියේ ක්‍රියා විරහිත වුණොත් අපට තිබෙන service agreement එක අනුව අදාළ පෞද්ගලික සමාගමෙන් තමයි ඒවායේ නඩත්තු කටයුතු කර ගන්න වෙන්නේ කියන එක. සමහර විට ඒ සඳහා යම් කාලයක් ගතවෙනවා. නමුත්, අපේ වෛද්‍ය පරිපාලනය පුළුවන් තරම් එය ක්‍රියාත්මක කරවීම සඳහා කටයුතු කරනවා, ගරු මන්ත්‍රීතුමනි. ඒ අතරේදී අපි එම රෝගීන් වෙනත් රෝහල්වලින් පහසුකම ලබා ගන්න පුළුවන් නම් ඔවුන් transfer කරනවා. හැබැයි, සමහර අවස්ථා තිබෙනවා, CT සහ MRI යන්ත්‍ර තිබෙන රෝහල් තිබෙන්නේ ගොඩක් දුරින්. එම නිසා පහසුකම් තිබෙනවා නම්, රෝගීන්ගේ හදිසි තත්ත්වය සලකා බලා, ඒ වාගේම රෝගීන්ගේ ජීවිතවල අවදානම ගැන සලකා බලා පෞද්ගලික අංශයෙන් එම පරීක්ෂණ කර ගන්නවා. රජය මඟින් ගෙවීම් කරනවා. එහෙම තමයි සමහර තැන්වල මේ කටයුතු කරගෙන යන්නේ.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)

கௌரவ சபாநாயகர் அவர்களே! GMOA என்று சொல்லப்படுவது எங்களுடைய நாட்டுக்கு இருக்கின்ற பெரியதொரு சாபம். கடந்த அரசாங்கக் காலமாக இருக்கலாம், இந்த அரசாங்கக் காலமாக இருக்கலாம், GMOA எப்போதுமே எங்களுடைய மக்களுக்கு எதிரான நடவடிக்கைகளைத்தான் எடுத்திருக்கின்றது. இப்போது பார்த்தீர்கள் என்றால், கிழக்கு மாகாணம் முழுவதுமுள்ள சகல அரச வைத்தியசாலைகளிலும் OPD strike செய்திருக்கின்றது. வைத்தியர் ஐ.எம். ஜவாஹிரு என்பவர் அக்கரைப்பற்று ஆதார வைத்தியசாலையின் MS. அந்த ஒரு MSக்கு எதிராக முறைப்பாட்டைச் செய்துவிட்டு, கிழக்கு மாகாணம் முழுவதுமுள்ள அரச வைத்தியசாலைகளில் OPD இயங்காமற் செய்வது ஒரு மனித உரிமை மீறல் இல்லையா? நீங்களும் ஒரு MSஆக இருந்தீர்கள்; உங்களுக்கும் இந்த விடயம் வடிவாக விளங்கும். 159 பாராளுமன்ற உறுப்பினர்களைக் கொண்டிருக்கின்ற நீங்கள் இந்தச் சுகாதாரத் துறையை அத்தியாவசிய சேவைக்குள் உள்ளடக்க முடியுமா? என்று கேட்கின்றேன். ஏனென்றால், எந்தவொரு நாட்டிலும் சுகாதாரத் துறை strike செய்வதில்லை. இலங்கையில் மட்டும்தான் strike செய்கின்றார்கள். இந்தத் தனிப்பட்ட மனித உரிமை மீறலை இவர்கள் செய்ய முடியுமா? இது தொடர்பாகச் சட்ட நடவடிக்கை எடுக்க முடியுமா? සුකාතාරත් තුරෛයෛ අත්‍යවශ්‍ය සේවාවක් ලෙස ඇතුළත් කරන්න පුළුවන්ද කියලා මම අහනවා.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු මන්ත්‍රීතුමනි, ඇත්තටම මේවා සම්බන්ධයෙන් නීති රීතිවලින්ම නොවෙයි, හදිසි නීති යටතේත් නොවෙයි අප කටයුතු කළ යුතු වන්නේ; ඉතාම මානුෂීය පදනමින් තමයි කටයුතු කළ යුතු වන්නේ. විශේෂයෙන්ම සෞඛ්‍ය සේවය අත්‍යවශ්‍යයි. එම නිසා ඒ කඩා බිඳ දැමීම් කවර ආකාරයෙන් සිදු වුණත් ඒක ජනතාවට බලපානවා. විශේෂයෙන් නැඟෙනහිර පළාතේ මානව සම්පතේ ලොකු හිඟයක් අපට තිබෙනවා. අපි භෞතික සම්පත් සපයමින් ඉන්නවා. නමුත්, ඒවා ක්‍රමානුකූලව තමයි සපයන්න වෙන්නේ. එවැනි තත්ත්වයකදී ඒ ජනතාවට විකල්ප නැහැ. එම නිසා ඒ ජනතාවට ඒ රජයේ රෝහලෙන්ම තමයි ප්‍රතිකාර ගන්නට වෙන්නේ. එවැනි තත්ත්වයකදී අඛණ්ඩ වැඩ වර්ජනයක් කිරීමෙන් ජනතාව පීඩාවට ලක් වෙනවා.

අනෙක් එක තමයි, එතැන තිබෙන්නේ එක් රජයේ වෛද්‍ය අධිකාරිවරයෙකු ඉවත් කිරීම නිසා යම් වෘත්තීය සංගමයක් විසින් කරනු ලබන වැඩ වර්ජනයක්. වෘත්තීය සමිතියකට හෝ යම් පුද්ගල කණ්ඩායමකට හෝ පුද්ගලයෙකුට හෝ පැමිණිලි ඉදිරිපත් කරන්න පුළුවන්. ඒවා විමර්ශනය කරලා ඒ විමර්ශන වාර්තා අනුව තමයි අමාත්‍යාංශයට තීන්දු ගන්න වෙන්නේ. එහෙම නැතිව බලපෑමක් කරන්න පුළුවන් කණ්ඩායමක් හෝ කෙනෙකු යම් පැමිණිල්ලක් ඉදිරිපත් කළ පමණින් ඒ රජයේ නිලධාරින් ඉවත් කළොත් ඒකෙන් ඒ අයට අසාධාරණයක් වෙනවාද කියලා බලන්නට ඕනෑ. අනෙක් එක, එහෙම කිච්චාටම කරන්න බැහැ. ඒ නිසා ඒ කණ්ඩායමට මම කියනවා ඉතාම සාධාරණව මේ දිහා බලන්න කියලා. රෝගීන් ඇපයට තබා ගන්නේ නැතිව මේ විමර්ශනවලට ඉඩ දෙන්න. අපි හැකි ඉක්මනින් විමර්ශන කටයුතු කරනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රධාන වැඩකටයුතු ආරම්භයේදී යෝජනා,

## පාර්ලිමේන්තුවේ රැස්වීම්
## பாராளுமன்ற அமர்வு
## SITTINGS OF THE PARLIAMENT

*මතු පළ වන යෝජනාව න්‍යාය පත්‍රයෙහි තිබිණ:*
*ஒழுங்குப் பத்திரத்தில் பின்வரும் பிரேரணை இருந்தது:*
*The following Motion stood on the Order Paper:*

"පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණ ද, අද දින රැස්වීම් පැවැත්වෙන කාල වේලාව පූ.භා. 9.30 සිට අ.භා. 12.30 දක්වා ද, අ.භා. 1.00 සිට අ.භා. 5.30 දක්වා ද විය යුතු ය. පූ.භා. 11.30ට පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8(5) ක්‍රියාත්මක විය යුතු ය. අ.භා. 5.30ට කථානායකවරයා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය."

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, ඉහත යෝජනාවේ සඳහන් "පූ.භා. 11.30" යන්න "පූ.භා. 10.40" වශයෙන් සංශෝධනය විය යුතුයි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ඔබතුමන්ලාට විනාඩි 45ක් වැඩිපුර ලැබිලා තිබෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රධාන වැඩ කටයුතු.

න්‍යාය පත්‍රයේ විෂය අංක 1, ඉදිරිපත් කිරීම, ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමා.

## දිට්වා සුළි කුණාටුවට මුහුණ දීම සඳහා පූර්ව සූදානමක් නොමැති වීම සම්බන්ධයෙන් පූර්ණ අධ්‍යයනයක් සිදු කර වාර්තා කිරීමටත්, ඒ පිළිබඳව සිය යෝජනා සහ නිර්දේශ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමටත් වන විශේෂ කාරක සභාව

## தித்வா புயலை எதிர்கொள்வதற்காக முன்னாயத்தத்துடன் இருக்கவில்லை என்பது தொடர்பில் முழுமையாக ஆராய்ந்து அறிக்கையிடுவதற்கும், அது தொடர்பிலான முன்மொழிவுகளையும் விதப்புரைகளையும் பாராளுமன்றத்துக்குச் சமர்ப்பிப்பதற்குமான தெரிகுழு

## SELECT COMMITTEE TO CONDUCT A COMPREHENSIVE STUDY ON THE LACK OF PREPAREDNESS TO FACE CYCLONE DITWAH AND REPORT TO PARLIAMENT AND SUBMIT ITS PROPOSALS AND RECOMMENDATIONS IN THAT REGARD

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
ගරු කථානායකතුමනි, විපක්ෂයේ ගරු මන්ත්‍රීවරුන් ඉල්ලා සිටි, පහත සඳහන් යෝජනාව මා ඉදිරිපත් කරනවා:

"ගරු සජිත් ප්‍රේමදාස මහතා
ගරු නීතිඥ අනුරාධ ජයරත්න මහතා
ගරු මුජිබුර් රහුමාන් මහතා
ගරු දිලිත් ජයවීර මහතා
ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය
ගරු සුරංග රත්නායක මහතා
ගරු චාමර සම්පත් දසනායක මහතා
ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා
ගරු ජේ.සී. අලවතුවල මහතා
ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා
ගරු බී. ආරියවංශ මහතා
ගරු දිලිප් වෙදආරච්චි මහතා
ගරු කිංස් නෙල්සන් මහතා
ගරු කේ. කාදර් මස්තාන් මහතා
ගරු එස්.එම්. මරික්කාර් මහතා
ගරු (ආචාර්ය) වී.එස්. රාධක්‍රිෂ්ණන් මහතා
ගරු එම්.ඒ.එම්. තාහිර් මහතා
ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා
ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා
ගරු නීතිඥ චමින්ද්‍රාණි කිරිඇල්ල මහත්මිය
ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා
ගරු ජගත් විතාන මහතා
ගරු ඩබ්ලිව්.එච්.එම්. ධර්මසේන මහතා
ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා
ගරු ඉම්රාන් මහරුෆ් මහතා
ගරු හෙක්ටර් අප්පුහාමි මහතා
ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා
ගරු හර්ෂණ රාජකරුණා මහතා

ගරු ගයන්ත කරුණාතිලක මහතා,- දිට්වා සුළි කුණාටුවට මුහුණ දීම සඳහා පූර්ව සූදානමක් නොමැති වීම සම්බන්ධයෙන් පූර්ණ අධ්‍යයනයක් සිදු කර වාර්තා කිරීමටත්, ඒ පිළිබඳව සිය යෝජනා සහ නිර්දේශ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමටත් වන පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව,- ශ්‍රී ලංකා ඉතිහාසයේ දරුණුම ඛේදවාචකය ලෙස සැලකෙන දිට්වා සුළි කුණාටුවෙන් සිදු වූ ජීවිත හානි, දේපළ හානි හා ජනතාවට සිදුව ඇති හානි මේ දක්වා තක්සේරු කර නොමැති හෙයින්ද;

මෑත කාලීනව මෙවන් ව්‍යසන දෙකක් එනම්, පාස්කු ඉරුදින ප්‍රහාරය සහ ආර්ථික අර්බුදය ඇති වූ අවස්ථාවලදී ද පාර්ලිමේන්තු විශේෂ කාරක සභා පත් කිරීමට කටයුතු කරන ලද හෙයින්ද;

මේ දක්වා සිදුව ඇති ආපදා අතුරින් මෙම ආපදාව සුවිශේෂ යැයි විශ්වාස කරන හෙයින්ද;

මෙම අතිශය ඛේදනීය තත්ත්වය සම්බන්ධයෙන් කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව හා විදෙස් මාධ්‍ය විටින් විට අනතුරු අඟවා පුරෝකථන සිදු කර තිබූ බව මේ වනවිට පාර්ලිමේන්තුවේදී අනාවරණය වී ඇති හෙයින්ද;

මෙම තත්ත්වයට මුහුණ දීම සඳහා අදාළ පාර්ශ්වයන් පූර්ව සූදානමකින් සිටියේ නම්, සිදුව ඇති හානිය සැලකිය යුතු ප්‍රමාණයකින් වළක්වා ගැනීමට හැකියාව තිබූ හෙයින්;

දිට්වා සුළි කුණාටුවට මුහුණ දීම සඳහා පූර්ව සූදානමක් නොමැති වීම සම්බන්ධයෙන් පූර්ණ අධ්‍යයනයක් සිදු කර වාර්තා කිරීමටත්, ඒ පිළිබඳව සිය යෝජනා සහ නිර්දේශ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමටත් වන පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවක් පත් කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කර සිටියි.

2. (අ) කථානායකවරයා විසින් කාරක සභාවෙහි සභාපතිවරයා සහ සාමාජික මන්ත්‍රීවරයන් නම් කළ යුතු ය; සහ

(ආ) පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 101 හි විධිවිධාන ප්‍රකාරව කාරක සභාව සාමාජික මන්ත්‍රීවරයන් දොළොස් දෙනෙකුට (12) නොවැඩි විය යුතු ය.

3. එම කාරක සභාවට -

(අ) සිය ගණපූරණය නියම කර ගැනීමට ද;

(ආ) ඉහත සඳහන් කරුණු සම්බන්ධයෙන් පුළුල් අධ්‍යයනයක් සිදු කිරීම සඳහා කාරක සභාව විසින් අවශ්‍ය යැයි තීරණය කරනු ලබන පරිදි, ඕනෑම තැනැත්තෙකු එම කාරක සභාව ඉදිරියට කැඳවීමට ද, ඕනෑම ලියවිල්ලක් හෝ වාර්තාවක් ලබා දෙන ලෙසට ඕනෑම තැනැත්තෙකුට නියම කිරීමට ද, එකී සියලු සාක්ෂි ලිඛිතව හෝ වාචිකව, ලබා ගැනීමට ද;

(ඇ) කාරක සභාවේ සහාය පිණිස අදාළ ක්ෂේත්‍රයන්හි විශේෂඥ දැනුමක් ඇති පුද්ගලයන්ගේ සහ ප්‍රවීණයන්ගේ සේවය ලබා ගැනීමට ද; සහ

(ඈ) කලින් කල අන්තර්වාර වාර්තා ඉදිරිපත් කිරීමට ද පාර්ලිමේන්තුව කල් තබනු ලැබ හෝ වාරාවසාන කරනු ලැබ තිබුණ ද රැස්වීම් පවත්වාගෙන යාමට ද,

බලය තිබිය යුතු ය.

4. කාරක සභාවේ වාර්තාව එහි පළමු රැස්වීමේ දින සිට මාස තුනක (03) කාලයක් හෝ පාර්ලිමේන්තුව විසින් දීර්ඝ කරනු ලබන එවැනි කාල පරිච්ඡේදයක් ඇතුළත දී පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු ය."

**ගරු දිලිප් වෙදආරච්චි මහතා**
(மாண்புமிகு திலிப் வெதஆரச்சி)
(The Hon. Dilip Wedaarachchi)

***විසින් ස්ථිර කරන ලදී.***
*ஆமோதித்தார்.*
*Seconded.*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## කල්තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

**ගරු බිමල් රත්නායක මහතා (ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க - போக்குவரத்து, நெடுஞ்சாலைகள் மற்றும் நகர அபிவிருத்தி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Bimal Rathnayake - Minister of Transport, Highways and Urban Development and the Leader of the House of Parliament)

ගරු කථානායකතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව, ගරු රෝහිණී කුමාරි විජේරත්න මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි 12ක කාලයක් තිබෙනවා.

## "දිට්වා" සුළි කුණාටුවෙන් පසු රටේ තත්ත්වය
## "தித்வா" புயலுக்குப் பின்னரான நாட்டின் நிலைமை
## POST-CYCLONE "DITWAH" SITUATION IN THE COUNTRY

[පූ.භා. 10.41]

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)

ගරු කථානායකතුමනි, අද දින සභාව කල් තබන අවස්ථාවේ මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"'දිට්වා' සුළි කුණාටුව නිසා රට තුළ සිදු වූ ව්‍යසනය අතිමහත්ය. සුළි කුණාටුව පිළිබඳව පුරෝකථනය කළ කාලගුණ අනාවැකි පිළිබඳව දැක් වූ අඩු සැලකිල්ල හෝ නොසලකා හැරීම තුළ සිදු වූ ජීවිත හානි, දේපළ හානි පිළිබඳව වූ වගකීමෙන් ආණ්ඩුවට මිදීමට නොහැකි අතර සිදු වූ ව්‍යසනය පිළිබඳව ව්‍යසනයට පෙර ව්‍යසනය සිදු වූ මොහොත සහ පශ්චාත් ව්‍යසන කළමනාකරණය පිළිබඳ මේ මොහොත වන විට පැහැදිලි දත්ත හෝ වැඩ පිළිවෙළක් ඉදිරිපත් කිරීමට රජය අපොහොසත් වී ඇත.

පශ්චාත් ව්‍යසන යළි ගොඩනැඟීම යනු, හානි වූ වටිනාකම්වල යළි පිහිටුවීමයි. සිදු වූ ජීවිත හානි හැර අනෙකුත් වටිනාකම් යළි පිහිටුවීම ආණ්ඩුවේ වගකීමයි. හානි වූ දේපළ සහ ජීවිතවලට වන්දි ගෙවීම, නැවත පදිංචියට තාවකාලික හා ස්ථිර යෝග්‍ය ප්‍රදේශ හඳුනා ගැනීම, ජන ජීවිත යථා තත්ත්වයට පත් කිරීම, විකල්ප ප්‍රදේශවල යටිතල පහසුකම් ගොඩනැඟීම, නැවත පදිංචි කළ හෝ පදිංචි කිරීමට යෝජිත පෙදෙස්වලට අවශ්‍ය සන්නිවේදන හා අනෙකුත් සමාජ සම්බන්ධතා ලබා දීම, එමෙන්ම ජෛව විද්‍යාත්මක රෝගාබාධ මැඩ පැවැත්වීමට අවශ්‍ය පියවර ගැනීම, පශ්චාත් මානසික ආපදා පිළිබඳ විධිමත් වැඩ පිළිවෙළක් සැකසීම වැනි ක්ෂේත්‍ර පිළිබඳව ආණ්ඩුව විද්‍යාත්මක ප්‍රවේශයකින් කටයුතු කරන බව දක්නට නොලැබේ.

පශ්චාත් ආපදා කළමනාකරණය ආණ්ඩුවේ ව්‍යාපෘතියක් බවට පත් කර ගනිමින් සහන සැලසීම පිළිබඳ සියලු කටයුතු මාධ්‍ය සන්දර්ශන බවට පත් වී ඇති බව දක්නට ලැබේ. ආපදා තත්ත්වය හේතුවෙන් හානි වූ නිවාස හා නාය යාමේ අවදානමට ලක්ව ඇති නිවාස සම්බන්ධයෙන් වන්දි මුදල් ලබා දීමේදී ප්‍රාදේශීය ලේකම්වරු ගැටලු රැසකට මුහුණ දී ඇති බවත්, වන්දි මුදල් ලබා දීමේදී අනුගමනය කළ යුතු මාර්ගෝපදේශ මොනවාදැයි එක් එක් හානිවලදී ලබා දිය යුතු වන්දි මුදල් ගෙව්වාද යන්න සඳහන් කර මාර්ගෝපදේශ නිකුත් කරන ලෙසත්, ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ සහ සහකාර ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ සංගමය ලිඛිත දැනුම්දීමක් සිදු කොට ඇත. අවදානම් කලාප පිළිබඳ වාචික උපදෙස් මිස ලිඛිතව උපදෙස් ලබා දීමට ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය කටයුතු නොකිරීමද බරපතළ තත්ත්වයකි. ආපදා තත්ත්වය නිසා අවතැන් වූ කඳවුරුවල රැඳී සිටින පුද්ගලයන් සම්බන්ධයෙන් කිසිදු මාර්ගෝපදේශයක් නිකුත් කර නොමැති බව එක්සත් ග්‍රාම නිලධාරින්ගේ සංගමය අවධාරණය කොට ඇත. අවතැන් කඳවුරුවල රැඳී සිටින පිරිස් නිසි පාරිසරික ඇගයීමක් හෝ මග පෙන්වීමක් නොමැති නාය ගිය පෙදෙස්වලම යළි පදිංචි කරවීමට දරන උත්සාහයක් ද වාර්තා වේ. මධ්‍යම, ඌව සහ සබරගමුව පළාත්වලට අලාභ හානි වූ දේපළ, මාර්ග හා පාලම් නැවත ප්‍රතිසංස්කරණය කිරීම බරපතළ ගැටලුවක් වී තිබේ.

එබැවින් විධිමත් ආපදා කළමනාකරණය පිළිබඳව නිසි සැලැස්මක් වහාම සකසා ඉදිරිපත් කළ යුතු බවටත්, එම කාර්යයේදී පාර්ලිමේන්තුවේ සියලුම මන්ත්‍රීවරුන්, පළාත් පාලන ආයතනවල සියලුම මහජන නියෝජිතයන් සක්‍රිය ලෙස දායක කරගත යුතු බවටත්, හදිසි ආපදා කළමනාකරණ සැලැස්මක් සැකසීම ජාත්‍යන්තර අධ්‍යයනයන් සහ නිර්ණායකයන් උපයෝගී කොටගෙන වහාම ක්‍රියාත්මක කළ යුතු බවටත් මම මේ සභාවට යෝජනා කරමි."

ගරු කථානායකතුමනි, මට තව මිනිත්තු කීයක් තිබෙනවාද?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ඔබතුමියට තව විනාඩි 8ක් තිබෙනවා.

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
ස්තුතියි.

ගරු කථානායකතුමනි, "දිට්වා" සුළි කුණාටුවෙන් වෙච්ච හානිය පිළිබඳව නිවැරදි දත්ත හඳුනා ගැනීම ඉතා වැදගත් වෙනවා. ඒ දත්ත පදනම් කරගෙන තමයි අපට ඒ අයට සහන සැලසීමට හෝ අනාගතයේදී සිදු විය හැකි ව්‍යසන පිළිබඳව සැලසුම් සකස් කර ගන්නට හැකි වෙන්නේ. හැබැයි තවමත් ඒ දත්ත නිවැරදිව හඳුනා ගත් බවක්වත්, ඒ හඳුනා ගත්ත දත්ත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්නට ආණ්ඩුව කටයුතු කරන බවක්වත් තවමත් අපට පෙනෙන්න නැහැ. ඊයේ හවසත් මම උත්සාහ කළා, මාතලේ දිස්ත්‍රික්කයේ නිවැරදි දත්ත ටික ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලින් ලිඛිතව ඉල්ලා ගන්න. නමුත් කනගාටුවෙන් වුණත් කියන්න ඕනෑ, ඇතැම් ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලින් තවමත් අපට ඒ නිවැරදි දත්ත ලබා ගන්න හැකියාවක් නැති බව. අද වෙනකොට මාසයයි සති තුනකට ආසන්න කාලයක් ගෙවී ගිහිල්ලා තිබෙනවා, අපි ඒ කුණාටුවට මුහුණ දීලා; නොවැම්බර් 27 සිට දෙසැම්බර් 27. අද ජනවාරි 21වන දා.

ඒ කුණාටුවට මුහුණ දීපු මේ රටේ ජනතාව මේ වෙනකොට විශාල වශයෙන් පීඩාවට පත් වෙලා සිටිනවා. අප හමුවේ ඇති දත්ත ජාත්‍යන්තර හා දේශීය මූලාශ්‍ර ආශ්‍රයෙන් සලකා බැලුවොත්, එක්සත් ජාතීන්ගේ සංවිධානය එම ව්‍යසනයෙන් ආපදාවට පත් වූ ජන සංඛ්‍යාව මිලියන 1.5ක් ලෙස පෙන්වා දීලා තිබෙනවා. ජීවිත හානි 474ක් සිදු වෙලා තිබෙනවාය කියලා සඳහන් වෙනවා, මාතලේ දිස්ත්‍රික්කයේ 29ක් ඇතුළත්ව. ඊළඟට, 356දෙනෙක් අතුරුදහන්වූවන් ලෙස වාර්තා වෙනවා. මගේ ආසනයේම 8දෙනෙක් අතුරුදහන් වෙලා තිබෙනවා, නාගල, සියඹලාගහ ළඟ ලැයිමේ 7දෙනායි, ලග්ගල, පල්ලේගම, නාරංගමුව කොටසේ වයස අවුරුදු 30ක් විතර වෙච්ච එක සංවර්ධන නිලධාරිනියකුත් එක්ක. ලංකාව පුරාම 356දෙනෙක් අතුරුදහන් වුණාය කියලා වාර්තා වෙනවා. ආපදා මධ්‍යස්ථාන තුළ 201,875දෙනෙක් හිටපු බව එක්සත් ජාතීන්ගේ වාර්තාවල සඳහන් වෙනවා. ජාත්‍යන්තර කම්කරු සංවිධානය වාර්තා කරන අන්දමට ආපදාවට ලක් වූ ප්‍රදේශවල 300,074ක් පමණ සේවා නියුක්තිකයන් ආපදාවට ලක් වී තිබෙනවා. ඒ නිසා මසකට ඇමෙරිකානු ඩොලර් මිලියන 48ක පමණ ආදායම් අහිමි වීමක් සිදු වන බවත් ILO එක සඳහන් කරනවා. ලෝක බැංකුව වාර්තා කරනවා, මේ ව්‍යසනය නිසා ඇමෙරිකානු ඩොලර් බිලියන 4ක හානියක් ආර්ථිකයට සිද්ධ වෙලා තිබෙනවා කියලා. ඔවුන් සඳහන් කරනවා, ඒක ලංකාවේ දළ ජාතික නිෂ්පාදනයට සාපේක්ෂව සියයට 4ක පමණ අගයක් ගන්නවා කියලා.

දිස්ත්‍රික්ක 25කට බලපාපු මේ ආපදාවෙන් මිලියන 2කට ආසන්න පුද්ගලයන් සංඛ්‍යාවක්, පවුල් ලක්ෂ 5ක් ආපදාවට ලක් වුණා. ජනතාවගේ ජීවන මාර්ග, මහා මාර්ග හා දුම්රිය මාර්ග ඇතුළු අත්‍යවශ්‍ය සේවා, පාලම්, නිවාස, ඉඩම් සහ පශු සම්පත් ක්ෂේත්‍රය ඇතුළු කෘෂිකර්ම ක්ෂේත්‍රය විනාශ වෙලා තිබෙනවා. ආරෝග්‍යශාලාත් විනාශ වෙලා තිබෙනවා. මම හිතන විදියට, වත්තේගම රෝහල සම්පූර්ණයෙන්ම විනාශයට පත් වෙලා තිබෙනවා. ගම්මඩුව ප්‍රාදේශීය රෝහලත් විනාශ වෙලා තිබෙනවා. ව්‍යාපාරික ස්ථානත් විනාශ වෙලා තිබෙනවා. ඒ අනුව ගත්තාම දැවැන්ත හානියක් සිද්ධ වෙලා තිබෙනවා. ලෝක බැංකුව පවසන්නේ සිදු වූ හානිය ඩොලර් බිලියන 4.1කට ආසන්නයි කියලා. ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය නිකුත් කළ වාර්තා අනුවත්, මෙම ජාත්‍යන්තර වාර්තා අනුවත් සිදු වූ හානිය නිවැරදි බව පැහැදිලි වෙලා තිබෙනවා. එක්සත් ජාතීන්ගේ සංවිධානය, ලෝක බැංකුව, ජාත්‍යන්තර කම්කරු සංවිධානය නිකුත් කර තිබෙන වාර්තා පරිශීලනය කරනකොට අපට මෙයට වඩා සවිස්තරාත්මක තොරතුරු දැන ගන්න පුළුවන්.

මෙවැනි ආපදා අවස්ථාවකදී ආණ්ඩුව වගකීම් ඉටු කළාද කියන කාරණය විමසන්න අපට අවස්ථා තුනක් සැලකිල්ලට ගන්න පුළුවන්. පළමු අවස්ථාව තමයි, ආපදාවට පෙර ආණ්ඩුව කොහොමද සූදානම් වුණේ කියන එක. ලැබුණු අනාවැකි, පූරෝකථන පිළිබඳව ආණ්ඩුවේ ක්‍රියාකාරිත්වය ඉතාම දුර්වල තැනක තිබුණාය කියන එක මම මේ වෙලාවේ කියන්න ඕනෑ. විශේෂයෙන්ම ජාත්‍යන්තර කාලගුණ අනාවැකි, කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ අනාවැකි, වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ උපදෙස් කියන ඒ කිසිම දෙයක් ආණ්ඩුව සැලකිල්ලට ගත්තේ නැහැයි කියන එක අද ආණ්ඩුව මොන තර්ක ගෙනාවත් වහන් කරන්න බැහැ.

දෙවැනි අවස්ථාව තමයි, ආපදා අවස්ථාවේදී කොයි විධියටද කටයුතු කළේ කියන එක. ආපදා තත්ත්වයක් තිබියදී රජය නිවාඩු දිනයක් ප්‍රකාශයට පත් කිරීමෙන්ම එය පැහැදිලියි. ඊළඟට, කලා වැවේ පාලම මත වෙච්ච සිද්ධිය. මම ඒවා එකින් එක කියන්න යන්නේ නැහැ. හැබැයි, ඒ අවස්ථාවල ආණ්ඩුව ඒවාට මුහුණ දීපු ආකාරය පිළිබඳව අපට සෑහීමකට පත් වෙන්න බැහැ.

තුන්වන අවස්ථාව තමයි ගරු කථානායකතුමනි, දැන් අපි සැලකිල්ලට ගන්න ඕනෑ. මේ තමයි පශ්චාත් ආපදා කළමනාකරණ අවස්ථාව. ආපදාවෙන් පස්සේ ඒ පීඩාවට පත් වුණු අයට මොන ආකාරයෙන්ද සහන සලසන්නේ කියන අවස්ථාව තමයි දැන් මේ තිබෙන්නේ. මේ කාලය තුළ ආණ්ඩුව ක්‍රියාත්මක වෙලා තිබෙන ආකාරය සමහර තැන්වලදී විහිළු සහගතයි. ඒවා එකින් එක විස්තර කරන්න කාලය මදි. ගරු කථානායකතුමනි, මේ වනකොටත් සමහර ප්‍රදේශවලට යන්න පාරක් නැහැ. උදාහරණයක් ගත්තොත්, මගේ ලග්ගල ආසනයේ, අඹන්ගඟ කෝරලේ, ඇලගල කියන ගමට යන්න මේ වන කල් ප්‍රවේශ මාර්ගයක් නැහැ. මෙය දරුවන්ට පාසල් යෑමේදී ලොකු ගැටලුවක් වෙලා තිබෙනවා. මිනිස්සු රැකියාවට යනකොට ලොකු ප්‍රශ්නයක් වෙලා තිබෙනවා. ඒ වාගේම පීඩාවට ලක් වූ අයට සහන දෙනකොට ලබා දීපු පොරොන්දු පිළිබඳව අද ලොකු කතිකාවක් ඇති වෙලා තිබෙනවා. ජනාධිපතිතුමා මෙතැන ඉඳගෙන කුණාටුවෙන් තහඩුවක් ගියත් රුපියල් ලක්ෂ 10ක් දෙනවා කිව්වා. හැබැයි, අද වෙනකල් තහඩුවක් නොවෙයි ගෙදරම ගියත් කිසිම දෙයක් දෙන්න හැකියාව ලැබිලා නැහැ. ඒ ජනතාවට යන්න තැනක් නැහැ. ඔවුන්ගේ ගෙවල් පිටින් නාය ගිහින් තිබෙනවා. ඔවුන්ට ගෙවල් සොයා ගන්න, ඉඩම් සොයා ගන්න කියලා ආණ්ඩුව කියනවා. එතකොට ඒ අය කොහොමද යන්නේ? කුලියට ගෙයක් ගත්තොත්, රුපියල් 25,000ක් දෙනවා කියනවා. හැබැයි, key money නැතිව කොහෙද ගෙවල් දෙන්නේ? මෙන්න මේ වාගේ ප්‍රායෝගික ගැටලුවලට මේ වෙනකොට අපේ ජනතාව මුහුණ දීලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි. ගෙයකට රුපියල් ලක්ෂ 50ක් දෙනවා කිව්වා, රුපියල් කෝටියක් දෙනවා කිව්වා, මිය ගිය කෙනෙක් වෙනුවෙන් රුපියල් ලක්ෂ 10ක් දෙනවා කිව්වා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමියනි, ඔබතුමියට තවත් අමතර විනාඩි 3ක් සමඟ විනාඩි 5ක කාලයක් තිබෙනවා.

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
ස්තුතියි.

කියන්න කනගාටුයි, මේ ව්‍යසනයේදී මිය ගිය කෙනෙක් වෙනුවෙන් රුපියල් ලක්ෂ 10ක් දෙනවා කිව්වා. හැබැයි, ඒ මිය ගිය අය වෙනුවෙන් රුපියල් ලක්ෂ 10ක මුදල මේ වෙනකල් ලැබිලා නැහැ.

මම හැම දාම කිව්වා, එදා සම්බන්ධීකරණ කමිටුවේදීත් කිව්වා, අපට - විරුද්ධ පක්ෂයේ මන්ත්‍රීවරුන්ට - මොනම ආකාරයකින්වත් මේ ආපදා කළමනාකරණය සම්බන්ධයෙන් දිස්ත්‍රික්කවල සිදුවන කටයුතුවලට සහභාගි වෙන්න අවස්ථාව නැහැ කියලා. ඒ නිසා මේ තිබෙන ගැටලු කියන්න අවස්ථාවක් නැහැ. මම මේ වෙලාවේ කියන්න ඕනෑ, විශේෂයෙන්ම මේ දේශපාලනීකරණය වීම තුළ, ආධාර බෙදා දීමේදී ග්‍රාම නිලධාරින්ගේ, ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ කාර්යභාරයට මේ ආණ්ඩුව විසින් හඳුන්වා දීපු ප්‍රජා ශක්ති දේශපාලන කමිටුවල මැදිහත් වීම නිසා දිගින් දිගටම කරදර සිද්ධ වන බවට වාර්තා වෙන බව. මම දැක්කා පත්තරයේ තිබෙනවා, මාර්ගෝපදේශ හරියට දෙන්න, එතෙක් අයින් වෙනවා කියලා ප්‍රාදේශීය ලේකම්වරු කියනවා. ඊළඟට, රුපියල් ලක්ෂ පහේ වන්දි ගෙවීමෙන් ග්‍රාම නිලධාරින් ඉවත් වෙනවා කියනවා. ඊළඟට කියනවා, අවදානම් කලාප ගැන වාචික මිස ලිඛිත උපදෙස් නැහැයි කියලා. මේ ආණ්ඩුවේ කළමනාකාරිත්වයේ තිබෙන ගැටලු නිසා පීඩාවට පත් වෙන්නේ ගරු කථානායකතුමනි, "දිට්වා" කුණාටුවෙන් බැට කාපු මිනිස්සු. ආණ්ඩුවේ කළමනාකරණය පිළිබඳව තිබෙන ප්‍රශ්න නිසා ඔවුන් බැට කනවා. ඒ අයගේ දේපළ හානි වෙලා තිබෙනවා, තමන්ගේ ඥාති මිත්‍රාදීන් අහිමි වෙලා තිබෙනවා, ඒ පීඩාව විඳගන්න වෙලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි. මේ ආණ්ඩුවේ නිසි කළමනාකාරිත්වයක් නැති නිසාත් අද ඒ ජනතාව පීඩාවට පත් වෙලා තිබෙනවා. මේ අයගේ අවශ්‍ය කටයුතු ක්‍රියාත්මක කරන රජයේ නිලධාරින්ට මේ අනවශ්‍ය බලපෑම් මැද ඒ කටයුතු කරන්න වෙලා තිබෙනවා. ආණ්ඩුවේ ගරු ජනාධිපතිවරයා ප්‍රකාශයට පත් කරන ලද සහන පැකේජ ක්‍රියාත්මක කිරීමේදී මම කියපු විධියට නිසි මාර්ගෝපදේශ නිවැරදිව නිකුත් නොකිරීම නිසා නිලධාරින් බලවත් අපහසුතාවට පත් වෙලා තිබෙනවා.

ඒ වාගේම මම මේ කාරණයත් මතක් කරන්න ඕනෑ, ගරු කථානායකතුමනි. NBRI එක සමහර වාර්තා ඉදිරිපත් කර තිබෙනවා. ඒවා හරිම හාස්‍යජනකයි.

මම එහි තිබෙන එක වගන්තියක් කියන්නම්. පල්ලේගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පුවක්පිටියේ ගෙවල් 13ක් සම්බන්ධයෙන් NBRI වාර්තාවක් තිබෙනවා. එහි වර්ෂාපතනයේ මිලිමීටර් ගණන් සඳහන් කරලා, ඒ ඒ මිලිමීටර් ගාණට වර්ෂාව වැටුණාම ඒගොල්ලන් කරන්න ඕනෑ දේවල් සම්බන්ධයෙන් සඳහන් කරලා තිබෙනවා. එහි කියා තිබෙනවා, "වර්ෂාපතන අගය පැය 24කට මිලිමීටර් 75කට වැඩි නම් විමසිලිමත්ව සිටීමටත්, පැය 24කට මිලිමීටර් 100කට වැඩි නම් අවධානයෙන් සිටීමටත්, පැය 24කට මිලිමීටර් 150ට වැඩි නම් එම ස්ථානයෙන් තාවකාලිකව වෙනත් ආරක්ෂිත ස්ථානයකට යාමත් නිර්දේශ කරනු ලැබේ" යනුවෙන්.

ගරු කථානායකතුමනි, එතකොට මේ මිනිස්සුන්ට වැහි කාලයට වෙන වැඩක් කරන්න වෙන්නේ නැහැ. වර්ෂාමානයක් ගෙනැවිත් තියාගෙන මිලිමීටර් කීයද, මිලිමීටර් කීයද කියලා වතුර මැන මැන ඉන්න වෙනවා. එතකොට, මේ මිනිස්සුන්ට යන්න තැනක් නම් කරලා තිබෙනවාද? වර්ෂාපතනය මේ කියන මිලිමීටර් ප්‍රමාණයට වඩා වැඩි නම්, එහෙම නැත්නම් යම් තැනක් ආපදාවට ලක් වෙනවා නම් ඒ අයට යන්න ආරක්ෂිත ස්ථානයක් නම් කරලා තිබෙනවාද? මෙන්න මේවා තමයි අපි හඳුනා ගත්ත වැරදි. අපි මේවාට ගේන්න ඕනෑ විසඳුම් මොනවාද ? ඊළඟ වැස්සේදී මේ ගෙවල් ටික කඩාගෙන යනකම් බලාගෙන ඉඳලා නැවත වතාවක් වන්දි දෙනවාද, එහෙම නැත්නම් මේ ආපදා කළමනාකරණ වැඩසටහන යටතේ අවදානම් සහිත ප්‍රදේශවල අයට නිසි, ස්ථිර, තිරසාර විසඳුම් දෙනවාද කියන එක පිළිබඳව ආණ්ඩුවේ අවධානය යොමු කරන්න ඕනෑ. මේ තත්ත්වයම තිබෙනවා මාතලේ දිස්ත්‍රික්කයේ රත්තොට අලකොළඹඩ ප්‍රදේශයටත්. ඒ වාගේම ඇල්කඩුව, වටගොඩ, යටවත්ත කියන මේ හැම ප්‍රදේශයකම මෙවැනි අවදානම්වලට ලක් වුණු අය ඉන්නවා. එක තැනක මැද ගෙවල් තුනක් ඉතුරු කරලා වටේම ගෙවල් ටික අයින් කරලා තිබෙනවා. එතකොට මේ ගෙවල් තුන හුදකලා වෙනවා. ඒ වාගේම උඩින් පිපිරිලා තිබෙන නිසා නැවත වතාවක් හානියට ලක් වෙන්නත් පුළුවන්. මෙන්න මේ වාගේ වැරදි තිබෙනවා. ඉහතින් සඳහන් කළ පත්තර වාර්තා ඇතුළුව අනික් තොරතුරු සියල්ල මා **සභාගත*** කරනවා.

මෙන්න මෙවැනි තත්ත්වයක් තිබෙනවා. ඒ නිසා මම මේ ආණ්ඩුවෙන් ඉල්ලීමක් කරනවා. හුදෙක් දේශපාලනික ප්‍රචාර මාධ්‍ය සංදර්ශනවලට සීමා වෙන්නේ නැතිව වහාම පශ්චාත් ආපදා කළමනාකරණ වැඩසටහනක් විධිමත් නොකළොත් මිලියන 105කට වැඩි ජනතාවක් විශාල අර්බුදයකට පත්වීම වළක්වා ගන්නට නොහැකි වෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දැන් කථාව අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමිය.

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
මම අවසන් කරනවා, ගරු කථානායකතුමනි.

මේ ව්‍යසනයෙන් නැති වුණේ ජීවිත 474යි. අද නිසි පියවර ගන්නේ නැතිව, ඉදිරියේදී ඇති වන මෙවැනි ව්‍යසනයකින් මිය යන, හානි වන සියලුදෙනාගේ ජීවිතවලට මේ ආණ්ඩුව වග කියන්න ඕනෑ කියලා මම මේ වෙලාවේ ප්‍රකාශ කරනවා.

මාතලේ, මහනුවර, නුවරඑළිය, බදුල්ල, කෑගල්ල තමයි මේ ව්‍යසනයෙන් විශාලම හානියට ලක් වූ දිස්ත්‍රික්ක හැටියට සලකන්නේ, ගරු කථානායකතුමනි. ඉදිරියේදීත් ඒ ප්‍රදේශවල නාය යාම්, ජල ගැලීම් සිදු වෙන්න පුළුවන් බව NBRI වාර්තා කරලා තිබෙනවා. ඒ වාගේම ඒවා සිතියම්ගත කරලා තිබෙනවා. බිහිසුණු අනාගතයක්, එවැනි තත්ත්වයක් නැවත ඇති වෙනවා කියලා පුරෝකථන තිබෙනවා නම් අපි මේ වෙනකොට නැවත වතාවක් දත්ත එකතු කරන්න ඕනෑ, ඒවාට සූදානම් වෙන්න ඕනෑ කියලා මම යෝජනා කරනවා. ඒ වාගේම ඉහත දිස්ත්‍රික්ක මුල් කරගෙන මධ්‍යම කඳුකරය ඉදිරි වසර 10ක් ආවරණය වන පරිදි "මධ්‍යම කඳුකර සංරක්ෂණ සංවර්ධන වැඩ පිළිවෙළක්" සම්පාදනය කරලා එය ක්‍රියාත්මක කරන්න කියලා මම යෝජනා කරනවා .

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමිය.

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
ඒ තුළින් සෙසු දිස්ත්‍රික්කවල පිටාර ගැලීම් පාලනය කර ගැනීමටත්, ඒ මඟින් වන හානි අවම කර ගන්න පුළුවන් වෙයි. ඒ වාගේම, ඒ සංවර්ධන වැඩසටහන නියාමනය කිරීමට පිළිගත් විද්වත් කණ්ඩායමක් එකතු කර ගන්න කියාත් යෝජනා කරනවා.

අවසාන වශයෙන්, සියලු දේශපාලන පක්ෂ සහ විද්වතුන් එකතු කරගෙන, මේ සියලු දිස්ත්‍රික්කවල ආපදා කළමනාකරණය ගැන නිසි වැඩ පිළිවෙළක් සකස් කරමින්, මේ ආපදාවට පත් වුණු සියලු ජනතාවට සහන සැලසීමට අවශ්‍ය පියවර ගන්නැයි කියලා මා නැවත වතාවක් මේ ගරු සභාවෙන් ඉල්ලා සිටිනවා. ස්තුතියි.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
යෝජනාව ස්ථිර කිරීම, the Hon. Anuradha Jayaratne. You have 12 minutes.

Order, please! Before he starts, the Hon. Deputy Speaker will take the Chair.

*අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [ගරු (වෛද්‍ය) රිස්වි සාලි මහතා] මූලාසනාරූඪ විය.*

*அதன்பிறகு, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ரிஸ்வி சாலி] தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. SPEAKER left the Chair, and DEPUTY SPEAKER [THE HON. (DR.) RIZVIE SALIH] took the Chair.*

[පූ.භා. 10.59]

**ගරු නීතිඥ අනුරාධ ජයරත්න මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அநுராத ஜயரத்ன)
(The Hon. Anuradha Jayaratne, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "දිට්වා" සුළි කුණාටුව හේතුවෙන් රටේ ඇති වුණු ආපදා තත්ත්වය පිළිබඳව සාකච්ඡා කරමින්, ඒකට නිසි වැඩ පිළිවෙළක් සකස් කළ යුතුයි කියලා ගරු රෝහිණී කුමාරි විජේරත්න මන්ත්‍රීතුමිය ගෙන ආ සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව ස්ථිර කරමින්, ඒ සම්බන්ධයෙන් අදහස් කිහිපයක් ප්‍රකාශ කරන්නට මා බලාපොරොත්තු වෙනවා. ඒ සඳහා අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. පළමුවැනි කාරණාව තමයි, මේ පිළිබඳ අවශ්‍ය කරුණු කාරණා සොයන්න, මේ පිළිබඳ වැඩ පිළිවෙළක් හදන්න, ඒ වාගේම ඉදිරියේදී මෙවැනි ප්‍රශ්නයක්, අර්බුදයක් ඇති වුණොත් එවැනි අවස්ථාවක අපි ක්‍රියා කළ යුත්තේ කොහොමද කියන එක පිළිබඳව තොරතුරු එක් රැස් කරලා වාර්තාවක් සකස් කරන්න විශේෂ කාරක සභාවක් පත් කරන්න කියලා අපි ඉල්ලීමක් කළා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම විශේෂ කාරක සභාවට සාමාජිකයින් නම් කරන්න යන විධියෙන් අපිට තේරෙන්නේ, හොරාගේ අම්මාගෙන් පේන අහන විධියේ විශේෂ කාරක සභාවක් පත් කරන්න, කථානායකතුමා අනුමත කරනවා කියලායි. අපි කිසි විධියකින් ඒක අනුමත කරන්නේ නැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒ වෙන මොනවත් නිසා නොවෙයි. එහි සංයුතිය ගත්තාම, විපක්ෂයේ මන්ත්‍රීවරුන් හතරදෙනෙකුත්, ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන් අටදෙනෙකුත් වශයෙන් තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි ඒකට ඉල්ලීම කළේ වෙන මොනවත් නිසා නොවෙයි. සමහර කණ්ඩායම් හිතාගෙන ඇති, මේක එක එක්කෙනාට මඩ ගහන්න, ප්‍රශ්න, අර්බුද ඇති කරන්න ගෙනෙන කාරක සභාවක් කියලා. හැබැයි, අපිට එතැනින් එහා ගිය බලාපොරොත්තුවක් තිබුණා; අවශ්‍යතාවක් තිබුණා. ඒ ප්‍රධාන කාරණා අතර එක පැත්තකින් ගත්තාම, මේකෙන් වැඩිම ප්‍රශ්න, අර්බුදවලට මුහුණ දීපු නගරයක් හැටියට ගම්පොල නගරය හඳුන්වන්න පුළුවන්. අපි දැක්කා, දෙවැනි දවස වෙනකොට Kotmale Dam එක ඉරි ගිහිල්ලා තිබෙනවා කිව්වා. Kotmale Dam එක කඩාගෙන යයි කියලා රෑ මිනිස්සු කලබල වුණා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, හැබැයි එහෙම කියන වෙලාවේදී මිනිස්සු යන්න ඕනෑ තැන පිළිබඳව දැන ගෙන හිටියේ නැහැ. අපි විශේෂ කාරක සභාවක් පත් කරන්න කියලා ඉල්ලුවේ, වෙන මොනවටත් නොවෙයි. කාටවත් මඩ ගහලා, ප්‍රශ්න, අර්බුද ඇති කර ගන්නවා වෙනුවට විපක්ෂයේ මන්ත්‍රීවරුන් හැටියට අපට කරන්න පුළුවන් කාර්යභාරයක් තිබෙනවා. Dam එකක් තිබෙනවා නම්, අපිට නිලධාරින් ගෙන්වලාඒ dam එකේ evacuation plan එක මොකක්ද කියලා අහන්න පුළුවන්. හදිසියක් වෙලා emergency evacuation එකක් තිබෙනවා කිව්වොත්, මිනිස්සු යන්න ඕනෑ කොතැනටද කියලා අහන්න පුළුවන්. හැබැයි, ඒ පිළිබඳව සැලැස්මක් හදන්න විශේෂ කාරක සභාවක් ඉල්ලුවාම, ආණ්ඩුවේ මන්ත්‍රීවරුන් අටදෙනායි, විපක්ෂයේ මන්ත්‍රීවරුන් හතරදෙනායි දාලා, ඒකෙත් පොත වහගන්න හදනවා නම්, අපි මේ කරන්න හදන්නේ මොකක්ද? අනාගතයේ දීත් මේ වාගේ ප්‍රශ්න, අර්බුද එනකොට මේ විධියටම අපි සියලුදෙනා විනාශ වෙලා තමයි නතර වෙන්නේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ නිසා මේ "දිට්වා" සුළි කුණාටුවත් එක්ක අපි ඉගෙන ගත යුතු පාඩම් බොහොමයක් තිබෙනවා. සමහර ආණ්ඩු වෙන්න පුළුවන්, අපි වෙන්න පුළුවන්, අපි සියලුදෙනාගේ කළමනාකරණයෙන් ගිලිහුණු කරුණු කාරණා ගණනාවක් තිබෙනවා. හැබැයි, ඒ ගණනාව හරියට හඳුනා ගෙන, ඒවා නිවැරැදි කරගෙන ඉස්සරහට යන්න ඕනෑ. "දිට්වා" සුළි කුණාටුවෙන් මොන තරම් ආපදා, ප්‍රශ්න ඇති වුණත් ඒවා ආශිර්වාදයක් කර ගන්න පුළුවන් වෙන්නේ, ඒ ක්‍රමයට අපි ක්‍රියාත්මක වුණොත් විතරයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද මේ විශේෂ කාරක සභාව පත් කරන්න යන විධියෙන් සම්පූර්ණයෙන් පෙනෙන්නේ, කාට හරි චෝදනාවක් එනවා නම්, කාට හරි ප්‍රශ්නයක් එනවා නම්, කාට හරි මඩක් එනවා නම්, ඒක වහ ගන්න කරපු ක්‍රියාවක් ලෙසයි. මම ඒක විශේෂයෙන් මේ සභාවේදී කියන්න ඕනෑ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ "දිට්වා" සුළි කුණාටුවෙන් ගම්පොල සහ මහනුවර නගරවලට ඇති වුණු බලපෑම පිළිබඳව මම කියන්නම්. මෙහිදී මම කාරණා කිහිපයක් විතරක් ඔබතුමාගේ අවධානයට යොමු කරනවා. Water Management Secretariat එකේ Director කෙනෙක් ඉන්නවා; ඒ කියන්නේ, ජල කළමනාකරණ ලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂවරයෙක් ඉන්නවා.

ඒ අධ්‍යක්ෂවරයා තමයි, නිලන්ත ධනපාල. ඔහු තමයි එම ක්ෂේත්‍රයේ හිටපු පරිණත, අත්දැකීම් තිබෙන අධ්‍යක්ෂවරයා. ඔහු තාක්ෂණික කමිටුවේත් ප්‍රධානියා හැටියට කටයුතු කළා. හැබැයි මීට මාස කිහිපයකට කලින් නිලන්ත ධනපාලව අයින් කරලා මනෝජ් පෙරේරා කියන එක්කෙනා Head of the Technical Team හැටියට පත් කර තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේක බරපතළ වැරැද්දක්. ලංකාවේ තිබෙන සියලු dams ටිකේ automated gates නැහැ. අපි පෞද්ගලිකව දන්නවා, කොත්මලේ ජලාශයෙන් වතුර ටික ඇරියාම පැය 2.44ට රන්ටැඹෙන් එළියට එනවා කියලා SMS එකක් ගහන බව. එහෙම තමයි සමහර තැන්වල කළමනාකරණය තිබෙන්නේ. අපට මෙතැනට ඇවිල්ලා automated gates ගැන ලොකු කතන්දර කියන්න පුළුවන්. කොත්මලේ වේල්ල අරිනකොට රන්ටැඹේ, රන්දෙණිගල, වික්ටෝරියාවලට SMS එක ගහනවා, මෙච්චර වෙලාවකින් ඔයගොල්ලන් සූදානම් වෙන්න කියලා. ඒ විධියට, කළමනාකරණය පිළිබඳව බරපතළ අත්දැකීම් එක්ක කටයුතු කළ යුතු තැනකට මනෝජ් පෙරේරා කියලා junior officer කෙනෙක් ගෙනැල්ලා දමනවා. ඒක තමයි මේ dams ටික කළමනාකරණය කරගන්න බැරි වෙච්ච ප්‍රධානම හේතුව.

ඒ විතරක් නොවෙයි. සාමාන්‍යයෙන් dam එකක ආපදාවකදී තිබෙනවා, protocol එකක්; dam එකක් කළමනාකරණය කරන්න ඕනෑ විධිය පිළිබඳව වැඩ පිළිවෙළක් තිබෙනවා. සාමාන්‍යයෙන් catchment එකේ පැයට මිලිමීටර් 300ක ධාරිතාවක් එනවා නම්, dam එක අරින්න ඕනෑ; වතුර ටික release කරන්න ඕනෑ. හැබැයි, කිසිම විධියකින් මේ වැඩේ ක්‍රියාත්මක කෙරුණේ නැහැ. සියලුම dams වතුර ටික එකතු කර ගත්තා. අවසානයේ ගේට්ටු 6ක් ඇරලා වතුර ටික යවනකොට dam එකේ වතුර ටික හරි flood level එකට පිරිලා තිබෙන්න ඕනෑ. අමතර වතුර ටික විතරයි අපි ඉවත් කරන්න ඕනෑ. හැබැයි අවසානයේ

කලබල වෙලා දඩිබිඩියේ මේ වතුර ඉවත් කළාට පසුව වාන් දමන level එකෙන් මීටර් 1.5කට වඩා කොත්මලේ අඩු වුණා. සමහර නිලධාරින්ගෙන් අහන්නේ, වැරදිලා හරි සුළි කුණාටුව ආවේ නැත්නම් පහළ ප්‍රදේශවලට වගා කරන්න වතුර දෙන්නේ කොහොමද කියලායි. එහෙම නම් ඒ කට්ටියගෙන් අපි අහනවා, ඔබතුමන්ලාගේ කළමනාකරණයේ තිබෙන ප්‍රශ්නත් එක්ක වේල්ල ඇරලා වතුර ටික ඉවත් කළාම, අර පිරිලා තිබෙන්න ඕනෑ dam එකේ මීටර් 1.5 ක් අඩු වුණේ කොහොමද කියලා. ඒක බරපතළ ප්‍රශ්නයක්. ඒක සම්පූර්ණයෙන්ම කළමනාකරණයේ ගැටලුවක්. ඒ නිසා මේ සම්බන්ධයෙන් පත් කරන විශේෂ කාරක සභාවත් විහිළුවකට, සෙල්ලමකට ගන්න එපා කියන ගෞරවනීය ඉල්ලීම අපි කරනවා.

මම මේ කියන කාරණා කිහිපය ගැන ආණ්ඩු පක්ෂය හැටියට ඔබතුමන්ලා සොයා බලන්න. මේකේ ඉන්නවා, කාර්යභාර ඉංජිනේරුවරු - EICs. ඔවුන් තමයි dam එක පිළිබඳ සියලු වගකීම ගන්නේ. මම නිකමට අහනවා, නුවර ඉන්න, කොත්මලේ ඉන්න ඔය කියන EIC මහත්වරු ටික එදා හිටියේ කොහේද කියලා. ඒ පත් කරපු EIC මහත්වරු ටික වගකීම් ඉටු කළේ කොහේද කියලා මම අහනවා. වාහන සහ සියලු දේවල් පාවිච්චි කරලා, damsවල වගකීම ඉටු කළේ කාට හිතවත් කට්ටිය වෙනුවෙන්ද කියලා ඔබතුමන්ලා පොඩ්ඩක් හොයලා බලන්න. මේවා තමයි කාරක සභා පත් කරලා අපි හොයන්න ඕනෑ දේවල්. එහෙම නැතුව ආණ්ඩුව මේකෙන් මඩ ගහගත්තා, ආණ්ඩුව විනාශයි කියලා එක එක්කෙනාට ආපදා කරගන්න එක නොවෙයි, එක එක්කෙනාට මඩ ගහගහන්න එක නොවෙයි අපි කරන්න ඕනෑ. හැබැයි ඔබතුමන්ලා කරන කටයුතුවලින් මේ සියල්ල යට ගහනවා. සියල්ල යට ගහනවා විතරක් නොවෙයි, නිවැරදි කාරණා ටික සමාජගත කරන්න හම්බ වෙන්නෙත් නැහැ. මෙවැනි ආපදාවක් නැවත ආවොත් ඔබතුමන්ලා ඒක කළමනාකරණය කරගන්න දන්නෙත් නැහැ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ නිසා මෙන්න මේ කියපු කාරණා ටික බරපතළ විධියට අපි සියලුදෙනාම අවධානයට ගන්න ඕනෑ.

අනෙක් පැත්තෙන් ගත්තාම, කොත්මලේ වේල්ලේ විතරක් 170 MCMක් තිබෙනවා, full tank level එක. පසුගිය dryout එකේ ඒක 25 MCMකට අඩු වුණා. සාමාන්‍යයෙන් තත්පරයට ඝන මීටර් 5,500ක් මේ dam එකෙන් එළියට දමන්න පුළුවන්. හැබැයි, 27වන දා රෑ අපි මේ කියන සම්පූර්ණ ආපදාවෙන් ගැටලු ආපු වෙලාවේදීත් උපරිම දැම්මේ තත්පරයට ඝන මීටර් 1,800ක ප්‍රමාණයක්. තත්පරයට ඝන මීටර් 5,500ක වතුර ඉවත් කරන්න පුළුවන් dam එකකින් එළියට දමන්නේ ඝන මීටර් 1,800යි. හැබැයි, පහළ තිබෙන ඔක්කොම ගම්මාන, towns ටික යට වෙලා. මේ කාරණාව එක එක්කෙනා මඩ ගහගෙන අර්බුද, ප්‍රශ්න ඇති කරගන්න ඕනෑ දෙයක් නොවෙයි. හැබැයි, මේ ප්‍රශ්නය ගැන හොයන්න. මේ ප්‍රශ්නය යට ගැහුවා කියන්නේ, හෙට දවසේ මේ රටේ ඇති වෙන ප්‍රශ්නයක් තමයි මේ යට ගහන්නේ. මේ කාරණා ටික සම්බන්ධයෙන් තව විශාල සංඛ්‍යාලේඛන පිළිබඳ තොරතුරු මා ළඟ තිබෙනවා. විනාඩි 12න් මට මේ සියල්ල කියන්න බැහැ. මා ළඟ ඇති තරම් තොරතුරු තිබෙනවා. මොකද, මමත් රාජ්‍ය ඇමතිවරයෙක් හැටියට කටයුතු කළා. ආණ්ඩු පක්ෂයෙන් මම ගෞරවනීය ඉල්ලීමක් කරනවා. මේ කාරණා පිළිබඳව හරියට හොයන්න, මේ කරුණු ටික හරියට අධ්‍යයනය කරලා මේ සම්බන්ධයෙන් වැඩ පිළිවෙළක් හදන්න. ඒ වාගේම ලංකාවේ ආපදා පිළිබඳ ප්‍රශ්නයක් එනවා නම්, ඒකට ක්ෂණිකව ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳව වැඩ පිළිවෙළක් සකස් කරමු කියන ගෞරවනීය යෝජනාවත් මම කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඇමෙරිකාවේ තිබෙනවා FEMA කියලා ආයතනයක්. FEMA කියන්නේ, Federal Emergency Management Agency. මම නිකමට ඊයේ දිනයේදී ඒ ගැන අධ්‍යයනය කරනකොට දැනගත්තා, ඒක සම්පූර්ණයෙන්ම ස්වාධීනව කටයුතු කරන, ක්‍රියාත්මක වෙන අධිකාරියක් කියලා. ඒකේ authority එක අනුව පුළුවන්කම තිබෙනවා, යම් ආපදාවක් එනවා නම් අදාළ නිලධාරින් ටික රැස් කරගෙන ඒ ආපදාවට අවශ්‍ය වැඩ පිළිවෙළ හදන්න. ආපදා විෂයභාර ඇමතිවරයා වේවා, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ ජනරාල් වේවා, කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වේවා, ඒ කට්ටිය අදාළ තොරතුරු ටික හරියට සන්නිවේදනය කළේ නැත්නම් සියල්ල ඉවරයි. ඒක තමයි අපට වුණේ. ප්‍රාදේශීය ලේකම් දන්නේ නැහැ, මිලිමීටර් 400ක 500ක වැස්සක් වහිනවා කියලා. ආපදා කළමනාකරණ Centre එක දන්නේ නැහැ, බෝට්ටු ටික එවලා සූදානම් වෙන්න ඕනෑ කියලා. මේ ඉන්න දේශපාලන අධිකාරියේ 225දෙනාම දන්නේ නැහැ, මෙච්චර වහිනවා කියලා. දැනගත්ත කට්ටිය හිටියා. හැබැයි, අවශ්‍ය තැන්වලට සන්නිවේදනය කළේ නැහැ. අපි FEMA එක පිළිබඳව අධ්‍යයනය කළ යුතුයි. ඒ පිළිබඳ කරුණු සියල්ල කියන්න මෙය වෙලාව නොවෙයි. ඒ ආයතනය පිළිබඳව අධ්‍යයනය කරලා අපේ තිබෙන Disaster Management Centre එක ස්වාධීන Authority එකක් හැටියට, ආයතනයක් හැටියට පත් කරන්න අවශ්‍ය සංශෝධන ටික මේ පාර්ලිමේන්තුවට ගේන්න කියලා මම ගෞරවයෙන් ඉල්ලනවා. සුනාමි පිළිබඳ warning එකක් වේවා, තත්පරයට මිලිමීටර් 400ක, 500ක වහින වැස්සක් වේවා, එහෙම නැත්නම් නාය යෑම් පිළිබඳ අවදානම වේවා, මේ සියල්ලටම ප්‍රාදේශීය ලේකම්වරු සහ ප්‍රාදේශීය සභා, නගර සභා සියල්ලම එකට එකතු කරලා අවශ්‍ය වැඩ පිළිවෙළ හදන්න. එතකොට ඒ කට්ටියට පුළුවන්කම තිබෙනවා අවශ්‍ය කටයුතු කරන්න.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ FEMA එක පිළිබඳවත් මම ඔබතුමාගේ අවධානය යොමු කරවනවා. මේ ගරු පාර්ලිමේන්තුවේ ඒ අවබෝධය ගන්න පුළුවන් මන්ත්‍රීවරුන් ඕනෑ තරම් ඉන්නවා; අමාත්‍යවරුන් ඉන්නවා. ඒ පිළිබඳව ඔබතුමන්ලා අධ්‍යයනය කරන්න. ඒ සඳහා අවශ්‍ය සංශෝධන අපේ පනතට ගෙනෙමු කියන ගෞරවනීය ඉල්ලීම මේ අවස්ථාවේදී මා කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ කරුණු පිළිබඳව කථා කරනකොට සමහරුන් අපට මඩ ගහනවා. ඔවුන් කියනවා, මුළු අම්බුලුවාවම නාය ගිය හින්දා ගම්පොල යට වුණා කියලා. අද ඔවුන් එවැනි මතවාද හදනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අම්බුලුවාව කියන්නේ එක පැත්තකින් කෑගල්ල; තවත් පැත්තකින් දොළොස්බාගේ; අනික් පැත්තෙන් ගම්පොල නගරය. මේක විශාල කන්දක්. අම්බුලුවාව භාරකාර මණ්ඩලය කියන්නේ මෙතැන හෙක්ටෙයාර 112ක් තිබෙන බවයි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔය කියන හෙක්ටෙයාර 112ක ප්‍රදේශය ගත්තොත්, දවස් 7ක් යනකොට ඒ සියල්ල විවෘත කළා. නාය යෑම පිළිබඳ ප්‍රශ්නයක්, මොකක්වත් ඔය කියන හෙක්ටෙයාර 112 තුළට ඇවිල්ලා නැහැ. හැබැයි, මතවාද හදන්නේ කොහොමද? අම්බුලුවාව හින්දා මුළු ගම්පොලක් යට වෙනවා කියලා මතවාදයක් හදලා අපට පහර ගහලා මේක ඉවර කරන්න පුළුවන් කියලා හිතනවා නම් ඒක විහිළුවක්, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒකෙන් කන්නේ අපි නොවෙයි. මහා පර්වතයකට ගැහුවාම ගල් පතුරක් ඇවිල්ලා අපට වදීවි. හැබැයි, විනාශ වෙන්නේ වෙන අයයි කියන එක බොහොම ඕනෑකමින් සිහිපත් කරගන්න කියන එකත් මේ වෙලාවේදී මම කියනවා.

ඊයේ දිනයේදී කිව්වා, නාය යෑම් පිළිබඳ අවදානම එක්ක කේබල් කාර් ව්‍යාපෘති සියල්ල නතර වෙලා කියලා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම ඔබතුමන්ලාගේ අවධානය යොමු කරවනවා, 2022දී ගෙනා ඩොලර් මිලියන 12.75ක ආයෝජනය කෙරෙහි. ඒකට මමයි මූලික වුණේ. ඒ ආයෝජනයෙන් ඩොලර් මිලියන 3.5ක් මේ රටට මේ වෙනකොට ගෙනැල්ලා තිබෙනවා. 2022 අවුරුද්ද කියන්නේ, ලංකාවේ Treasury එකේ ඩොලර්

[ගරු නීතිඥ අනුරාධ ජයරත්න මහතා]

මිලියන 10ක සංචිතයක් තිබුණු කාලයක්. ඒ වාගේ කාලයක තමයි අපි මේ රටට ආයෝජනයක් ගෙනාවේ. මේ ව්‍යාපෘතියට මගේ පවුලේ කවුරු හරි සම්බන්ධ වුණා කියලා විවිධ මතවාද ඉදිරිපත් කරලා, අදහස් ඉදිරිපත් කරලා මේක හංවඩු ගහනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම ආණ්ඩුවට අභියෝගයක් කරනවා. ඔය ROI සඳහා අවුරුදු 8කින්, 10කින් තිබෙන ව්‍යාපෘතිවලට පුළුවන් නම් ආයෝජකයෙක් ගේන්න. මම කියනවා, ඒ ඕනෑම කෙනෙක් හෙට මේකෙන් ඉවත් වෙනවා කියලා. සති දෙකක්, මාසයක් යන්න පුළුවන් නම්, එක ආයෝජකයෙක් ගෙනැල්ලා ඔය කේබල් කාර් ව්‍යාපෘතිය කරලා පෙන්වන්න කියලා ඔය මඩ ගහන ආණ්ඩුවේ සමහරුන්ට මම අභියෝග කරනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මේක පිළිබඳව විවිධ විධියට අර්ථ කථනය කරලා ඕනෑම පරීක්ෂණයක් කරන්න, ඒවා හොයන්න. ඒක හරි. ඒක කරන්න ඕනෑ. හැබැයි බොරු මඩ ගහලා, මතවාද හදලා, සියලු දේවල් යටපත් කරන්න පුළුවන් කියලා හිතනවා නම් ඒක වැරදියි. එහෙම කරන්න බැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ඒ වාගේම මම තවත් කරුණක් මතක් කරනවා. අම්බුලුවාව සම්බන්ධයෙන් එන කාරණයේදීත් මේක නාය ගියා, ප්‍රශ්න ආවා, කේබල් කාර් ප්‍රශ්නය යනාදී වශයෙන් විවිධ කාරණා කිව්වා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම නිකමට මේ සභාවට ඉදිරිපත් කරනවා, මම මෙහි සභාපතිවරයා වෙන්න කලින් මුළු අම්බුලුවාවෙන්ම 2019 අවුරුද්දටම හොයලා තිබුණේ රුපියල් මිලියන 11ක් බව. 2020 අවුරුද්දේ ඒ ප්‍රමාණය රුපියල් මිලියන 13යි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Anuradha Jayaratne, your time is up.

**ගරු නීතිඥ අනුරාධ ජයරත්න මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அநுராத ஜயரத்ன)
(The Hon. Anuradha Jayaratne, Attorney-at-Law)
Give me one more minute, Sir.

2021දී ආදායම රුපියල් මිලියන 28යි; 2022දී රුපියල් මිලියන 55යි; 2023දී රුපියල් මිලියන 123යි; 2024දී රුපියල් මිලියන 286යි. අපි විසිඑක් ගුණයකින් එහි ආදායම වැඩි කළා. රුපියල් මිලියන 374ට තිබිච්ච වත්කම විතරක් රුපියල් බිලියන 1.2කට වැඩි කළා. රජය විතරක් හම්බ කර ගත්තා, රුපියල් ලක්ෂ 1,000කට වැඩිය. අපි ඒ මුදල් බදු හැටියට රජයට ගෙව්වා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කිසිදු චේතනයක් අරගෙන නොවෙයි, අපි මේක හදලා තිබෙන්නේ. ආණ්ඩුවට මේ රටේ බලය දීලා තිබෙන්නේ හරි දේ කරන්න. ඔබතුමන්ලා හරි දේ හැටියට හිතලා මේ ඕනෑම දෙයක් කරන්න. කිසි ප්‍රශ්නයක් නැහැ. අපි එකඟයි. හැබැයි මේවාට පහර ගහලා, අපට මඩ ගහලාඅපේ හඬ යටපත් කරන්න පුළුවන් කියලා හිතනවා නම්, ජයරත්නලාගේ කශේරුකාව පිළිබඳව දන්නේ නැතුවයි එහෙම කරන්නේ කියන එකත් මේ සභාවට මතක් කරමින් මට කාලය ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Hon. K.V. Samantha Viddyarathna. You have 14 minutes.

[පූ.භා. 11.11]

**ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා (වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමා)**
(மாண்புமிகு கே.வீ. சமந்த வித்யாரத்ன - பெருந்தோட்ட மற்றும் சமூக உட்கட்டமைப்பு வசதிகள் அமைச்சர்)
(The Hon. K.V. Samantha Viddyarathna - Minister of Plantation and Community Infrastructure)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම සතුටු වෙනවා, ගරු රෝහිණී කුමාරි විජේරත්න මන්ත්‍රීතුමිය මේ වාගේ යෝජනාවක් ඉදිරිපත් කිරීම ගැන. මුලින්ම මම කියන්න ඕනෑ, විපක්ෂයේ සමහර අය හිතන දේවල් ඒ විධියට සිදු වෙන්නේ නැහැ කියන එක. මොකද, මේ යෝජනාව ගැන කියනකොට අපට මතකයි, අපි පසුගිය අය වැයෙන් වතු කම්කරුවන්ගේ වැටුප් වැඩි කරන්නත් යෝජනාවක් ගෙනා බව. එතකොට මේ ගරු මන්ත්‍රීතුමිය ඇතුළු විපක්ෂය මතයක් ගෙනාවා, මේ වැටුප ගෙවන්න බැහැ, මේක නීත්‍යානුකූල නැහැ කියලා. නමුත් මම සන්තෝෂයෙන් කියන්න කැමැතියි, මේ සඳුදා තිබුණු කැබිනට් මණ්ඩල රැස්වීමේදී අපි ඒ සඳහා කැබිනට් අනුමැතිය ගත් බව. රජයෙන් රුපියල් මිලියන 5,000ක් වෙන් කර තිබෙනවා, වතු කම්කරුවන්ගේ වැටුපට රජයේ දායකත්වය සඳහා. ඒ වාගේම වතු සමාගම් ද මේ වෙනුවෙන් දායක වෙනවා. ඒ අනුව රුපියල් 1,350ට තිබිච්ච වතු කම්කරුවන්ගේ වැටුප මේ ජනවාරි මාසයේ සිට රුපියල් 1,750 දක්වා වැඩි වෙනවා. ජනවාරි වැටුප අපි දෙන්නේ පෙබරවාරි 10වෙනි දා. ඒක කවුරුත් දන්නවා. පෙබරවාරි 10වෙනි දාට වතු කම්කරුවන්ට ඒ වැටුප ලබා දෙනවා. එතකොට, බැහැ කියපුවා කෙරුණා නේ. ඒ වාගේ මේවාත් මෙහෙම තමයි. මේ "දිට්වා" සුළි කුණාටුව ආවාට පස්සේ අරක වෙන්නේ නැහැ, මේක වෙන්නේ නැහැ, අරක බෙදන්නේ නැහැ, මේක බෙදන්නේ නැහැ කිය කියා ගියාට ඒවා බෙදිලා තිබෙන බව මම තේරුම් කරලා දෙන්න කැමැතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, යෝජනාවේ තිබුණු පරිදිම කිව්වා, ලංකාවට වෙච්ච විශාලම ආපදාව මේක කියා විපක්ෂය පිළිගන්නවාය කියලා. විපක්ෂය කියන විධියට මේක විශාල ආපදාවක් නම් ඒ එක්කම අපට පිළිගන්න වෙනවා, මේක කළමනාකරණය කරන්නත් සෑහෙන මහන්සියක් දරන්න වෙනවා කියලා. එතුමන්ලා ආණ්ඩු කරපු කාලයට වඩා අපේ ආණ්ඩුවට විශාල ආපදාවක් කළමනාකරණය කරන්න වුණා. ඒ ආපදාව කළමනාකරණය කරනකොට අඩුපාඩුවක් වුණේ නැහැම කියන්න බැහැ. යම් යම් තැන්වල යම් යම් අඩුපාඩු තිබෙන්න පුළුවන්. හැබැයි, ඒක මේ රටේ ජනතාවත් තේරුම් අරගෙන තිබෙනවා කියලා මම හිතනවා. මේ ආපදා තත්ත්වය කළමනාකරණය කිරීම සම්බන්ධයෙන් විශාල වෙහෙස මහන්සියක් රජයක් හැටියටත්, රටේ ජනතාව හැටියටත් සිදු කර තිබෙනවා කියන එක ඔබතුමන්ලා තේරුම් ගනිවි කියලා මා විශ්වාස කරනවා.

සංඛ්‍යාලේඛන නැහැ කිව්වාට අදාළ තැන්වලින් ඉල්ලුවා නම් සංඛ්‍යාලේඛන වාගේම තොරතුරු ලබා ගන්න පුළුවන්. ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයෙන් මම ඊයේ වාර්තාවට අනුව තොරතුරු ලබා ගත්තා. මාතලේ දිස්ත්‍රික්කයේ තොරතුරු නැහැ කියපු නිසායි මම මේ විස්තර කියන්නේ. මාතලේ දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 11ක් තිබෙනවා. ඒ අනුව, මාතලේ දිස්ත්‍රික්කයේ ආපදා බලපෑමට ලක් වුණු මුළු පවුල් සංඛ්‍යාව 12,240යි; ඒ පවුල්වල ඉන්න පුද්ගලයින් සංඛ්‍යාව 42,574යි; සිදු වූ මරණ සංඛ්‍යාව 29යි; තුවාල වූ පුද්ගලයින් ගණන 12යි; අතුරුදහන් වූ ගණන 8යි; පූර්ණ හානියට ලක් වූ නිවාස ගණන 256යි; අර්ධ හානියට ලක් වූ නිවාස ගණන 4,105යි. තොරතුරු නැහැ කියපු නිසායි මම මේ විස්තර කිව්වේ, ඔබතුමන්ලාට තේරුම් ගන්න.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ආපදාව සිදු වෙලා තවම මාස දෙකක් ගත වුණේ නැහැ. විශාල ආපදාවක් තමයි මේ රටට සිද්ධ වුණේ. ඒ මාස දෙක තුළ අපි කරපු කාර්යය පොඩි නැහැ. ඒ ආපදා තත්ත්වය කළමනාකරණය කරන්න අපි විශාල කාර්යභාරයක් ඉටු කළා. සිදු වුණු ආපදාවේ තරම මම මේ කියන්නේ. දිස්ත්‍රික්ක 25න්, දිස්ත්‍රික්ක 22කටම මේ ආපදාව බලපෑවා. ආපදාවට ලක් නොවුණු දිස්ත්‍රික්ක තිබෙන්නේ 3යි. ඒ, ගාල්ල, මාතර දිස්ත්‍රික්ක දෙකත් එක්ක තව එක දිස්ත්‍රික්කයක්. ඔබතුමන්ලා ආණ්ඩු කරපු කාලයේ ආපදාවක් වුණාම රටේම අයට උදවු කරන්න පුළුවන් වුණාට මේ වතාවේ ආපදාවට ලක් වූ බදුල්ලට උදවු කරන්න කොළඹට, ගම්පහට, මහනුවරට, කුරුණෑගලට, අනුරාධපුරයට බැරි වුණා. ඇයි, ඒ? ඒ අයත් ආපදාවට ලක් වෙලා හිටපු නිසා. ඒ නිසා මේ වතාවේ උදවු කරන්න හිටපු ප්‍රමාණයත් අඩු වුණා. හැබැයි, ආපදාව විශිෂ්ට ලෙස කළමනාකරණය කරමින් තිබෙනවා කියලා අපි හිතනවා. මම නොවෙයි එහෙම කියන්නේ. විපක්ෂය නොකිව්වාට එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ලංකාව භාර නියෝජිතයාත් කිව්වා, "අපේ රටට මේ වාගේ ආපදාවක් වුණොත් අපේ මිනිස්සු මේ විධියට කළමනාකරණය කර ගන්නේ නැහැ" කියලා. හැබැයි, ජාත්‍යන්තර මට්ටමෙන් එහෙම කිව්වත් විපක්ෂයට මේක තේරෙන්නේ නැහැ. ඒකට ඉතින් අපට කරන්න දෙයක් නැහැ. ඔතැන තිබෙන්නේ වෙන ප්‍රශ්නයක්. විපක්ෂයේ වෙන ගති ලක්ෂණයක් තිබෙනවා නේ. ඒවා තමයි මේ බලපාන්නේ. ලෝකයක් අපේ රට අගයනකොට අපේ රටේ විපක්ෂයට ඒක කියන්න බැරි, විපක්ෂයත් යම් විපත්තියකට මුහුණ දීලා තිබෙන නිසා ද කියලා මට හිතෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කෙසේ වුවත් රටේම තොරතුරු ගත්තොත්, ආපදාවෙන් බලපෑමට ලක් වූ මුළු පවුල් සංඛ්‍යාව 659,197ක්. ඒක විශාල ප්‍රමාණයක්. ආපදාවෙන් බලපෑමට ලක් වූ පුද්ගලයින් සංඛ්‍යාව 2,341,066ක්; සිදු වූ මරණ සංඛ්‍යාව 640ක්; අතුරුදහන් වූ පුද්ගලයින් ගණන 174ක්. ඒ වාගේම ආපදාවට ලක් වූ අයට ඉන්න සුරක්ෂිතතා මධ්‍යස්ථාන 2,172ක් තිබුණා. මේවා තුළින් ජනතාව කළමනාකරණය වුණා. මේවායේ හිටපු ලක්ෂ ගණනක් ජනතාව අපි පෝෂණය කළා, ආරක්ෂා කළා. එහෙම කළේ නැහැ කියලා කාටවත් කියන්න බැහැ. පවුල් ලක්ෂයකට වඩා මේ සුරක්ෂිත මධ්‍යස්ථානවල හිටියා. අද වනකොට ලංකාවේ මේ වාගේ සුරක්ෂිත මධ්‍යස්ථාන තිබෙන්නේ 93ක් පමණයි. ඒ අනුව, ඔවුන් විශිෂ්ට කළමනාකරණයක් කළ බව මම මතක් කරන්න කැමැතියි.

ඊළඟට, ජාතික ගොඩනැඟිලි පර්යේෂණ ආයතනය - NBRI එක - සැලකිය යුතු කාර්යභාරයක් මේ ආපදා අවස්ථාවේදී සිදු කළා. අඩුපාඩු නැහැ කියන්න බැහැ. වෙනදා මීරියබැද්ද, සාමස්සර කන්ද වාගේ කඳු එකයි, දෙකයි අවුරුද්දටම නාය ගියේ. හැබැයි, මේ වතාවේ NBRI එක පවසන පරිදි ඔවුන්ගේ වාර්තාවල තිබෙනවා, රටේ සිදු වූ විශාල නාය යෑම් පිළිබඳව. මේ කියන්නේ, කණ්ඩි කඩා වැටීම් පිළිබඳව නොවෙයි. විශාල නාය යෑම් 1,436ක් සිදු වෙලා තිබෙනවා. නාය යෑම් 1436ක්! මේ නාය යෑම් නිසා දැවැන්ත අනතුරක් තමයි රටට සිදු වුණේ. ඒ අනතුර කළමනාකරණය කරනවා කියන එක පහසු කාර්යයක් නොවෙයි කියලා බුද්ධිමත් ජනතාව තේරුම් ගනීවි. එක පැත්තකින් නාය ගියා. අනෙක් පැත්තෙන් ගංවතුර ආවා. ඒ හේතුවෙන් අපේ රටේ ආර්ථිකයට දැවැන්තම පහරක් එල්ල වුණා. මේ වාගේ තත්ත්වයක් තමයි ඇති වුණේ. සුළි සුළං ආවා. මේ ඔක්කොටම අපි මුහුණ දුන්නා. අපි ගොදුරු වූ බරපතළ තත්ත්වය, ඛේදවාචකය කළමනාකරණය කිරීමේදී ඒ සඳහා සහයෝගය ලබා දුන් මේ රටේ ජනතාවට මම ස්තුතිවන්ත වෙනවා. ඒ නිසා අපට ආපදා තත්ත්වය කළමනාකරණය කර ගන්න පුළුවන් වුණා. ජනතාව ඒ වෙනුවෙන් ස්වේච්ඡාවෙන් ඉදිරිපත් වුණා. සාමාන්‍ය ජනතාව විශාල වශයෙන් මේ වෙනුවෙන් සහයෝගය ලබා දුන්නා. විපක්ෂය ඒ කාලයේ මැතිවරණ එනකොට බෙදපු බස්, බෙදපු බත් මේ ආපදා අවස්ථාවේදී බෙදුණේ නැහැ. ඒකයි ඇත්ත කතන්දරය. ඒ කාලයේ සැහෙන්න දේවල් බෙදුවා. කෙසෙල් ගෙඩිවල ලේබල් ගහලා හරි බෙදුවා. මේ සැරේ බෙදපු කෙසෙල් ගෙඩියක් නැහැ. අන්තිමේදී ජනතා විරෝධයක් එනකොට ඇපෙන් බේරෙන්න වාගේ පොඩි මාධ්‍ය සන්දර්ශන ටිකක් පෙන්වලා ගියා. මේ රටට ආධාර කළ විදෙස් රටවලට බෙහෙවින් ස්තුතියි; විදෙස්ගත ශ්‍රී ලාංකිකයන්ට බෙහෙවින් ස්තුතියි.

ඔවුන් ඒ කාර්යය ඉටු කළා. ඒ වාගේම මේ රටේ ත්‍රිවිධ හමුදාව, පොලීසිය, සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ නිලධාරින් මේ ආපදා අවස්ථාවේදී විශාල කාර්යභාරයක් ඉටු කළා. ඒ සියලු දෙනාට ස්තුතියි, මේ ආපදා තත්ත්වය කළමනාකරණය කිරීම සම්බන්ධයෙන්. මේ රටේ රාජ්‍ය නිලධාරින් පෙන්නුවා, ඔවුන්ට ඒ වැඩ කටයුතු කරන්න විශාල ශක්තියක් තිබෙන බව. ඔවුන් බිම් මට්ටමට බැහැලා වැඩ කරමින් ඒ කටයුතු කළමනාකරණය කළා. ඉක්මනින් ආධාර ටික බෙදුවා. ඒ විධියට විශිෂ්ට කාර්යභාරයක් මේ රටේ රාජ්‍ය සේවකයින් විසින් ඉටු කළා. ජනාධිපතිතුමා ඇතුළු දේශපාලන අධිකාරිය විධිමත් විධියට, ලස්සනට, රෑ - දවල් කියලා බලන්නේ නැතුව මේ ආපදා තත්ත්වය කළමනාකරණය කළා. ඒ නිසා තමයි මාස දෙකක් ගත වීමට පෙරාතුව මේ විධියට මේ දේවල් සිද්ධ වුණේ.

එක් අවස්ථාවක ඉහළ රාජ්‍ය නිලධාරියෙක් මගේ අත අල්ලාගෙන කිව්වා, අපි බේරුණා කියලා. මම ඇහුවා, මොකෙන්ද කියලා. එතුමා කිව්වා, "දිට්වා" සුළි කුණාටුව ආපු වෙලාවේ ගුටි කන්නේ නැතුව රාජ්‍ය සේවකයින් බේරලා දුන්නාට බෙහෙවින්ම ස්තුතියි කියලා. මම ඇහුවා, ඒ කථාවේ තේරුම මොකක්ද කියලා. එතුමා මෙහෙමයි කිව්වේ. මේක මගේ කථාව නොවෙයි, එතුමාගේ කථාව. "මේ රටේ විදුලිය නැති වුණා, ගෑස් හිඟ වුණා, ජනතා අර්බුදයක් ආපු වෙලාවේ පාරට බැහැලා ආණ්ඩු එළෙව්වා, රාජ්‍ය සේවකයින්ට පහර දෙන්න හැදුවා, එහෙම අරගළ ආපු, ආණ්ඩු පෙරළපු රටක විදුලිය, ගෑස්, කිරි පිටි නැති වෙලා විතරක් නොවෙයි, ජීවිත නැති වෙලා, ගෙවල් දොරවල් නැති වෙලා, ඔක්කෝම නැති වෙලා යන්න එන්න තිබෙන පාරවල් ඇහිරිලා, රටේ බොහෝ ප්‍රදේශවල විදුලිය වාගේම සන්නිවේදන කටයුතු ඇනහිටලා, බොන්න වතුර නැතුව තිබිය දී මේ මිනිස්සු පාරට බැස්සේ නැත්තේ ඔබතුමන්ලාගේ ආණ්ඩුව කෙරෙහි විශ්වාසයක් තිබුණු නිසායි, විශිෂ්ට ලෙස මෙය කළමනාකරණය කරපු නිසා අපි බේරුණා" කියලා එතුමා කිව්වා. මම ඒ අවස්ථාවේදී කිව්වා, ආණ්ඩුවත් අපි බේරා ගත්තා, රටම බේරා ගත්තා, සතුටුයි කියලා. ඒ නිසා විපක්ෂයේ මන්ත්‍රීතුමන්ලාට ඒක තේරෙන්නේ නැති වෙන්න විධියක් නැහැ. අරගළ ආවේ මීට වඩා පොඩි ප්‍රශ්නවලට. මේ වාගේ බරපතළ ප්‍රශ්න ආවත් අපි ඒවා විශිෂ්ට ලෙස කළමනාකරණය කළා.

වලපනේදී හමු වුණු අම්මා කෙනෙක් මගේ අත අල්ලා ගෙන කිව්වා, "පුතා, මගේ ගෙදරටත් රුපියල් ලක්ෂ 50ක් හම්බ වෙනවා" කියලා. මට සන්තෝෂයි කියලා මම කිව්වා. එතකොට ඒ අම්මා කිව්වා, "හැබැයි, පුතා මගේ ගෙදර රුපියල් ලක්ෂ 50ක් වටින්නේ නැහැ, මට ඒ මුදල වැඩියි, අපිට කවදාවත් ආණ්ඩුවකින් එහෙම දීලා නැහැ" කියලා. මේ අයට දරා ගන්න බැරි ප්‍රශ්න ඕවා. ඇත්ත කාරණා ඕවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒ නිසා සැලකිය යුතු කාර්යභාරයක් මේ ක්‍රියාවලිය තුළ කෙරිලා තිබෙනවා. එහෙම සැලකිය යුතු කාර්යභාරයක් සිදු වෙලා නැහැ කියන්න පුළුවන්කමක් නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු ජනාධිපතිතුමාට වෙන් වුණු හෙලිකොප්ටර් දෙකක් තිබෙනවා. ඒ හෙලිකොප්ටර් දෙක "දිට්වා" සුළි කුණාටුව ආපු වෙලාවේ ජනතාවට සහන දෙන්න

[ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා]

පාච්චල් කළා. හැබැයි, ඒ කාලයේ හිටපු ජනාධිපතිවරු හෙලිකොප්ටරයේ නැඟලා ගංවතුර දිහා බලා ගෙන ගියා කැමරාව අල්ලා ගෙන යන්න අවශ්‍ය නිසා. ඒ අය හෙලිකොප්ටරයේ නැඟලා සිරි නැරඹුවා. හැබැයි, මේ වෙලාවේදී එහෙම වුණේ නැහැ. ජනතාව වෙනුවෙන් දෙන්න පුළුවන් උපරිම දේවල් අපි ලබා දුන්නා. සුනාමිය ආපු වෙලාවේදී බන්දුල ගුණවර්ධනව ගෙනෙන්න අරුගම්බේට හෙලිකොප්ටරයක් ගියා. සාමාන්‍ය මිනිස්සු දාලා එතුමාව විතරක් බේරා ගෙන ආවා. අන්න එහෙමයි එදා ආපදා කළමනාකරණය වුණේ. මෙදා ආපදා කළමනාකරණය මෙහෙමයි; එදා ආපදා කළමනාකරණය එහෙමයි. ඒ නිසා කථා කරනකොට බොහොම කල්පනාවෙන් කථා කරන්න.

ආපදා කළමනාකරණය ගැන දැන් මෙතුමන්ලා අපට උගන්වන්න එනවා. කොවිඩ් වසංගතය ආපු වෙලාවේදී ඒක කළමනාකරණය කළේ කොහොමද? මේ රටේ වෛද්‍යවරු වාගේම විශේෂඥයින් කිව්වා, එන්නත ගෙනෙන්න, වැක්සින් එක ගෙනෙන්න කියලා. නමුත්, වැක්සින් එක ගෙනාවේ නැහැ. ඒ නිසා මේ රටේ මිනිස් ජීවිත කීයක් අහිමි වුණාද? ඒ කළමනාකරණය මොකක්ද කියලා මම අහනවා. ඒ වෙලාවේදී ඔවුන් කරපු කළමනාකරණය තමයි, කොවිඩ්වලින් ජනතාව බේරා ගන්න පැණි පොවපු එක, මුට්ටි ගඟේ පා කරපු එක. ඔවුන් ඒවා කරමිනුයි හිටියේ. රටේ ජනතාව ඒ වෙලාවේදී පාරට බැස්සා. නමුත්, මේ ආපදා අවස්ථාවේදී එහෙම වුණේ නැහැ. රටේ ජනතාව පාරට බස්සන්න විපක්ෂය සැහෙන්න මහන්සි ගත්තා. ආපදාවට පත් අයට රුපියල් 25,000ක් දෙනවාය කියලා මේ ගරු සභාවේ දී කිව්වාම ඊට පහුවැනි දා විපක්ෂ නායකවරයා ගිහිල්ලා ජනතාවගෙන් අහනවා, රුපියල් 25,000 ලැබුණාද කියලා. ඔන්න ඔහොමයි ඒවා කළමනාකරණය කළේ. ඒ නිසා මේවා තේරුම් ගන්න කියලා මම විපක්ෂයට කියනවා.

බිඳුණු රටවල්, බිඳුණු වැව් අමුණු, සිඳුණු කෙත් බිම්, තැවුණු හදවත්, දැවුණු සිත්පිත් ඔක්කොම ගොඩනඟන්න මේ රටේ කලාකරුවන් සහ සාහිත්‍යවේදීන් සියලුදෙනා ගම් බිම්වලට බැහැලා වැඩ කටයුතු කළා. ගෞරවනීය ස්වාමීන් වහන්සේලා ඇතුළු පූජ්‍ය පක්ෂයත් මේවාට කර තැබුවා. පන්සල්, කෝවිල් සහ පල්ලි ආපදා මධ්‍යස්ථාන වුණා. අපි ඒවා නොදන්නවා නොවෙයි. ඒවා තේරුම් ගන්න ඕනෑ බොහෝ කරුණු - කාරණා තිබෙනවා කියන එක මම මතක් කරන්න කැමතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි භාර ගත්තේ "දිට්වා" සුළි කුණාටුවට වැඩිය සුළි කුණාටුවකට අහු වෙච්ච රටක්. ඒ වනකොට ආණ්ඩු කරපු කට්ටිය රට සුළි කුණාටුවට හසු කරලා අපට භාර දුන්නා. අපි එවැනි රටක් භාර ගත්තේ. අපි මේ රට භාර ගන්නකොට කොච්චර ආපදාවට පත් වෙලා තිබුණාද කිව්වොත්, භාණ්ඩාගාරයත් මහා ආපදාවකට පත් වෙලා තිබුණේ. භාණ්ඩාගාරයේ පතුල හිඳිලා තිබුණේ; පතුල හින්දවලා තිබුණේ. ආපදාව ඔය පැත්තෙන් ආවේ. ඒක "දිට්වා" සුළි කුණාටුවට වැඩිය බරපතළයි. මේ පාර්ලිමේන්තුවත් ආපදාවට පත් වෙලා තිබුණේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඔය මයික් එක ගලවා, ගලවා වීසි කළේ. මෙතැන මිරිස් කුඩුවලින් කරපු සෙල්ලම් එදා තිබුණේ. තවමත් මේ පාර්ලිමේන්තුවට යම් ආපදාවක්, ප්‍රශ්නයක් තිබෙනවා නම් ඒවා විපක්ෂය පැත්තෙන් එන්නේ, අපේ පැත්තෙන් නොවෙයි. මේක බුද්ධිමත් සංවාද මණ්ඩපයක් බවට තවමත් පත් කර ගන්න අපහසුයි. හැබැයි, ගරු කථානායකතුමා ඒ වෙනුවෙන් සැහෙන්න වෙහෙසෙන බව අපට පෙනෙනවා. නමුත්, මෙතැන තවම ඒ සඳහා ඉඩ දෙන්නේ නැහැ. ඒ විධියට රට දැවැන්ත ආපදාවට පත් කරලා තිබුණු වෙලාවේදී තවත් ආපදාවකට අපට කර ගහන්න සිද්ධ වුණා.

අපි ඒකට කර ගැහුවා. ගරු ජනාධිපතිතුමා මේ පාර්ලිමේන්තුවට ඇවිල්ලා පරිපූරක ඇස්තමේන්තුවක් දාලා රුපියල් බිලියන 500ක් වෙන් කළා, ඔය ආපදාවට ලක් වූ ජනතාව වෙනුවෙන්. කොහොමද නැහැ කියන්නේ? මම මේ කාරණත් මතක් කරන්න කැමැතියි. දැන් බෙදුවේ නැහැ කියලා කියනවා නේ; දුන්නේ නැහැ කියනවා නේ. ඒ ගැන නොදන්නා නිසා මම මුලින්ම මාතලේට දීපු ඒවා ගැන කියන්නම්කෝ. රුපියල් 25,000ක සහනාධාර දීමනාව දෙන්න ඕනෑ මාතලේ පවුල් සංඛ්‍යාව 6,239යි. ඊයේ වෙනකොට එයින් පවුල් 6,027කට රුපියල් 25,000ක සහනාධාර දීමනාව ගෙවලා ඉවරයි. ප්‍රගතිය සියයට 94.71යි. ඊළඟට, රුපියල් 50,000ක සහනාධාර දීමනාව මාතලේ පවුල් 1,253කට දෙන්න ඕනෑ. මේ වෙනකොට එම සහනාධාර දීමනාව පවුල් 1,143කට ගෙවා තිබෙනවා. රුපියල් 15,000ක් ලබාදෙන ශිෂ්‍ය දීමනාව මාතලේ දරුවන් 1,743කට ගෙවන්න ඕනෑ. මේ වෙනකොට මාතලේ දරුවන් 1,497කට ශිෂ්‍ය දීමනාව ගෙවා තිබෙනවා. ආපදාවට ලක්වෙලා නැති නිසා එතුමියලාට ගෙවන්න පුළුවන්කමක් නැහැ. ගෙවන්න ඕනෑ අයට ගෙවලා තිබෙනවා. නොදන්නාකම ගැන අපට කරන්න දෙයක් නැහැ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි මුළු රටේම ගත්තොත් රුපියල් 25,000ක සහනාධාර දීමනාව පවුල් 422,847කට ගෙවා තිබෙනවා. රුපියල් 25,000ක සහනාධාර දීමනාව ගෙවීමේ ප්‍රගතිය ගත්තොත් සියයට 98යි. රුපියල් 50,000ක සහනාධාර දීමනාව පවුල් 109,046කට ගෙවා තිබෙනවා. ප්‍රගතිය සියයට 71යි. රුපියල් 15,000ක ශිෂ්‍ය දීමනාව දරුවන් 136,828කට ගෙවා තිබෙනවා. ප්‍රගතිය සියයට 74යි. කොහොමද නැහැ කියන්නේ? නැහැ කියන්න පුළුවන්කමක් නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ රටට මේ ආපදාව ආපු වෙලාවේ විපක්ෂයේ මෙතුමන්ලාගේ ආණ්ඩුවක් තිබුණා නම් මේක කළමනාකරණය කරන්න බැහැ. ඇයි? ස්වේච්ඡාවෙන් මිනිස්සු වැඩට බහින්නේ නැහැ; අරමුදල්වලට සල්ලි දෙන්නේ නැහැ. ආපදා කළමනාකරණය තිබුණු ආණ්ඩුවලින් ඉගෙන ගන්න ඕනෑ නැහැ. අපේ රටට සුනාමිය ආපු වෙලාවේ ඒ ව්‍යසනයෙන් මියගිය අය වෙනුවෙන් එවපු සුනාමි අරමුදල් ගියේ "Helping Hambantota" ගිණුමට බව අපි දන්නවා. මිනිසුන්ගේ මළකඳන්වලට ආපු සල්ලි ඒ විධියට හොරා කෑවා. "සිරිලිය" ගිණුමට සල්ලි ගියා. අපේ රටට සුනාමිය ආපු වෙලාවේ සුනාමි සහන මණ්ඩල ගැහුවා. සුනාමිය ආවාට පස්සේ සුනාමියට වඩා බරපතළ ආපදාවක් ඒ කාලයේ ආවා. ඒ කාලයේ ඒවා කළමනාකරණය කළේ එහෙමයි. දැන් එනවා කථා කරන්න.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ දිස්ත්‍රික්කයේ හල්දුම්මුල්ල, මීරියබැද්ද නාය ගියේ 2014 ඔක්තෝබර් 26වැනි දා. ඒ කාලයේ මෙතුමන්ලාගේ ආණ්ඩුව තිබුණේ. NBRO එක 2007දී වාර්තාවක් දීලා තිබුණා, "මේ ස්ථානය අධි නාය යනවා, මේ පවුල් අයින් කරන්න" කියලා. මෙතුමන්ලාගේ ආණ්ඩුව ඒ කිසිම පවුලක් එතැනින් ඉවත් කළේ නැහැ. අන්තිමට මොකක්ද වුණේ? මගේ දිස්ත්‍රික්කයේ ආදරණීය ජනතාව 36දෙනෙක් පස් කඳුවලට යටවෙලා පොළොවේ මිහිදන් වුණා. ඉතින්, එදා ආපදාව කළමනාකරණය කළා ද? NBRO එක කියලා තිබුණා නේ ඒ ජනතාව ඉවත් කරන්න කියලා. ඒවා අනාවැකි නොවෙයි. NBRO එක වාර්තාව දීලා තිබුණා නේ, ඒ ජනතාව ඒ තැන්වලින් ඉවත් කරන්න කියලා. ඒ වාර්තාව දීලා අවුරුදු 7ක් ගත වුණත් ඒ ජනතාව ඒ ස්ථානවලින් ඉවත් කළේ නැහැ. ඒ නිසා මිනිස් ජීවිත 36ක් නැති වුණා. ඒවා ස්වභාවිකව සිදුවුණු මරණ නොවෙයි. ඒ මරණවල වගකීම එදා පැවති ආණ්ඩුව බාර ගන්න ඕනෑ. ඒක මිනීමැරුමක් හැටියට ගන්න ඕනෑ. ඇයි? ඉවත් කරන්න කියලා දන්වා තිබියදීත් ඒ ජනතාව ඒ තැන්වලින් ඉවත් කළේ නැහැ. ඒ මිනිස්සුන්ට තවම ගෙවල් හදලා නැහැ. හදන්න ඉතිරිවෙලා තිබෙන ගෙවල් ටික අපේ ආණ්ඩුවෙන් අපි හදනවා.

හල්දුම්මුල්ල, කබරගල නාය ගියා 2023 මාර්තු මාසයේ 26වැනි දා. පවුල් 50ක් අදත් ඉන්නේ වහපු තේ ෆැක්ටරියක. එදා ආණ්ඩු කරපු මේ අය ඒ මිනිසුන්ට ගෙවල් දුන්නාද? කළමනාකරණය කළාද? ඇයි දැන් අපෙන් අහන්නේ? එතුමන්ලා එදා ඒක කළේ නැහැ. ඒ මිනිසුන්ට ගෙවල් හදන්න ගිය මාර්තු මාසයේ 15වැනි දා මුල්ගල් තියලා අපේ ආණ්ඩුව වැඩ පටන් ගත්තා. දැන් ඒක අවසන් අදියරේ තිබෙන්නේ. තව මාස 2ක් යනකොට ඔබතුමන්ලා කඳවුරුගත කළ මිනිසුන්ට අපි ගෙවල් දෙනවා. දැන් එනවා, ආපදා කළමනාකරණය ගැන කථා කරන්න.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම මේ කාරණයත් මතක් කරන්න කැමැතියි. අපි මේ රටේ ජනතාව උපරිම වශයෙන් කළමනාකරණය කළා. මහා ශ්‍රම කන්දරාවක් වැඩ කරන්න ආවා. රජයේ ප්‍රතිපාදනවලින් මේ සියල්ලම කරන්න බැහැ. මම නියෝජනය කරන බදුල්ල දිස්ත්‍රික්කයේ වැව්, අමුණු, ඇළ මාර්ග 1,492ක් "දිට්වා" සුළි කුණාටුව නිසා විනාශ වුණා. මහා වාරිමාර්ග විනාශ වුණා. නිලධාරින් කිව්වා, මේවා නැවත හදන්න අවුරුදු 3ක්වත් යයි කියලා. බත්මැඩිල්ල හදන්න; තල්දෙන හදන්න; උමා ඇළ හදන්න ඒ කාලය යයි කිව්වා. නමුත්, අපි ඒවා හැදුවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. තාවකාලිකව දැන් ඒවායින් වතුර දෙනවා. දැන් මිනිසුන් කෙතේ වැඩ. වී ටික වගා කරනවා, එළවලු ටික වගා කරනවා, රටට කන්න දෙන්න. මේ අය දැන් මොනවාද කියන්නේ?

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Minister, you have exceeded your time.

**ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා**
(மாண்புமிகு கே.வீ. சமந்த வித்யாரத்ன)
(The Hon. K.V. Samantha Viddyarathna)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ ගරු ආර්.එම්. ජයවර්ධන මැතිතුමාගේ වෙලාවෙන් විනාඩි දෙකක් මට දෙනවා.

අපේ බදුල්ල දිස්ත්‍රික්කයේ හානියට පත් වුණු වාරිමාර්ග ප්‍රතිසංස්කරණය කිරීම වෙනුවෙන් අපි ස්වේච්ඡාවෙන් වැඩ කළා. රැයක් දවාලක් නැතිව අපි වැඩ කළා. රාත්‍රී කාලයේදී වැඩ කළ ඒවා ගණන් ගන්නේ නැතිව මේ කාලය පුරා අපි වැඩ කරපු ශ්‍රමය දෙස බැලුවොත් අපි මිනිස් දින 36,833ක් වාරි මෙහෙයුම් වෙනුවෙන් වැඩ කර තිබෙනවා; මිනිස් දින 36,833ක්. ඒ මිනිස් දින ගණන මුදල් බවට පත් කළොත්, ඉංජිනේරුවාටත්, සාමාන්‍ය කම්කරුවාටත් එකම ගණන දාලා හදලා බැලුවාම රුපියල් ලක්ෂ 884ක වටිනාකමක් සහිත වැඩ කරලා තිබෙනවා, බදුල්ලේ වාරිමාර්ග 1,492ක් හදන්න. අද ඒ මිනිසුන්ට වගා කරන්න අවශ්‍ය වතුර ටික අපි දෙනවා. මම අහනවා, විපක්ෂයේ අයගේ ආණ්ඩුවක් මේ වන විට බලයේ හිටියා නම් මේ දේවල් කරන්න පුළුවන්ද කියලා. ඒ හැකියාව තිබෙන දේශපාලන ව්‍යාපාරය තමයි අපි.

අපි ජනතාව එකතු කරගෙන ඉදිරියට ගියා. අපි "නැණ දිරි මෙහෙයුම" කියලා මෙහෙයුමක් බදුල්ලේ කරගෙන ගියා. අපේ පාසල්, පෙර පාසල් 233ක් විනාශ වුණා. NBRO එකෙන් කියා තිබෙනවා, පාසල් 8ක් සහමුලින්ම අයින් කරන්න කියලා. ඒ පාසල් 8 හැර අනෙක් පාසල් සහ පෙර පාසල් අපි දරුවන්ට ඉගෙන ගන්න පුළුවන් ආකාරයට යථා තත්ත්වයට පත් කළා, පුළුවන් උපරිම වෙර වීරිය දාලා. අන්න ඒ සඳහා මිනිස් දින 40,587ක් වැය කරලා තිබෙනවා. මේ මිනිස් දිනවලට ළමයින් ඇතුළත් වෙලා නැහැ; පාසල් දරුවෝ ඇතුළත් වෙලා නැහැ; වැඩිහිටියෝ විතරයි ඉන්නේ. මිනිස් දින 40,587ක්. මාතරින්, රත්නපුරෙන්, අම්පාරෙන් රාජ්‍ය නිලධාරින් ඇතුළු සාමාන්‍ය ජනතාව බදුල්ලට ආවා. එහෙම ඇවිල්ලා තමයි මේ දේවල් කළේ. ඒ මිනිස් දින 40,587 මුදල් කරලා බැලුවොත් අපි ස්වේච්ඡාවෙන් වැඩ කරලා තිබෙනවා රුපියල් ලක්ෂ 957ක. අපි කළමනාකරණය කරලා නැද්ද කියලා මම අහනවා. වලපනේ, හඟුරන්කෙත, මතුරට, නිල්දණ්ඩාහින්න වැනි ප්‍රදේශවල විශාල හානියක් වුණා. බදුල්ලේ අපි සාමාන්‍ය මට්ටමට වැඩ ටික ඉවර කරගෙන, පසුගිය දෙසැම්බර් 16වැනි දා විශාල සේනාවක් අරන් ඒ ප්‍රදේශවලට ගිහිල්ලා දවස් 10ක් ඒ ප්‍රදේශවල වැඩ කළා. මම රාජ්‍ය සේවකයන්ට ගරු කරනවා. බදුල්ලේ රාජ්‍ය සේවකයෝ 1,006 දෙනෙක් මේ සහන සේවාවලට ගියා.

ප්‍රධාන ලේකම්තුමිය, ලේකම්වරු, පළාත් ලේකම්වරු ගිහිල්ලා බිම් මට්ටමේ වැඩ කළා. ඇළවල් ශුද්ධ කළා. මේ රටේ රාජ්‍ය සේවයට ගෞරවයක් තිබෙනවා. අපේ අමාත්‍යාංශයේ පරිපාලන සේවයේ ඉහළම නිලධාරින් ගිහිල්ලා ඇත මඩොල්සීම, ඇකිරියේ ඇළවල් ශුද්ධ කරලා දුන්නා. ඒ වාගේ මම නොදන්නා තව ඕනෑ තරම් වැඩකටයුතු කෙරිලා ඇති. වලපනේ මාර්ග සහ වාරිමාර්ග 119ක් අපි පිළිසකර කළා. එහි වටිනාකම ශ්‍රම දිනවලට බැලුවාම ලක්ෂ 223ක වැඩ කරලා තිබෙනවා. කොහොමද කළමනාකරණය කළේ නැහැ කියන්නේ? කළමනාකරණය කරලායි තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වර්තමානය වෙනකොට අපේ රටට විපක්ෂයක දැඩි අවශ්‍යතාවක් තිබෙනවා. රික්තකයක් තිබෙනවා, විපක්ෂයකට. අපට ඕනෑ යහපත් විපක්ෂයක්. මේ වාගේ විපත්තියක් ආපු වෙලාවක විපක්ෂය එකතු වෙලා වැඩ කරන්නේ නැත්නම් ඒක විපත්තියක්. මේ විපක්ෂය විපත්තියක්. ඕක තමයි ඇත්තම කතන්දරය. ප්‍රශ්නය තිබෙන්නේ මෙතැන නොවෙයි. මේ කට්ටිය මෙච්චර සැරට අපට ගහන්නේ ඇයිද දන්නවාද, ගරු නියෝජ්‍ය කථානායකතුමනි? අපි බලවේග ගණනාවක් අවුස්සලා තිබෙනවා. මේ රටට හානි කරන, දුෂ්ට බලවේග ගණනක් අපි මේ වනකොට අවුස්සලා තිබෙනවා. අපේ පළමුවැනි අවුරුද්ද ගෙවෙන කොට මේ රටේ ජනතාව වෙනුවෙන්, දරුවන් වෙනුවෙන් අපි විශිෂ්ට මෙහෙයුම් ගණනාවක් ආරම්භ කර තිබෙනවා. මේ රටේ විෂ මත්ද්‍රව්‍ය තුරන් කිරීමේ ව්‍යාපාරය ආරම්භ කර තිබෙනවා, "රටම එකට" ජාතික මෙහෙයුම යටතේ "ඉවත් වෙනු" කියලා. එතකොට ඒ විෂ මත්ද්‍රව්‍ය ව්‍යාපාරවල ඉන්න කට්ටිය ඇවිස්සෙනවා. ඒ කට්ටියගේ ලාභ නැති වෙන කොට ඇවිස්සෙනවා. ඒ කට්ටියගේ බිස්නස් වැටෙන කොට ඇවිස්සෙනවා. අහුවෙයි කියනකොට, භය වෙනකොට ඇවිස්සෙනවා. ඒ ඇවිස්සෙන කට්ටිය මෙතැන ඇවිල්ලා නළියනවා; එළියේ නළියනවා. ඕක තමයි ඇත්ත.

අපි රට වෙනුවෙන් පාතාලයට එරෙහිව දැවැන්ත සටනක් ආරම්භ කර තිබෙනවා. මේ රටේ රාජ්‍ය ආයුධ, ත්‍රස්තවාදීන් ළඟ තිබුණු ආයුධ බොහොමයක් මේ සමහර පවුල්වල අය ළඟ තිබෙනවා; ජනාධිපතිවරුන්ගේ පුත්තු ගාව තිබෙනවා. ඒවා අල්ලනකොට, පාතාලයට එරෙහිව සටන් කරනකොට, ගිහිල්ලා ජාත්‍යන්තරයේ සැඟවී සිටින පාතාලය ගෙනෙන කොට, කුඩු නායකයින් ගෙනෙනකොට මෙතැන නළියනවා. ඒජන්තයෝ ටික නළියනවා. ඒවායේ හවුල්කාරයෝ නළියනවා. අපි මේ රටේ වංචාවට, දූෂණයට එරෙහිව මහා සටනක් දියත් කර තිබෙනවා. හොරු අල්ලනවා. නඩු වැටෙනවා. අධිකරණ අලුතින් ඇති වෙනවා. එතකොට මෙතැනට ඇවිත් නළියනවා.

මේ රටේ කුඩු මුදලාලි කෙනෙක් ආණ්ඩුවට විරුද්ධ වනවා අපට පෙනෙනවාද? පාතාලයේ කෙනෙකු විරුද්ධ වෙනවා පෙනෙනවාද? ඒවා පෙනෙන්නේ නැහැ නේ. පෙනෙන්නේ නැත්තේ කඩතුරාවකින් වැහිලා තිබෙන නිසා. කුඩුකාරයා සමහර වෙලාවට ඉන්නේ සුදු ඇඳගෙන, සුද්දවන්තයෙක් වාගේ. සමහරවිට මන්ත්‍රී ආසනයේ ඉන්නේ. සමහරවිට කුඩුකාරයාගේ ඒජන්තවරු, නියෝජිතයෝ පූජ්‍ය පක්ෂය ලෙසින් එනවා.

[ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා]

එතකොට මිනිස්සු සාදුකාර දෙනවා. හැබැයි, ඇත්ත ප්‍රශ්නය තිබෙන්නේ යට. එතැන තිබෙන්නේ කුඩු, එතැන තිබෙන්නේ දූෂණය, එතැන තිබෙන්නේ වංචාව, එතැන ඉන්නේ පාතාලය. මම මේ රටේ ජනතාවගෙන් ඉල්ලීමක් කරනවා, මේවා හරියට හඳුනා ගන්න කියලා. මේ රටට එරෙහි දුෂ්ට බලවේගවලට එරෙහිව අපි කටයුතු කරන කොට මෙතැන එනවා විවිධ යෝජනා දාලා නොයෙක් ඒවා කරන්න. විපක්ෂයේ කාර්යභාරය නොවෙයි ඒක. විපක්ෂයේ කාර්යභාරය විය යුත්තේ මොකක්ද? රටට විපතක් වුණේ යූඑන්පී ද, ශ්‍රී ලංකා ද, ජේවීපී ද, එන්පීපී ද කියා බලලා නොවෙයි. ඔක්කෝටමයි විපත වුණේ. ඒ නිසා ඔක්කෝම එකතු වෙන්න ඕනෑ.

මේ ආපදාව වුණේ නොවැම්බර් 26වැනි දා රාත්‍රියේ. 27වැනි දා උදේ 9.00ට ආවා, ජනාධිපතිතුමා පාර්ලිමේන්තුවේ අංක 01, කාරක සභා කාමරයට. ඇවිල්ලා ඇහුවා,"කෝ විපක්ෂ නායකතුමා?" කියලා. කට්ටිය මූණට මූණ බැලුවා, විපක්ෂ නායකතුමා නැහැ. විපක්ෂ නායකතුමනි, ජනාධිපතිතුමා ඔබතුමාට කෝල් එකක් අරගෙන කිව්වා, "ඉක්මනට එන්න, මේ කාරණය කථා කරන්න" කියලා. ඔබතුමා එනකල් seat එකේ වාඩි වුණේ නැහැ. ඔබතුමා ආවාම එක්කගෙන ගිහිල්ලා seat එකේ වාඩි වෙලා කථා කළේ. බැලුවා දැත් දිගු කරලා, එකට, එක ගමනක් යන්න. නමුත් ඒ ගමන කොහොමද යන්නේ? මෙතැන තිබෙන්නේ වෙන ප්‍රශ්නයක් නේ. විපක්ෂය විපත්තියකට මුහුණ දීලා තිබෙනවා. ඒ නිසා මම කියන්න කැමැතියි, කෙන්ද කන්ද කරලා, බිල්ලෝ මවලා මේ විධියට යන්න පුළුවන්කමක් නැති බව. විපක්ෂයේ හැසිරීම ඉතාම නරක තත්ත්වයක තිබෙනවා කියන එක මතක් කරන්න කැමැතියි.

මට නියමිත කාලය අවසන් නිසා අවසාන වශයෙන් මම මේ කාරණය කියන්න කැමැතියි. මම මේ කාරණය අපේ රටේ ජනතාවටයි කියන්නේ. ආපදා තත්ත්වය අපි විශිෂ්ට ලෙස කළමනාකරණය කරමින් තිබෙනවා. නිවාස හානි වූ අයට රුපියල් ලක්ෂ 50ක් දෙනවා කිව්වා. ඒ වාගේම ජනාධිපතිතුමාම ගිහිල්ලා කුරුණෑගල, අනුරාධපුරයේ ගෙවල් හදන්න වැඩකටයුතු පටන් ගත්තා. ළඟදීම අපි බදුල්ල දිස්ත්‍රික්කයේ මහියංගනයෙන් පටන් ගන්නවා. ඉඩම් ටික හොයලා තිබෙන්නේ. ජනතාවට දෙන්න පුළුවන් උපරිම සහන දෙනවා. මම ස්තුතිවන්ත වෙනවා, ස්වේච්ඡාවෙන්, බොහොම සද්භාවයෙන් උදව් පදව් කරපු අපේ ශ්‍රී ලාංකිකයන්ට; විදෙස්ගත ශ්‍රී ලාංකිකයන්ට; විදෙස් රටවලට; පක්ෂ -විපක්ෂ සමහර මන්ත්‍රීවරුන්ට. විපක්ෂයේ සමහර මන්ත්‍රීවරු මාත් එක්ක වලපනේ ගියා. ගිහිල්ලා වැඩ කළා. පොඩි මිනිහා එනවා. ලොකු මිනිහා වාගේ නොවෙයි. රටේ ජනතාවට විපක්ෂයේ භාවිතාව හොඳින් විග්‍රහ කර බලන්න පුළුවන්. විපක්ෂයේ භාවිතාව තුළ කුහකකම පෙනෙනවා; ක්‍රෝධය පෙනෙනවා; වෛරය පෙනෙනවා; මරිමෝඩකම පෙනෙනවා. ඒවා වළක්වාගෙන රික්තකය සම්පූර්ණ කරගෙන කටයුතු කරන යහපත් විපක්ෂයක් අවශ්‍යයි. ඔහොම හැසිරුණොත් වෙනත් විපක්ෂයකට නම් අවස්ථාවක් තිබෙනවා. හැබැයි, මේ රටේ ආණ්ඩු පක්ෂයකට රික්තකයක් නැහැ. මොකද, ආණ්ඩුව ලස්සනට කරගෙන යනවා විතරක් නොවෙයි, මේ ආණ්ඩුව ඔබතුමන්ලාට පෙරළන්න පුළුවන්කමකුත් නැහැයි කියන එකත් මම මතක් කරන්න කැමැතියි.

බොහොවින්ම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Next, the Hon. Sajith Premadasa. You have 14 minutes.

[පූ.භා. 11.34]

**ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ රටේ සාමාන්‍ය සම්ප්‍රදාය අනුව ජනතා සේවාවන් ඉෂ්ට කරන්නේ රාජ්‍ය බලය ලැබුණායින් පසුවයි. විශේෂයෙන්ම පවතින රජයට නොතේරෙන කාරණාවක් තමයි, මෙවර ආපදාවේදී සියලුදෙනාම එකතු කරගෙන විපතට පත් වුණු අයට සහන ලබා දීමට අපි හැම ආකාරයකින්ම කටයුතු කළා කියන එක.

මට පෙර කථා කළ අමාත්‍යවරයා අසාධාරණ විවේචන රැසක් එල්ල කළා කියලා මම හිතනවා. මම දන්නේ නැහැ, එතුමාට මේක පරිවර්තනයේදී අමතක වීමක් වුණාද කියලා. එක්සත් ජාතීන්ගේ ප්‍රධානියා කිව්වේ, රජයේ ආපදා කළමනාකරණය ගැන නොවෙයි; මේ ආපදාව හමුවේ එතුමාගේ රටේවත් මිනිසුන්ගේ මේ වාගේ එකමුතුභාවයක් ඇති වුණු තත්ත්වයක් එතුමා දැකලා නැහැ කියන එකයි. එක්සත් ජාතීන්ගේ ප්‍රධානියා කිව්වේ, ජනතාවගේ එකමුතුභාවය ගැනයි; රජයේ කාර්ය භාරයේ කාර්යක්ෂමතාව ගැන නොවෙයි. මා හිතන්නේ, පරිවර්තනයේදී මොකක් හෝ ගැටලුවක් වෙලා තිබෙනවා. ඒකට ඉතින් ඒ ඇමතිතුමාට වග කියන්න බැහැ. ඒකට වග කියන්න ඕනෑ අපේ රටේ යල්පැන ගිය අධ්‍යාපන ක්‍රමයයි. ඒක වෙනම කතන්දරයක්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි මෙහිදී කරුණු කීපයක් පැහැදිලිව පෙන්වා දෙනවා. සහන ලබා දීම; එනම් උන් හිටි තැන් අහිමි වුණු ජනතාවට නිවාස ලබා දීම, ඉඩ කඩම් ලබා දීම, පූර්ණ හානි, අර්ධ හානි ආදි සියල්ලට අදාළ සහන ලබා දීම අද ඉතා මන්දගාමී ආකාරයටයි ක්‍රියාත්මක වන්නේ.

මීට පෙර කථා කරපු ඇමතිවරයා කිව්වා, මේ විනාශය සිදු වුණු මොහොතේම ජනාධිපතිවරයා මට දුරකථන ඇමතුමක් දුන්නා කියලා. ඔව්, එතුමා දුරකථන ඇමතුමක් දුන්නා. එතුමා කමිටු කාමරයේ ඉඳගෙන මේ සභා ගර්භයේ හිටපු මට දුරකථන ඇමතුමක් දුන්නා. නමුත්, මේ ඇමතිතුමා පෙන්වන්න හැදුවේ අපි ඒ වෙලාවේ වෙනත් තැනක සිටියා කියලායි. ජනාධිපතිවරයා කමිටු කාමරයේ ඉඳගෙන දුරකථන ඇමතුම දෙනකොට අපි ක්ෂණිකවම එතැනට ගියා; කරන්න ගිය දේවල් ටික ඔක්කෝම නතර කරලා එතැනට ගියා. ඒ ඇයි? මේ ආපදාවට එකමුතුභාවයෙන් මුහුණ දිය යුතු නිසා.

මා ළඟ මේ තිබෙන්නේ, 2005 අංක 13 දරන ශ්‍රී ලංකා ව්‍යසන කළමනාකරණ පනත. ගරු ඇමතිතුමනි, මම ඔබතුමාගෙන් අහනවා, මෙහි 11වන වගන්තිය බලාත්මක කළේ නැත්තේ ඇයි කියලා. හදිසි තත්ත්වයක් ප්‍රකාශයට පත් නොකළේ ඇයි? කළමනාකරණය අතින් ඔච්චර ඉහළ මට්ටමක සිටියා නම්, එය ප්‍රමාද වුණේ ඇයි? පනතේ 11වැනි වගන්තිය යටතේ ව්‍යසන තත්ත්වයක් ප්‍රකාශයට පත් කළා නම්, 12වැනි වගන්තිය යටතේ ලබා දිය යුතු පහසුකම්, උපකරණ ආදි සියල්ලක්ම ලබා දීම ඉක්මනින් ක්‍රියාත්මක වෙනවා; ඒ ඔක්කෝම ක්‍රියාත්මක වෙනවා. නමුත් ඒක කළේ නැහැ, දින ගණනාවක් යනකල්. ඔන්න, ඔබතුමන්ලාගේ කළමනාකාරිත්වයේ දක්ෂතාව.

ඒ වාගේම, පූර්ණ නිවාස හානි සඳහා රුපියල් ලක්ෂ 50ක් දෙනවා කිව්වා, අර්ධ නිවාස හානි සඳහා රුපියල් ලක්ෂ 25ක් දෙනවා කිව්වා. අඩුම ගණනේ මරණයක් වෙනුවෙන් ලබා දෙන රුපියල් ලක්ෂ 10 වන්දි මුදලවත් සම්පූර්ණයෙන් දීලා

තිබෙනවාද? අපට ලැබී තිබෙන තොරතුරුවලට අනුව ඉතාම අඩු පිරිසකටයි එය දීලා තිබෙන්නේ. මරණ සිදු වුණු පවුල්වලට තවමත් දීලා තිබෙන්නේ රුපියල් ලක්ෂයයි. සුළු පිරිසකට දීලා තිබෙනවා, ඊට වඩා වැඩි මුදලක්.

කුලී නිවාසවලට යන අයට key money දීලා තිබෙනවාද? උත්තර දෙන්න. අවදානම් තත්ත්වය තිබුණත් කඳවුරුවල ඉන්න අයට දැන් කියනවා, ආපහු ගෙවල්වලට යන්න කියලා. ඉතින් පුදුමයක් නොවෙයි නේ කඳවුරු ප්‍රමාණය අඩු වෙනවා කියන එක. ඒ අයට තිරසර විසඳුමක් අවශ්‍යයි. කෝ, තහඩුවක් ගියත් ලබා දෙනවා කියපු රුපියල් ලක්ෂ 10? දෙනවාද, තහඩුවකට ලක්ෂ 10ක්?

මෙහිදී ඔබතුමන්ලා කටයුතු කරන්නට ඕනෑ වෙනස් ආකාරයකටයි; චෝදනා මුඛයෙන් නොවෙයි. මහා නාය යෑම් ඇති වෙලා, මහා ගල් පෙරළිලා, සමහර ගල් අතර මහ රූඩී තිබෙන කොට ඔබතුමන්ලාම කිව්වා නේ, "පස් ටිකක් දාලා මේ වැඩේ ෂේප් කර ගන්න පුළුවන්" කියලා. ඒවාද විද්‍යාත්මක නිගමන කියලා මම අහන්න කැමැතියි.

මම ඔබතුමාට විශේෂ කාරණයක් කියන්න කැමැතියි, ගරු ඇමතිතුමනි. රජය දුන්නු පොරොන්දු වට්ටෝරුවක් තිබෙනවා. මෙන්න මා ළඟ තිබෙනවා, ඒ වට්ටෝරුව. හැබැයි, මේ පොරොන්දු ක්‍රියාත්මක කරන්නට නිසි ක්‍රමවේද සකස් කරලා නැහැ. ඒ නිසා ග්‍රාම නිලධාරිවරු කියනවා, මේ කියන සහන ටික මේ විධියට දෙන්න අමාරුයි කියලා; ඒ චක්‍රලේඛවල, රෙගුලාසිවල අඩු පාඩුකම් තිබෙනවා කියලා. ඒ අයගේ සංගම් යොමු කරපු ලිපි දෙකක් මම මේ අවස්ථාවේදී **සභාගත*** කරනවා.

ග්‍රාම නිලධාරීන් විතරක් නොවෙයි, ප්‍රාදේශීය ලේකම්වරුත් ඒ බව කියා තිබෙනවා. ඒ තරමටම ඔබතුමන්ලා අකාර්යක්ෂමද? අරක දෙනවා, මේක දෙනවා කියලා ලොකු වට්ටෝරුවක් ඉදිරිපත් කරලා අවසානයේ රෙගුලාසි ටික සකස් කර ගන්න බැහැ. ග්‍රාම නිලධාරිවරු කියනවා, ප්‍රාදේශීය ලේකම්වරු කියනවා, මේ රෙගුලාසි හරහා ඔය කියන දේවල් දෙන්න බැහැ කියලා. ඒ අය ඉදිරිපත් කරපු ලිපි දෙකක් මම සභාගත කළා. මොකක්ද, ඔබතුමන්ලා ඒකට දෙන උත්තරය? ඔබතුමන්ලාගේ දක්ෂතාව ඒකද කියා මම අහන්න කැමැතියි. මම රජයෙන් ඉල්ලා සිටිනවා, දෙනවා කියපු සහන ටික කරුණාකර ඒ විධියටම දෙන්න කියලා; තහඩුවක් ගියත් දෙනවා කියපු රුපියල් ලක්ෂ 10, දෙනවා කියපු රුපියල් ලක්ෂ 25, රුපියල් ලක්ෂ 50 දෙන්න කියලා. ඒ සියල්ලක්ම දෙන්න. ඕවා දෙනවා කියලා නේ රුපියල් බිලියන 500ක් පාර්ලිමේන්තුවෙන් අනුමත කරවා ගත්තේ. ඒ සහන ලබා දීම ක්‍රියාත්මක කරන්න. ඉඩමක් නැත්නම්, ගෙයක් වෙනුවෙන් දෙන රුපියල් ලක්ෂ 50ට අමතරව ඉඩම ගන්නත් ලක්ෂ 50ක් දෙනවා කිව්වා; ඒ විධියට රුපියල් ලක්ෂ 100ක් දෙනවා කිව්වා. කිව්වාද, නැද්ද? කෙරෙනවාද, වැඩේ? ඒවා ලබා දෙන්න. අපි දෙන්නම් අපේ සහයෝගය. ඔබතුමන්ලා කියනවා නේ, අපි සහයෝගය දෙන්නේ නැහැ කියලා. අපි සහයෝගය දුන්නු ආකාරයත් මම ඔබතුමන්ලාට කියන්නම්.

මම පැහැදිලිවම එකක් කියන්න ඕනෑ. මේ රටේ තිබෙන මේ ආපදා කළමනාකරණ ක්‍රමය සහමුලින් වෙනස් කරන්න ඕනෑ. ඒකේ චෝදනාව මම ඔබතුමන්ලාගේ රජයට විතරක් කරන්නේ නැහැ. ඒකේ චෝදනාව අපිත් භාර ගන්නවා. සුනාමි ව්‍යසනයෙන් මිනිස්සු 35,000ක්, 38,000ක්, 40,000ක් පමණ මිය ගිහිල්ලාත් අපි සුනාමියෙන් පාඩමක් ඉගෙන ගත්තේ නැහැ. අපට බැරි වුණා, පැවැති අඩු පාඩුකම් හඳාගෙන ඉදිරියට යන්න. "අපට" කියන්නේ, අප හැමෝටම; පැවැති ආණ්ඩු ඔක්කෝටම. ආපදා කළමනාකරණ ක්ෂේත්‍රය මේ එක එක ඇමතිවරුන්ගේ අමාත්‍යාංශවල එල්ලන්නේ නැතිව, ජනාධිපතිවරයා ළඟ තබා ගන්නේත් නැතිව වහාම ක්‍රියාත්මක වන පරිදි ඒ වෙනුවෙන් වෙනමම කැබිනට් අමාත්‍යාංශයක් හදන්න. ව්‍යසන කළමනාකරණය පිළිබඳ අලුත් පනතක් නිර්මාණය කරන්න; අලුත් ආයතන නිර්මාණය කරන්න; තිබෙන ආයතන ශක්තිමත් කරන්න.

මම මේ අවස්ථාවේ මේ කාරණයත් කියන්න ඕනෑ. මේ ව්‍යසනයේදී ඇත්ත වශයෙන්ම විශිෂ්ට සේවාවක් ඉෂ්ට කරපු අපේ රටේ රාජ්‍ය නිලධාරීන්, රණවිරුවන්, මහජනතාව ඇතුළු සියලුදෙනාට අපේ ස්තුතිය පුද කරනවා. ඒ වාගේම, ආධාර උපකාර කරපු දෙස් විදෙස් ආයතනවලට, රටවලට, සංවිධානවලට, ඒ සියලුදෙනාට අපි ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව, ගොඩනැඟිලි පර්යේෂණ ආයතනය, භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය ඇතුළු මේ ක්ෂේත්‍රයට සම්බන්ධ ආයතන සියල්ල කැප කිරීම් කළා. ඒ විශිෂ්ට ආයතන, විශිෂ්ට පුද්ගලයන්, විශිෂ්ට රාජ්‍ය සේවකයන්, විශිෂ්ට රණවිරුවන්, විශිෂ්ට පුරවැසියන් ඇතුළු සියලුදෙනාට අපේ ශීර්ෂ ප්‍රණාමය පුද කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, හැබැයි අපේ රටේ Doppler Radar system එකක් ස්ථාපනය කරන්න තවමත් බැරි වෙලා තිබෙනවා, සුනාමි ව්‍යසනයෙන් ජීවිත 35,000ක්, 38,000ක් පමණ අහිමි වෙලා තිබියදීත්. මීට මාස කීපයකට ඉස්සෙල්ලා ජපන් ආධාර යටතේ පුත්තලමේ එම කටයුත්ත ආරම්භ කළා.

ඒක හොඳ දෙයක්. ඉක්මනින්ම පොතුවිල් එකත් ආරම්භ කරමු. සුනාමියෙන් ඉගෙන ගත්තේ නැති පාඩම් ටික මේකෙන් ඉගෙන ගෙන අපි ඉදිරියට යමු. ආයෙත් විනාශයක් වෙනකම් ඉන්නේ නැතිව මේ ව්‍යසන කළමනාකරණ පනත, මේ යන්ත්‍රණය ඇතුළු සියල්ලක්ම වෙනස් වෙන්නට ඕනෑ; ඒවා අලුත් වෙන්නට ඕනෑ. ඒවාට අවශ්‍ය උපකරණ ටික ලබා දෙන්නට ඕනෑ. කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ, භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ, ගොඩනැඟිලි පර්යේෂණ ආයතනයේ, ආපදා කළමනාකරණ ක්ෂේත්‍රයේ ඉන්න ඒ විශිෂ්ට නිලධාරීන්ට ලබා දිය හැකි උපරිම ශක්තිය, නවීන තාක්ෂණය, උපරිම සහයෝගය ලබා දෙන්නට කටයුතු කරමු කියා මම මේ අවස්ථාවේ යෝජනා කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ අවස්ථාවේ ජාත්‍යන්තර ආධාරක සමුළුවක් කැඳවන්න කියලා පුන පුනාම අපි ප්‍රකාශ කළා. "අනේ, please, ඕනෑ නැහැ" කිව්වා. අපට ජාත්‍යන්තර ආධාරක සමුළුවක් අවශ්‍ය නැද්ද? මේ ව්‍යසන තත්ත්වය තුළ රටත්, ජනතාවත්, රජයත් අපහසුතාවට පත් කරන්නට නම් අපි ඒ වාගේ යෝජනාවක් කරනවාද? ඇයි ජාත්‍යන්තර ආධාරක සමුළුවක් කැඳවන්නේ නැත්තේ? ඒ අපි යෝජනා කරපු නිසාද? හරි, අපි කළ යෝජනාව ඉවත් කරගන්නම්. ඔබතුමන්ලා දැන් යෝජනාවක් කරන්නකෝ, ඒක රජයේ යෝජනාවක් කියලා. එහෙම කරලා හරි වැඩේ කරන්නකෝ. ඒක අපි කියපු හින්දා වෙන්න ඇති නේ ප්‍රශ්නය තිබෙන්නේ. ඒක රජයේ යෝජනාවක් හැටියට ඉදිරිපත් කර ගන්නකෝ.

ඊළඟ කාරණාව වැදගත්ම කාරණාවක්. මහ බැංකුවේ අධිපතිතුමා ඊයේ පෙරේදා කිව්වා, අලුත් IMF ගිවිසුමකට යන්න ඕනෑ කියලා. දැන් තමයි තේරිලා තිබෙන්නේ IMF කොන්දේසි ටික වෙනස් කරගන්නට ඕනෑ කියලා.

* **පුස්තකාලයේ තබා ඇත.**
* நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.
* *Placed in the Library.*

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

ගෝලීය ආර්ථික අපේක්ෂා පිළිබඳව 2026 ජනවාරි මස නිකුත් කරන ලද ලෝක බැංකු වාර්තාවේ දකුණු ආසියාවට අදාළ කොටස මම දැන් **සභාගත*** කරනවා.

ඒ අනුව 2026 වර්ෂයේත්, 2027 වර්ෂයේත් අපේ රටේ ආර්ථික වර්ධන වේගය පහළ වැටෙනවා. 2026දී සියයට 3.5ට පහළ වැටෙනවා. 2027දී සියයට 3.1ට පහළ වැටෙනවා. මම ප්‍රාර්ථනා කරනවා, ලෝක බැංකුවේ දත්ත වරදින්න කියලා. වැරදිලා, මේ ආර්ථික වර්ධන වේගය ඉහළ අගයක් වේවා කියලා මම ප්‍රාර්ථනා කරනවා. නමුත් අපේ රට ආධාර ලබා ගන්නා ආයතනයක්, ණය ලබා ගන්න ආයතනයක් මඟින් තමයි මේ ගණන් පුරෝකථනය කරන්නේ. මෙහෙම ආර්ථික වර්ධන වේගයක් තුළ 2028 අවුරුද්දකට ඇමෙරිකානු ඩොලර් බිලියන 4 - 4.5 අතර ප්‍රමාණයක ණය ගෙවන්න පුළුවන්ද? ඇයි තවත් බලාගෙන ඉන්නේ? ඇයි IMF එකත් එක්ක කථා කරන්නේ නැත්තේ? අපට ආරංචියි, ලබන සතියේ විතර IMF delegation එකක් එනවා කියලා. ඔබතුමන්ලා යෝජනා කරනවා නම්, අපිත් හමුවෙන්නම් IMF delegation එක. අපිත් ඒ අය හමුවෙලා මේ ගැන කියන්නම්, ඔබතුමන්ලාට කියන්න බැරි නම්.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Leader of the Opposition, you have two more minutes.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
I am taking some more time, Sir.

ඔබතුමන්ලාට කියන්න අමාරු නම්, ඔබතුමන්ලාට කියන්න බැරි නම් අපි කියන්නම්. ඒකටත් "අනේ, please, එපා" කියනවා නම් නොකර ඉන්නම්. හැබැයි, ඔබතුමන්ලාට විපක්ෂයේ සහයෝගය අවශ්‍ය නම්, මේ IMF ගිවිසුමේ කොන්දේසි ටික ලිහිල් කරලා ඉදිරියට යන්න අපේ සහයෝගය දෙන්නම්. රට වෙනුවෙන් අපි දෙන්නම් සහයෝගය. ඒකටත් කියනවාද, "අනේ, please, එපා" කියලා. කියනවා නම් මන්ත්‍රීවරයාගේ නමත් එක්ක නැඟිටලා කියන්නකෝ "අනේ, please, එපා" කියලා. කොන්දක් තිබෙනවා නම් කියන්නකෝ. මම විශේෂයෙන් ඉල්ලීමක් කරනවා, ඒ ඉල්ලීම ඉටු කරන්න කියලා.

අපි ඊයේ සහභාගි වුණා, රජයෙන් ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණයේ කර්මාන්තකරුවන්ට ලබා දෙන ණය යෝජනා ක්‍රම පිළිබඳ විග්‍රහයට. ඒක හොඳ වැඩක්. අපි හොඳ දේට හොඳයි කියනවා. හැබැයි, එතැන බරපතළ ප්‍රශ්නයක් තිබෙනවා. ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණයේ කර්මාන්තකරුවන්ගෙන් සියයට 50කට වැඩිය ඉන්නේ CRIB එකේ; ඒගොල්ලන් blacklist කරලා. ඒ අය මහා ණය කන්දරාවක, පොලී කන්දරාවක, ප්‍රාග්ධන කන්දරාවක හිරවෙලා ඉන්නේ. ඒ නිසා මෙන්න මේ අයට විසඳුමක් ලබා දෙන්න. ඒ අයට බේදවාචක හතරකට -පාස්කු ප්‍රහාරය, කොවිඩ් වසංගතය, බංකොලොත්භාවය, "දිට්වා" සුළි කුණාටුව කියන හතරට- මුහුණ දෙන්න සිදු වුණා.

---

*** පුස්තකාලයේ තබා ඇත.**
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

මම හිතන විදියට, ඒක වසර 6ක්, 7ක් අතරතුර අවස්ථා හතරක සිදු වුණු මහා පීඩනයක්. අපේ රටේ දළ දේශීය නිෂ්පාදිතයට සියයට 52ක දායකත්වයක් ලබා දෙනවා, ලක්ෂ 45කට ආසන්න ප්‍රමාණයකට ජීවනෝපාය සපයනවා, ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණයේ කර්මාන්තකරුවන්. දැන් non-performing loans ඇති සමහරුන්ගේ - CRIB එකේ ඉන්න අයගේ - එකතු වෙලා තිබෙන පොලිය - accumulated interest එක - වැඩියි, ගෙවන්න තිබෙන ප්‍රාග්ධනයටත් වඩා. හැබැයි ඔබතුමන්ලා ඊයේ ඉදිරිපත් කරපු වැඩසටහන්වල ඒවාට විසඳුමක් නැහැ. ඒ වැඩසටහන් හොඳයි. නමුත් සියයට 50ක් වන ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණයේ කර්මාන්තකරුවන් ගැන හොයලා බලන්න. NPLවල ඉන්න අය ගැනත් හොයලා බලන්න.

ගරු ඇමතිතුමනි, දැන් ඔබතුමා යම් කාරණයක් කිව්වා, වතු කම්කරු ජනතාව ගැන. අනේ ඇමතිතුමෝ, "වතු කම්කරු" කියන්න එපා, "වතු ප්‍රජාව" කියන්න. වතු කම්කරු කියන වචනය පාවිච්චි කළාම ඒගොල්ලෝ නිකම් පහළ දැමීමක් වෙනවා. ඔවුන් වතු ප්‍රජාව; උඩරට මලෙයහම් ප්‍රජාව. වතු කම්කරු කියලා කියන්නේ නැතුව වතු ප්‍රජාව කියන එක පාවිච්චි කරන්න. ගරු ඇමතිතුමනි, ඔබතුමා කිව්වා නේ, වතු කම්කරුවන්ට දෛනිකව රුපියල් 1,750ක් දෙනවාට විරුද්ධ වුණා කියලා. කවුද විරුද්ධ? කවුද විරුද්ධ අපේ පැත්තේ? කිසිම කෙනෙක් විරුද්ධ නැහැ. මම ඒක වගකීමෙන් කියන්නේ. අපි කියන්නේ රුපියල් 1,750න් ඔබ්බට ගිහිල්ලා, හැම ඡන්දේ කාලයකම රුපියල් 1,500ක්, 1,750ක්, 2,000ක්, 2500ක් දෙනවා කිය කියා ඉන්නේ නැතුව, ඉඩම් අයිතියට සමානුපාතික නොවන ආකාරයට මේ රටේ තේ නිෂ්පාදනයට විශාල දායකත්වයක් ලබා දෙන, හැම දාම ලැයිම් කාමරවල ළතැවෙන මේ රටේ වතු ප්‍රජාවයි, රැකියා විරහිත තරුණ ප්‍රජාවයි කුඩා තේ වතු හිමියන් බවට පත් කරන්න කියලායි. ඒ සඳහා වගා නොකරපු මුඩු ඉඩම් ටික ඒ අයට බෙදලා දෙන්න. රුපියල් 1,750 ගැන ළතැවෙන්න කියන එක නොවෙයි කියන්නේ. වතු ප්‍රජාවට දෛනිකව රුපියල් 1,750 ලබා දෙන එක හොඳයි. ඒක කරන්න. ඉන් ඔබ්බට ගිහිල්ලා වගා නොකරන ඉඩම් ටික ඒ අයට ලබා දීලා ඒ අයගේම නිවසක් හදාගෙන කුඩා තේ වතුහිමියන් හැටියට අපේ රටේ තේ නිෂ්පාදනයට දායකත්වය ලබා දීමට අවස්ථාව ලබා දීම අපේ ප්‍රතිපත්තියයි කියන එක මම මේ අවස්ථාවේ ප්‍රකාශ කරන්න කැමැතියි.

ගරු ඇමතිතුමනි, දැන් ඔබතුමා කිව්වා නේ, හෙලිකොප්ටර ගමන් ගැන. කිව්වා නේද? ඇත්තවශයෙන්ම ආපදාවකදී හෙලිකොප්ටර පාවිච්චි කරලා සහන ලබා දීම, අනෙකුත් පහසුකම් ලබා දීම නිවැරදි දෙයක්. මම මේ අවස්ථාවේ මේ කාරණයත් මතක් කරන්න ඕනෑ. මේ ආපදා කළමනාකරණයේදී වීරෝදාර ගුවන් නියමුවෙකුගේ ජීවිතය අහිමි වුණා. එතුමා ගුවන් නියමුවකු හැටියට කටයුතු කරද්දී මමත් එතුමාත් එක්ක ගිහිල්ලා තිබෙනවා. එතුමා මගේ පෞද්ගලික හිතවතෙක්. නමුත් ජනතාව ගැන හිතලා ගත්තු ක්‍රියාමාර්ග නිසා නිර්මාල් මහත්මයාගේ ජීවිතය අහිමි වුණා. මම ඒක මේ අවස්ථාවේ විශේෂයෙන් මතක් කරන්න ඕනෑ. ඒ වාගේම, මේකෙදි අපේ රණවිරුවන් කිහිපදෙනෙකුගේ ජීවිත අහිමි වුණා, ස්වේච්ඡාවෙන් උදව්වට ආපු ජනතාවගේ ජීවිත අහිමි වුණා. අපි එය මතක් කරනවා බොහොම සංවේදීව. ගරු ඇමතිතුමනි, ඔබතුමා මට කියන්නකෝ, හෙලිකොප්ටරය පාවිච්චි කරලා මඩකලපුවට ගිහිල්ලා මල්වතු ඔය මඩකලපුවෙන් මහ මුහුදට යනවා කියලා කියන එකෙන් ප්‍රයෝජනයක් තිබෙනවාද කියලා? ඒක හරිද? ඒවාට හෙලිකොප්ටර පාවිච්චි කරන එක හරිද? මඩකලපුව තිබෙන්නේ කොහේද, මල්වතු ඔය තිබෙන්නේ කොහේද? හෙලිකොප්ටර භාවිත කරලා විවිධ ආධාර උපකාර කිරීම ඉතා වැදගත්.

අවසාන වශයෙන් මම කැමැතියි, මේ කාරණයත්. ඒ වැදගත් ක්‍රියාවත් සමඟ මේ කටයුත්තත් කරන්න ඕනෑ කියලා අනාගතවාදී යෝජනාවක් කරන්න. අනාගතවාදී යෝජනාවක් කරනකොට අපේ රටේ බොහොම සුප්‍රසිද්ධයි, "හා, හා" කියන එක, විහිළු කරන එක. හැබැයි ඉතින් ආපදාවක් ආවාම හැමෝම අඬනවා, හැමෝම කනගාටු වෙනවා. ඒ නිසා මම කියන්න කැමැතියි, ඉතාම ඉක්මනින් ලෝකයේ ක්‍රියාත්මක වෙන සෙන්ඩායි ව්‍යුහය - Sendai Framework එක - ක්‍රියාත්මක කරන්න ඕනෑ කියලා. ආපදා කළමනාකරණය සඳහා ලොවම පිළිගත් ප්‍රශස්තම ක්‍රමය වන සෙන්ඩායි ක්‍රමය සඳහා අපිත් ගිවිසුම්ගත වෙලා තිබෙනවා. එය ක්‍රියාවට නංවන්න අපි කටයුතු කරමු.

අපි හියෝගෝ කියන රාමුවේ - Hyogo Framework එකේ - ඉඳලා සෙන්ඩායි කියන රාමුවට අත්සන් තබා තිබෙනවා. හැබැයි, අත්සන් තබා තිබෙනවා විතරයි. අපිට බැරි වෙලා තිබෙනවා, එය සජීවීකරණය කරන්න; ඒක ක්‍රියාත්මක කරන්න. ඒකේ අරමුණු මොනවාද? ආපදාවකදී මරණ අඩු කිරීම, බලපෑමට ලක් වන ජනතාව අඩු කිරීම, දළ දේශීය නිෂ්පාදිතයට බලපාන ආර්ථික හානිය අඩු කිරීම, යටිතල පහසුකම්වලට සිදු වන හානිය අවම කර ගැනීම, ආපදා අවදානම අවම කිරීමේ - disaster risk reduction - උපාය මාර්ග නිර්මාණය කිරීම, ආපදා අවදානම අවබෝධ කර ගැනීම, ආපදා අවදානම් පාලනය ශක්තිමත් කිරීම, ඔරොත්තු දීමේ හැකියාව උදෙසා ජාතික හා පළාත් පාලන ආපදා අවදානම් අවම කිරීමේ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කිරීම යනාදියයි. මේක තමයි Sendai Framework එක. අලුත් පනත හදනකොට, අලුත් ව්‍යුහය හදනකොට, අලුත් වැඩ පිළිවෙළ හදනකොට මේ Sendai Framework එකේ ගුණාංග කේන්ද්‍රගත කරගෙන අපි ඒ වැඩේ කරමු. ආපදා කළමනාකරණයට අලුත් කැබිනට් අමාත්‍යාංශයක් හදමු, මේ එක එක්කෙනාගේ අමාත්‍යාංශවල මේවා එල්ලන්නේ නැතුව. අලුත් ව්‍යුහයක් හදමු, අලුත් යන්ත්‍රණයක් හදමු.

ගරු සමන්ත විද්‍යාරත්න ඇමතිතුමනි, අවසාන වශයෙන් මම ඔබතුමාට තව කාරණයක් කියන්න කැමැතියි. ඔබතුමා අපව බොහොම හැල්ලුවට ලක් කළා නේ, වැඩ කොටසක් කළේ නැහැ කියලා. ඔබතුමා එහෙම කියන්නේ කොහොමද? මම ඔබතුමාට කියන්නම්, අපි කළ දේවල් ගැන. අපි දන්නා දන්නා අය හමු වෙලා, හමු විය හැකි සියලුම තානාපතිවරුන්, සියලුම මූල්‍ය ආයතන නියෝජිතයන් හමු වෙලා, ජාත්‍යන්තර මූල්‍ය ආයතන; World Bank එකද, IMF එකද, ADB එකද ඒ කියන හැම තැනටම කථා කරලා කිව්වා නේ, ලබා දිය හැකි උපරිමයෙන් ආධාර ලබා දෙන්න කියලා? නැහැයි කියනවාද? කවුරුහරි නැහැයි කියනවාද? ඕනෑ නම් මම සාක්ෂි ඉදිරිපත් කරන්නම්. ඉතින්, විපක්ෂයෙන් කාර්යභාරයක් සිදු වුණේ නැහැ කියලා ඔබතුමන්ලා කියන්නේ කොහොමද? ඒක දේශපාලන උපක්‍රමයක්, එහෙම නැත්නම් මාධ්‍ය සන්දර්ශනයක් නොවෙයි. ඇත්ත වශයෙන්ම මේ රටේ ජනතාව ගැන සැබෑ කැක්කුමක් තිබෙනවා කියන කාරණය සින්නක්කර ඔප්පුවෙන් තිබෙන්නේ ඔයගොල්ලන්ට විතරද? අපිට නැද්ද? ඔබලාට විතරයි, ජනතාව ගැන ආදරයක් තිබෙන්නේ. එහෙමද? එහෙම කථා කරන්න එපා. ඒ වාගේ කුහකකම් කරන්න එපා. පිටරට සිටින අයට අපි කිව්වාද, මේ පිහිටවපු අරමුදල්වලට සල්ලි එවන්න එපාය කියලා? කිව්වාද? අපි කිව්වේත් පුළුවන් තරම් උදවු කරන්න කියලායි.

මම ඔබතුමාට තව විශේෂ කාරණයක් කියන්න කැමැතියි. දැන් ඡන්ද කාලයක් නැහැ නේ. අපි මේ ආපදාවත් සමඟ දැනට රෝහල් 13කට ආධාර උපකාර කර තිබෙනවා. දැනට ලක්ෂ 438ක අරමුදල් කැප කරලා තිබෙනවා. ඒවා විවිධ දානපතියන්ගෙන් ලැබුණු සල්ලි. ඒවා අපේ සල්ලි නොවෙයි. විවිධ දානපතියන් සම්බන්ධ කරගෙන අපි ඒ කටයුතු කර තිබෙනවා. බදුල්ල දිස්ත්‍රික්කයේ මහියංගනය රෝහලටත් අපි උදවු කර තිබෙනවා. අපි එම රෝහලට haemodialysis machine එකක් ලබා දීලා තිබෙනවා. අපිට බැලූ බැල්මට පෙනෙනවා, ලොකුවට අඬ බෙර ගහලා ආධාර උපකාර කරන්න පටන් ගත් අය දැන් අතුරුදහන් වෙලා තිබෙන බව. අපි එහෙම අතුරුදහන් වෙන්නේ නැහැ. සමගි ජන බලවේගය, සමගි ජන සන්ධානය, ප්‍රගතිශීලී විපක්ෂය කියන අපි එහෙම අතුරුදහන් වෙන්නේ නැහැ. අපි තවම ඒ වැඩ කටයුතු කරගෙන යනවා. ඒ ආධාර උපකාර කරන්නට දානපතියන් ඉදිරිපත් වන ආකාරයට අපි ඒ යුතුකම ඉෂ්ට කරනවා. ඒ නිසා මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා, මේ රට බෙදෙන ආකාරයට කථා කරන්න එපා කියලා.

අපි අනාථ කඳවුරුවලට ගිහිල්ලා සටහන් ගන්නා එකත් හැල්ලුවට ලක් කළා. මොනවාටද, සටහන් ගන්නේ? අඩුපාඩුකම් ටික ලියා ගෙන මෙතැනට ඇවිල්ලා ඉදිරිපත් කරන්න. ඒක වරදක්ද? ඒක ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලනය නොවෙයිද? ඔන්න අපි හොර රහසේ හෝ ප්‍රසිද්ධියේ විදේශීය රටවල සිටින ශ්‍රී ලාංකිය ප්‍රජාවට, විදේශීය ආයතනවලට, මූල්‍ය ආයතනවලට, රටවල්වලට "එක ඩොලරයක්වත් මේ රටට දෙන්න එපා" වැනි දේවල් කියනවා නම්, අන්න ඒක ද්‍රෝහීකමක් ඇමතිතුමා. ඒ වාගේ ද්‍රෝහීකම් මේ ප්‍රගතිශීලී විපක්ෂය කිසිම දවසක කරන්නේ නැහැ. සක්විති රජකම දෙනවාය කිව්වත් අපි ඒ වාගේ කුහකකම්, ඒ වාගේ පාදඩ දේශපාලනය කිසිම දවසක කරන්නේ නැහැ. ඒ ගැනත් මම ඉතා පැහැදිලිවම ඔබතුමාට කියන්න කැමැතියි.

අපි මේ විවාදය හරහා අලුත් ආරම්භයක් ඇති කර ගනිමු; අලුත් ආපදා කළමනාකරණ ව්‍යුහයක්, පනතක්, වැඩ පිළිවෙළක් ඇති කර ගනිමු, විශේෂයෙන්ම සෙන්ඩායි රාමුව තුළ. මොකද, මේ climate change එක තුළ, මගේ ප්‍රාර්ථනාව නම් කවදාවත් අපේ රටට ඒ වාගේ විනාශයක් සිදු වෙන්න එපාය කියන එකයි.

නමුත් ඒ ප්‍රවණතාව වැඩියි. එහෙම නම් අපි සූදානම් වෙන්න ඕනෑ. ඒ නිසා මම අවසාන වශයෙන් කියන්න කැමැතියි, ඉන්දියාවේ ඔඩිෂා ප්‍රාන්තයෙන් පාඩමක් ඉගෙන ගන්න කියලා. 1999දී ආපු super cyclone එකෙන් ඔවුන්ට ජීවිත 10,000ක් අහිමි වුණා; ඔවුන් පාඩම් ඉගෙන ගත්තා. ඉගෙන ගෙන ඉන් පසුව 2013දී ආපු සුළි කුණාටුවෙන් ජීවිත ලක්ෂ 10ක් බේරා ගත්තා; 2019දී ආපු සුළි කුණාටුවෙන් ජීවිත ලක්ෂ 12ක්, 13ක් බේරා ගත්තා. ඒ නිසා ඉන්දියාවේ ඔඩිෂා ප්‍රාන්තයෙන් ඉගෙන ගන්න හුඟක් පාඩම් තිබෙනවා. ඒ පාඩම් ඉගෙන ගෙන, අපි හොඳ ගමනක් ඉදිරියට යමු. අපේ ප්‍රාර්ථනාව, කිසිදාක මේ වාගේ විපතක් අපේ රටට සිදු නොවේවා යන්නයි. ඒ වාගේම මේ විපත් අවස්ථාවේ දී අපට සහාය, ශක්තිය ලබා දුන් රාජ්‍ය අංශයේ සියලු නිලධාරි මහත්ම මහත්මීන්ට, රණවිරුවන්ට, දානපතියන්ට, දෙස් විදෙස් ආධාරකරුවන්ට, මූල්‍ය ආයතනවලට හෘදයකින් තොරව අපි 225දෙනාගේම ප්‍රණාමය පුද කර සිටිනවා. මුළු රටම වෙනුවෙන් විපක්ෂ නායකවරයා හැටියට අපි 225දෙනාගේම ස්තූතිය පුද කරනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Next, the Hon. (Dr.) Susil Ranasinghe. You have 11 minutes.

[මධ්‍යාහ්න 12.00]

**ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා (නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) சுசில் ரணசிங்ஹ - வீடமைப்பு, நிர்மாணிப்பு மற்றும் நீர் வழங்கல் அமைச்சர்)
(The Hon. (Dr.) Susil Ranasinghe - Minister of Housing, Construction and Water Supply)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සාමාන්‍යයෙන් මම නම් පෞද්ගලිකව විපක්ෂ නායකතුමා සිනා මුසු මුහුණෙන් ඉන්න අවස්ථා දැකලා තිබෙන්නේ සීමිතව. නමුත් එතුමාගේ කථාවේදී ලෝක බැංකුවේ පුරෝකථනයක් ගැන සඳහන් කළා. අපේ රටේ

[ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා]

ඉදිරි වසරවලදී ආර්ථික වර්ධන වේගය අඩු වෙනවාය කියලා කළ පුරෝකථනයක් ගැන සඳහන් කළා. ඒ වෙලාවේදී එතුමාගේ මුහුණ බලන්න එපා යැ; මල් හතයි! මම හිතන විධියට, මේ විවාදයේදී පළමුවැනි කථාව අපේ සමන්ත විද්‍යාරත්න ඇමතිතුමා ඉදිරිපත් කළා. එතුමාගේ කථාවේදී මේ ආපදාවට මුහුණ දීම සඳහා රජයක් විධියට, රටක් විධියට කටයුතු කරපු විධිය, ගත්ත ක්‍රියාමාර්ග ගැන කියැවුණා. ඒ වාගේම කරන්න බැහැයි කියලා පස්ස ගහපු සමහර දේවල් කරන්න අපට පුළුවන් වුණා. ඒ වාගේම අපි කොහොමද මේ ව්‍යසනයෙන් ජය ගත්තේ කියන එක සම්බන්ධයෙන් සමන්ත විද්‍යාරත්න ඇමතිතුමාගේ කථාවේදී ඉතා අග්‍රගණ්‍ය විධියට පැහැදිලි කළා. විවාදය එතැනින් -එතුමාගේ කථාවෙන්- නවත්වන්න පුළුවන්. නමුත් අපේ ආණ්ඩු පාර්ශ්වයේ කථිකයන් තවදුරටත් සංඛ්‍යා දත්ත සහිතව ඒ සම්බන්ධයෙන් සාකච්ඡා කරන්න සූදානම්.

තවත් එක කාරණයක් මම කියන්න අවශ්‍යයි. විපක්ෂ නායකතුමාගේ කථාවේදී කිව්වා, අපි සුනාමියෙන් පාඩම් ඉගෙන ගත්තේ නැහැ, අපි ඔක්කෝම එහි වගකීම භාර ගන්න ඕනෑය කියලා. ඒ වාගේම එතුමා ලෝකයේ අත්දැකීම් ගැන කිව්වා; ඉන්දියාවේ ප්‍රාන්තයකින් ඉගෙන ගන්නය කිව්වා. තවත් බොහෝ කරුණු ඉදිරිපත් කළා. නමුත් මේ ව්‍යසන කළමනාකරණ පනත පාවිච්චි කරලා ආපදාවකට මුහුණ දීම සඳහා යන්ත්‍රණයක් හදන්න බැරි වුණා නේ. එතැන තමයි ප්‍රශ්නය තිබෙන්නේ. අපි කවුරුත් දන්නවා, අපේ ඉතිහාසයේ, අපි දන්නා ඉතිහාසයේ රටක් විධියට අපි මුහුණ දුන් දැවැන්තම විනාශයක් තමයි මේ ආපදාව. දවස් කිහිපයක් ඇතුළත අපේ රටේ විදුලිය බිඳ වැටුණා; මං මාවත් කැඩුණා; කෝච්චි ධාවනය නතර වුණා; ජල සම්පාදන කටයුතු නතර වුණා; මිනිසුන්ගේ ගෙවල් ගහගෙන ගියා; නාය ගියා. පවුල් ලක්ෂ හයකට අධික සංඛ්‍යාවක් දවස් දෙක තුනක් ඇතුළත ආපදාවට ලක් වුණා; අපහසුතාවට පත් වුණා; සිය ගණනක්දෙනා මිය ගියා. දවස් දෙකක් ඇතුළත මුළු රටම ඇද වැටුණා. මුලින්ම අපට කරන්න තිබුණේ, මුදා ගැනීමේ කටයුතු. දෙවනුව අපට තිබුණේ, ජන ජීවිතය ස්ථාවර කරන්න. තෙවනුව බිඳ වැටුණු යටිතල පහසුකම් නැවත යථා තත්ත්වයට පත් කිරීම. විදුලිය වෙන්න පුළුවන්, ජලය වෙන්න පුළුවන්, මං මාවත් වෙන්න පුළුවන්, ඉතා කෙටි කාලයක් ඇතුළත අත්‍යවශ්‍ය යටිතල පහසුකම් නැවත ස්ථාපනය කරන්න තිබුණා. ඊට පස්සේ තමයි අපට හැරෙන්න සිද්ධ වුණේ, කෘෂිකර්මාන්තය ඇතුළු කර්මාන්ත බිඳ වැටීමට පිළියම් යොදන්න; ආර්ථිකයට හානියක් නොවෙන්න කටයුතු කරන්න. ඒ සියලු දේටම අපි රජයක් විධියට ඉතා හොඳින් සාර්ථකව මුහුණ දුන්නාය කියලා අපට විශ්වාසයක් තිබෙනවා. සති දෙකක් යන්නට කලින් ඒ සියලු දේවල් ස්ථාපිත කරලා, රටේ සාමාන්‍ය තත්ත්වයක් ස්ථාපිත කරන්න අපට පුළුවන් වුණා. ඒ සම්බන්ධයෙන් විපක්ෂ නායකතුමා රජයේ නිලධාරින්ට ස්තුති කළා.

හැබැයි, රාජ්‍ය යන්ත්‍රණය ක්‍රියාත්මක වන්නේ ඒ සඳහා ඇමතිවරුන් සහ ජනාධිපතිතුමා නායකත්වය ලබා දෙන නිසායි. විපක්ෂ නායකතුමාට මම කියන්න ඕනෑ, මේ ආපදාවෙන් පසුව ඇති වූ තත්ත්වයට සාර්ථකව මුහුණ දීම සඳහා ජනාධිපතිතුමාත්, ඇමතිවරුන් විධියට අපිත් රාජ්‍ය යන්ත්‍රණයට අවශ්‍ය නායකත්වය දීලා තිබෙන බව.

මේ අවස්ථාවේදී මම විශේෂයෙන් කියන්න කැමැතියි, ආපදාවෙන් හානියට පත් වුණු නිවාස ගොඩනැඟීම සඳහා වන වැඩ පිළිවෙළ සම්බන්ධයෙන්. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දැනට ලැබී තිබෙන තොරතුරු අනුව පූර්ණ වශයෙන් හානියට පත් වුණු නිවාස සංඛ්‍යාව දළ වශයෙන් 6,000ක් පමණ වනවා. අර්ධ වශයෙන් හානියට පත් වුණු නිවාස සංඛ්‍යාව 109,000ක් පමණ වනවා. දිස්ත්‍රික් වශයෙන් සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමෙන් ලැබුණු එම තොරතුරු හා දත්ත අප සතුව තිබෙනවා.

මේ වනකොට කෘෂි කර්මාන්ත හා කර්මාන්ත ක්ෂේත්‍ර සම්බන්ධයෙන් අපි සැලකිය යුතු මට්ටමක වැඩ කොටසක් කරලා තිබෙනවා. මේ වෙලාවේ අපේ ප්‍රමුඛතම කාර්යභාරය වන්නේ, කැඩී බිඳී ගිය නිවාස නැවත ගොඩනැඟීම සහ ආපදාවට පත් වූ පවුල්වලට තමන්ට කැමැති තමන්ගේම තැනක ජීවිත ගෙවා ගැනීම සඳහා වූ වැඩසටහනක් සකස් කිරීමයි. ඒ සඳහා අපි රජය විධියට කටයුතු කරනවා. මේ සඳහා ජනාධිපතිතුමාම මැදිහත් වෙලා කරුණු, තොරතුරු ලබා ගනිමින් දිස්ත්‍රික් ලේකම්වරුන් මෙහෙයවමින්, මුදල් අමාත්‍යාංශයේ නිලධාරින් මෙහෙයවමින් කටයුතු කරනවා. අපි ඒ සඳහා වැඩසටහනක් හදලා අවශ්‍ය මුදල් වෙන් කරලා තිබෙනවා.

අපි පොරොන්දු වුණා, පූර්ණ වශයෙන් හානි වුණු නිවාසයක් සඳහා රුපියල් ලක්ෂ 50ක් ලබා දෙන්න. අර්ධ වශයෙන් හානි වුණු නිවාස සඳහා මුලින් රුපියල් ලක්ෂ 5ක් අපි ලබා දෙනවා. ඊට පසුව තක්සේරුවක් කරලා රුපියල් ලක්ෂ 5කට වැඩි හානියක් වුණු නිවාස සඳහා එම තක්සේරුව මත උපරිම රුපියල් ලක්ෂ 25ක් දක්වා වන්දි ගෙවන්න අපි කටයුතු කරනවා. නිවාස හානි වුණු ජනතාව සඳහා ආධාර මුදල් ලබා දීමේ ක්‍රියාවලිය පසුගිය 9වැනි දා ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් අනුරාධපුරයේදී සහ කුරුණෑගලදී ස්ථාන 4කදී මුල්ගල් තබමින් ආරම්භ කළා. මේ වනකොට අපි දිස්ත්‍රික්ක ගණනාවක නිවාස හානි වුණු පවුල් 1,150ක් වෙත එම ආධාර මුදල් ලබා දීමේ ක්‍රියාවලිය ආරම්භ කරලා, තවදුරටත් එම කටයුතු සිදු කරමින් පවතිනවා.

පූර්ණ වශයෙන් හෝ අර්ධ වශයෙන් හානි වුණු නිවාස හිමිව තිබුණු පවුල්වලට ඔවුන් කැමැති, ඔවුන්ගේ නිවස තිබුණු තැනම නැවත පදිංචි වෙන්න පුළුවන් නම් ඒක ඔවුන්ටත් හොඳයි. ඒ වාගේම ඔවුන්ගේ ආර්ථික ජීවිතයේ යහපත වෙනුවෙනුත් ඒක හොඳයි. එහෙම තමයි අපි හිතන්නේ. පූර්ණ වශයෙන් හෝ අර්ධ වශයෙන් හානි වුණු නිවාස හිමි පවුල්වලට ඔවුන්ගේ නිවස තිබුණු තැනම නැවත පදිංචි වෙන්න පුළුවන් නම්, එතැන ආරක්ෂිතයි නම්, ඔවුන්ට එම ස්ථානවලම පදිංචි වන්න අවශ්‍ය ආධාර අපි ලබා දෙනවා. මම ඉස්සෙල්ලා කිව්වා වාගේ පූර්ණ හානි වුණු නිවාසයකට රුපියල් ලක්ෂ 50ක් ද, අර්ධ වශයෙන් හානි වුණු නිවාසවලට වන්දි ගෙවීමේ ක්‍රියාවලිය අනුව වන්දි ලබා දීලා ඔවුන් එතැන පදිංචි කරවන්න ඕනෑ.

නමුත් අපි දකිනවා, විශේෂයෙන්ම කඳුකර ප්‍රදේශවල - මධ්‍යම පළාතේ දිස්ත්‍රික්කවල - අධි අවදානම් කලාප තිබෙන බව. ජාතික ගොඩනැඟිලි පර්යේෂණ ආයතනය විසින් දැන් එවැනි ස්ථාන හඳුනාගෙන තිබෙනවා. මේ සම්බන්ධව ජාතික ගොඩනැඟිලි පර්යේෂණ ආයතනයට අධ්‍යයනය කරන්න තිබෙන්නේ තව පොඩි කොටසක්. ඒක සංකීර්ණ කටයුත්තක්. මේ වනකොටත් කණ්ඩායම් කිහිපයක් එම අධ්‍යයන කටයුතු කරමින් ඉන්නවා. කඳුකර ප්‍රදේශවල පූර්ණ වශයෙන් හානි වුණු නිවාසවල සිටි පවුල්වලට නැවත ඔවුන්ගේම ඉඩමේ පදිංචි වෙන්න බැහැ. මොකද, එය අවදානම් කලාපයක්. සම්පූර්ණයෙන්ම නිවසට හානි වෙලා තිබෙනවා, නමුත් ඔවුන් හිටපු තැන නැවත පදිංචි වෙන්න බැහැ. ඒ වාගේම සමහර නිවාසවලට අර්ධ වශයෙන් හානි වෙලා තිබෙනවා, නමුත් එම ඉඩමේම ඔවුන්ට නැවත පදිංචි වෙන්න බැහැ. මොකද, එතැන අධි අවදානම් කලාපයක්. ඊළඟට, නිවසට කිසිදු හානියක් නොවුණු පවුල් ඉන්නවා. නමුත්, එතැන නැවත පදිංචි වෙන්න බැහැ. මොකද, එතැන අධි අවදානම් කලාපයක්. ඒ නිසා අධි අවදානම් කලාපවල ජීවත් වුණු මෙන්න මේ කණ්ඩායම් තුන අපි වෙන තැනක පදිංචි කරවන්න ඕනෑ. ඒ සඳහා රජය විසින් ඉඩම් ලබා දෙන්න සූදානම්. මේ වනකොට අපි ප්‍රාදේශීය ලේකම්තුමන්ලා හරහා, දිස්ත්‍රික් ලේකම්තුමන්ලා හරහා ඒ සඳහා විකල්ප ඉඩම් හඳුනාගෙන තිබෙනවා. මම උදාහරණ කිහිපයක් කියන්නම්.

කෑගල්ල දිස්ත්‍රික්කයේ ස්ථාන 48ක මේ සඳහා අක්කර 32ක් හඳුනාගෙන තිබෙනවා. ඒ අනුව විකල්ප නිවාස ඉදිකිරීම සඳහා ඉඩම් කට්ටි 266ක් හඳුනාගෙන තිබෙනවා. නුවරඑළිය දිස්ත්‍රික්කය

ගත්තාම, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 9ක අක්කර 178ක් හඳුනාගෙන තිබෙනවා. ඒ අනුව අධි අවදානම් කලාපවල ජීවත් වුණු ජනතාවට නිවාස ඉදිකර දීම සඳහා දැනට එම ඉඩම් හඳුනාගෙන තිබෙනවා. මහනුවර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 18ක මේ සඳහා අක්කර 346ක් හඳුනාගෙන තිබෙනවා.

මාතලේ දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 11ක ඒ සඳහා අක්කර 1,225ක් හඳුනාගෙන තිබෙනවා. මේ ඉඩම් කැබලි සුදුසු පරිදි මේ ජනතාවට ලබා දෙන්න පුළුවන්. නමුත් අපි දන්නවා, සමහර දිස්ත්‍රික්කවල හැම පවුලකටම මේ ආකාරයට ගෙයක් හදාගන්න අවශ්‍ය ඉඩම් කැබැල්ලක් ලබා දෙන්න විධියක් නැති බව. මොකද, ඉඩම් සීමිතයි. විශේෂයෙන්ම මේ නාය යෑමේ අධි අවදානම තිබෙන නිසා එම ප්‍රදේශවල ලබා දිය හැකි ඉඩම් සීමිතයි. සෑම පවුලකටම ඉඩම් කැබැල්ලක් ලබා දීමට නොහැකි තැන්වල අපට සිද්ධ වනවා, එක් ඉඩමක් තෝරාගෙන ඒ අය ගෙනැල්ලා ගම්මානයක් විධියට, එහෙම නැත්නම් මහල් නිවාස විධියට එක් තැනක පදිංචි කරවන්න. අපි එහෙමත් කල්පනා කර තිබෙනවා. ප්‍රාදේශීය ලේකම්තුමන්ලා, දිස්ත්‍රික් ලේකම්තුමන්ලා එවැනි තැන් දැන් හඳුනාගෙන තිබෙනවා. එවැනි තැන්වල මහල් නිවාස විධියට හෝ ගම්මාන විධියට නිවාස ඉදිකරන්න ඕනෑ. ඒ සඳහාත් අපි සූදානම්. අපි ඒ නිවාස සංකීර්ණ ඉදිකිරීම සඳහා ඉංජිනේරුමය සැලසුම් - designs - සකස් කර, ඒ තැන්වලට ගිහින් අදාළ පරිදි මේ කටයුතු කරන්න සූදානමින් ඉන්නවා.

ඒ වාගේම තමයි, ඒ නිවාස අහිමි වෙච්ච ජනතාවට ඔවුන්ගේ නිවාසය හදාගන්නකල් නෑදෑ ගෙදරක ඉන්න පුළුවන්, එහෙම නැත්නම් කුලී නිවාසයක ඉන්න පුළුවන්. ඒ සඳහා රුපියල් 25,000ක නිවාස කුලියක් ලබා දීමේ කටයුතු ද අපි ආරම්භ කර තිබෙනවා. ඒ නිවාස කුලී මුදල බොහෝ දෙනෙකුට මේ වන විට ලබා දී තිබෙනවා; ඒවා ගෙවමින් තිබෙනවා. ඒ වාගේම තමන්ට ඉන්න නෑදෑ ගෙදරකුත් නැත්නම්, කුලියට ගන්න ගෙයක් සොයාගන්නත් නැත්නම් ඔවුන්ට මේ සුරක්ෂා මධ්‍යස්ථානවල ඉන්න පුළුවන්. ඒ පහසුකම් සපයන්නත් අපි ලෑහැස්තියි. නමුත්, මේ සුරක්ෂා මධ්‍යස්ථානවල දීර්ඝ කාලයක් රැඳෙන්න බැහැ; කවුරුවත් එහෙම රැඳෙන්න කැමැතිත් නැහැ. ඒ නිසා අපි පොලඹවන්නේ තමන්ගේ තැනක, නැත්නම් කුලී නිවසක ඔවුන්ට ඉන්න පහසුකම් සලසාගන්නයි. එහෙමත් නැත්නම්, තාවකාලික නිවාසයක ඉන්න ඕනෑය කියලා කෙනෙක් කල්පනා කරනවා නම්, අපට සිද්ධ වනවා, ඔවුන්ට තාවකාලික නිවාසයක නවාතැන් දෙන්න. එලෙස තාවකාලික නිවාස සඳහා යොදා ගන්න පුළුවන් රජයේ ගොඩනැඟිලි, පෞද්ගලික අංශයේ ගොඩනැඟිලි අපි දැන් හඳුනාගෙන තිබෙනවා. තාවකාලික නිවාස පිළිසකර කර ගැනීම සඳහා වූ වැඩ පිළිවෙළකුත් දැන් ක්‍රියාත්මක වනවා. මම ඉස්සෙල්ලා කිව්වා වාගේ අර්ධ හානි සිදු වෙච්ච නිවාස සඳහා ගෙවීම් කටයුතු ආරම්භ කර තිබෙනවා. ඉතින්, මේ විධියට මේ නිවාස නැවත ගොඩනැඟීම සඳහා වන වැඩකටයුතු අපි දැන් ආරම්භ කර තිබෙනවා.

"දිට්වා" සුළි කුණාටුවෙන් හානියට පත් වෙච්ච නිවාස නැවත ගොඩනැඟීමේදී අපි බලාපොරොත්තු වන්නේ තිබුණු නිවස එහෙමම repair කරන්න නොවෙයි. මෙහිදී අපේ බලාපොරොත්තුව වන්නේ, නැවත ගොඩනැඟීමක් තුළින් හිටපු තැනට වඩා ඉස්සරහට යන්නයි. ඒ නිසා තමයි අපි මේකට "Rebuilding Sri Lanka" කියන නම යෙදුවේ. "Rebuilding Sri Lanka" සඳහා අපි වෙනම ජනාධිපති විශේෂ කාර්ය සාධක බලකායක් පිහිටුවා තිබෙනවා. එම බලකාය මේ වනකොට දෙවතාවක් රැස්වෙලා තිබෙනවා. මේ එක් එක් කර්තව්‍යයන් සඳහා අපි අනුකමිටු හදාගෙන තිබෙනවා. ඉදිරියේදී ඒ අනුකමිටු රැස්වෙන්න නියමිතයි. ඒ අනුකමිටු හරහා පෞද්ගලික අංශය, මේ සම්බන්ධ විශේෂඥයින්, මේ සඳහා එකතු කරගත හැකි රාජ්‍ය අංශයේ නොවන සියලුදෙනාත් එකතු කරගෙන ඔවුන්ගේ දායකත්වයෙන් මේ කටයුත්ත ඉස්සරහට ගෙනයන්න අපි සූදානම්.

සුළි කුණාටුව ආපු වෙලාවේත්, ඊට පසුවත්, දීර්ඝ කාලීනවත් ක්‍රියාත්මක කරන්න ඕනෑ සැලසුම් සියල්ල අපි සකස් කර තිබෙනවා. දැන් ඒවා ක්‍රියාත්මක වෙමින් තිබෙනවා. ඒ සඳහා මුදල් වෙන් කර තිබෙනවා. ඒ සඳහා යන්ත්‍රණය හදලා තිබෙනවා. ඉදිරියේදී ආපදාවක් සිද්ධ වුණොත් ඒ වෙනුවෙන් අපි හදලා තියන්න ඕනෑ යන්ත්‍රණය මොකක්ද කියන එක සම්බන්ධයෙනුත් අපි සැලකිල්ලට භාජන කර තිබෙනවා, මේ ව්‍යසන කළමනාකරණ පනතට යන්ත්‍රණයක් එකතු කරන්නේ කොහොමද කියලා. ඒ වෙනුවෙනුත් වැඩකටයුතු ආරම්භ කර තිබෙනවා.

අද තවත් කරුණු අපේ කථිකයින්ගෙන් වාර්තා වෙයි, මේකට මුහුණ දීම සඳහා අපි වැඩකටයුතු කරන්නේ කොහොමද කියන එක සම්බන්ධයෙන්. මට කාලය ලබා දුන්නාට බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

The Hon. Kaveenthiran Kodeeswaran. You have seven minutes.

[பி.ப. 12.13]

**ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මහතා**
(மாண்புமிகு கவீந்திரன் கோடீஸ்வரன்)
(The Hon. Kaveenthiran Kodeeswaran)

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, 'தித்வா' புயலினால் ஏற்பட்ட அனர்த்தம் தொடர்பான ஒரு பிரேரணை இந்தச் சபையில் கொண்டுவரப்பட்டிருப்பதையிட்டு நான் மகிழ்ச்சியடைகின்றேன். விசேடமாக, இந்த அனர்த்தமானது இந்த நாட்டிலே மிகவும் பாதிப்பை ஏற்படுத்தியிருந்தது. இதனால் பாதிக்கப்பட்ட மக்களுக்கான நிவாரணங்கள் வழங்கப்பட்டுக்கொண்டிருக்கின்ற இந்த நேரத்திலே, அம்பாறை மாவட்டத்திலே ஆலையடிவேம்பு, திருக்கோவில், நாவிதன்வெளி, கல்முனை, அட்டாளைச்சேனை, காரைதீவு, பொத்துவில் போன்ற பிரதேசங்களின் பல இடங்களிலே வெள்ளம் மற்றும் புயலினால் ஏற்பட்ட அனர்த்தமானது பலத்த பாதிப்பை ஏற்படுத்தியிருந்ததை நான் இங்கு குறிப்பிட வேண்டும். அந்தப் பாதிப்பு ஏற்பட்ட 10-15 நாட்கள் வரை அங்கு மின்சார வசதியற்ற ஒரு நிலையும், போக்குவரத்துச் செய்ய முடியாத ஒரு துர்ப்பாக்கிய நிலையும், தொடர்பாடலை உரிய முறையில் செய்ய முடியாத ஒரு நிலையும் காணப்பட்டது. அதனால் பாதிக்கப்பட்டவர்கள் அந்தச் சந்தர்ப்பத்தில் ஏற்பட்ட அனர்த்தத்தைத் தெரியப்படுத்துவதற்கு எந்தவித வசதி வாய்ப்பும் அற்ற ஒரு சூழ்நிலை காணப்பட்டது. அனர்த்தத்தினால் பாதிக்கப்பட்டவர்கள் உரிய நேரத்திலே சம்பந்தப்பட்ட அதிகாரிகளுக்கு அறிவிக்க முடியாத ஒரு துர்ப்பாக்கிய நிலைக்குள் தள்ளப்பட்டிருந்தார்கள். ஆனால், அவர்களுக்கு ஏற்பட்ட அனர்த்தம் பற்றி அறிவிப்பதற்கு அந்த அதிகாரிகளால் குறிப்பிட்ட ஒரு குறுகிய காலக்கெடு விதிக்கப்பட்டிருந்தது. பாதிக்கப்பட்டவர்கள் அந்தக் காலத்திற்குள்ளே தமது அனர்த்தப் பாதிப்புகளைத் தெரிவிக்க வேண்டும் என்று சொல்லப்பட்டிருந்தது.

இந்த அனர்த்தத்தால் கூடுதலாகப் பாதிக்கப்பட்டவர்கள் அம்பாறை மாவட்டத்தின் ஆலையடிவேம்பு, திருக்கோவில், பொத்துவில் போன்ற பிரதேசங்களிலே இருக்கின்ற பண்ணையாளர்கள். அவர்களது கோழிகள், மாடுகள் உட்பட்ட கால்நடைகளின் இழப்பு மற்றும் ஏனைய பல விடயங்களால் அவர்கள் பாதிப்புக்கு உள்ளானார்கள். குறிப்பாகப் பண்ணையிலே இருந்த மாடுகள் இறந்தவுடன் மிருக வைத்தியரிடமோ அல்லது ஏனைய அதிகாரிகளிடமோ

[ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මහතා]

தெரிவிப்பதற்கு அவர்களுக்கு எந்தவித வசதியும் அற்ற ஒரு சூழ்நிலை காணப்பட்டது. அதனால் பாதிக்கப்பட்டவர்கள் அதிகாரிகளால் விதிக்கப்பட்ட காலக்கெடு முடிந்த குறுகிய காலத்துக்குப் பிறகுதான் தமது இழப்பை அறிவித்தார்கள். இற்றைவரை அவர்களுக்கான இழப்பீடு கொடுக்கப்படவில்லை. ஆனால், தென்பகுதிப் பிரதேசங்களில் கால நீடிப்பு மேற்கொள்ளப்பட்டு இந்த அனர்த்தத்தினால் பாதிப்படைந்த பண்ணையாளர்களுக்கு இழப்பீட்டு நிவாரணம் வழங்கப்பட்டிருக்கின்றது. எமது பண்ணையாளர்கள் மிருக வைத்திய அதிகாரிகளிடம் கேட்கின்றபோது, "உங்களது காலக்கெடு முடிந்துவிட்டது, உங்களுக்கு நிவாரணம் தரமுடியாது" என்று சொல்கிறார்கள். உண்மையிலேயே அந்தப் பண்ணையாளர்கள் மிகவும் பாதிக்கப்பட்டிருக்கிறார்கள். ஆகவே, அவர்களுக்கான நிவாரணத் தொகையைக் கொடுக்க வேண்டும்.

அதேபோல்தான் வெள்ள அனர்த்தம் ஏற்பட்டபோது பல இடங்களிலே வீடுகளுக்குள் வெள்ளம் போய் வீடுகள் சிதைவடைந்த நிலையில் பாதிக்கப்பட்டிருக்கின்றது. அந்த நிலையில் அவர்கள் உரிய நேரத்திலே அதனை அறிவிக்கமுடியாத சூழ்நிலை காணப்பட்டது. ஆனால், சம்பந்தப்பட்ட அதிகாரிகள், நீங்கள் photos எடுத்தீர்களா அல்லது எங்களுக்கு phoneஇல் தெரிவித்தீர்களா? என்று கேட்கிறார்கள். ஆனால், அந்தக் காலப்பகுதியில் அம்பாறை மாவட்டத்தில் மின்சார வசதியோ, தொலைத்தொடர்பு வசதியோ அற்ற ஒரு சூழ்நிலை இருந்தது. எங்களது பிரதிப் பாதுகாப்பு அமைச்சர் அவர்களுக்கு இந்த விடயம் சம்பந்தமாகத் தெரியும். இதனடிப்படையில் உரிய நேரத்திலே அறிவிக்காதவர்களையும் கருத்திற்கொண்டு அவர்களுக்கும் இந்த நிவாரணத்தை வழங்குவதற்கான ஏற்பாடுகளை இந்தச் சபை மேற்கொள்ள வேண்டும். ஏனென்றால், ஏனைய இடங்களிலே பதிவுகளை மேற்கொள்வதற்கான காலம் நீடித்துக் கொடுக்கப்பட்டிருக்கின்றது. அதேபோல் ஆலையடிவேம்பு பிரதேசங்களிலுள்ளவர்களுக்கும் அந்த வசதியை நீங்கள் ஏற்படுத்திக் கொடுக்க வேண்டுமென்று இந்த உயரிய சபையினூடாக ஒரு வேண்டுகோளை விடுக்கின்றேன்.

அதுமட்டுமல்ல, இப்போது ஏற்பட்ட புயல் அனர்த்தத்தைப் பற்றி நீங்கள் கதைத்துக் கொண்டிருக்கின்றீர்கள். ஆனால் அம்பாறை மாவட்டத்திலே திருக்கோவில் மற்றும் காரைதீவு ஆகிய இரண்டு பிரதேசங்கள் கடலரிப்பினாலே அழிவடைந்து போகின்ற துர்ப்பாக்கிய நிலைக்குத் தள்ளப்பட்டிருக்கின்றது. குறிப்பாக, திருக்கோவில் பிரதேசம் கிட்டத்தட்ட 200-300 மீற்றர் தூரம் கடலலைகளினால் மண் அரிக்கப்பட்டு அழிவுக்குள்ளாக்கப்பட்டிருக்கின்றது. அதேபோல், காரைதீவுப் பிரதேசமும் கடலரிப்பினாலே அழிவடைந்துகொண்டு போகின்றது. அவற்றைப் பாதுகாப்பதற்கான எந்த நடவடிக்கையையும் இந்த அரசு எடுக்கவில்லை. கல் அணையைப்போட்டு அந்தப் பிரதேசங்களில் கடலரிப்பைத் தடுங்கள் என்று இந்த உயரிய சபையினூடாகப் பல தடவை கோரியிருக்கின்றோம்.

அந்த மக்களின் வாழ்வாதாரம் பாதிக்கப்பட்டிருக்கின்றது; அவர்கள் பாரிம்பரியமாக வழிபட்டு வந்த ஆலயங்கள் அழிவடைந்திருக்கின்றன. குறிப்பாக, திருக்கோவிலில் இருக்கின்ற மயானத்தில் அடக்கம் செய்யப்பட்ட பூதவுடல்கள் கடலலைகளினால் அள்ளுண்டு கடலுக்குள் செல்கின்றன. அதேபோல்தான் மாளிகைக்காட்டில் இருக்கின்ற மயானத்தில் அடக்கம் செய்யப்பட்ட ஜனாஸாக்கள் கடலரிப்பின் காரணமாகக் கடலுக்குள் அள்ளுண்டு போகின்றன. தங்களுடைய உறவுகளை இழந்திருக்கின்றவர்கள் அவர்களை இறுதியாக அடக்கம் செய்த இடத்தைக்கூட பாதுகாக்க முடியாத துர்ப்பாக்கிய நிலைக்குத் தள்ளப்பட்டிருக்கின்றார்கள். அந்த மயானங்களில் புதைக்கப்பட்ட பூதவுடல்களை, ஜனாஸாக்களைக்கூட பாதுகாக்க முடியாத நிலைக்கு அவர்களை இந்த அரசு தள்ளியிருக்கின்றது. ஆகவே, காரைதீவிலே மாளிகைக்காட்டில் இருக்கின்ற மயானத்தைப் பாதுகாப்பதற்கு நடவடிக்கை எடுங்கள்! அதேபோல் திருக்கோவிலிலே இருக்கின்ற மயானமும் அழிவடைந்திருக்கின்றது; வெள்ளத்தினால் காவுகொள்ளப்பட்டிருக்கின்றது. ஆகவே, கண்முன்னாலே நடைபெறுகின்ற இந்த அனர்த்தத்தைச் சீர்செய்ய நீங்கள் நடவடிக்கையெடுக்க வேண்டுமென்று இந்த உயரிய சபையினூடாக வேண்டுகோள் விடுக்கின்றேன்.

விசேடமாக, பூகோளவியல் ரீதியாக இலங்கை கேந்திர முக்கியத்துவம் வாய்ந்த ஒரு நாடாக இருக்கின்றது. ஆகவே, இந்த நாட்டைப் பாதுகாக்க வேண்டிய கடமையும் பொறுப்பும் எமக்கு இருக்கின்றது. ஏனென்றால், இந்த நாட்டின்மீது பல நாடுகள் கண்வைத்துக் கொண்டிருக்கின்றன. எதிர்காலத்திலே உலக யுத்தம் ஏற்படக்கூடிய ஒரு சூழ்நிலை காணப்படுகின்றது. உலக யுத்தம் ஏற்படுமாகவிருந்தால், இந்த நாட்டிலுள்ள மக்களைப் பாதுகாப்பதற்காக, பொருளாதாரத்தைப் பாதுகாப்பதற்காக, அத்தியாவசியத் தேவைகளை மேற்கொள்வதற்காக என்ன வழிமுறைகளை நீங்கள் செய்திருக்கிறீர்கள்? நாடு என்ற ரீதியிலே என்ன வழிமுறைகளை வைத்திருக்கின்றீர்கள்? ஆகவே, அது தொடர்பான ஒரு பிரேரணையை இந்த உயரிய சபையிலே கொண்டுவந்து அதற்கான நடவடிக்கைகளை மேற்கொள்ள வேண்டும். ஏனென்றால், சர்வதேச நாடுகள் தங்களுக்குள்ளே போட்டிபோட்டுக் கொண்டிருக்கிறார்கள். இந்தப் போட்டியின் நிமித்தமாக யுத்த சூழ்நிலை ஏற்படுமானால், எமது நாடு அந்த வலைக்குள் அகப்படக் கூடாது. ஆகவே, அதற்கான முன்னாயத்தங்களை நீங்கள் மேற்கொள்ள வேண்டும். நாடு என்ற ரீதியிலே நாங்கள் அனைவரும் ஒன்றாகச் சேர்ந்து பயணிக்க வேண்டும். அதற்காக அத்தியாவசியப் பொருட்களை, எரிபொருட்களைச் சேமிப்பில் வைத்துக்கொள்வதற்கு, எமது உற்பத்திகளை மேம் படுத்துவதற்கு, அதிலிருந்து எமது மக்களைப் பாதுகாப்பதற்கு ஒரு சிறந்த திட்டத்தை மேற்கொள்ள வேண்டுமென்ற கோரிக்கையை இந்த உயரிய சபையினூடாக அரசிடம் முன்வைத்து, விடை பெறுகின்றேன். நன்றி!

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Next, the Hon. Sundaralingam Pradeep. You have 10 minutes.

[பி.ப. 12.21]

**ගරු සුන්දරලිංගම් ප්‍රදීප් මහතා (වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு சுந்தரலிங்கம் பிரதீப் - பெருந்தோட்ட மற்றும் சமூக உட்கட்டமைப்பு வசதிகள் பிரதி அமைச்சர்)
(The Hon. Sundaralingam Pradeep - Deputy Minister of Plantation and Community Infrastructure)

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, உலகில் ஏற்படுகின்ற இயற்கை அனர்த்தங்கள் முன்கூட்டி அறிவித்தோ அல்லது தெரியப்படுத்தியோ வருவதில்லை. இவ்வாறான அனர்த்தங்களால் உலக வல்லரசுகளும் அபிவிருத்தி அடைந்த நாடுகளும்கூட பாதிப்படைகின்றன; பல்லாயிரக்கணக்கான

உயிர்களையும் உடைமைகளையும் இழக்கின்றன. அந்த வகையிலே, அண்மையில் இலங்கையில் ஏற்பட்ட 'தித்வா' புயல் காரணமாக யாரும் எதிர்பாராத வண்ணம் எமது நாடு பாரியதோர் அழிவைச் சந்தித்தது. 2024ஆம் ஆண்டுக்கு முன்பு பொருளாதாரச் சிக்கலால் அல்லது பொருளாதாரப் புயலால் பாதிப்படைந்த நாட்டை மீண்டும் கட்டியெழுப்பிச் சரியான நிலைக்குக் கொண்டுவந்து கொண்டிருந்த வேளையில்தான் 'தித்வா' புயலின் பாதிப்பு இலங்கை வரலாற்றிலே பேரவலத்தை ஏற்படுத்தியது.

இந்தப் புயல் காரணமாக பல நூற்றுக்கணக்கான உயிர்களையும் பெறுமதியான உடைமைகளையும் நாங்கள் இழந்திருக்கின்றோம். எனினும், அரசாங்கம் என்ற வகையில் பொறுப்புடன் செயற்பட்டு, பாதிக்கப்பட்ட மக்களுக்கு எவ்வளவுக்கு முடியுமானளவு நிவாரணத்தை வழங்க முடியுமோ அவ்வளவுக்கு அவற்றை வழங்கி, மக்களுக்கு ஆதரவாகவும் மிகவும் நேர்த்தியான முறையிலும் எமது நடவடிக்கைகளை முன்னெடுத்திருந்தோம். ஆனால், இன்று எதிர்க்கட்சியினர், நாங்கள் இந்தப் பாதிப்பைத் தடுக்கத் தவறிவிட்டதாகக் கூறுகின்றார்கள். பாதிக்கப்பட்ட மக்களுக்கு கால் இறந்தால் பாணைக்கூட கொடுக்க முடியாத இந்த எதிர்க் கட்சியினர், "நாகப் பாம்புடன் நரிகளும் சேர்ந்ததுபோல" கண்டிக்குச் சென்று, பாதிப்படைந்த மக்களை வைத்து அரசியல் செய்தார்கள். ஆனால், எமது மாண்புமிகு ஜனாதிபதி அவர்கள், அமைச்சர்கள், பிரதி அமைச்சர்கள் எமது பாராளுமன்ற உறுப்பினர்கள், உள்ளூராட்சி மன்ற உறுப்பினர்கள் என அனைவரும் களத்தில் இறங்கி மக்களுக்காகச் சேவை செய்தார்கள். எமது தோழர்கள் எந்தவித எதிர்பார்ப்புமின்றித் தங்களது சொந்தப் பணத்தைச் செலவிட்டு மீட்புப் பணியிலே ஈடுபட்டிருந்தார்கள்.

இதுவரை காலமும் இலங்கை அரசியலில் இல்லாதவாறு தேசப்பற்றோடு மக்கள் ஒன்றிணைந்து இந்த நிவாரணப் பணிகளிலே ஈடுபட்டுக் கொண்டிருக்கையிலே, ஒரு தண்ணீர் போத்தலைக்கூட கொடுக்க முடியாத இந்த எதிர்க் கட்சியினர் எங்களைப் பற்றி விமர்சனம் செய்கின்றார்கள். இவர்களுடைய கபட அரசியலைப் பற்றி நாட்டு மக்களுக்கு நன்கு தெரியும். மக்களிடமிருந்து அந்நியப்பட்டுக்கொண்டு இருக்கும் இவர்கள், மக்களைத் திசை திருப்ப ஏதாவது வழி கிடைக்காதா? தாங்கள் எதிர்வரும் காலங்களில் சிறை செல்ல நேரிடுமே, அதிலிருந்து தப்பித்துக்கொள்ள இந்த ஆட்சியை மாற்ற ஏதாவது வழி கிடைக்காதா? எனத் தேடிக்கொண்டு இருக்கிறார்கள். ஒரு காலத்தில் இவர்கள் இனவாதத்தை வைத்து அரசியல் செய்து மக்களைப் பிரித்தார்கள். இன்று அந்த அரசியல் மக்களிடம் எடுபடவில்லை. எனவே, புயலின் பின் நிவாரணப் பணியின்போது ஏற்பட்டிருக்கும் சிறு சிறு தவறுகளைப் பெரிதாக்கி, அதை வைத்து அரசியல் செய்ய முற்படுகிறார்கள். உண்மையிலே நாங்கள் இதை மோசமான அரசியல் செயற்பாடாகவே பார்க்கிறோம்.

இந்தப் புயலினால் ஏற்பட்ட பாதிப்புக்காக உலக நாடுகள் எமக்கு உதவி செய்திருக்கின்றன. விசேடமாக, இந்தியப் பிரதமர், தமிழ் நாடு முதலமைச்சர் ஆகியோர் ஓடோடி வந்து எமக்கு உதவி செய்தார்கள். இலங்கையைச் சேர்ந்த புலம்பெயர் உறவுகள், தொண்டு நிறுவனங்கள் எனப் பலரும் உதவி செய்தார்கள். அத்தோடு, இதுவரைக்கும் இல்லாதவாறு அரச ஊழியர்கள் அர்ப்பணிப்போடு செயற்பட்டார்கள். இரவு, பகல் பாராது அவர்கள் முழுமூச்சுடன் செயற்பட்டுக் கொண்டிருக்கையிலே, இன்று அந்த அரச ஊழியர்களைப் பார்த்து இவர்கள் கையை நீட்டுகின்றார்கள். இது மிகவும் மோசமானதொரு வங்குரோத்து அரசியல் நிலைமையாகக் காணப்படுகிறது.

மலையக மக்களுடைய சம்பள உயர்வு தொடர்பாக கௌரவ எதிர்க்கட்சித் தலைவர் பேசியிருந்தார். இன்று முதலைக் கண்ணீர் வடிக்கின்ற எதிர்க்கட்சித் தலைவர் உட்பட ஏனைய உறுப்பினர்கள் இம்முறை எமது மாண்புமிகு சனாதிபதி தோட்டத் தொழிலாளர்களுக்கு 5,000 மில்லியன் ரூபாய் அரச நிதியை ஒதுக்கியவுடன், கதி கலங்கி அதற்கெதிராக முறைப்பாடு செய்யச் சென்றார்கள். பின்னர் மக்களுடைய எதிர்ப்பின் காரணமாக மறுபக்கம் 'பல்டி' அடித்துத் தாங்களும் அதற்கு ஆதரவு என்று கூறுகிறார்கள். கடந்த காலத்திலே எதிர்க் கட்சியினருக்குக் கொஞ்சமாவது வாக்குகள் கிடைத்திருக்கின்றதென்றால் அது மலையகப் பகுதிகளிலேதான். எதிர்காலத்தில் அந்த வாக்குகளையும் அவர்கள் முற்றுமுழுதாக இழக்கின்ற நிலைக்கு வந்திருக்கின்றார்கள். விசேடமாக, அந்த முறைப்பாட்டைச் செய்யச் சென்ற மாத்தளை மாவட்டத்தைச் சேர்ந்த அந்தப் பெண் பாராளுமன்ற உறுப்பினர் இனி எக்காரணம் கொண்டும் மலையகப் பகுதிகளுக்கு வாக்குக் கேட்கச் செல்ல முடியாது. மக்கள் அவர்கள் வரும்வரைக்கும் பார்த்துக் கொண்டிருக்கிறார்கள்.

මම කියන්න කැමැතියි, විපක්ෂයේ ඉන්න, මාතලේ දිස්ත්‍රික්කයේ අර මන්ත්‍රීවරිය -මම නම කියන්නේ නැහැ- එනතුරු මලෛයහම් ජනතාව සලකන්න බලාගෙන ඉන්න බව. දැන් කියනවා, වතු කම්කරුවන්ට පඩි වැඩි කිරීමට අපේ විරෝධතා නැහැ කියලා. එදා පැමිණිලි කරන්න ගියේ කවුද? විපක්ෂයට යම් ඡන්දයක් ඉතුරු වෙලා තිබුණේ වතුවල, විශේෂයෙන්ම මලෛයහම් පැත්තේ. දැන් ඒකත් නැත්තටම නැති වෙලා තිබෙන්නේ. ඒ නිසා ඔයගොල්ලන්ට යන්න බැහැ, ආපහු මලෛයහම් ජනතාවගෙන් ඡන්දය ඉල්ලන්න.

அது மட்டுமல்லாமல் இவர்கள் கூறினார்கள், "மலையகத் தோட்டத் தொழிலாளர்களுக்குச் சம்பள உயர்வு கிடைக்காது" என்று. எதிர்வரும் பெப்ருவரி மாதம் 10ஆம் திகதி, மலையகத் தோட்டத் தொழிலாளர்களுக்கு ஒரு நாள் சம்பளமாக 1,750 ரூபாயை எமது அரசாங்கம் வழங்கும் என்பதை நான் கூறிக்கொள்ள விரும்புகின்றேன்.

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, இன்று மலையகப் பகுதியானது புயலினால் மிகவும் பாரதூரமாகப் பாதிப்படைந்திருக்கின்றது. எமது மக்கள் வீடுகளை இழந்து, உடைமைகளை இழந்து அநாதரவாகியிருக்கிறார்கள். சில குடும்பங்கள் இன்னும் பாதுகாப்பு மையங்களில் இருக்கின்றார்கள். மலையகத்தில் குடியிருப்பதற்கான இடங்கள் மிகவும் குறைவு. தேசிய கட்டிட ஆராய்ச்சி நிறுவனத்தின் அறிக்கையின் பிரகாரம் அங்கு நாங்கள் பாதுகாப்பான இடங்களைத் தெரிவுசெய்து, மலையக மக்களுக்குச் சொந்த உரித்துடைய 10 பேர்ச் காணியுடன் வீடுகளைக் கட்டிக் கொடுப்பதற்குத் தீர்மானித்திருக்கின்றோம். அந்த வகையில், 2026ஆம் ஆண்டில் முதற்கட்டமாக 7,000 வீடுகளைப் புயலினால் பாதிக்கப்பட்டுள்ள மலையக மக்களுக்குக் கட்டிக் கொடுப்பதற்கு எமது அரசாங்கம் தீர்மானித்திருக்கிறது.

இவ்வாறு எமது அரசாங்கம் வெள்ளத்தால் பாதிப்படைந்த, மண் சரிவினால் பாதிப்படைந்த மக்களுக்கு உதவி செய்வதைப் பார்த்துக்கொண்டிருக்க முடியாத எதிர்க் கட்சியினர், இந்த அரசாங்கத்தை அசைக்க முடியாதென்ற நிலையில், இன்று கூறுவதற்கு ஒன்றுமில்லாமல் சிறு சிறு விடயங்களைக் கையிலெடுத்து அதனை ஊதிப் பெருப்பித்துக் கொண்டிருக்கிறார்கள். ஆனால், இலங்கை நாட்டின் மக்கள் தெளிவாக இருக்கின்றார்கள். இன்று நாடு சிறந்ததொரு

[ගරු සුන්දරලිංගම් ප්‍රදීප් මහතා]

தலைவனைக் கண்டிருக்கின்றது. சனாதிபதி மக்களோடு மக்களாக இருந்து, மக்களிடம் சென்று ஆறுதல் கூறுகின்றார். இன்று மக்களுக்கு அரசாங்கம் வழங்குகின்ற ஆறுதல் மிகப் பெரிதாக இருக்கின்றது. எனவே, இந்த அரசாங்கத்தைக் கவிழ்க்க முடியும் என்று இவர்கள் பகல் கனவு கண்டு கொண்டிருக்கின்றார்கள். கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, இன்னும் ஐந்து வருடங்கள் மட்டுமல்ல, எதிர்வரும் காலங்களிலும் இந்த நாட்டில் எமது ஆட்சிதான் நீடிக்கும் என்பதையும் எதிர்க்கட்சியினர் புரிந்துகொள்ள வேண்டும். நன்றி!

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Order, please! The ongoing Adjournment Debate shall stay suspended until 1.00 p.m. for lunch.

***රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත්හිටුවන ලදින්, අ.භා. 1.00ට නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියගේ (ගරු හේමාලි වීරසේකර මහත්මිය) සභාපතිත්වයෙන් නැවත පවත්වන ලදී.***

*அதன்படி, அமர்வு பி.ப. 1.00 மணிவரை இடைநிறுத்தப்பட்டு மீண்டுந் தொடங்கிற்று. குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு (திருமதி) ஹேமாலி வீரசேகர] தலைமை வகித்தார்கள்.*

*Sitting accordingly suspended till 1.00 p.m. and then resumed, DEPUTY CHAIRPERSON OF COMMITTEES [THE HON. (MRS.) HEMALI WEERASEKARA] in the Chair.*

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු රවුෆ් හකීම් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 15ක කාලයක් ලැබෙනවා.

[பி.ப. 1.00]

**ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ரஊப் ஹகீம்)
(The Hon. Rauff Hakeem, Attorney-at-Law)

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, இன்றைய தினம் நடைபெறுகின்ற ஒத்திவைப்புப் பிரேரணை மீதான விவாதத்தில், அண்மையில் 'தித்வா' சூறாவளி ஏற்படுத்திய பாதிப்புகள் சம்பந்தமாகவும் அதன் பின்னரான மீள்கட்டுமான நடவடிக்கைகள் சம்பந்தமாகவும் பேசப்படுகின்றது. இந்த அனர்த்தத்தால் நாடு முழுவதும் பாதிப்புகள் ஏற்பட்டு இருக்கின்றன. அதாவது, ஏறத்தாழ எல்லா மாவட்டங்களும் பாதிக்கப்பட்டு இருக்கின்றன. எனக்கு வழங்கப்பட்டுள்ள குறுகிய நேரத்துக்குள் அனைத்துத் தரப்பினரிடமிருந்தும் வருகின்ற முறைப்பாடுகளை இங்கு எடுத்துரைப்பது என்பது இயலாத காரியம். இருப்பினும், உடனடி நிவாரணங்கள், நஷ்டஈடுகளுக்கு அப்பால், உட்கட்டமைப்பு வசதிகளை மீள்கட்டுமானம் செய்யும் பணியானது, அவை மீண்டும் பாதிப்புக்குள்ளாகாத வகையில் இருக்க வேண்டும் என்பதில் அரசாங்கம் நிச்சயமாக கவனம் செலுத்த வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன். இது முக்கியமான விஷயம்!

நான் பிரதிநிதித்துவப்படுத்துகின்ற கண்டி மாவட்டம் மிக மோசமான நிலச்சரிவுக்கும் வெள்ள அனர்த்தத்துக்கும் உள்ளாகிய ஒரு மாவட்டம் என்ற அடிப்படையில் பல விஷயங்களை இங்கு பேசவேண்டி இருந்தாலும், முதற்கண் இன்று காலையில் இங்கு பேசிய அம்பாறை மாவட்டப் பாராளுமன்ற உறுப்பினரும் நண்பருமான கௌரவ கோடீஸ்வரன் அவர்கள் குறிப்பிட்டதொரு விவகாரம் தொடர்பில் கருத்துக்கூற விரும்புகின்றேன். அதாவது, திருக்கோவில் பிரதேசத்திலுள்ள ஒரு மயானமும் காரைதீவு பிரதேச சபைக்குட்பட்ட மாளிகைக்காடு முஸ்லிம் மையவாடியும் கடலரிப்பால் மிக மோசமாகப் பாதிக்கப்பட்டு, அங்குள்ள பூதவுடல்களும் ஜனாஸாக்களும் கடலில் அடித்துச் சொல்லப்படுகின்ற ஒரு துர்ப்பாக்கிய நிலைமை ஏற்பட்டிருப்பதாக அவர் குறிப்பிட்டார். எங்களால் திருக்கோவிலுக்குச் செல்ல முடியவில்லை. இருந்தாலும், மாளிகைக்காடு பிரதேசத்துக்குச் சென்று அந்த அனர்த்த நிலைமையைப் பார்த்தபோது, அங்குள்ள மக்கள் படுகின்ற அவஸ்தையைக் கண்டோம். குறிப்பாக, அவர்களுடைய சொந்த உறவுகளின் ஜனாஸாக்களை அடக்கஸ்தலத்தில்கூட வைத்திருக்க முடியாத ஒரு நிலவரத்தை இந்த இயற்கை அனர்த்தம் ஏற்படுத்தியிருக்கிறது.

கிழக்கு மாகாணத்தில் அம்பாறை மாவட்டத்திலுள்ள பல இடங்களை கடலரிப்பானது தொடர்ந்தேர்ச்சியாகப் பல வருட காலமாக மிக மோசமாகப் பாதித்து வருகின்றது. குறிப்பாக, நிந்தவூர் பிரதேசம் மிக மோசமாகப் பாதிக்கப்பட்டு இருக்கிறது. இப்பொழுது மாளிகைக்காடு, கல்முனைப் பிரதேசங்களிலும் பெருமளவான நிலங்கள் கடலரிப்பால் காவுகொள்ளப்பட்டு இருக்கின்றன. இந்த நிலையில், கிட்டத்தட்ட 5,000 குடும்பங்கள் வாழுகின்ற சாய்ந்தமருது, மாளிகைக்காடு பிரதேசத்தின் மையவாடிக்கு மாற்றுக் காணியொன்றைப் பெற்றுக்கொடுக்கின்ற அவசியமும், இருக்கின்ற மையவாடியைப் பாதுகாக்கின்ற அவசியமும் இருப்பதை நான் இங்கு வலியுறுத்த விரும்புகின்றேன். இது சம்பந்தமாக ஏற்கனவே தீர்மானம் எடுக்கப்பட்டதன்படி, கரையோரப் பாதுகாப்புத் திணைக்களம் இதற்கென 20 மில்லியன் ரூபாயை ஒதுக்கியிருப்பதாக எங்களுக்கு அறியக் கிடைக்கின்றது. இந்த 20 மில்லியன் ரூபாயை வைத்துக்கொண்டு, எப்படி நிந்தவூரிலிருந்து கல்முனை கடற்கரைப் பள்ளிவாசல் வரையான பகுதியையும் திருக்கோவிலிலிருந்து ஏனைய பிரதேசங்களையும் பாதுகாப்பது என்ற பாரிய பிரச்சினை இருந்துகொண்டு இருக்கின்றது. எனவே, இந்தத் தொகையைக் கூட்டித்தர வேண்டும் என்பதுடன், நிரந்தரமான பாதுகாப்பு அணையொன்றை அமைத்துத்தர வேண்டுமெனவும் கேட்டுக் கொள்கின்றோம்.

மிக முக்கியமான பள்ளிவாசலாக நாங்கள் எல்லோரும் கருதுகின்ற கல்முனை குடியேற்றப் பள்ளி என்று அழைக்கப்படுகின்ற நாகூர்ஆண்டகை வலியுல்லாஹ் அவர்கள் ஞாபகார்த்தமாகக் கட்டப்பட்டிருக்கின்ற கடற்கரைப் பள்ளிவாசலின் மினாரா கோபுரம் அமைந்துள்ள பகுதி வரையும் கடலரிப்பு ஏற்படும் அபாயம் தென்படுகின்றது. ஏற்கனவே அந்த இடத்தில் பாறாங்கற்கள் கொண்டுவந்து கொட்டப்பட்டபோதிலும், அவை அளவில் மிகச் சிறியதாக இருந்ததால், அது எந்தவிதத்திலும் அப்பகுதியைப் பாதுகாப்பதற்குப் போதுமானதல்ல என்று அன்றே புகார் செய்யப்பட்டது. இன்று இந்தப் பிரச்சினை மிகத் துல்லியமாகத் தெரிகிறது. எனவே, அங்கு பெரிய பாறாங்கற்களைக் கொண்டுவந்து போடுவது மாத்திரமல்ல, நிரந்தரமான அணையொன்றைக் கட்டுவதன்மூலம்தான் சரித்திர முக்கியத்துவம் வாய்ந்த கடற்கரைப் பள்ளிவாசலைப் பாதுகாக்க முடியுமென்று பள்ளிவாசல் நிருவாகமும் கருதுகின்றது; ஊர் மக்களும் கருதுகின்றார்கள். எனவே, இது சம்பந்தமாக அரசாங்கம் கவனமெடுக்க வேண்டும். ஓர் அரச

கலாசார நிகழ்வாக வர்த்தமானி அறிவித்தல்மூலம் அறிவித்தல் வெளியிடப்பட்டு, அங்கு வருடா வருடம் கந்தூரி நிகழ்வு நடைபெறுகின்றது. அதற்கு நாடு பூராவுமிருந்து பக்தர்கள் வருகை தருவார்கள். அந்தளவுக்குப் பழைமைவாய்ந்த முக்கியமான ஒரு பள்ளிவாசல்தான் இந்தப் பள்ளிவாசல். இந்தப் பள்ளிவாசல் 200 வருடங்கள் பழைமையானது. இதற்கு அண்மையில் இருக்கின்ற மஸ்ஜிதுல் பலாஹ் பள்ளிவாசல் 100 வருடங்கள் பழைமை வாய்ந்தது. கடலோரமாக இருக்கின்ற இந்தப் பள்ளிவாசலின் நிலம் மற்றும் தென்னை மரங்கள் எல்லாம் கடல் அலைகளால் அடித்துச் செல்லப்பட்டு இருக்கின்றன. அது மாத்திரமன்றி, அங்கிருக்கின்ற மலசலகூடத்தொகுதியும் முழுமையாகப் பாதிக்கப்பட்டு இருக்கின்றது.

கடற்கரைப் பள்ளிவாசலுக்கு அருகில் அண்மையில் கட்டப்பட்ட மீனவர்களுக்கான ஓய்வு விடுதியும் சரிந்துவிழுந்து, முழுமையாக அழிந்துவிடக்கூடிய நிலைமை உருவாகியிருக்கிறது. எனவே, இந்தப் பிரதேசத்தில் கடலரிப்பை முழுமையாகக் தடுக்கக்கூடிய தடுப்பு அணைகள் அமைக்கப்பட வேண்டும். அத்துடன், கடலரிப்பைத் தடுக்கக்கூடிய பாரிய பாறாங்கற்களைக் கொண்டுவந்து, விஞ்ஞான ரீதியாக கடலுக்குக் குறுக்காகவும் கிடையாகவும் போட்டு, எஞ்சியிருக்கின்ற நிலத்தையாவது பாதுகாப்பதற்கு நடவடிக்கை எடுக்கப்பட வேண்டுமென இங்கு வலியுறுத்திச் சொல்லிவைக்க விரும்புகின்றோம்.

தற்பொழுது இச்சபையில் எங்களுடைய பாராளுமன்ற உறுப்பினர் கௌரவ ஹிஸ்புல்லாஹ் அவர்கள் இருக்கிறார். மட்டக்களப்பு மாவட்டத்தில் புனானை அணைக்கட்டும் பொத்தானைப் பிரதேசமும் கடுமையான பாதிப்புகளைச் சந்தித்திருப்பதாக எங்களுக்கு அறியக் கிடைக்கின்றது. களுவமடுப் பிரதேசத்திலுள்ள மண்டு என்று சொல்லப்படும் கட்டு பாரியளவில் உடைப்பெடுத்ததால் புனானை அணைக்கட்டு, பொத்தானைக் கிராமத்திலுள்ள பல ஏக்கர் வயல்கள் நீர் நிரம்பி அழிந்துபோய் இருக்கின்றன. அது மாத்திரமன்றி, நீர் வயல்களுக்கு ஊடாகப் பாய்ந்ததால் பொத்தானையிலுள்ள concrete பாதை துண்டுதுண்டாகக் கிளப்பப்பட்டு போக்குவரத்துக்குச் சிக்கலாக மாறியிருக்கின்றது. வெள்ளம் காரணமாக உடைப்பெடுத்த கட்டு சீரமைக்கப்படாததால், இன்னும் நீர் அந்த வழியாக வெளியேறுவதால் வயல்கள் தொடர்ந்தும் பாதிக்கப்படும் நிலைமை காணப்படுவதாகச் சொல்லப்படுகின்றது. எனவே, அந்த அணைக்கட்டு மீண்டும் உடைப்பெடுக்காதபடி சீரமைக்கப்பட வேண்டும். தித்வா சூறாவளி ஏற்படுவதற்கு முன்னர் நான் மட்டக்களப்பு மாவட்டத்துக்குச் சென்றிருந்தபோது, சக பாராளுமன்ற உறுப்பினர் ஹிஸ்புல்லாஹ்வுடன் சென்று இதனைப் பார்வையிட்டேன். அப்பொழுதே இந்த அணைக்கட்டின் ஒருசில இடங்களில் பாதிப்பு ஏற்பட்டிருந்தது. இப்பொழுது அது மிக மோசமாகப் பாதிக்கப்பட்டுள்ளது. எனவே, விவசாயிகளுக்கு உரிய நஷ்டஈடு வழங்கப்பட வேண்டுமென நான் இங்கு வலியுறுத்திக் கூறிக்கொள்ள விரும்புகின்றேன்.

அண்மையில் நாங்கள் மூதூருக்குச் சென்றிருந்தோம். அனர்த்த நிவாரணம் சம்பந்தமான சுற்றறிக்கையில் இருக்கின்ற குளறுபடிகள் காரணமாக, எவ்வாறு நஷ்டஈடுகளை வழங்குவது தொடர்பில் அங்குள்ள பிரதேச செயலாளர் தடுமாறிக்கொண்டு இருப்பதை நாங்கள் பார்க்கக்கூடியதாக இருந்தது. அங்குள்ள பிரதேச செயலக நிருவாகம் இந்த சுற்றறிக்கையிலுள்ள குறைபாடுகளைச் சுட்டிக் காட்டினார்கள். 25,000 ரூபாய் இயலுமானவரை எல்லோருக்கும் கொடுக்கப்பட்டு இருந்தாலும், சமையலறை உபகரணங்கள், சமையலறை மீள்கட்டுமானப் பணிகளுக்கான 50,000 ரூபாய் கொடுப்பதில் சிக்கல் இருக்கின்றது. சிறு வியாபாரங்களில் ஈடுபடுபவர்களுக்கு 200,000 இலட்சம் ரூபாய் ஒரே தடவையில் கொடுப்பதாகச் சொல்லப்பட்டிருந்தாலும், சுற்றறிக்கையில் இருக்கின்ற குளறுபடிகள் காரணமாக எந்த வியாபாரங்களுக்கு அதைக் கொடுக்க முடியும் என்பதில் சிக்கல் நிலை காணப்படுகின்றது. இதனால் அதை வழங்குவதில் தயக்கம் காட்டுகின்றார்கள்.

200,000 ரூபாய் என்பது, சாதாரண வியாபாரத்தில் ஈடுபடுகின்ற ஒருவருக்கு சிறிய தொகை! அதை எடுத்தாவது தங்களது வியாபாரத்தை மீள ஆரம்பிப்பதற்கான முயற்சியில் ஈடுபட முடியாத நிலவரம் அங்கு காணப்படுகின்றது. இதற்குக் காரணம், பெறுமானம் சேர்க்கப்பட்ட ஒரு வியாபாரமாக - value-added businessஆக - குறித்த வியாபாரம் இருக்க வேண்டுமெனச் சொல்லப்படுவதுதான். உதாரணத்துக்கு, மூதூர் பிரதேசத்தில் அதிகமான கருவாட்டு வாடிகள் பாதிக்கப்பட்டு இருக்கின்றன. இந்நிலையில், மீன்களை உலர்த்திக் கருவாடு செய்வது பெருமானம் சேர்க்கின்ற வியாபாரமா, இல்லையா? என்பது தெரியாமல் அங்கிருக்கின்ற பிரதேச செயலாளர் தடுமாறுகின்ற நிலை காணப்படுகின்றது. அரசாங்கத்தின் சுற்றறிக்கையில் பாதுகாப்பு அமைச்சினதும் வேறு அமைச்சுக்களினதும் பெயர்களைக் குறிப்பிட்டு, அவற்றின் ஊடாகத்தான் நிதி வழங்கப்படுமெனக் குறிப்பிடப்பட்டுள்ளது. இது சம்பந்தமாகத் தெளிவில்லாத நிலைமை இருப்பதால், இந்த அமைச்சுக்கள் இதனைத் தெளிவுபடுத்த வேண்டுமெனக் கூறுகிறார்கள். இவ்வாறு பிரதேச செயலக மட்டத்தில் சில சந்தேகங்கள் நிலவுவதால் பாதிக்கப்பட்ட மக்களுக்கு உரிய நேரத்தில் நஷ்டஈடுகள் சென்றடைய முடியாத துர்ப்பாக்கிய நிலைமை காணப்படுகின்றது என்பதையும் நாங்கள் இங்கு சுட்டிக்காட்ட வேண்டும்.

எங்களுடைய கண்டி மாவட்டத்தின் பல பிரதேசங்கள் அனர்த்தத்தால் அவலங்களைச் சந்தித்தபோது, எங்களுக்கு உதவிய பலருக்கும் என்னுடைய உரையில் கட்டாயம் நன்றி கூற வேண்டும். குறிப்பாக, இங்கு இருக்கின்ற கௌரவ ஹிஸ்புல்லாஹ் அவர்களுக்கும் சகோதரர் ஏ.எல்.எம். அதாஉல்லா அவர்களுக்கும் நன்றி கூற வேண்டும். இவர்கள் அங்குள்ள குப்பை கூளங்களை அகற்றும் பணிக்குத் தமது பிரதேசத்திலுள்ள உள்ளூராட்சி சபைகளின் உதவிகளைப் பெற்றுத் தந்தார்கள். அதேபோல், எங்களுடைய கௌரவ உதுமாலெப்பை அவர்களும் அட்டாளைச்சேனையில் இருந்து கனரக இயந்திரங்களைக் கொண்டுவந்து இந்தப் பணிக்கு உதவினார். இந்தப் பணிகளை நாங்கள் கம்பளை நகரிலும் கெலிஓயா பிரதேசத்திலும் கலுகமுவ கிராமத்திலும் செய்யக்கூடியதாக இருந்தது.

எங்களுக்குக் கிடைத்த தரவுகளின்படி, எகொட கலுகமுவ, பரண எல்பிட்டிய போன்ற கிராமங்களில் பாதிக்கப்பட்ட எல்லோருக்கும் உடனடியாக நிவாரணங்களைப் பெற்றுக்கொடுப்பதில் சற்றுத் தாமதம் இருந்தது. தற்பொழுது அதனை ஓரளவு நிவர்த்தி செய்திருந்தாலும், நிறையப் பேருக்கு 50,000 ரூபாய் கொடுப்பனவு வழங்கப்பட வேண்டும். அதற்கப்பால், முழுமையாகப் பாதிக்கப்பட்ட வீடுகள், பகுதியளவில் பாதிக்கப்பட்ட வீடுகள் என்பதைத் தீர்மானிப்பதிலும், ஐந்து மில்லியன் ரூபாய் கொடுப்பதா? இரண்டரை மில்லியன் ரூபாய் கொடுப்பதா? என்பதைத் தீர்மானிப்பதிலும் சிக்கல்கள் இருக்கின்றன. அரசாங்கம் தீர்மானித்துள்ளதன்படி, இரண்டரை மில்லியன் ரூபாய்

[ගරු නිතිඥ රවුෆ් හකීම් මහතා]

பெறுவதற்கு உரித்துடையவர்களுக்கு முதலில் ஐந்து இலட்சம் ரூபாயை வழங்கிவிட்டு, மிகுதித் தொகையை சேத மதிப்பீடுகளை மேற்கொண்ட பின்னர் வழங்குவதாகச் சொல்லப்படுகின்றது.

ஆனால், மக்களுக்கு மத்தியில் இவ்விடயம் தொடர்பில் குழப்பநிலை காணப்படுகின்றது. கிராம உத்தியோகத்தர்களின் சங்கமானது சேத மதிப்பீடு சம்பந்தமான விடயத்திலிருந்து முழுமையாக விலகிக்கொள்வதாகச் சொல்கின்றது. ".........GNTUA withdraws from Rs. 5 m payment". இது "The Morning" பத்திரிகையில் நேற்று வெளியாகிய செய்தி! இவ்வாறு பல இடங்களில் அரச உத்தியோகத்தர்கள் இந்த விடயத்தைப் பொறுப்பெடுப்பதற்குத் தயங்குகின்றார்கள். சுற்றறிக்கையில் மேற்குறித்த விடயங்கள் சரிவர தெளிவுபடுத்தப்படாததால் இந்த நிலவரம் ஏற்படுவதாக இங்கு எனக்கு முன்பு பேசிய சில உறுப்பினர்களும் சுட்டிக் காட்டினார்கள். எனவே, இந்தக் குளறுபடிகளை அரசாங்கம் சரிவர தீர்த்துத் தர வேண்டும்.

என்னைப் பொறுத்தவரையில், பல இடங்களில் பிரச்சினைகள் கூடுதலாக இருக்கின்றன. யட்டிநுவர கிராமத்தில் Dehianga North GN Division-154இல் ஏறத்தாழ 370 குடும்பங்கள் வாழ்கின்றன. இந்தப் பிரதேசத்தில் 35 வீடுகள் பகுதியளவிலும் 8 வீடுகள் முழுமையாகவும் பாதிக்கப்பட்டுள்ள நிலையில், இதுவரை 25,000 ரூபாய் மாத்திரம்தான் அவர்களுக்குக் கிடைத்திருக்கின்றது. ஒரு கிராம உத்தியோகத்தரும் இன்னுமோர் அலுவலரும்தான் அங்கு வந்துசென்று இருக்கிறார்களே தவிர, பிரதேச செயலாளரோ வேறு எவருமே வரவில்லை. போதாக்குறைக்கு NBRI நிறுவனத்தினர் வந்து பார்வையிட்டு அறிக்கை தரவில்லை என்றால், அங்குள்ள மக்களுக்கு நட்டஈடு கிடைக்க மாட்டாது என்ற நிலவரமும் அங்கு நிலவுகின்றது. இதையும் நான் அரசாங்கத்தின் கவனத்துக்குக் கொண்டுவர விரும்புகிறேன்.

முக்கியமாக, இந்த அனர்த்தத்தால் பாடசாலைகளும் பாதிக்கப்பட்டு இருக்கின்றன. படகொல்லாதெனியா பாடசாலைக்கு NBRI நிறுவனத்தினர் இன்னும் வரவில்லை. கல்ஹின்னை, ஹரிஸ்பத்துவ, பூஜாபிட்டிய பிரதேச செயலாளர் பிரிவில் இருக்கின்ற படகொல்லாதெனியா பாடசாலைக்கு அருகிலுள்ள வீட்டில் இருக்கின்ற 12 வயது சிறுவன் உயிரிழந்திருக்கின்ற சம்பவமும் மண்சரிவால் ஏற்பட்டது. அந்தப் பாடசாலையின் பல கட்டிடங்கள் பயன்படுத்தப்பட முடியாத நிலையில் இருக்கின்றன. கீழேயுள்ள மைதானத்துக்கு அருகில் இருக்கின்ற சுற்றுமதில் உடைந்திருக்கின்ற காரணத்தால் மைதானத்துக்கும் பாரிய பாதிப்பு ஏற்பட்டு இருக்கின்றது. எனினும், இதை வந்து பார்வையிட்டு அறிக்கை சமர்ப்பிப்பதற்கு NBRI நிறுவனத்தினர் இன்னும் வரவில்லை.

ஆண்டியாகடவத்தை அல்-ஹிக்மா பாடசாலை பற்றி நான் கடந்த முறையும் குறிப்பிட்டேன். இப்போது UNICEF நிறுவனம் ஆறு தற்காலிக வகுப்பறைகளை அமைப்பதற்கு உதவிசெய்ய முன்வந்திருப்பதாக கல்வி அதிகாரிகள் கூறியிருக்கிறார்கள். அதற்கப்பால், அங்கு நிரந்தரக் கட்டிடமொன்று அமைக்கப்பட வேண்டும். அது மாத்திரமல்ல, அங்கிருக்கின்ற நிரந்தரக் கட்டிடங்கள் முழுமையாகப் பாவனைக்கு உகந்த வகையில் மாற்றியமைக்கப்பட வேண்டிய அவசியமும் இருந்துகொண்டு இருக்கின்றது. இதற்கென பாரிய நிதி ஒதுக்கீட்டை கல்வி அமைச்சு செய்யவேண்டி இருக்கின்றது. அதேபோன்று, ஸாஹிரா தேசிய பாடசாலையிலும் ஆறு தற்காலிக வகுப்பறைகளை அமைப்பதென தீர்மானம் எடுக்கப்பட்டு இருந்தாலும், அங்கு மண்சரிவு ஏற்பட்டிருக்கின்ற இடம் மிக உயர்ந்த இடமாக இருக்கும் நிலையில், அதையும் திருத்தி அமைப்பதற்குப் பாரிய மதிலை அங்கு கட்டியாக வேண்டிய அவசியம் இருக்கின்றது.

மேலும், கஹட்டபிட்டிய, அல்-மினா ஆரம்பப் பாடசாலையில் இருக்கின்ற கட்டிடங்களுக்குப் பதிலாக Zahira Primary Schoolஇன் groundக்கு அருகாமையில் இரண்டு தற்காலிக வகுப்பறைகளை அமைத்துக் கொடுப்பதாக முடிவெடுக்கப்பட்டு இருக்கின்றது. இப்படி பல விடயங்களை உள்ளடக்கி முடிவுகள் எடுக்கப்பட்டு இருந்தாலும், இவற்றைப் பூரணமாகச் செய்து கொடுப்பதற்கு மேலதிக ஒதுக்கீடுகளைப் புதிதாக அமைக்கப்பட்டிருக்கின்ற செயலணி பெற்றுக்கொடுக்க வேண்டும். இந்தச் செயலணியின் செயற்பாடுகள் சம்பந்தமாக வர்த்தமானி அறிவித்தலொன்றும் வெளியிடப்பட்டு இருக்கின்றது. இந்தச் செயலணியின் செயற்பாடுகள் இன்னும் விரிவுபடுத்தப்பட வேண்டும்; அவை பகிரங்கப்படுத்தப்பட வேண்டும்.

அடுத்து, NBRI நிறுவனம் ஓர் அறிக்கையைக் கொடுத்தால், அதற்கு எதிராக மேன்முறையீடு செய்வதற்கும் வசதி செய்துகொடுக்கப்பட வேண்டும். அந்த நிறுவனத்தின் அறிக்கை நியாயமானதாக இல்லையென்றால், பாதிக்கப்பட்டவர்கள் அதற்கெதிராக மேன்முறையீடு செய்வதற்கான சந்தர்ப்பத்தை வழங்குவதற்கான பொறிமுறை ஒன்று உருவாக்கப்பட வேண்டுமெனக் கேட்டு விடைபெறுகின்றேன். நன்றி.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු චතුරංග අබේසිංහ නියෝජ්‍ය අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 1.15]

**ගරු චතුරංග අබේසිංහ මහතා (කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு சதுரங்க அபேசிங்ஹ - கைத்தொழில் மற்றும் தொழில் முயற்சியாண்மை அபிவிருத்திப் பிரதி அமைச்சர்)
(The Hon. Chathuranga Abeysinghe - Deputy Minister of Industry and Entrepreneurship Development)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, "දිට්වා" සුළි කුණාටුවෙන් ලංකාවට වෙච්ච ආපදාව සහ ආපදාවට ලක් වෙච්ච ජනතාව නැවත නඟාසිටුවීම සම්බන්ධයෙන් ඉතා වැදගත් විවාදයක් තමයි අද පැවැත්වෙන්නේ.

මට මුලින්ම කියන්න තිබෙන්නේ, අපේ රට අවදානමකට සූදානම් වීම, අවදානමකින් ගැලවීම කියන සමස්ත ක්‍රියාවලිය ඇතුළු රාජ්‍ය යන්ත්‍රණයේ ක්‍රියාකාරිත්වය පිළිබඳවයි. මේ මගේ ඉස්සරහ ඉන්න ගරු මන්ත්‍රීවරු රට පාලනය කරපු කාලයේ කරලා නැතිව තිබුණු දේවල් කරන්න කියලා එතුමන්ලා කරන ඉල්ලීම ගැන අපි සතුටු වෙනවා. ගරු රෝහිණී කවිරත්න මන්ත්‍රීතුමිය විශේෂයෙන්ම කිව්වා, සමහර ප්‍රදේශවල ජනතාව නැවත පදිංචි කරන්න ඕනෑ, ඒ අයට ආරක්ෂාව දෙන්න ඕනෑ කියලා. දෙමව්පියන්ගේ සිට පරම්පරාගත දේශපාලනයක් කරපු එතුමිය තමයි අද කියන්නේ ජනතාව අවදානමේ ඉන්නවා කියලා. ඉතින්, ඒක විහිළුසහගත කාරණයක්.

ඒ වාගේම සමහරු කථා කළා, එක් එක් ආයතනවල තිබෙන දුර්වලතා ගැන. ඔබතුමන්ලා පාලනය කරපු කාලයේ තමයි ඒ ආයතන දුර්වල කරලා තිබෙන්නේ. ඒ ආයතනවලට තාක්ෂණය දීලා නැහැ, ඒ ආයතනවලට නිලධාරින් හරියට පත් කරගෙන නැහැ, ඒ ආයතනවලට හැකියාව දීලා නැහැ. ඉතින් දැන් පොඩි පොඩි අඩුපාඩු තිබෙනවා තමයි. ඒවා හඳාගෙන ඉස්සරහට යන්න තමයි අපි අද මේ විවාදය භාවිත කරන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ව්‍යවසායකත්වය සහ කර්මාන්ත ගැන බලන අමාත්‍යාංශය විධියට අපට මේ ආපදාවත් එක්කම සිද්ධ වෙච්ච දේ තමයි, අපේ රටේ කර්මාන්ත අකර්මණ්‍ය වුණු එක. ඒ නිසා අපට තිබුණු මූලිකම අරමුණ සහ අවශ්‍යතාව තමයි මේ කර්මාන්ත සහ ව්‍යාපාර නැවත නගාසිටුවීම. අපි සතුටින් කියනවා, විශේෂයෙන්ම සතියක් දෙකක් ඇතුළත අපේ මහාමාර්ග අමාත්‍යාංශය, බලශක්ති සහ ජල සම්පාදන ආයතනවල තිබුණු කාර්යක්ෂමතාව මත අපට මහා පරිමාණ කර්මාන්ත සියයට 90කට වඩා ප්‍රමාණයක් නැවත ආරම්භ කරගන්න හැකියාවක් ලැබුණු බව. විශේෂයෙන්ම අපි අවධානය යොමු කළේ, කොහොමද මේ කර්මාන්ත නැවත ආරම්භ කරන්නේ කියලා. ඒ නිසා කර්මාන්ත අමාත්‍යාංශය විධියට අපි Disaster Management Centre එකක් හදලා, ඒකට අවශ්‍ය තාක්ෂණය අරගෙන, අවදානමට ලක් වෙලා සිටින මේ කර්මාන්තකරුවන්ට, ව්‍යවසායකයන්ට අපි කිව්වා අප අමතන්න කියලා. අමතලා, දැනට තිබෙන හදිසි - immediate - අර්බුද පිළිබඳව අප දැනුවත් කරන්න කියලා කිව්වා. විශේෂයෙන්ම අපි සතුටුයි කියන්න, මේ ආපදා තත්ත්වය යටතේ අපේ ජනතාව ස්වේච්ඡාවෙන්, විශේෂයෙන් IT කර්මාන්තයේ ඉන්න ජනතාව ස්වේච්ඡාවෙන් හැදුවා, "floodsupport.org" කියලා website එකක්. ඒක හරහා තමයි ගොඩක් තොරතුරු රජයටත් රැස් කරලා දුන්නේ. ඒ platform එක අපි කර්මාන්ත අමාත්‍යාංශයට අරගෙන, ඒක පාවිච්චි කරලා කර්මාන්තකරුවන්ට, ව්‍යවසායකයන්ට කිව්වා, ඒ අයට වෙච්ච ආපදා පිළිබඳ දැනුම් දෙන්න කියලා. ඉතින් අපට පුළුවන් වුණා, මේ ක්‍රියාවලිය හරහා 30,000ක පමණ දත්ත ප්‍රමාණයක් එකතු කර ගන්න. ඉතින් ඒක තමයි අපි මූලිකව කළේ. ඒ වාගේම පාරවල්, වතුර, බලශක්තිය සහ සේවකයන් නැවත ව්‍යාපාරයට ළඟා කර ගැනීමට අවශ්‍ය පහසුකම් සැපයුවා. මෙන්න මේ ක්‍රියාවලිය හරහා තමයි රටේ ආර්ථිකය නැවත වේගවත්ව අපි ගොඩ ගත්තේ.

ඊළඟට, මේ එක් එක් කර්මාන්තයට වෙලා තිබුණු හානිය බලලා, විශේෂයෙන්ම ජනාධිපතිතුමා සමඟ පැවැති සාකච්ඡාවකදී තීරණයක් ගත්තා, මේ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවලට ඇස්තමේන්තුවකින් තොරව ලක්ෂ 2ක ආධාරයක් ලබා දෙන්න කියලා. ඉතින් ඒ ආපු තොරතුරු මත අපි ගත්ත ක්‍රියාමාර්ග ගත්තොත්, ඒ චක්‍රලේඛයේ පැහැදිලිව තිබුණා, කර්මාන්ත අමාත්‍යාංශයේ ආයතනයක් එක්ක සම්බන්ධ ආයතනවලට කර්මාන්ත අමාත්‍යාංශය හරහා මේ ගෙවීම කරන්න සහ අනෙකුත් ව්‍යාපාරවලට Disaster Management Centre එක හරහා, ප්‍රාදේශීය ලේකම් මඟින් ඒ ගෙවීම් කරන්න කියලා.

විශේෂයෙන් කර්මාන්ත අමාත්‍යාංශයේ නිලධාරින් සියලුදෙනාටම අපි ස්තුතිවන්ත වෙන්න ඕනෑ. මොකද, සති දෙකක් ඇතුළත ඔවුන් විශේෂ මෙහෙයුම් ක්‍රියාවලියක් කරලා මේ වෙනකොට 6,370කගේ කර්මාන්ත සහතික කරලා තිබෙනවා, ඒ අයට ආපදාවක් සිදු වුණාය, ඒ ගෙවීම් ලැබීමට සුදුසුකම් තිබෙනවාය කියලා. ඒ වාගේම අපට කර්මාන්තකරුවන් 9,000කගේ පමණ තොරතුරු ලැබිලා තිබෙනවා. අපි දැන් ප්‍රාදේශීය ලේකම් කාර්යාල හරහා අනෙකුත් ව්‍යාපාර යොමු කරනවා, වෙනත් ක්‍රියාපටිපාටිවලට යන්න. මේ ක්‍රියාවලිය හරහා අපි මේ වෙනකොට 1,395දෙනෙකුට ලක්ෂ 2 බැගින් ගෙවලා තිබෙනවා. විශේෂයෙන්ම දෙසැම්බර් 31වන දා වෙනකොට රුපියල් බිලියනයක වෙන් කිරීමක් මුදල් අමාත්‍යාංශයෙන් කළා. නමුත් අපි දන්නවා, මුදල් ක්‍රියාවලිය අනුව ඒ මුදල් දෙසැම්බර් 31න් පසුව අත්හිටවෙන බව. අපි නැවතත් ඒ අරමුදල් ඉල්ලුම් කළා. මේ වෙනකොට ඒ ක්‍රියාවලිය ඉදිරියට යනවා. ජනවාරි 31වෙනකොට කර්මාන්ත අමාත්‍යාංශයට අනුබද්ධ ආයතන 6,370ටම එම ගෙවීම් කිරීම තමයි අපේ බලාපොරොත්තුව වෙලා තිබෙන්නේ.

අපි දන්නවා "දිට්වා" සුළි කුණාටුවෙන් ආපදාවට පත් වෙච්ච ව්‍යාපාරවලට moratorium එකක් දෙන්න කියලා Central Bank එක සියලු බැංකුවලට circular එකක් issue කළ බව. Moratorium එක කිව්වාම අපි දන්නවා, ගරු විපක්ෂ නායකතුමා කිව්වා වාගේ, මීට කලින් ව්‍යාපාරිකයන්ට හම්බ වුණු moratorium එක නිසා තමයි පොලිය එකතු වෙලා ගෙවා ගන්න බැරි තත්ත්වයකට සමහර ව්‍යාපාර පත් වෙලා තිබෙන්නේ කියලා. මෙතැනදී ඉතාම පැහැදිලිව කියලා තිබෙනවා, කිසිම දඩ පොලියක් එකතු කරන්නේ නැතිව මාස 6ක් තමන්ගේ ණය නොගෙවා සිටීමට කාලයක් ලබා දෙන්න කියලා. ඉතින්, මේ වෙනකොටත් අපේ ව්‍යාපාරිකයන් මේ පහසුකම් භුක්ති විඳිනවා. ඒ වාගේම සියයට 9ට වඩා අඩු පොලියක් සමඟ නැවතත් ණය ලබා දෙන්න කියලා වාණිජ බැංකුවලට circular එකක් issue කරලා තිබෙනවා. ඒක තමයි Central Bank එකෙන් කරන්න පුළුවන් දේ. ඊළඟට රජය විධියට, රජය පැත්තෙන් සියයට 3ක පොලියට රුපියල් බිලියන 10ක් මේ වෙනකොට බැංකු ක්ෂේත්‍රයට යොමු කර තිබෙනවා. ඒ, මේ සුළි කුණාටුවෙන් හානියට පත් වූ ව්‍යාපාරවල කාරක ප්‍රාග්ධනයටත්, ස්ථාවර ප්‍රාග්ධනයටත් අවශ්‍ය ණය සියයට 3ක පොලියට ලබා ගැනීම සඳහා. ඒ අනුව කුඩාම සහ ක්ෂුද්‍ර ව්‍යාපාරවලට ලක්ෂ දෙකහමාරකුත්, අනෙකුත් ව්‍යාපාරවලට මිලියනයකුත්, මහා පරිමාණ ව්‍යාපාරවලට මිලියන 25 දක්වාත් මේ ණය ලබා ගන්න පුළුවන්. ඒ වාගේම තමයි මේ ණය නැවත ගෙවීම සඳහා සහන කාලයක් ලබා දීලා තිබෙනවා. *[බාධා කිරීමක්]*

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මම සභාවේ හිටියේ නැති වෙලාවේ මගේ නම සඳහන් කරලා තිබෙනවා.

**ගරු චතුරංග අබේසිංහ මහතා**
(மாண்புமிகு சதுரங்க அபேசிங்ஹ)
(The Hon. Chathuranga Abeysinghe)

ඉතින් ඔබතුමියගේ නම කියන්නේ නැතිව බැහැ නේ, නේද?

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මම නැති වෙලාවේ මගේ නම ප්‍රකාශ කිරීම ගැන මම ප්‍රකාශයක් කරන්න ඕනෑ. චතුරංග අබේසිංහ නියෝජ්‍ය ඇමතිතුමා කියලා තිබෙනවා, තාත්තලාත් මේ පාර්ලිමේන්තුවේ සහ මාතලේ දිස්ත්‍රික්කයේ දේශපාලනය කළා කියලා. ඔව්, කළා. හැබැයි එතකොට "දිට්වා" ආවේ නැහැ. *[බාධා කිරීමක්]* නැහැ, ඔබතුමාගේ තාත්තාත් මේ පාර්ලිමේන්තුවේ සිටිද්දී තමයි ඔබතුමාත් මේ කථා කරන්නේ. මම ඔබතුමාට කියන්න ඕනෑ, ඒ කාලයේ ආපු ව්‍යසනයකදී උඩසිය, ඇටන්වල ආපදාවට ලක් වුණු සියලුදෙනාට නොච්චියාගම ප්‍රදේශයේ ඉඩම් දීලා පදිංචි කරලා තිබෙන බව. ඒවාට විධිමත් ක්‍රමවේද තිබුණා. අපි කියන්නේ අන්න ඒ විධියට ක්‍රමවේදයක් සකස් කරන්න කියන එකයි. ඒ වාගේම අනාගතයේදී එන්න පුළුවන් ව්‍යසන වෙනුවෙන් විධිමත් වැඩ පිළිවෙළක් සකස් කරන්න කියන යෝජනාව තමයි මම අද කරලා තිබෙන්නේ. මඩ ගහ ගන්න යෝජනාවක් ඒක ඇතුළේ නැහැ.

**ගරු චතුරංග අබේසිංහ මහතා**
(மாண்புமிகு சதுரங்க அபேசிங்ஹ)
(The Hon. Chathuranga Abeysinghe)

මමත් කිව්වේ ඒක තමයි. අවුරුදු 70ක් ගිහිල්ලාත් අනාරක්ෂිත තැන්වල, අනවසර ඉදි කිරීම්වල මේ රටේ ජනතාව ජීවත් වෙනවා. ඒක තමයි අවසාන ප්‍රතිඵලය.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මම කියමින් සිටියේ රජයෙන් ලබා දීපු ඒ loan එක ගැන. කර්මාන්ත අමාත්‍යාංශයෙන් අපි කාරණා දෙකක් කළා. අපි මහා පරිමාණ වශයෙන් ආපදාවට ලක් වුණු කර්මාන්ත 200 ගණනක් හඳුනාගෙන තිබෙනවා. ඒකෙදි අපි මුලින්ම ආරම්භ කළා Industry Recovery Foster Programme - IRFP - කියලා එකක්. ඒකෙදි කළේ බිඳ වැටුණු කර්මාන්ත නඟා සිටුවීමට ලංකාවේ ප්‍රධාන ආයතන සම්බන්ධ කර ගැනීම. විශේෂයෙන්ම බ්‍රැන්ඩික්ස් ආයතනය, බ්‍රවුන්ස් ආයතනය, කාගිල්ස්, CBL, ඩීමෝ, එක්ස්පෝ ලංකා, හේලීස්, හයිඩ්‍රාමනී, JKH, MAS Holdings, නෙස්ලේ, Tokyo Cement, ටොයෝටා, යුනිලිවර් කියන ආයතන දැන් ස්වේච්ඡාවෙන් ඉදිරිපත් වෙලා තිබෙනවා, බිඳ වැටුණු කර්මාන්ත නඟා සිටුවීමට කර්මාන්ත අමාත්‍යාංශයත් එක්ක අත්වැල් බැඳගෙන ඉදිරියට යන්න.

ඊළඟට, කර්මාන්තවල හානියට පත් වුණු යන්ත්‍රසූත්‍ර නැවත ආනයනය කිරීම සම්බන්ධයෙන් ඉල්ලීමක් ලැබිලා තිබෙනවා. ඒ සඳහා අවශ්‍ය තොරතුරු මේ වන විට කාර්මික සංවර්ධන මණ්ඩලය එකතු කරමින් සිටිනවා. ඊට පස්සේ මුදල් අමාත්‍යාංශයත් එක්ක කථා කරලා, බදු ගෙවීමකින් තොරව හෝ බදු නැවත ලබා දීමේ පදනම මත ඒ උපකරණ නැවත ලබා ගැනීමට වැඩ පිළිවෙළක් සකස් කරන්න පුළුවන්ද කියලා අපි උත්සාහ කර බලනවා. එතැනින් එහාට ගිහිල්ලා කර්මාන්ත අමාත්‍යාංශය, එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන - UNDP - එක්ක වැඩ කරගෙන යනවා, මේ බිඳ වැටුණු කර්මාන්තවලට තවදුරටත් අපි උදවු කරන්නේ කොහොමද, මේ ණය ක්‍රමවල අඩුපාඩු තිබෙනවා නම් ඒ සඳහා guarantee එකක් හදා ගන්නේ කොහොමද කියන එක සම්බන්ධයෙන්. ඒ වාගේම මේ කර්මාන්තවලට risk management ක්‍රමවේදයක් තිබුණේ නැහැ. ඒ කියන්නේ, නැවත තිරසාර විධියට තමන්ගේ කර්මාන්ත පවත්වාගෙන යන්න අවදානම් කළමනාකරණය කිරීමේ වැඩ පිළිවෙළක් තිබුණේ නැහැ. ඒ නිසා අවදානම් කළමනාකරණ වැඩ පිළිවෙළක් නිර්මාණය කරන්නත් අපි මේ වෙනකොට ක්‍රියාත්මක වෙනවා. මේ සියලු කර්මාන්ත සහ අවදානම් කලාපවල තිබෙන කර්මාන්ත අනාගතයේදී අපි කළමනාකරණය කරන්නේ කොහොමද කියලා වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක වෙනවා.

එතැනදී විශේෂයෙන්ම රක්ෂණාවරණ ගත්තොත්, සමහර ප්‍රදේශවලට ගංවතුර රක්ෂණාවරණයක් නැහැ. ඒ සඳහා අපිට ජාතික වශයෙන් තීරණයක් ගන්න වෙනවා, ඒ ආයතන මේ ප්‍රදේශයේ මේ විධියටම තියනවාද, අත්‍යවශ්‍යයෙන්ම ගඟ අයිනේ තිබෙන්න ඕනෑ ව්‍යාපාරවලට රක්ෂණාවරණයක් හදන්නේ කොහොමද කියලා. ඒ නිසා අපි මේ ක්‍රියාවලිය භාවිත කරලා බිඳවැටුණු කර්මාන්ත වේගයෙන් නඟා සිටුවන්නත්, ඒ වාගේම අනාගතයේදී අවදානම් කළමනාකරණය කියන එක කර්මාන්තකරණයේ ප්‍රධාන අංගයක් බවට පත් කරන්නත්, ඒ සඳහා අවශ්‍ය කරන තාක්ෂණික දැනුම කර්මාන්තකරුවන්ට ලබා දෙන්නත් කටයුතු කරනවා. ඒ අවදානම් කළමනාකරණය තුළින් මෙවැනි අවදානමකදී, විශේෂයෙන්ම ඉදිරියේදී ඇති වෙන්න පුළුවන් අවදානමකදී, කර්මාන්ත ක්ෂේත්‍රය කිසිදු බාධාවකින් තොරව ඉදිරියට ගෙන යාමට අවශ්‍ය කරන ජාතික සැලැස්මක් නිර්මාණය කිරීම තමයි කර්මාන්ත අමාත්‍යාංශය මේ වන විට සිද්ධ කරමින් සිටින්නේ.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 1.27]

**ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ස්වාභාවික ව්‍යසනයක් සිද්ධ වෙලා මාස දෙකක් නික්ම යන කාලසීමාව ඇතුළේ තමයි, ජනතාව පදිංචි කරවන්නේ කොහොමද කියන කාරණය පිළිබඳව අපි තවමත් පාර්ලිමේන්තුවේ විවාද කරන්නේ. ඒ වාගේම, ඔබතුමන්ලා තවම අවුරුදු 76ක් ගැන මතක තබා ගෙන ඉන්නවා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඒ අවුරුදු 76ක කාලය තුළ කාගේ කාගෙත් තාත්තලාගේ කෙරුවාවල් ගැන කියන්න ගත්තොත්, ඔබතුමන්ලාටත්, මටත් මේ ඔක්කොම අයට පැය ගණනක් විවාද කරන්න පුළුවන්. ඒ නිසා ඔබතුමන්ලා ඒ 76 අවුරුදු කාලයෙන් පැත්තකට වෙලා 77 වන අවුරුද්දේ, ඒ විනාශ කරපු එක ගොඩ නඟන්න උත්සාහ කරන්න, 76 අවුරුදු ශාපය ගැන කථා කරන්නේ නැතුව. 77 වන අවුරුද්දේ ආපු ව්‍යසනයට මුහුණ දෙන්න විධියක් නැතුව, ඒකෙන් ජනතාව අසරණ වෙනතුරු, මහා ගංවතුරකට ජනතාව ගසාගෙන යනතුරු බලාගෙන සිටියා. පසුගිය සතියේ, කුණාටුවක් එනවා කියලා පැයෙන් පැයට SMS එව්වා; පැයෙන් පැයට එව්වා. හැබැයි, එදා ඒ SMS එක ආවේ නැත්තේ ඇයි? එදා නිලධාරින් ඇවිල්ලා ආණ්ඩුවට කිව්වාම, ක්‍රියාත්මක වුණේ නැත්තේ ඇයි? එදා නාය යනතුරු, ගංවතුර ඇවිල්ලා නගර පිටින් විනාශ වෙලා යනතුරු බලාගෙන හිටියේ ඇයි? ඊට පස්සේ කියනවා, අපි එළිවෙනතුරු නිදි වරාගෙන මිනිස්සු බේරා ගත්තා ලු. නිදිවැරුවා නොවෙයි, එළිවෙනතුරු නින්ද ගියේ නැහැ කරපු වැඩේට. එළිවෙනතුරු නින්ද ගියේ නැහැ. හැබැයි, එළිවෙනතුරු නිදිවරා ගෙන ජනතාවට සේවය කළා ලු. ඡන්දය ගත්තා නම් කරන්න ඕනෑ නේ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අපි විශේෂ කාරක සභාවක් - Select Committee එකක් - පත් කරන්න කියලා ඉල්ලා සිටියා. අද ඒ යෝජනාව අනුමත වුණා. හැබැයි, ඒකටත් පුළුවන් නම් අර කන්ටේනර් සම්බන්ධයෙන් පත් කරපු විශේෂ කාරක සභාවට වාගේ කරයි.

කන්ටේනර් 323 නිදහස් කිරීම සම්බන්ධයෙන් සොයා බැලීමට විශේෂ කාරක සභාවක් පත් කරන්න කියලා ඉල්ලුවාම, අධිකරණ ඇමතිවරයා එහි සභාපති කළා. ඒ සඳහා වරාය ඇමතිවරයාත් පත් කළා; පොලීසිය භාර නියෝජ්‍ය ඇමතිවරයාත් පත් කළා. හරි නේ. හොරාගෙ අම්මගෙන් පේන අහනවා වාගේ තමයි. පුළුවන් නම්, අද අපි කථා කරන කාරණයට අදාළව පත් කරන විශේෂ කාරක සභාවටත් කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව භාර නියෝජ්‍ය ඇමතිවරයායි, මහවැලියයි, වාරිමාර්ග භාර ඇමතිවරයායි, පරිසර ඇමතිවරයායි පත් කරන්න. පත් කරලා කියන්න, මේ තුන්දෙනාගෙන් වගකීම පැහැර හැරියේ කවුද කියලා හොයන්න කියලා. එතකොට හරි. ගරු කථානායකතුමාටත් කියන්න, දේශපාලන කෝණයෙන් බලා හැම තිස්සේම මේ සියල්ල එක තැනකට ලඝු කරන්න උත්සාහ කරන්නේ නැතුව කරුණාකරලා මේ කාරණා දිහා විවෘත මනසකින් බලන්න කියලා.

ජනාධිපතිවරයා පාර්ලිමේන්තුවට ආවා. ඇවිල්ලා ලොකු ප්‍රකාශයක් කළා. මේ ආපදාවේදි නිවසක තහඩුවක් ගිහින් තිබුණත් රුපියල් ලක්ෂ 10ක් දෙනවා කිව්වා. ගෙදර

සම්පූර්ණයෙන් විනාශ වුණොත් රුපියල් ලක්ෂ 50ක් දෙනවා කිව්වා. ඉඩමට රුපියල් ලක්ෂ 50ක් දෙනවා කිව්වා. දැන් මොකක්ද වෙලා තිබෙන්නේ? ජනාධිපතිතුමාම පාර්ලිමේන්තුවට ඇවිල්ලා කිව්වා, බොරු කියනවා නම් පාර්ලිමේන්තුවේ කියන්න කියලා. ඒකත්, එහෙම කථාවක්ද කියන්න අපි දන්නේ නැහැ. ඒක එතුමා සහ මෙතුමන්ලා තමයි දන්නේ. හැබැයි, අවසානයේ මොකක්ද වුණේ? ගම්වල ජනතාව රවට්ටලා ඒ දීමනාව රුපියල් ලක්ෂ 5කට අඩු කරලා, අවසානයේ රුපියල් 25,000ක් දෙන්න තීරණය කළා. දැන් ඒ පීඩනය එන්නේත් රාජ්‍ය නිලධාරින්ට. ග්‍රාම නිලධාරි මහත්වරුන්ගෙන් අහනවා, ගෙදරක බිත්තියක් හෝ පොළොව ඉරි තළා තිබෙනවා නම් කීයක් ලබා දෙනවාද කියලා. ග්‍රාම නිලධාරින්ගේ සංගමය මාධ්‍ය සාකච්ඡාවක් තියලා තමන්ගේ ස්ථාවරය හෙළි කළා. විගණනය සම්බන්ධයෙන් උත්තර දෙන්න සිද්ධ වන එක වෙන එකක්. තවම විගණකාධිපතිවරයා පත් කර නැහැ. ඔබතුමන්ලාට ඕනෑ කෙනා දමා ගන්නකල් ඉන්නවා ඇති. ඒ මිනිස්සු ඒක දන්නේ නැහැ නේ. ඔබතුමන්ලාට ඕනෑ කෙනා විගණකාධිපතිවරයා බවට පත් කර ගන්නකල් මේ කටයුත්ත අදිනවා නේ. ඒක රටේ ජනතාවට අදාළ කාරණයක් නොවෙයි. හැබැයි, ඔබතුමන්ලා මේ පාර්ලිමේන්තුවේ කියන බොරුවලට නිලධාරින් ලවා වැඩ ගත්තාම ඒවාට උත්තර දෙන්න වෙන්නේ කාටද? ඒ නිලධාරින්ටමයි. අවසානයේ අමාරුවේ වැටෙන්නේ කවුද? ඒ නිලධාරින්මයි. රුපියල් ලක්ෂ 10 දෙනවා නම් ඒක දෙන්න. දෙන්නේ නැත්නම් නැහැයි කියන්න. නිලධාරින්ගේ ගෙවල්වලට මිනිස්සු යවන්න ලැහැස්ති වෙන්න එපා.

ඊළඟට තිබෙනවා, නාය යන ප්‍රදේශ. සමහර තැන්වලට NBRO එකෙන් ගිහිල්ලා කියනවා, ඒ ගෙවල්වලට යන්න එපා කියලා. අවසානයේ මොකක්ද වෙන්නේ? ඒ මිනිස්සුන්ට ඒ ගෙදරට යන්නත් නැහැ, ආණ්ඩුවෙන් විකල්පයක් ලබා දෙන්නේත් නැහැ. ඔබතුමන්ලා මේ මාස එකහමාරක්, දෙකක් -තව දවස් කිහිපයකින් මාස දෙකක් වෙනවා- තිස්සේ විකල්ප ඉඩම් කී දෙනෙකුට දී තිබෙනවාද කියලා මේ පාර්ලිමේන්තුවට කියන්න. රුපියල් ලක්ෂ 50 කී දෙනෙකුට දීලා තිබෙනවාද? නුවරඑළිය දිස්ත්‍රික්කය ගත්තොත්, කොත්මලේ, Dessford Estate එක වාගේම මහනුවර, මාතලේ වැනි ප්‍රදේශ ගැනත් බලන්න. එම ප්‍රදේශවලට මම ගිය වෙලාවෙත් එක තරුණයෙක් කිව්වා, දිනේෂ් අයියා ඔවුන්ට ඉඩම් දීලා තිබෙනවා කියලා. මම අදත් ඒ මල්ලිට කථා කළා. හැබැයි, ඉඩම් නම් තවම දීලා නැහැ. *[බාධා කිරීමක්]* ආ, ඔබතුමාද? හරි නේ. මෙතැන හිටියාට වැඩක් නැහැ, රැම්බෝ වගේ. එහේ ගිහිල්ලා ඉඩම් ටික දෙන්න. *[බාධා කිරීමක්]* ඔව්, අපේ තාත්තාගෙන් ඇහුවොත් මම කියන්නම්. ඉතිරි ටික අහගන්න මාව අවුස්සගන්න එපා. ඔය පේනවා නේ, මාලිමාවේ මල් පැළ. මල් පැළ නායට ගහගෙන ගිහිල්ලා. අන්න යනවා. ගමේ අයට බොරු කියලා, අර මනුස්සයා අමාරුවේ වැටිලා. දැන් ගමේ අය යනවා, ඒ අයගේ ඉඩම් ගෙවල් හොයාගෙන.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මේ ආපදාවෙන් පීඩාවට පත් ජනතාවට ඉඩම් දෙන්න ආණ්ඩුවට තිබෙන වැඩ පිළිවෙළ මොකක්ද? ඒවා වහගන්න දැන් මොකක්ද කරන්නේ? එක පැත්තකින් මර්දනය ක්‍රියාත්මක කරනවා. අධ්‍යාපන අමාත්‍යාංශය බලන්න. මම දැක්කා, මෙහි හොඳ විෂයයන් කිහිපයක් තිබෙනවා. අධ්‍යාපන ප්‍රතිසංස්කරණවලට අපි කවුරුවත් විරුද්ධ නැහැ. Syllabus එකේ තිබෙන සමහර කාරණාවලට තමයි අපේ විරුද්ධත්වය තිබෙන්නේ. ඒ website එක ආවේ කොහොමද කියලා හොයන්නේ නැහැ. හොඳ කාරණයක් තිබෙනකොට ඔබතුමන්ලා, ඔබතුමියලා සියලුදෙනාම අගමැතිතුමියට සුබ පතනවා. හැබැයි, අර කාරණය සම්බන්ධයෙන් ඔබතුමන්ලා මොකක්ද කරන්නේ? 6 වසරේ පොත ගැන මොකක්ද කරන්නේ? පන්ති 5 පාස් වෙලා වැඩක් නැහැ නේ, 6 ෆේල් නම්. දැන් 6 වසර ෆේල් වෙච්ච එකක් නේ තිබෙන්නේ. අන්තිමට නිලධාරින්ව අනිවාර්ය නිවාඩු යවනවා.

ඇඹිලිපිටියේ ගංජා හේනක් ඇල්ලුවා. ඇඟ බැඳපු මහත්තයෙකුගේ -පාර්ලිමේන්තු මන්ත්‍රීතුමෙකුගේ- ගංජා හේනක් ඇල්ලුවා. අන්තිමට මොකක්ද වුණේ? ඒක අල්ලපු නිලධාරියාට ගැහුවා; නිලධාරියාව හිරේ දැම්මා. හොඳයි! System එක change වෙවෙන යන බවක් පෙනෙනවා. ඒ වාගේම කුරුණෑගලට ගිහිල්ලා පස් කැපුවා, කියලා පස් ටිකත් බාගත්තා. මේවාට සාක්ෂි තිබෙනවා. මාධ්‍යයටත් කථා කරලා තිබෙනවා. අද වෙනකල් එක්කෙනෙක්වත් අත්අඩංගුවට ගත්තාද? හැබැයි, ඔබතුමන්ලාගේ සහයෝගයට නීතිපති දෙපාර්තමේන්තුව ඉස්සරහ බෝඩ් උස්සන්න නම් යනවා. පරිසරය ගැන කථා කරන්නේ; හැබැයි පස් කපන කෙනා අල්ලන්න කවුරුවත් නැහැ. භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයෙන් නීතිය ක්‍රියාත්මක වෙන්නේත් නැහැ; වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවෙන් නීතිය ක්‍රියාත්මක වෙන්නේත් නැහැ. හැබැයි, අපේ ගම්වල ඉන්න අහිංසක මනුස්සයෙක් වැසිකිළි වළක් කැපුවත් මොකක්ද වෙන්නේ? අල්ලාගෙන ගිහිල්ලා හිරේ දමනවා, වනජීවී දෙපාර්තමේන්තුවෙන්, එහෙම නැත්නම් භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයෙන්. හැබැයි සමහර තැන්වල අක්කර ගණන්, හෙක්ටෙයාර ගණන් පස් කපනවා, තමන්ගේ ව්‍යාපාර කරන්න. ඒවාට නීතිය ක්‍රියාත්මක වෙන්නේ නැහැ. නියෝජ්‍ය ඇමතිතුමෙක් කිව්වා නේ පරම්පරා ගැන. ඒ කාලයේ කළේ නැහැ කියලා කිව්වා නේ. ඔබතුමන්ලා කරපු විධිය දැක්කා නේ. කොළඹ දිස්ත්‍රික්කයේ එක තැනක අනවසර ඉදිකිරීම් අයින් කරන්න අධිකරණ නියෝගයක් තිබියදීත් පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරියක් කථා කළා, අධිකරණ නියෝගය තිබුණාට කමක් නැහැ, ඒක කරන්න එපා කියලා. එහෙම තමයි තමුන්නාන්සේලාගේ දේශපාලනය; එහෙම තමයි තමුන්නාන්සේලා දේශපාලනය කරන්නේ. හැබැයි, අවසානයේ මොකක්ද වෙන්නේ?

ඊළඟට, ත්‍රිකුණාමලයේ සිද්ධිය බලන්න. පොලීසිය භාර ඇමතිවරයා පාර්ලිමේන්තුවට ඇවිල්ලා එම සිද්ධිය සම්බන්ධයෙන් මොකක්ද කිව්වේ? බුදු පිළිම වහන්සේගේ ආරක්ෂාවට එය පොලීසියට වැඩම කෙරෙව්වා කිව්වා. පහුවදා OIC මහත්මයායි, පොලීසියේ නිලධාරිනුයි මුතුකුඩයක් ඉහලලා, හේවිසි ගහලා බුදු පිළිම වහන්සේ නැවත වැඩමෙව්වා. හැබැයි, දැන් හාමුදුරුවෝ හිරේ. දෙවෙනි වතාවට බුදු පිළිම වහන්සේ වැඩම කළේ කවුද? හැබැයි, හාමුදුරුවෝ හිරේ යනවා. ඔබතුමන්ලාට ඕනෑ තැනට ඕනෑ විධියට නීතිය නවන්න අවශ්‍ය වුණාම ඒකට තමුන්නාන්සේලා කියන්නේ, system එක change වෙනවා කියලා. හැබැයි රටේ සාමාන්‍ය ජනතාවට බලපාන කාරණයක් තිබෙනවා නම්, රටේ ජනතාවට සහනයක් දෙන්න ඕනෑ නම්, රටේ ජනතාවට යම් සංවර්ධන යෝජනා ක්‍රමයක් ගෙනෙන්න ඕනෑ නම් ඒකට තමයි system ඔක්කෝම බලපාන්නේ. කැබ් ගෙනෙනකොට, වරායේ කන්ටේනර් පන්නනකොට, ගල්අඟුරු ටෙන්ඩර් දමනකොට ඒවා අදාළ නැහැ. හමුදාවට ආහාර සපයන ටෙන්ඩරයෙන් මාසයකට රුපියල් කෝටි 10ක් පාඩුයි. මේ, ජනාධිපතිවරයාගේ අමාත්‍යාංශය. ඒවා හොඳයි. හැබැයි, අනෙක් පැත්තෙන් ගංවතුරෙන් හානියට පත් වූ, නාය යාමෙන් විපතට පත් වූ මනුස්සයාට ගෙයක් හදලා දෙන්න බැහැ. තමුන්නාන්සේලා එක පැත්තකින්, හාමුදුරුවරුන් විවේචනය කරනවා. අනෙක් පැත්තෙන්, පන්සලක් - විහාරස්ථානයක් - ගොඩනහනවා දැක්කොත් ඒකට විරුද්ධ වනවා. නාගදීපයේ ගිහිල්ලා සිල් ගත්තොත්, ජනාධිපතිවරයා කියනවා, ජාතිවාදය කියලා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මතක තබා ගන්න, මේ ජාතිවාදය නොවෙයි.

අපි සටන් කළේ LTTE එකත් එක්ක මිසක් දෙමළ ජනතාව එක්ක නොවෙයි. ඒක අමතක වෙලා නම් මතක තබාගන්න. අපි සටන් කළේ LTTE එකත් එක්ක. දෙමළ මිනිස්සු එක්ක නොවෙයි. ඒ වාගේම තමයි, දෙමළ ජනතාවට කතරගමට යන්න නිදහස තිබෙනවා. ඒ වාගේම සිංහල-බෞද්ධ ජනතාවට නාගදීපයට යන්නත් පුළුවන්. කතෝලික ජනතාවට මඩු මෑණියෝ වඳින්න යන්නත් පුළුවන්. ඔබතුමන්ලාට ඒ මානසිකත්වය තිබුණු කාලය දැන් ඉවරයි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ඔබතුමාට වෙන් වූ කාලය අවසානයි, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa, Attorney-at-Law)
මට තව තත්පර 30ක් දෙන්න, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

ඔබතුමන්ලා විපක්ෂයේ ඉන්න කාලයේ වගා හානි සඳහා අක්කරයකට රුපියල් 150,000ක් දෙන්න කිව්වා. අද ඔබතුමන්ලා ඒක හෙක්ටෙයාරයකට රුපියල් 150,000ක් බවට පත් කර තිබෙනවා. මම වැරදියි නම් නිවැරදි කරන්න. හැබැයි, එදා හානිය වුණේ වගාවට. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අද සම්පූර්ණ භූමියම හානි වෙලා. එක්කෝ වළවල් හැරිලා, එක්කෝ වැලි පිරිලා. මේ සඳහා සාධාරණව කටයුතු කරන්න කියන ඉල්ලීමත් කරමින්, මම ආණ්ඩුවෙන් ඉල්ලන්නේ ව්‍යසනයට පත් වෙච්ච ජනතාව ගම් බිම්වලට යවන්න අවශ්‍ය වැඩ පිළිවෙළ කඩිනමින් ක්‍රියාත්මක කරන්න කියලායි. එහෙම නැතිව, මේ පාර්ලිමේන්තුව ඇතුළේ ලොකු කයිවාරු ගහලා එලක් වන්නේ නැහැ.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු එම්.කේ.එම්. අස්ලම් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 1.37]

**ගරු එම්.කේ.එම්. අස්ලම් මහතා**
(மாண்புமிகு எம்.கே.எம். அஸ்லம்)
(The Hon. M.K.M. Aslam)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මට කලින් කථා කළ මන්ත්‍රීතුමාගේ කථාවට පිළිතුරු ලබා දෙමින් මම කථාව පටන් ගන්නම්. මේ රට විනාශ වෙලා තිබෙනවා, ව්‍යසනයක් ඇති වෙලා තිබෙනවා, ආපදාවට ලක් වෙලා තිබෙනවා. පොඩ්ඩක් අහගෙන ඉන්න තරම් ඉවසීමක් තිබෙනවා ද දන්නේ නැහැ, ගරු මන්ත්‍රීතුමා, පොඩ්ඩක් ඉඳලා යමු.

අපේ ජනාධිපතිතුමාගේ රුපියල් ලක්ෂ 10 වැඩසටහන ගැන කථා කරනකොට, ඊට අදාළව පැහැදිලිව චක්‍රලේඛ නිකුත් වෙලා තිබෙනවා. රුපියල් ලක්ෂ 10 නොවෙයි, ලක්ෂ 25 දක්වා ඒ වැඩසටහන යනවා. ඒ කොහොමද? ඇස්තමේන්තුවෙන් පස්සේ. ඇස්තමේන්තුවෙන් තොරව රුපියල් ලක්ෂ 5ක් දෙනවා කියන එක තමයි ජනාධිපතිතුමාගේත් අදහස වුණේ. චක්‍රලේඛයත් ආවේ එහෙමයි. රුපියල් ලක්ෂ 10 නොවෙයි, රුපියල් ලක්ෂ 25 දක්වා අර්ධ හානිවලට ලක් වූ පුරවැසියන්ට අපි ගෙවනවා. ඒ, එක කාරණයක්.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මේ ආපදාව සිදු වුණේ ස්වාභාවික ව්‍යසනයක් හේතුවෙන්. හැබැයි, තමුන්නාන්සේලාගේ රජය තිබෙන කොට තමුන්නාන්සේලා කෘත්‍රිම ලෙස හැදුවේ මොකක්ද? අපේ රට විනාශ කරන්න සංවිධානාත්මකව කෝලාහල හැදුවා. අපේ රටේ තිස් අවුරුදු යුද්ධයක් පැවතුණා. ඒ වාගේම දිගන, දර්ගා නගරය, හෙට්ටිපොළ වැනි ප්‍රදේශ සම්පූර්ණයෙන් ගිනි ගත්තා. ඒ ගිනි ගත්තේ රටේ ජනතාවගේ ජීවිත, රටේ ජනතාවගේ දේපළ. ඒ වාගේම සිංහල, දෙමළ, මුස්ලිම් ඇතුළු සියලු ජාතීන්ගේ හිත් රිදවන්න සම්පූර්ණ කතන්දර හැදුවේ, සැලසුම් කළේ, සැලසුම් සහගතව මේ ව්‍යසනය - විනාශය - කළේ ඔබේ ආණ්ඩු කාලයේ. අපට මතක් වෙනවා, කුරුණෑගලෙන් ගිහිල්ලා යාපනය පුස්තකාලය ගිනි තැබූ ආකාරය. පූර්ව සූදානම බලන්න. දිගන විනාශ කළේ කොහොමද? දර්ගා නගරය විනාශ කළේ කොහොමද? හැබැයි, දැන් මේ වෙච්ච සිදුවීම ස්වාභාවික විපතක් කියන එක අපි තේරුම් ගන්න ඕනෑ.

ඔබේ රජයන් තිබුණා. ඒත් තාක්ෂණය දියුණු කළේ නැහැ. මේ වනකොට අපි සැලසුම් කර තිබෙනවා, කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවට, NBRO එකට, DMC එකට අවශ්‍ය නවීන තාක්ෂණය ලබා දෙන්න. ඒ සඳහා අපි විශාල මුදල් ප්‍රමාණයක් වෙන් කර තිබෙනවා කියන එකත් මේ වෙලාවේ මම කියන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අපි මේ කාරණය තේරුම් ගන්න ඕනෑ. මොකක්ද මේ වෙලා තිබෙන්නේ? කිසිම චක්‍රලේඛයක් කියවන්නේ නැතුව මෙතැනට ඇවිල්ලා බොරුවට දොඩවනවා. රටේ නායකත්වය ගන්න සැලසුම් කරන මේ මන්ත්‍රීතුමාගේ කථාවේ මොන විද්‍යාත්මක පදනමක් තිබුණා ද කියන්න මම දන්නේ නැහැ. මේ රට විනාශ වෙච්ච වෙලාවේ මොන තරම් දේවල් කථා කරන්න තිබෙනවාද? හැබැයි, අපි දැක්කේ බොරුවක් කියලා, කිසිම සැලසුමක් නැති, කිසිම අදහසක් ගන්න බැරි, රටේ ජනතාව පිළිගන්නේ නැති නිකම්ම නිකම් දේශපාලන කථාවක් පවත්වලා ඔන්න ඔහේ දුවන එකයි. එතුමා හැම දාම පස් වරු 1.30ට තමයි කථා කරන්න මේ සභාවට එන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, දැන් මම අද දවසේ මාතෘකාවට එන්නම්. අපි 2016 සිට 2024 දක්වා කාලය ආසන්න වශයෙන් ගත්තොත්, එම කාලය ඇතුළත ස්වාභාවික ව්‍යසනවලින් අපේ රටේ 490ක්, 500ක් පමණ ප්‍රමාණයකගේ ජීවිත අහිමි වෙලා තිබෙනවා. ඒ වාගේම පූර්ණ හානි සිදු වූ නිවාස ආසන්න වශයෙන් 2,500ක් තිබෙනවා. නිවාස 134,000ක් අර්ධ හානියට පත් වෙලා තිබෙනවා. හැබැයි, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, 2025 අවුරුද්දේ සිදු වුණු "දිට්වා" සුළි කුණාටුව නිසා 646කගේ ජීවිත අහිමි වුණා. ඒ වාගේම නිවාස 6,000ක් පූර්ණ හානියටත්, නිවාස 110,000ක් අර්ධ හානි තත්ත්වයටත් පත් වුණා. පසුගිය අවුරුදු 10 තුළ සිදු වෙච්ච හානියට වඩා ප්‍රබල හානියක් අද වනකොට මේ ආපදා තත්ත්වය හේතුවෙන් සිදු වෙලා තිබෙනවා. නමුත්, අපි එතැනින් එහාට ගිහිල්ලා බලන්න ඕනෑ. ජනතාවාදී, සැලසුමක් තිබෙන, සංවිධානාත්මක දේශපාලන ව්‍යාපාරයක් හැටියට අපේ ජනාධිපතිතුමා ප්‍රමුඛ ආණ්ඩුව වාගේම රාජ්‍ය යන්ත්‍රණය මේ ව්‍යසනයෙන් පසුව ඒ ජනතාවට දෙන්න ඕනෑ පහසුකම් ලබා දීම වෙනුවෙන් ලොකු උත්සාහයක නිරත වෙනවා අපි දැක්කා. විශේෂයෙන් රාජ්‍ය නිලධාරින් රෑ දවල් නොබලා ඒ වෙනුවෙන් වැඩ කටයුතු කළා.

මම කුරුණෑගල දිස්ත්‍රික්කය නියෝජනය කරන්නේ. කුරුණෑගල දිස්ත්‍රික් ලේකම් චන්දන මහතා, වයඹ පළාත් ප්‍රධාන ලේකම් ඉලංගකෝන් මහතා, මම ජීවත් වන ප්‍රදේශය වන රිදීගම, ප්‍රාදේශීය ලේකම්තුමා වන ඩබ්ලිව්.ජී.කේ.ඩී වික්‍රමසූරිය මහතා, විදුලි අධිකාරි ප්‍රසාද් මහතා, MOH, ප්‍රාදේශීය සභාවේ සභාපතිතුමා ඇතුළු ග්‍රාම නිලධාරිවරයාගේ ඉඳලා සියලු නිලධාරි යන්ත්‍රණය ඉතා සක්‍රියව රෑ දවල් නොබලා ඒ වෙනුවෙන් මහන්සි වුණු බව අපි දන්නවා.

මේ ආපදා තත්ත්වය හේතුවෙන් කුරුණෑගල දිස්ත්‍රික්කයත් විශාල ලෙස ආපදාවට ලක් වුණා. මේ ආපදා තත්ත්වය නිසා මරණ 62ක් සිදු වුණා. ඒ වාගේම පූර්ණ හානි සිදු වූ නිවාස

618කුත්, අර්ධ හානි සිදු වූ නිවාස 5,000කුත්, අවදානම් නිවාස 807කුත් තිබෙනවා. රිදීගම ප්‍රදේශයේ ආසන්න වශයෙන් නාය යෑම් 60ක් වාර්තා වෙලා තිබෙනවා. ඒ හේතුවෙන් නිවාස 140ක් පූර්ණ හානියට පත් වෙලා තිබෙනවා. ඒ වාගේම අර්ධ හානියට පත් නිවාස 500 ගණනක් තිබෙනවා. අධිඅවදානම් නිවාස 450ක් තිබෙනවා.

රිදීගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ග්‍රාම නිලධාරි කොට්ඨාස 113න්, 109කටම මේ ආපදා තත්ත්වය හේතුවෙන් හානි වුණා. ඒ නිසා මේක ලොකු සටනක්. හැබැයි, මේ අවස්ථාවේදී දේශපාලන අධිකාරිය සහ රාජ්‍ය යන්ත්‍රණය ඒකාබද්ධව කටයුතු කරනවා අපි දැක්කා. ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සියලු දෙනා මධ්‍යගත කරගෙන අපි මේ වැඩසටහන ලස්සනට නිමා කළා. ආණ්ඩුවක් හැටියට අපේ පැත්තෙන් ජනතාවට කෙරෙන්න ඕනෑ මොකක්ද? ජනාධිපතිතුමාගේ නායකත්වය යටතේ සියලු චක්‍රලේඛ වෙනස් වුණා. ග්‍රාම නිලධාරින්ට රුපියල් 50,000 දක්වා අත්පිට මුදලක් දෙන්න පුළුවන්කම තිබුණා. ඒ වාගේම ප්‍රාදේශීය ලේකම්තුමන්ලාට ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් තොරව විශාල මුදල් ප්‍රමාණයක් වියදම් කරන්න හැකි වුණා. කුරුණෑගල දිස්ත්‍රික්කයේ විපක්ෂයේ ඉන්න සමහර මන්ත්‍රීවරු සද්භාවයෙන් අපේ ආසනයටත් ආවා. ඒ අය වෙනත් ආසනවලටත් ඇවිල්ලා ඉන්නවා අපි දැක්කා. අපි ඒ අයව අගය කරන්න ඕනෑ. ඒ විතරක් නොවෙයි, මේ ආපදා අවස්ථාවේදී ස්වේච්ඡා සංවිධාන, වෙනත් රාජ්‍ය නොවන සංවිධාන අපේ රටට ඇවිල්ලා උදවු කරනවා අපි දැක්කා. විශේෂයෙන්ම World Vision Lanka වැනි ආයතන මැදිහත් වෙලා මේ ආපදාවට පත් ජනතාවට දිය යුතු සහන ටික උපරිම වශයෙන් ලබා දුන්නා. ඒ ජනතාවට උදවු කරන්න ඔවුන් ඉදිරිපත් වුණා. මෙතැන සිංහල, දෙමළ, මුස්ලිම් කියලා භේදයක් නැහැ. ඒ භේදය හැදුවේ කවුද? සැලසුම් සහගතව, දේශපාලන කුහකයින්. තමන්ගේ බලය වෙනුවෙන් නිර්මාණය කරපු ඒ දේශපාලනය නිසා තමයි අපේ රටේ දසදහස් ගණනකගේ ජීවිත අහිමි වුණේ. නමුත්, සොබාදහම අපේ රටට එතරම් ලොකු විනාශයක් කරලා නැහැ. හැබැයි, ඒ විනාශයෙන් හානි වුණු දේවල් නම් අපිට හදා ගන්න පුළුවන්. නමුත්, ඒ මිනිස්සුන්ගේ හිත්වල හදපු ඒ කෝලාහල සිතුවිලි ඉවත් කරලා, හදපු වෙනත් ජාතිවාදී ප්‍රශ්න ඉවත් කරලා, ඒ හිත් හදන්න අපට බොහොම අමාරුයි.

මේ ව්‍යසනයෙන් පසුව ඉතා ඉක්මනින් අපි නැඟිට්ටා. මේ ආපදාව නිසා නිවාස 6,000ක් පමණ පූර්ණ ලෙස හානියට පත් වුණා. ඒ අනුව, මේ හානි වුණු නිවාස සියල්ල එකතු කළ විට 20,000ක් ඉක්මවන නව නිවාස ඉදි කළ යුතු වෙනවා. ඒ වාගේම අධිඅවදානම් කට්ටියටත් රුපියල් ලක්ෂ 50ක නිවසක් හිමියි. ඒ සම්බන්ධයෙන් අපි ඉදිරි වැඩසටහන් කුරුණෑගල, රිදීගමදී පටන් ගත්තා. අපි ඉදිරියේදී ජනතාවගේ ප්‍රසාදයත් එක්ක ඒ නිවාස හදනවා, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

මට තව කාරණයක් කියන්න තිබෙනවා. අපේ රටේ එක එක කාලයට, එක එක ප්‍රශ්න එනවා.

கடந்த காலங்களில் ஜித்தாவுக்கான Consulate General appointment சம்பந்தமாகப் பிரச்சினை ஏற்பட்டது. குறித்த பதவிக்கான நியமனத்துக்கு ஒரு நபரை எமது வெளிநாட்டலுவல்களுக்குப் பொறுப்பான அமைச்சு தீர்மானித்து, அவர் சம்பந்தமான விபரங்களைப் பெறும்போது, குறித்த appointmentஐ அவருக்கு வழங்க முடியாத சூழ்நிலை ஏற்பட்டது. ஆனால், குறித்த பதவிக்கு ஒருவரை நியமிக்க வேண்டும் என்பதால், அந்தச் சந்தர்ப்பத்தில் அதற்குரிய தரத்தில் ஒருவரைத் தீர்மானிக்க வேண்டிய நிர்ப்பந்த நிலை வெளிநாட்டலுவல்களுக்குப் பொறுப்பான அமைச்சுக்கு இருந்தது. ஆனால், ஜித்தா நகரத்திற்கு நியமிக்கப்பட வேண்டியவர் நிச்சயமாக ஒரு முஸ்லிம் நபராக இருக்க வேண்டும். ஏனென்றால், அந்த நியமனம் 'ஹஜ்' யாத்திரையோடு தொடர்பானது. முஸ்லிம் அல்லாதவர் அந்த இடத்தில் கடமையாற்றும்போது 'ஹஜ்' யாத்திரைக்கான ஏற்பாடுகளைச் செய்வதில் கஷ்டமான நிலைமை ஏற்படும். அதன் காரணமாக அரசாங்கக் கட்சி முஸ்லிம் பாராளுமன்ற உறுப்பினர்களாகிய நாங்கள் 8 பேரும் ஒன்றாகச் சேர்ந்து எங்களுடைய வெளிநாட்டலுவல்கள் அமைச்சரோடு பேசினோம். அதன் பின்னர் அந்த நிலைமையை அவர் உணர்ந்து கொண்டார். எனவே, எங்கள் 8 பேருடைய ஒற்றுமையான செயற்பாட்டின்மூலம் நிச்சயமாக இந்த நாட்டுக்கும் நாட்டிலுள்ள முஸ்லிம்களுக்கும் சிறந்த ஓர் எதிர்காலத்தையும் பொருத்தமான சூழலையும் ஏற்படுத்திக் கொடுக்கக்கூடிய சக்தி எங்களுக்கு உள்ளது. நாங்கள் அரசாங்கத்தோடு கைகோர்த்து எம்மக்களின் வாழ்க்கைத் தத்துவத்திற்காகப் பாடுபடுவோம் என்று கூறி, இந்தச் சந்தர்ப்பத்தைத் தந்த உங்களுக்கு நன்றி கூறி, விடைபெறுகின்றேன்.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු නාමල් කරුණාරත්න නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 11ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 1.47]

**ගරු නාමල් කරුණාරත්න මහතා (කෘෂිකර්ම සහ පශු සම්පත් නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு நாமல் கருணாரத்ன - கமத்தொழில் மற்றும் கால்நடை வளங்கள் பிரதி அமைச்சர்)
(The Hon. Namal Karunaratne - Deputy Minister of Agriculture and Livestock)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, "දිට්වා" සුළි කුණාටුව නිසා අපේ රටට විශාල ආපදාවක් සිද්ධ වුණා. 646කට ආසන්න ප්‍රමාණයකට ජීවිත අහිමි වුණා. 173කට වැඩි ප්‍රමාණයක් අතුරුදන් වුණා. ඒ වාගේම, නිවාස 5,988ක් සම්පූර්ණයෙන් - පූර්ණ වශයෙන් - හානියට පත් වෙලා තිබෙනවා. නිවාස 108,043කට වැඩි ප්‍රමාණයක් අර්ධ හානියට පත් වෙලා තිබෙනවා. මේ ආපදාව නිසා ජන ජීවිත විශාල කඩා වැටීමකට ලක් වෙලා තිබෙනවා. ඒ අනුව, රජය ස්වේච්ඡා සංවිධානවල සියලු දෙනාගේම සහයෝගය සහිතව රාජ්‍ය ආයතනවල, රාජ්‍ය නිලධාරින්ගේ පූර්ණ දායකත්වය යටතේ වන්දි ලබා දීමේ ක්‍රියාවලිය, රට යථා තත්ත්වයට පත් කිරීමේ ක්‍රියාවලිය ළහිලහියේ සිද්ධ කරන්න පටන් ගත්තා. ඒ අනුව සතියක් හමාරක්, දෙකක් යනකොට රට සාමාන්‍ය තත්ත්වයට ගන්න පුළුවන්කම ලැබුණා. මෙහිදී අපේ රටේ පොදු මහ ජනතාවත්, රජයේ ආයතනත්, රාජ්‍ය නිලධාරිනුත්, අපේ මහජන නියෝජිතයනුත් පාට, පක්ෂ භේදයෙන් තොරව කරන ලද ඒ පොදු මැදිහත්වීම ඉතාම වැදගත් වුණා. ඒක මේ වෙලාවේ ගෞරවාන්විතව මම මතක් කරන්න ඕනෑ.

කෘෂි කර්මාන්තය පැත්තෙන් ගත්තොත්, විශේෂයෙන්ම මේ ව්‍යසනයත් එක්ක අපේ රටේ ආහාර හිඟයක් එයි ද කියන සාකච්ඡාවක් ආවා. ඒ පිළිබඳව සමහර අය බොහොම සතුටින් මාධ්‍යවලට ප්‍රකාශ ඉදිරිපත් කළා. "ඉදිරියේදී රටේ එළවලු හිඟයක් එනවා; සහල් හිඟයක් එනවා; ආණ්ඩුව ඒකට මුහුණ දෙන්නේ කොහොමද, ඒකට මේ ආණ්ඩුවේ වැඩ පිළිවෙළ මොකක්ද කියලා බලමු" කියලා සමහර අය කිව්වා. නමුත්, ඒ සියල්ල ව්‍යර්ථ කරන්න අපි සමත් වෙලා තිබෙනවා. අපි ඉතා වගකීමෙන්

[ගරු නාමල් කරුණාරත්න මහතා]

කියනවා, අපේ රටේ සහල් හිඟයක් එන්නේ නැහැ කියලා. ඒ වාගේම තමයි, අපේ රටේ එළවලු හිඟයක් නැහැ. ආහාරවල හිඟයක් එන්නේ නැත. ඒ සියලුම ගැටලු අපි මේ වෙනකොට නිරාකරණය කර ඇති බව මේ වෙලාවේ මම ප්‍රකාශ කරන්න කැමැතියි.

විශේෂයෙන් අස්ලම් මන්ත්‍රීතුමාට කලින් කථා කරපු මගේම නම තිබෙන මන්ත්‍රීතුමා ප්‍රකාශ කෙරුවා, අපි කිව්වා ලු, අක්කරයකට රුපියල් ලක්ෂ එකහමාරක් දෙනවා කියලා. අපි එවැනි ප්‍රකාශයක් කරලා නැහැ. හැබැයි, මේ වනකොට ගොවි ජනතාවගේ පැත්තෙන් ගත්තොත් ගොවියාගේ වගාවන් හානි වුණොත් වන්දි ගෙවීමේ ක්‍රියාවලියක් තිබුණා; නැත්තේ නැහැ. ඒ ගෙව්වේ භෝග 6කට. ඒ තමයි, මිරිස්, අර්තාපල්, ලොකු ලූනු, සෝයා, වී සහ බඩඉරිඟු. මේ භෝග හයට පමණයි වන්දි ගෙව්වේ. ඒ ගෙවීමේ ක්‍රමවේදයට අනුව ගත්තොත්, මේ ආපදාවත් එක්ක පැළ ගොයමට තමයි හානි වුණේ; ඒ ගොයමට අක්කරයකට ලැබෙන්නේ රුපියල් 16,000යි. එහෙම නම් ඒ රුපියල් 16,000 වෙනුවට, මේ වෙනකොට ගොවි ජනතාවට අක්කරයකට රුපියල් 60,000ක් ලැබිලා තිබෙනවා. මේ අනුව විශේෂයෙන්ම ගොවීන් 96,847දෙනෙකුට මේ වන්දි මුදල් ගෙවා අවසානයි, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

හෙක්ටෙයාරවලින් ගත්තොත්, හෙක්ටෙයාර 50,005කට මේ වෙනකොට ගෙවලා අවසානයි. රුපියල් මිලියන 7,500කට වැඩි ප්‍රමාණයක් වී වගා කරන ගොවීන්ට වන්දි මුදල් ලෙස ගෙවලා අවසානයි. තව ප්‍රමාණයක් ගෙවන්න තිබෙනවා. ගිය අවුරුද්දට අදාළව ආපු තොරතුරුවලට අනුව අපි සම්පූර්ණයෙන් ගෙවලා අවසානයි. පහුවෙලා ආපු තොරතුරු ප්‍රමාණයක් තිබෙනවා. ඒ අනුව හෙක්ටෙයාර 9,000කට ආසන්න ප්‍රමාණයක් තිබෙනවා. ඒ ටිකටත් ඉදිරි දින කිහිපය තුළ ගෙවීම් කටයුතු කර අවසන් කරනවා. භෝග හයකට තමයි කලින් වන්දි ගෙව්වේ. හැබැයි, මේ වෙනකොට කැකිරි ද, පිපිඤ්ඤා ද, වට්ටක්කා ද, එළබටු ද, තිබ්බටු ද, වම්බටු ද, පතෝල ද, කරවිල ද කියන මේ ඕනෑම එළවලුවකට, ඒ වාගේම කෙසෙල් ද, අන්නාසි ද, පත්තක්කා ද කියන මේ ඕනෑම පලතුරකට වගා හානි වෙනුවෙන් අපි වන්දි ගෙවනවා. මෙහෙම වන්දි ගෙවීමේ ක්‍රමවේදයක් තිබුණේ නැහැ. ඒ තොරතුරු එකතු කර ගන්න එකත් ගැටලුවක් වෙලා තිබුණා. මොකද එහෙම system එකක් රටේ තිබුණේ නැති නිසා. එළවලු, බඩඉරිඟු ඇතුළු වෙනත් භෝගවලට අදාළව මේ වෙනකොට වන්දි ගෙවීම් සැලකිය යුතු ප්‍රමාණයක් කරලා තිබෙනවා. ඒ ගෙවීම් කටයුතු මේ වෙනකොට කරගෙන යනවා. ලබන මාසයේ මුල වෙනකොට, ඊටත් පෙර ඒ වන්දි මුදල් සියල්ල ගෙවා අවසන් කරන්න පුළුවන් බව මේ වෙලාවේ මම ප්‍රකාශ කරන්න කැමැතියි. විශේෂයෙන් එළවලු ගොවියෝ, අතිරේක භෝග වගා කරන ගොවියෝ 23,053කට මේ වෙනකොටත් වන්දි ගෙවා අවසානයි. එහෙම නම්, මේ පරිසරය ඇතුළේ රුපියල් මිලියන 826ක් මේ වෙනකොට අපි ගෙවලා තිබෙනවා. කවදාවත් ගොවි ජනතාවට මේ අතුරු භෝගවලට වන්දි ලැබුණේ නැහැ.

විපක්ෂයේ අය අද මේ වන්දි ගෙවීමේ ක්‍රියාවලිය ගැන කථා කරනවා; ප්‍රශ්න කරනවා. ඒගොල්ලන් ඒ කාලයේ ගෙවපු විදිය පිළිබඳව ගොවි ජනතාව දන්නවා. මාතලේ දිස්ත්‍රික්කයේ තමයි ලංකාවේ වැඩියෙන්ම ලොකු ලූනු නිෂ්පාදනය කරන්නේ. මාතලේ දිස්ත්‍රික්කය පැත්තේ කෙනෙකුම තමයි අද සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව ගෙනාවේ. ඒ නිසා මම එතැනින්ම මතක් කරන්නම්. ලොකු ලූනු බීජ ගොවියාගේ ලොකු ලූනු බීජ එදා ආණ්ඩුව ගත්තා, රුපියල් 9,000 ගණනේ ගෙවනවා කියලා. නමුත්, සත පහක් ගෙව්වේ නැහැ, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. අපි අනුරාධපුරයට ගිහිල්ලා මේ ගැන සාකච්ඡා කළා, පී. හැරිසන් හිටපු ඇමතිතුමා එක්ක. අපි මේක සාකච්ඡා කළා, දඹුල්ලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී මාතලේ නියෝජනය කළ අලුවිහාරේ හිටපු ඇමතිතුමා එක්ක. අපි මේක සාකච්ඡා කෙරුවා, විදුර වික්‍රමනායක හිටපු ඇමතිතුමා එක්ක. අපි පෙළපාළි ගියා; උද්ඝෝෂණ කෙරුවා; ආයතන වැටලුවා. ගමගෙදර දිසානායක නියෝජ්‍ය ඇමතිතුමා මගේ ළඟ ආසනයේ ඉන්නවා. අපේ අනෙක් මන්ත්‍රීතුමාත් ඉන්නවා. එතුමන්ලාත් දන්නවා ඇති, එදා ගොවීන්ට සත පහක් ගෙව්වේ නැහැ කියලා. පොලු තිබ්බා. රුපියල් 9,000 ගණනේ ගෙවනවා කියලා තමයි ගොවියාගේ ලොකු ලූනු බීජ ගත්තේ. නමුත්, ගෙව්වේ නැහැ. මේක තමයි ඉතිහාසය. කොහේද වන්දි ගෙවන්නේ? ගොවියාගේ බඩු ටික අරගෙන සල්ලි ගෙව්වේත් නැහැ.

ඒ විතරක් නොවෙයි, වැලිමඩ, ඌවපරණගම, බොරලන්ද, බොරගස්වැව ඇතුළු ස්ථාන හයකදී පසුගිය ආණ්ඩුව ගොවි ජනතාවගේ අර්තාපල් ගත්තා. අල කිලෝ 2,044,000ක් ගත්තා. රුපියල් 95 ගණනේ ගොවියාට ගෙවනවා කිව්වා. මොකද කළේ? සත පහක් ගෙව්වේ නැහැ. ගොවියාට පොලු තිබ්බා. අන්තිමට අපට සිදු වුණා, උද්ඝෝෂණ කරන්න; අමාත්‍යාංශය වටලන්න. අපේ නායකත්වයෙන් ගිහිල්ලා ඒ අමාත්‍යාංශය වැටලුවා. ඇමති පැන්නා. හැබැයි, පැනපු ඇමති අපි නැවත වතාවක් ගෙන්වා ගත්තා. ගෙන්වා ගෙන ඒ මුදල්වලින් කොටසක් ගත්තා. හැබැයි, තවමත් ඒ ගොවි ජනතාවට පොලු තියපුවා එහෙමමයි. තවමත් කෝටි තුන, හතරක් ගොවි ජනතාවට ගෙවලා නැහැ. මේක තමයි තත්ත්වය. අන්න එහෙමයි මේගොල්ලන් පොලු තිබ්බේ. මේක තමයි ඒගොල්ලන්ගේ ඉතිහාසය.

ඒ වාගේම මොනරාගල බඩඉරිඟු ගොවියාට පොලු තිබ්බා, කෝටි 16ක්. අම්පාරේ ගොවියාට කෝටි 32ක් පොලු තිබ්බා. ගෙව්වේ නැහැ. අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අපි කොච්චර ගියාද? අපි කොච්චර පෙළපාළි ගියාද? උද්ඝෝෂණ කෙරුවාද? එදා අම්පාරේ හිටපු මහ දිසාපතිතුමා ලොකු මැදිහත්වීමක් කෙරුවා, ගොවි ජනතාවට මේ වන්දි මුදල් ටික අරගෙන දෙන්න. හැබැයි, සාර්ථක වුණේ නැහැ. එදා තිබුණු ආණ්ඩු, අද මෙතැන ඉඳන් කිඹුල් කඳුළු හෙළන හිටපු මැති ඇමතිවරුන්ගේ ආණ්ඩු එදා කටයුතු කෙරුවේ ඔන්න ඔය විදියටයි.

ගොවියාට සැලකුවේ ඔන්න ඔය විදියට. ඒගොල්ලෝ අද මෙතැනට ඇවිල්ලා මිනිස්සු ගැන, ගොවි ජනතාව ගැන පුදුම අනුකම්පාවකින් කථා කරනවා. මේවා අහන ගොවි ජනතාවට මොන පැත්තෙන් හිනා යනවාද දන්නේ නැහැ.

මේ වෙනකොටත් අපේ රටේ වැව් 282ක් පූර්ණ හානි තත්ත්වයට වෙලා තිබෙනවා. වැව් වැඩියෙන්ම හානි වෙලා තිබෙන්නේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ. අමුණු 625කට හානි වෙලා තිබෙනවා. වැඩියෙන්ම හානි වෙලා තිබෙන්නේ බදුල්ලේ. ඇළ මාර්ග 551කට හානි වෙලා තිබෙනවා. වැඩියෙන්ම හානි වෙලා තිබෙන්නේ මහනුවර. වැව් 1,017ක් අර්ධ හානි තත්ත්වයට වෙලා තිබෙනවා. වැඩියෙන්ම හානි වෙලා තිබෙන්නේ අනුරාධපුරයේ. අමුණු 734ක්, ඇළ මාර්ග 2,026ක් අර්ධ හානි වෙලා තිබෙනවා. ඒ වාගේම සුළු හානි ගත්තොත්, වැව් 257ක්, අමුණු 74ක්, ඇළ මාර්ග 615ක් ආදී වශයෙන් කැඩිලා බිඳිලා තිබෙනවා. අපි මේ සියල්ල හදනවා. මේ එකක්වත් මේ තත්ත්වයෙන් තබන්නේ නැහැ. අපි මේ සියල්ලම හදනවා. මේවා යථා තත්ත්වයට ගන්නවා. මේ සුළි කුණාටුවත් එක්ක අපේ රටට වුණු හානියේදී ඒවා යථා තත්ත්වයට පත් කරන එක පමණක් නොවෙයි, අපේ ඉලක්කය. අපේ ඉලක්කය තමයි තිබුණු තැනින් ඒවා අනිවාර්යයෙන් උඩට ගන්න එක.

සභාව කල් තබන අවස්ථාවේ ගෙනෙන ලද මේ යෝජනාව ඇතුළේම ප්‍රකාශ කරලා තිබෙනවා, ප්‍රාදේශීය ලේකම්වරුන්ගෙන්, ග්‍රාම නිලධාරිවරුන්ගෙන් මේ වැඩකටයුතුවලදී යම් යම් විරෝධතා ඇවිල්ලා තිබෙනවා කියලා. නිකම් බොරු කියන්න එපා. ඇත්තටම ඒ නිලධාරින් රජයේ මුදල් ඉතිරි කර ගැනීමට අදාළව යම් යම් ධනාත්මක තත්ත්වයන් ඇතුළේ ඒගොල්ලන්ගේ අදහස් ඉදිරිපත් කර තිබෙනවා මිස මේ සම්බන්ධයෙන් විරෝධතාවක් නොවෙයි ඉදිරිපත් කර තිබෙන්නේ. අර්ධ හානිවලදී ඒ නිවාසයට රුපියල් 25,000ක, රුපියල් 30,000ක හානියක් වෙලා තිබුණත්, රුපියල් ලක්ෂ 5ක වන්දියක් ඒගොල්ලන්ට හම්බ වෙනවා. අන්න ඒ විධියට තමයි මේ කටයුත්ත සිදු වන්නේ.

අපි ගංවතුරට යට වුණු ප්‍රදේශවලට ගියා. අපි ඒ ගිය පැතිවල ජනතාවගේ ගෙවල්වල බිත්තිවල දිනයත් එක්ක ගංවතුර මට්ටම ඇඳලා තිබුණා, කලින් මට්ටම මෙන්න මේක, දැන් මට්ටම මේක කියලා.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසන්.

**ගරු නාමල් කරුණාරත්න මහතා**
(மாண்புமிகு நாமல் கருணாரத்ன)
(The Hon. Namal Karunaratne)
මම ඉක්මනින් අවසන් කරනවා, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

ඒ ජනතාව කියන්නේ මොකක්ද? "මීට කලින් මෙහෙම යට වුණාම බඩු මල්ලක් නම් අපට හම්බ වෙලා තිබෙනවා. බොරු කියන්න ඕනෑ නැහැ නේ. ඊතැනින් පස්සේ නම් වෙච්ච දෙයක් නැහැ" කියලා තමයි ඔවුන් කියන්නේ. මේ උත්තරය තමයි ඒ ජනතාවගෙන් ගොඩක් වෙලාවට එන්නේ.

අපේ රටට සුනාමි ආවා. සුනාමි හරහා ආපු මහා ධනස්කන්ධය හොරා කෑවා. ඒකත් එක්ක ඒගොල්ලන්ට වෙන වෙනම නම් හැදුණා. ඒගොල්ලෝ හැදුණා. ඒගොල්ලෝ ගොඩ ගියා. ඒක තමයි තිබුණු තත්ත්වය. ඒගොල්ලෝ බෙදා ගත්තා. ඒගොල්ලෝ බදා ගෙන කෑවා. හැබැයි, ඒගොල්ලෝ බෙදා ගත්තු, ඒගොල්ලෝ බදාගෙන කාපු සංස්කෘතිය අපි සම්පූර්ණයෙන් වෙනස් කරලා තිබෙනවා. අද ජනාධිපති අරමුදල ජනතාව වෙනුවෙන් හරවා තිබෙනවා. ඒගොල්ලෝ ගිනි වන්දි කියලා ගෙදරට වෙනම කෝටි කන්දරාවක් ගත්තා. රක්ෂණය කරලා ඒකෙන් වෙනම මුදල් ගත්තා. ඊට පස්සේ ගෙවලුත් ගත්තා. ඒගොල්ලෝ බෙදා ගත්තා. අන්න ඒ සංස්කෘතිය වෙනස් කරලා තමයි අපි පොදු මහ ජනතාවට මේ සහනාධාර සියල්ල හරවා තිබෙන්නේ.

අවසාන වශයෙන් මම මේ කාරණයත් කියන්න කැමැතියි. මේ ආපදාව නිසා අපේ රටට විශාල හානියක් වුණා. හානියට පත් වුණු රට අපි අනිවාර්යයෙන්ම උඩට ගන්නවා. ඊට අදාළ ශක්තිය, ධෛර්යය අපට තිබෙනවා. මොන බාධක ආවත් අපේ රට අපි ඉදිරියට අරගෙන යනවා කියන කාරණය ප්‍රකාශ කරමින් මා නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු ජීවන් තොන්ඩමන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

[பி.ப. 2.00]

**ගරු ජීවන් තොන්ඩමන් මහතා**
(மாண்புமிகு ஜீவன் தொண்டமான்)
(The Hon. Jeevan Thondaman)
கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, 'தித்வா' புயலுக்குப் பின்னரான நாட்டினுடைய நிலைமை சம்பந்தமாக இன்றைக்கு நடைபெறுகின்ற விவாதத்திலே அநேகமான உறுப்பினர்கள் தங்களுடைய கருத்துகளைத் தெரிவித்திருந்தார்கள். குறிப்பாக, மலையக மக்கள் சம்பந்தமாக என்னுடைய கருத்தையும் கட்டாயம் நான் இங்கே தெரிவித்தாக வேண்டும். மலையகத்தில் இருக்கின்ற சிவில் அமைப்புகள் ஒன்றுசேர்ந்து இந்த அனர்த்தத்தின் பின்னர் எடுக்கப்படவேண்டிய நடவடிக்கைகள் பற்றிய ஓர் ஆவணத்தைத் தயார் செய்திருந்தன. இது தொடர்பாக எவ்வாறு நடவடிக்கையெடுக்க வேண்டுமென்ற தெளிவான ஓர் ஆவணத்தை நான் கடந்த பாராளுமன்ற அமர்வின்போது சமர்ப்பித்திருந்தேன். ஆனால், அவற்றைக் கணக்கிலும் எடுக்கவில்லை, கவனத்திலும் எடுக்கவில்லை. அந்த வகையில், இன்றைக்கு இருக்கின்ற தருணத்தைப் பொறுத்தவரைக்கும் மலையக மக்களை இரண்டாந் தரப் பிரஜைகளாகத்தான் அரசாங்கம் நடத்தியிருக்கிறது. இதற்கு முக்கியமான காரணங்கள் என்னவென்று நான் சொல்கின்றேன்.

இன்றைய காலகட்டத்தில் ஆயிரக்கணக்கான வீடுகள் மலையகத்தில் பாதிக்கப்பட்டிருக்கின்றன. பாதிக்கப்பட்ட வீடுகளில் வாழ்கின்ற குடும்பங்கள் அனைத்துக்குமே அதே தோட்டப் பகுதியில் மாற்று இடத்தை வழங்க முடியும்; அவ்வாறு வழங்குவதற்கு அங்கே இடம் இருக்கின்றது. அதனை நாங்கள் தெளிவாகச் சொல்லியிருந்தோம். ஆனால், மாற்று இடத்தை வழங்குவதற்கு அரசாங்கம் எந்தவிதமான நடவடிக்கையும் எடுக்கவில்லை. அங்கே என்ன நடந்திருக்கின்றது? அங்கிருக்கின்ற கிராம உத்தியோகத்தரும் காவல்துறை அதிகாரிகளும் பெருந்தோட்டத்துறை முகாமையாளர்களுடன் கைகோர்த்துக்கொண்டு அங்கு முகாம்களில் வாழுகின்ற மக்களை வலுக்கட்டாயமாக அதே இடிந்துபோன வீடுகளுக்குத் திருப்பி அனுப்பியிருக்கிறார்கள். அங்கு அந்த மக்களுக்கு ஏதாவது சேதாரம் நடந்ததென்றால், அரசாங்கம் கட்டாயம் அதைப் பொறுப்பெடுத்தாக வேண்டும். அது மட்டுமல்லாமல், இப்போது இருக்கின்ற சூழ்நிலையில் அங்கே வாழுகின்ற மக்களை ஒன்றுகூட்டி எந்தவிதமான பேச்சுவார்த்தையும் நடத்தாமல், ஏதோ மாடுகளை அனுப்புவதுபோலத்தான் அனுப்பிக் கொண்டிருக்கிறார்கள். அப்படியிருக்கும்போது மலையக மக்கள் சார்பாக அரசாங்கம் நியாயமாக நடந்திருக்கிறது என்று எப்படி எங்களால் சொல்ல முடியும்?

இவ்வளவு நாளாக நான் அரசாங்கத்திற்கு ஆதரவு கொடுத்தேன். மலையக மக்களுக்கு இந்த மாதிரியான பிரச்சினைகள் இருக்கின்றன. இந்தப் பிரச்சினைகளை நீங்கள் ஒரு வாய்ப்பாகப் பயன்படுத்தி அங்கே வாழுகின்ற மக்களுக்கு மாற்று இடத்தைக் கொடுங்கள்! அவர்களுக்கு வீடு கட்டிக் கொடுப்பதற்கு கட்டாயம் பல்வேறு donors வருவார்கள். ஆனால், இன்றைக்கு அங்கு வாழ்கின்ற மக்கள் திரும்ப அதே இடிந்த வீடுகளில் போய் வாழ்ந்துகொண்டிருக்கிறார்கள். அது மட்டுமல்ல, கௌரவ அமைச்சர் அவர்கள் சொல்லியிருந்தார், "நாங்கள் இந்த வருஷம் காணி உறுதிப் பத்திரங்களும் வழங்கி, 7,000 வீடுகளைக் கட்டிக் கொடுக்கப்போகிறோம்" என்று. 2025 ஜனவரியில் இதே அமைச்சர் சொன்ன விஷயம், "நாங்கள்

[ගරු ජීවන් තොන්ඩමන් මහතා]

4,500 வீடுகளைக் கட்டி மலையக மக்களுக்கு ஒப்படைக்கப்போகிறோம்" என்பது. போன வருஷம் கட்டிய வீடுகளைத்தான் இந்த வருஷம் ஒப்படைக்கப் போகிறார்கள். நான் மறுபடியும் சொல்கிறேன், நீங்கள் வீடுகளைக் கட்டி ஒப்படையுங்கள்! அதில் எந்தத் தவறும் இல்லை; அதில் எந்த மாற்றுக் கருத்தும் கிடையாது. ஆனால், அதற்குப் பெயர் வீட்டுரிமை! மலையக மக்கள் கேட்பது காணி உரிமை! காணி உரிமைக்கும் வீட்டுரிமைக்கும் பெரிய வித்தியாசம் இருக்கின்றது.

இன்றைக்கு மலையகத்தில் 1½ இலட்சம் குடும்பங்கள் வாழ்கின்றன. 1½ இலட்சம் குடும்பங்களுக்கும் தலா 28 இலட்சம் செலவில் வீடுகள் கட்டுவது சாத்தியம் கிடையாது. எதிர்க்கட்சியிலிருந்தும் நான் உங்களுக்கு ஆதரவாகத்தான் சொல்லிக் கொண்டிருக்கின்றேன். ஏனென்றால், நாட்டின் பொருளாதார நிலைமை அப்படியிருக்கின்றது. ஆனால், இன்றைக்கு காணி உறுதிப் பத்திரங்கள் வழங்குவதற்கு வெறுமனே 28,000 ரூபாய்தான் தேவைப்படுகின்றது. அங்கு 204,000 ஹெக்டயர் நிலப்பரப்பு இருக்கின்றது. இந்த 1½ இலட்சம் குடும்பங்களுடைய தலையெழுத்தை மாற்றுவதற்கு வெறுமனே 5,000 ஹெக்டயர் காணிதான் தேவைப்படுகின்றது. ஆனால், இப்போது இருக்கின்ற சூழ்நிலையில் காணி உரிமை சம்பந்தமாக எந்தப் பேச்சுவார்த்தையும் இல்லை.

இன்னொரு விஷயம், மக்களை இடமாற்றம் செய்தார்களோ இல்லையோ, 2 மாதங்களுக்கு முன்னர் அனர்த்தம் மற்றும் அங்கே இருக்கின்ற சில குறைபாடுகள் காரணமாக நோர்வூட் பிரதேச செயலகத்தை ஹற்றனுக்கு மாற்றுவதாகச் சொல்லியிருந்தார்கள். அந்த மாற்றம் தற்காலிகமானதா, நிரந்தரமானதா? இன்றைக்கு நோர்வூட் பிரதேச சபைக்கு உட்பட்ட குடும்பங்கள் கஷ்டப்படுகின்றன. அதேநேரத்தில், நோர்வூட் பிரதேச செயலகமாக இருக்கட்டும், தலவாக்கலை பிரதேச செயலகமாக இருக்கட்டும், இரண்டுக்குமே ஒரே பிரதேச செயலாளர்தான் இருக்கின்றார். அதாவது, அவருடைய 3 கடமை நாட்களை தலவாக்கலை பிரதேச செயலகத்திற்கும், 2 நாட்களை நோர்வூட் பிரதேச செயலகத்திற்கும் ஒதுக்கிவைப்பாராம். அப்படியிருக்கும்போது இந்தப் பிரதேச செயலகத்தை உருவாக்கி என்ன பிரயோசனம்?

கௌரவ உறுப்பினர்களே, உங்கள் எல்லோருக்கும் ஒரு விஷயம் புரிந்தாக வேண்டும். இந்த நோர்வூட் பிரதேச செயலகத்தை ஹற்றனுக்கு இடமாற்றம் செய்தது ஒரேயொரு காரணத்திற்காகத்தான். அதாவது, ஆளும்கட்சியில் இருக்கின்ற ஓர் உறுப்பினர் ஹற்றனில் போய் இருந்தால் தமக்கு வசதியாக இருக்கும் என்பதனாலும், அங்கே அரசாங்கம் கொடுக்கின்ற நிவாரணங்களைத் தாங்கள் கொடுப்பதாகச் சொல்வதற்காகவுமே! அது பிரச்சினை இல்லை, அது அரசியல்! அதைக்கூட மன்னிக்கலாம். ஆனால், ஒரு நபரின் வசதிக்காக மற்றைய இடத்திலுள்ள வளங்களை ஏன் குறைக்க வேண்டும்? அதேமாதிரி, நோர்வூட் பிரதேச செயலகம் மற்றும் அம்பகமுவ பிரதேச செயலகம் ஆகிய இரண்டுக்குமே ஒரே கணக்கு உத்தியோகத்தர்தான் நியமிக்கப்பட்டிருக்கின்றார். ஏன் அரசாங்கத்தால் அதன் தேவைக்கேற்ப கணக்கு உத்தியோகத்தரை நியமிக்க முடியவில்லை? நாங்கள் இந்த நாட்டின் பிரஜைகள் கிடையாதா, என்ன?

அது மட்டுமில்லாமல், இன்றைக்கு இருக்கிற சூழ்நிலையில் நீங்கள் எல்லோருமே இன்னொரு விஷயத்தைப் புரிந்துகொள்ள வேண்டும். இன்று காலையில், 1,750 ரூபாய் சம்பளத்தை வழங்குவது தொடர்பாக அமைச்சரவை அனுமதித்திருப்பதாக அமைச்சரவையிலிருந்து ஒரு கடிதம் வந்திருக்கின்றது. இந்த விஷயத்தை மலையக மக்களிடம் நான் நேரடியாகவே பேச விரும்புகின்றேன். கடந்த வரவு செலவுத்திட்ட வாக்கெடுப்பின்போது எதிர்க்கட்சியிலிருந்து அதற்கு ஆதரவாக வாக்களித்தது இந்த ஜீவன் தொண்டமான் மாத்திரமே. வேறு யாருமே கிடையாது! அவ்வாறு வாக்களித்ததற்குக் காரணம் பயம் கிடையாது, உங்கள் மூலமாக மலையக மக்களுடைய சம்பளம் அதிகரித்தால் போதும் என்பதுதான். ஆட்சிக்கு வருவதற்கு முன்பு இவர்கள் தோட்டத் தொழிலாளருக்கு 2,138 ரூபாய் அடிப்படைச் சம்பளம் வழங்கப்படும் என்று சொல்லியிருந்தார்கள். ஆனால், ஆட்சிக்கு வந்த பிற்பாடு அந்தப் பேச்சு அப்படியே அமுங்கிவிட்டது.

அன்றைக்கு நாங்கள் அரசாங்கத்தை உசுப்பேற்றுவதற்காக, "தோட்டத் தொழிலாளர்களின் சம்பளத்தை முடிந்தால் 10 ரூபாயாவது கூட்டிக் காண்பியுங்கள்!" என்று அழகாகச் சொன்னோம். மலையக மக்களின் நலன்கருதிச் சம்பளத்தைக் கூட்டுவதற்கு முயற்சி எடுத்தார்களா, இல்லாவிட்டால் ஜீவன் தொண்டமான் தவறானவரென்று நிரூபிக்க முயற்சி எடுத்தார்களா என்று தெரியவில்லை. ஆனால், சம்பளத்தை அதிகரிக்கக் காரணமாக இருந்ததற்காக நான் பெருமைப்படுகின்றேன். அதேநேரத்தில், 1,750 ரூபாய் அடிப்படைச் சம்பளம் வழங்குவதாக நீங்கள் சொல்லியிருந்தாலும், 1,550 ரூபாய்தான் இன்றைக்கு வழங்கியிருக்கின்றீர்கள்; பாக்கி 200 ரூபாய் 6 மாதக் கொடுப்பனவு. பரவாயில்லை, அதையும் நான் வரவேற்கின்றேன். எனினும், மலையக மக்கள் விடயத்தில் நீங்கள் சொன்ன வாக்குறுதியைக் காப்பாற்றவில்லை; 1,550 அடிப்படைச் சம்பளத்தை வழங்கியிருக்கின்றீர்கள்.

இன்றைக்கு ஆதங்கத்துடனும் கோபத்துடனும்தான் உங்கள் எல்லோரிடமும் நான் பேசிக்கொண்டிருக்கின்றேன். ஏனென்றால், இன்றைக்கு நீங்கள் மலையக மக்களை அடைமானம் வைத்திருக்கின்றீர்கள்! "பெருந்தோட்ட நிறுவனங்களை நம்பாதீர்கள்! அந்நிறுவனங்கள் சம்பளத்தை அதிகரிப்பதாகச் சொல்லிவிட்டுப் பின்வழியாகப் பெரிய பிரச்சினைகளை உருவாக்கும்" என்று இதே சபையில் நான் படித்துப் படித்துச் சொன்னேன். இன்றைக்கு ஹொரண பெருந்தோட்ட நிறுவனம், தலவாக்கலை பெருந்தோட்ட நிறுவனம் என்பன தோட்டத் தொழிலாளர்களுடைய normஐ 20 கிலோவில் இருந்து 22-23 கிலோ வரை கூட்டியிருக்கின்றன. அதேமாதிரி, மலையகத்தில் பல்வேறு பகுதிகளில் உள்ள பெருந்தோட்ட நிறுவனங்கள் இன்றைக்கு 20 கிலோ கொழுந்து பறித்த தொழிலாளர்களை 26 கிலோ வரைக்கும் பறிக்க வேண்டும் எனக் கூறியிருக்கின்றன. நாங்கள் உங்கள்மீது வைத்திருந்த நம்பிக்கைக்கு நீங்கள் திருப்பிக் கொடுப்பது இதுதானா? நீங்கள் எங்களுடைய தொழிலாளர்களுக்கு வழங்குகின்ற 200 ரூபாய் கொடுப்பனவுக்காக அவர்களிடமிருந்து எதிர்பார்க்கின்ற விஷயம் இதுதானா?

எங்களுடைய சனாதிபதி செய்வார் என்று நம்பி இன்றைக்குச் சிலர் இந்த அரசாங்கத்துக்குக் கொடி பிடித்துக்கொண்டு இருக்கலாம். அவ்வாறு கொடி பிடிக்கின்றவர்களாக இருக்கட்டும், தோட்டத்தில் வேலை செய்யாத நபர்களாக இருக்கட்டும், இந்தச் சபையில் உட்கார்ந்திருக்கின்ற நீங்களாக இருக்கட்டும், உங்கள் எல்லோரிடமும் நான் ஒரேயொரு விஷயத்தைச் சொல்கின்றேன். காலை, மத்தியானம், சாயங்காலம் என்று 3

தடவை மலையேறிப் போய்க் கொழுந்து பறிக்கின்றவர்களுக்குத்தான் தெரியும் பறிக்கும் கொழுந்தின் தொகையை ஒரு கிலோவால் கூட்டினால் எவ்வளவு பிரச்சினைகள் வரும் என்று. ஏன், இறாத்தலைக் கூட்டிச் சம்பளத்தை அதிகரிப்பதற்கு எங்களுக்குத் தெரியாதா?

2020இல் ஆட்சிக்கு வந்து 6 மாதத்திற்குளே 1,000 ரூபாயாகச் சம்பளத்தை அதிகரித்து வழங்கினோம். அவ்வாறு சம்பளத்தை அதிகரித்தாலும் கொழுந்து பறிக்கும் வழமையில் எந்த விதமான மாற்றமும் வரவேயில்லை; அது 20 கிலோ என்ற அதேயளவில்தான் இருந்தது. 2024இல் 1,350 ரூபாய் அடிப்படைச் சம்பளம் வழங்கினோம்; அப்போதும் கொழுந்து பறிக்கும் வழமையில் எந்தவிதமான மாற்றமும் கிடையாது. அந்தச் சம்பள அதிகரிப்பானது நிபந்தனையற்றதாகும். ஆனால், இன்றைக்கு Lethenty Marlboroughஇல் பறிக்கும் கொழுந்தின் இறாத்தல் அளவைக் கூட்டி இருக்கின்றார்கள். இன்றைக்குக் காலையில் நடந்த கேவலமான ஒரு விஷயம், அங்கே இருக்கின்ற தோட்ட முகாமையாளர் ஒருவர் நேரடியாக எங்களுடைய தலைவியிடம் போய் "மோ்஡ வேலை செய்யாதீர்கள்!" என்று சொல்லியிருக்கின்றார். இன்று மலையக மக்களுக்குத் தெரிந்திருக்கும் என்று நினைக்கின்றேன், அவர்களுக்கான பிரதிநிதித்துவம் இல்லையென்றால் என்ன நடக்குமென்பது. இதே விஷயம் தொடர்பாக நாங்கள் முன்னின்று தட்டிக்கேட்கும்போது, நாங்கள் நடிக்கிறோம் என்று சொன்னார்கள்; அடாவடித்தனம் பண்ணினோம் என்று சொன்னார்கள். அவ்வாறு செய்ததால்தான் எங்களுடைய சமூகத்துக்கு அந்தத் தோட்ட முகாமையாளர் மரியாதை கொடுத்தார். அது சம்பந்தமாக என்ன நடவடிக்கையை எடுக்கப் போகின்றீர்கள்? அவர்கள் பறிப்பதில் 8 கிலோ கொழுந்தை வெட்டிக் கொண்டிருக்கின்றார்கள்.

இவ்வாறு இருக்கும்போது இன்னொரு விடயமும் பேசப்பட்டுக் கொண்டிருக்கின்றது, Leaseஐ 99 வருடத்துக்கு அதிகரிக்கப்போவதாக. தயவுசெய்து அந்தத் தவறைப் பண்ணிவிடாதீர்கள்! எங்களுடைய மக்களை அடமானம் வைக்காதீர்கள்! இன்றைக்கு இருக்கின்ற சூழ்நிலையில் உங்கள்மீது பெரிய நம்பிக்கையை மக்கள் வைத்திருக்கின்றார்கள். ஆனால், அந்த மக்களுடைய நம்பிக்கையைக் கொஞ்சம் கொஞ்சமாகச் சிதைத்துக் கொண்டிருக்கின்றீர்கள். அது உங்கள் எல்லோருக்கும் தெரிந்தேயாக வேண்டும். இதற்கு நான் சனாதிபதி அவர்களையோ, பெருந்தோட்ட நிறுவனங்களையோ குறைசொல்லப் போவதில்லை; இன்று மலையகத்தைப் பிரதிநிதித்துவப்படுத்திக்கொண்டு ஆளுங்கட்சிலிருக்கின்ற உறுப்பினர்களைத்தான் குறை சொல்வேன். இவர்கள் ஆட்சிக்கு வருவதற்கு முன்னர் பேசியது ஒன்றாகவும் ஆட்சிக்கு வந்ததன் பின்னர் நடந்துகொள்ளும் விதம் வேறாகவும் இருக்கின்றது. இனி எந்த முகத்தை வைத்துக்கொண்டு இவர்கள் மலையகத்துக்குப் போவார்கள்? நான் மறுபடியும் சொல்கின்றேன், இன்னும் தாமதமாகவில்லை, தொழில் அமைச்சூமூலமாக தோட்டத் தொழிலாளர்களுக்கு ஒருநாள் சம்பளமாக 1,750 ரூபாய் வழங்க வேண்டுமென்று வர்த்தமானியை வெளியிடுங்கள்! பெருந்தோட்ட நிறுவனங்களை அதற்கான circularஐ வெளியிட வையுங்கள்!

இறுதியாக நான் ஒரேயொரு விடயத்தைச் சொல்வதற்கு விரும்புகின்றேன் - I am almost done, Madam Chair. Give me just one more minute.

இங்கு ஒவ்வொரு தடவையும் நாங்கள் மக்களுக்காகக் குரல் கொடுக்கும்போதும் சிலபேர் உடனே கங்கணம் கட்டிக்கொண்டு 76 வருடமாக மக்கள் பட்டுக்கொண்டிருக்கின்ற கஷ்டம், 200 வருட அடிமைத்துவம், உங்களுடைய குடும்பம் ஆட்சியிலிருந்தது என்று கூற வந்துவிடுவார்கள். இன்று, மலையக மக்களுக்குப் பிரஜாவுரிமை வாங்கிக் கொடுத்த சௌமியமூர்த்தி தொண்டமானுடைய பேரனாகவும், கல்விக்கு முன்னுரிமை கொடுத்த ஆறுமுகம் தொண்டமானுடைய வாரிசாகவும் பெருமையோடும் சொல்வேன் நான் மலையக மக்களைப் பிரதிநிதித்துவப்படுத்துகின்றேன் என்று. அதேநேரம், 55 தொழிற்சாலைகளை எரித்த நீங்கள் பேசும்போது, இனவாத துவேஷத்தில் ஈடுபட்ட நீங்கள் பேசும்போது, பேசுவதற்கு அருகதையில்லை என்று என்னிடம் சொல்வதற்கு உங்களுக்கு என்ன அருகதையிருக்கின்றது? நான் ஓர் அரசியல் குடும்பத்திலிருந்து பிறந்து வந்தவன்தான். அதற்காக மலையக மக்கள்மீது எனக்கிருக்கின்ற பாசம், பற்று, மரியாதையைத் தீர்மானிப்பதற்கு இங்கு யாருக்கும் அதிகாரமில்லை. நன்றி.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු ඊ.එම්. බස්නායක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.11]

**ගරු ඊ.එම්. බස්නායක මහතා**
(மாண்புமிகு ஈ.எம். பஸ்நாயக்க)
(The Hon. E.M. Basnayaka)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, "දිට්වා" සුළි කුණාටුව ඇතිවෙලා මාස දෙකකට ආසන්න කාලයක් ගතවන මේ මොහොතේ, ඒ පිළිබඳ විවාදයේදී අදහස් දැක්වීමට අවස්ථාව ලබා දීම පිළිබඳව මුලින්ම ඔබතුමියට ස්තුතිවන්ත වෙනවා.

මේ රටේ හිටපු ජනාධිපතිතුමෙකුගේ පුතෙක් පාර්ලිමේන්තුව නියෝජනය කරමින් ආපදාවට පත් වූ අපේ රටේ ජනතාවට මේ රජය කොහොමද සැලකුවේ කියලා අහනවා. මම කියන්නම්. ඔබතුමා කොහේ හරි ඉන්නවා නම් අහගන්න. මේ වන විට අපි රුපියල් 25,000 දීමනාව 428,084ක් වන ප්‍රතිලාභීන්ගෙන් 416,310දෙනෙකුට ගෙවලා තිබෙනවා. ඒක ගෙවීමේ ප්‍රතිශතය සියයට 97යි. ඒ ජනාධිපතිතුමාගේම පුතා ඊට පස්සේ කිව්වා, රුපියල් 50,000 වන්දි මුදල තවම ගෙවලා නැහැ කියලා. එතුමා කොහේ හරි ඉඳගෙන අහගෙන ඉන්නවා නම් මේ ගැන හොයලා බලන්න. ප්‍රතිලාභීන් 160,471දෙනෙකුගෙන් මේ වනකොට 109,912දෙනෙකුට ඒ මුදල ගෙවා අවසන් කර තිබෙනවා. මේ සංඛ්‍යා දත්ත දන්නේ නැතුව එතුමා මේ පාර්ලිමේන්තුවට ඇවිල්ලා වැරදි තොරතුරු ප්‍රකාශ කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අපි දන්නවා දිත්වා සුළි කුණාටුව ආවාට පස්සේ අපේ ජනාධිපතිතුමා ඇතුළු ආණ්ඩුව ජනතාවට ලබා දෙන ප්‍රතිලාභ ගැන තීන්දු ගන්නකොට අපේ රටේ තිබුණු තත්ත්වය. ආණ්ඩුව අරගෙන මාස තුනකට ආසන්න කාලයක් යනකොට අපි දන්නවා, අපේ රටේ තිබුණු ආර්ථික තත්ත්වය මොකක්ද කියලා. එදා රුපියලේ තත්ත්වය මොකක්ද? හැබැයි, ආපදාවට පත් වූ අවස්ථාවේ ජනතාව වෙනුවෙන් මෙහෙම ප්‍රතිලාභ වෙන් කරද්දී, පූර්ණ හානි වූ ගෙදරකට රුපියල් ලක්ෂ 50ක්, අර්ධ හානි වූ නිවසකට රුපියල් ලක්ෂ 5 සිට රුපියල් ලක්ෂ 25 දක්වාත්, පාසල් ළමුන්ගේ පොත් පත් උපකරණ ටික ගන්න රුපියල් 25,000ක්, ගෙදර උපකරණ

[ගරු ඊ.එම්. බස්නායක මහතා]

ටික ගන්න රුපියල් 50,000ක්, වී ගොවිතැන් කළ හෙක්ටෙයාරයකට රුපියල් 150,000ක්, එළවලු සහ බඩඉරිඟු හෙක්ටෙයාරයකට රුපියල් ලක්ෂ 2ක්, සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තවලට රුපියල් ලක්ෂ 2ක් වශයෙන් වන්දි ලබා දෙනවා කියනකොට, විපක්ෂයේ මහත්වරු හිතන්න ඇති ඒ මුදල් දෙන්න බැහැ කියලා. ඒ ඇයි? ඒ අය අවුරුදු 76ක් බංකොලොත් කරලා ගිය මේ රටේ, බත් මුට්ටිය වාගේම දංකුඩේත් හූරලා කාලා විනාශ කරපු මේ රටේ, අවුරුද්දකුයි මාස තුනක් යනකොට ආපදාවට ලක් වූ අපේ රටේ මිනිසුන්ට මෙහෙම ප්‍රතිපාදන වෙන් කරන්න අපි සූදානම් වෙනකොට ඒ අය හිතුවා ඒවා ගෙවාගන්න බැරි වෙයි, ඒවා කියන්නේ විහිලුවට කියලා. නැහැ, ගරු මන්ත්‍රීවරුනි. අපි ඒවා කිව්වේ පුළුවන් නිසායි. දැන් අපි ඒ වන්දි මුදල් ගෙවමින් ඉන්නවා.

ඒ වාගේම මීට ඉස්සෙල්ලා එක් මන්ත්‍රීවරයෙක් කථා කරලා දුවනවා අපි දැක්කා. එතුමා විනාඩි 10ක කථාවට විතරයි පාර්ලිමේන්තුවට එන්නේ. එහෙම ඇවිල්ලා අහනවා, දැන් ගෙවල් හදනවාද කියලා. ඔව්, ගෙවල් හදනවා තමයි. හැබැයි, ඒ ගෙවල් හදන්න ඕනෑ ස්ථිරසාර ලෙස. ඒක නිසා තමයි ජාතික ගොඩනැඟිලි පර්යේෂණ ආයතනය හරහා අදාළ පරීක්ෂණ වාර්තා ටික අරගෙන මේ වන විට දිස්ත්‍රික්ක මට්ටමින්, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් ඒ ඉඩම් ටික තෝරාගෙන තිබෙන්නේ. ඒ ඉඩම් ටික නැවතත් ජාතික ගොඩනැඟිලි පර්යේෂණ ආයතනයෙන් පරීක්ෂා කරන්න ඕනෑ. ජාතික ගොඩනැඟිලි පර්යේෂණ ආයතනයෙන් පරීක්ෂා කිරීමෙන් පසුව තමයි ආපදාවට ලක් වූ පූර්ණ හානි වුණු 6,000කට ආසන්න ප්‍රමාණයත්, ආපදාවට ලක් විය හැකියැයි විශ්වාස කරන 20,000කට ආසන්න ප්‍රමාණයත් පදිංචි කරන්න අපි සැලසුම් කරලා මුදල් වෙන් කරලා තිබෙන්නේ. ඒ නිසා මහත්තයෝ බලාගෙන ඉන්න. අපි දන්නවා, එදා සුනාමියෙන් ආපදාවට ලක් වූ අයට තවම වන්දි ටික ගෙව්වේ නැහැ, ඒ නිවාස ටික හැදුවේ නැහැ. සාලාවේ බෝම්බ පිපිරීමට අදාළව කළ යුතු කටයුතු ටික තවම කෙරිලා නැහැ. හැබැයි, දිත්වා ඇවිල්ලා මාස දෙකක් යනකොට අහනවා, "කෝ, ගෙවල් හැදුවාද" කියලා. ඔව්, හදනවා තමයි.

ඒ වාගේම අපි තව කාරණයක් බලන්න ඕනෑ. අපි මීට කලිනුත් සඳහන් කළා වාගේ, පූර්ණ හානියට ලක් වූ නිවාසවල හිටපු පුරවැසියා ඔහු ජීවත් වූ ගමේම, ඔහු ජීවත් වූ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ඇතුළේම, ඔහු ජීවත් වුණු දිස්ත්‍රික්කය ඇතුළේම පදිංචි කරවන්න පුළුවන්ද කියලා අපි බලනවා.

මොකද, ඒ මනුස්සයාගේ සංස්කෘතිය හැදිලා තිබෙන්නේ එතැන, ජීවනෝපාය මාර්ගය හැදිලා තිබෙන්නේ එතැන, ඥාති හිතවත්තු ටික ඉන්නේ එතැන. ඉතින්, අපි ඉස්සෙල්ලාම බලනවා, ඒ අය ඒ තැන්වලම පදිංචි කරන්න පුළුවන්ද කියලා. ඒක තමයි අපි බලන්නේ. නායයට අහුවෙලා, නායයට යටවෙලා, ගංවතුරට යටවෙලා නිවාස හානි වෙලා තිබෙනවා නම්, අන්න ඒ අය නැවත පදිංචි කරන්න පුළුවන්ද කියලා බලන්න ඕනෑ. ඔබතුමන්ලා පසුගිය කාලය පුරාවට ඒ ආයතනවලට අවශ්‍ය නිලධාරින් බඳවා ගැනීම කළේ නැහැ. හිටපු නිලධාරින් -ඉංජිනේරුවන් ටික, දොස්තරලා ටික, විශේෂඥ මිනිස්සු ටික- රට දාලා ගියා. දැන් ඒ ආයතනවල විශේෂඥ මිනිසුන් අතලොස්සයි ඉන්නේ. අන්න ඒ නිලධාරින්ගේ අඩුව නිසා ගොඩනැඟිලි පර්යේෂණ ආයතනයට තවම බැරි වෙලා තිබෙනවා, අදාළ පරීක්ෂණ ටික හරියට අවසන් කරගන්න. ඒ ටික අවසන් කරගත්තාට පස්සේ නැවත පදිංචි කිරීම අවසන් කරන්න පුළුවන්. අපේ ජනාධිපතිතුමා කුරුණෑගල දිස්ත්‍රික්යෙන් ඒ වැඩ කටයුතු පටන් ගත්තා. අපි අනෙක් දිස්ත්‍රික්කවලත් පටන් ගන්නවා. මේ වනවිට අපි ඒ තොරතුරු එකතු කරමින් ඉන්නවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, තව මන්ත්‍රීවරයෙක් කිව්වා මහනුවර දිස්ත්‍රික්කය ගැන. එතුමා තෝරාගත්ත ආසන කිහිපයක් ගැන කිව්වා. නැහැ, ගරු මන්ත්‍රීතුමනි. මහනුවර දිස්ත්‍රික්කයේ ප්‍රදේශීය ලේකම් කොට්ඨාස 20ටම හානි වුණා. ඔබතුමා එක ඉස්කෝලයක් ගැන විතරයි කිව්වේ. හැබැයි, ඊට වඩා ඉස්කෝල ප්‍රමාණයකට විශාල හානියක් වුණා; 173කට ආසන්න ප්‍රමාණයකට හානි වුණා. එක පාසලක් ගැන කියලා, තමන්ට ඡන්ද තිබෙන ආසනය, එහෙම නැත්නම් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ගැන විතරක් කියලා මෙතැනදී ඡන්දවලට කථා කරනවා. විළිලැජ්ජයි. මන්ත්‍රීවරු හැටියට අවුරුදු ගණනක් මේ පාර්ලිමේන්තුවේ ඉඳලා එහෙම කථා කරනවා.

ඒ වාගේම මම දැක්කා, පරම්පරා තුනක් මේ පාර්ලිමේන්තුව නියෝජනය කරලා වතු ජනතාවගේ එහෙම නැත්නම් ඒ මලයගම් ජනතාවගේ අයිතිවාසිකම් ටික දෙන්න බැරුව මෙතැනට ඇවිත් හඬා වැටෙනවා. ඔව්, ඔබතුමන්ලාට දුකයි තමයි; දුක් වෙන්න ඕනෑ. මුත්තාගේ ඉඳලා මේ වෙනකම් පරම්පරා තුනක් පාර්ලිමේන්තුව නියෝජනය කරලා ඒ මිනිසුන්ගේ අයිතිවාසිකම් ටික ලබා දෙන්න බැරි වෙලා තිබෙනවා. දැන් කියනවා, "ඉඩම් කැලි ටික දෙන්න පුළුවන්. ගෙවල් හදලා දෙන්න බැහැ" කියලා. නැහැ, අපි කියනවා අපි ගෙවලුත් හදලා දෙනවා කියලා. ඉඩම් කැලි ටිකත් දෙනවා. ඔබතුමන්ලා පරම්පරා තුනක් ඒ මිනිසුන්ගේ දහඩිය බිංදු ගැන, ඒ මිනිසුන්ගේ දුක්ගැනවිලි ගැන කිය කියා මේ පාර්ලිමේන්තුව නියෝජනය කළත්, ඒ මිනිසුන්ගේ අවශ්‍යතා ටික සම්පූර්ණ කරලා නැති මිනිස්සු.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අපේ මහනුවර දිස්ත්‍රික්කයට තමයි මේ ආපදාවෙන් වැඩිම හානිය වුණේ කියලා මම විශ්වාස කරනවා. විශේෂයෙන් මධ්‍යම පළාතට. මධ්‍යම පළාතේත් මහනුවර දිස්ත්‍රික්කයට. ලංකාවේ මරණ 640 ගණනක් වෙනකොට එයින් මරණ 243ක් මගේ දිස්ත්‍රික්කයේ සිදු වුණේ. අපි දන්නවා, මීමුරේ ගැන ගොඩක් කථා වුණා. ගංගොඩ ගැන ගොඩක් කථා වුණා. මී මුරේ පාරේ විතරක් කිලෝ මීටර් 34ක් ඇතුළත පනස්තුන් පොළකින් නාය ගිහින් තිබෙනවා. ඔය කියන මහත්වරු ඒක ඉක්මනින් හදලා අවසන් කරන්න කියනවා. ඔව්, අවසන් කරනවා තමයි. අපි රටක් හැටියට, ජාතියක් හැටියට, ආණ්ඩුවක් හැටියට රජයේ සියලු නිලධාරින් එකතු කරගෙන, මේ රටට ආදරය කරන සියලු මිනිස්සු එකතු කරගෙන, සියලු ආයතන එකතු කරගෙන මාස දෙකක් යන්න කලින් මේ රටේ ජනතාවගේ ජනජීවිතය යථා තත්ත්වයට පත් කළා. තව ස්ථිරසාරව කරන්න වැඩ තිබෙනවා. පාරවල් ටික හදන්න තිබෙනවා. ඒ මංමාවත් ටික හදන්න තිබෙනවා. ඒ ඇළවෙලි ටික හදන්න තිබෙනවා. ඒ නිවාස ටික හදන්න තිබෙනවා. ඒ අවශ්‍ය කටයුතු කරන්න තිබෙනවා තමයි. ගතවුණේ තවම මාස දෙකයි. "කෝ, ඔක්කොම අවසානද?" කියලා අහනවා.

අපි ඔය මහත්වරුන්ට කියනවා, ලෝක ඉතිහාසයේ එහෙම නැත්නම් ලංකා ඉතිහාසයේ ලංකාවට වැඩිම විනාශයක් කරපු, වැඩිම හානියක් කරපු ආපදාව මේ දිට්වා සුළි කුණාටුව බව. අඩුම ගණනේ මේකවත් තේරුම් ගන්න. මෙතැන කුහක දේශපාලනයක් තිබෙන්නේ. මිනිසුන්ගේ දහඩිය කඳුළු මතින් දේශපාලනය කරන එක, මිනිසුන්ගේ මිනී මතින් දේශපාලනය කරන එක, මිනිසුන්ගේ දුක් ගැනවිලි, බඩගින්න පදනම් කරගෙන දේශපාලනය කරන එක දැන්වත් නවත්වන්න මහත්වරුනි. අයින් කරන්න, ඔය කාලකණ්ණි අදහස. ඔය සංකල්පවලින් වෙනස් වෙන්න. මිනිස්සු ගැන හිතන්න, මිනිස්සු ලෙස. විපක්ෂයේ මන්ත්‍රීතුමන්ලාගෙන් එසේ ඉල්ලා සිටිමින්, මේ අවස්ථාව ලබාදීම ගැන ඔබතුමියට ස්තුතිවන්ත වෙනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු රුවන්තිලක ජයකොඩි මන්ත්‍රීතුමා, ඔබතුමාට විනාඩි අටක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.20]

**ගරු රුවන්තිලක ජයකොඩි මහතා**
(மாண்புமிகு ருவன்திலக்க ஜயக்கொடி)
(The Hon. Ruwanthilaka Jayakody)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ශ්‍රී ලංකා ඉතිහාසයේ අපි මුහුණ දුන්න දරුණුම අපදාව තමයි දිට්වා සුළි කුණාටුව. මෙයින් සිදුවූ භෞතික හානිය බැලුවොත්, ඩොලර් බිලියන 4.1ක් පමණ වෙනවා.

එය දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 4ට ආසන්නයි. ඒ වාගේම, මරණ 634කට අධික ප්‍රමාණයක් සිද්ධ වෙලා තිබෙනවා. ආණ්ඩුව විධියට සියලු අය කළමනාකරණය කරමින්, සියලු රාජ්‍ය යන්ත්‍රණය ගොනු කර ගනිමින් අපි ඒ ව්‍යසනයට මුහුණ දුන්නා. සියලු ග්‍රාම නිලධාරින්, ප්‍රාදේශීය ලේකම්තුමියන්ලා, ප්‍රාදේශීය ලේකම්තුමන්ලා, දිසාපතිතුමන්ලා සහ අනෙක් රාජ්‍ය නිලධාරින් ඇතුළු අපි සියලුදෙනාම එකතු වෙලා මූලික වටයේදී මේ ව්‍යසනය සාර්ථකව කළමනාකරණය කරන්න මැදිහත් වුණා. අපි එසේ මැදිහත් වෙද්දී නයි නාළිකාව, ලංකාවට පළමුවෙන්ම බොරු කියන නාළිකාව - ඒ ගොල්ලෝ - මේක ගැන වෙනස් මතයක් සමාජගත කරන්න හදනවා අපි දැක්කා. ඒ ගොල්ලෝ මේක විද්‍යාත්මකව වෙනස් විධියකට අර්ථ දක්වන්න හැදුවා. ඇත්තටම අපි ඒක ගැන විද්‍යාත්මකව කථා කරන එක වැදගත්.

"දිට්වා" සුළි කුණාටුව ලංකාවට ඉතාම ආසන්නයේ වර්ධනය වුණු නිසා ඒ වර්ධනය වෙන්න පටන් ගත්ත අවස්ථාවේම මධ්‍යම කඳුකරයට විශාල වැසි පතිත වුණා. ඒ වාගේම, මෙය ලංකාවේ ගිනිකොන දිග වෙරළෙන් ඇතුළු වෙලා ඉතා සෙමෙන් ලංකාව හරහා ගමන් කොට ලංකාවේ උතුරු ඊසාන දිග වෙරළෙන් ඉවත් වුණු නිසා ලංකාවේ හැම ප්‍රදේශයකටම එහි හානිය බලපෑවා. මේක පැය 48කට වැඩි කාලයක් ලංකාව තුළ සෙමෙන් ගමන් කිරීම හේතුවෙන් මධ්‍යම කඳුකරය ඇතුළු සෙසු ප්‍රදේශවලට අඛණ්ඩව ඉතා තද වැසි ඇති වුණා. එහෙම තමයි සිද්ධ වුණේ. මේක ඉතා කෙටි කාලයක් තුළ වර්ධනය වෙච්ච එකක්. හැබැයි ඒ අවස්ථාවේදී මාධ්‍ය මඟින් මෙවැනි දෙයක් කියන්න උත්සාහ කළා මට මතකයි. 2020දී "බුරවි" කුණාටුව මැඩපැවැත්වූවා, නමුත් "දිට්වා" සුළි කුණාටුව මැඩපවත්වන්න බැරි වුණා, ඒක කරන්න බැරි වුණේ ඇයි කියන අදහස මාධ්‍ය මඟින් සමාජගත කරන්න හැදුවා.

"බුරවි" සුළි කුණාටුව ගත්තොත්, එය ඉතා ඈතින් වර්ධනය වුණු එකක්. එය ශ්‍රී ලංකාවේ ඉතා ඈතින් වර්ධනය වෙන්න පටන් ගෙන ඊසාන දිග වෙරළෙන් ඇතුළු වෙලා ඉතා ඉක්මනින් ලංකාව හරහා ගමන් කරලා ලංකාවෙන් ඉවත් වුණු නිසා ලංකාවේ උතුරු කොටසට විතරයි බලපෑවේ. ඒක පැය 12ක්, 14ක් පමණ තමයි ලංකාව තුළ තිබුණේ. හැබැයි "දිට්වා" සුළි කුණාටුව පැය 48ක් තිබුණා. මොකද, එය හෙමිනුයි ගමන් කළේ. ඒ නිසා තමයි හානිය වැඩි වුණේ. ඒ වාගේම අපිට ඉක්මනින් මේ සම්බන්ධයෙන් කියන්න බැරි වුණේ. නමුත් "බුරවි" සුළි කුණාටුව සම්බන්ධයෙන් දවස් තුනකට කලින් කියන්න අපිට පුළුවන් වෙලා තිබුණා. මේවා කියන්නේ කවුද? කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව තමයි මේවා ගැන කථා කරන්නේ; විද්‍යාත්මක දත්ත ඉදිරිපත් කරන්නේ. කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව ඒ විද්‍යාත්මක දත්ත ඉදිරිපත් කරද්දී; පුරෝකථන ඉදිරිපත් කරද්දී; නිර්ණායක ඉදිරිපත් කරද්දී වෙනත් ආයතනවල දත්තත් ලබාගන්නවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, 1970දී "භෝලා" සුළි කුණාටුව බංග්ලා දේශය හරහා ගමන් කළ බව ඔබතුමියට මතක ඇති. ඒ ඉතිහාසයේ වාර්තා වූ ඉතාම මාරක නිවර්තන සුළි කුණාටුව. ඇත්තටම ඒකෙදි සිදු වූ හානියෙන් ලක්ෂ 5කට අධික ප්‍රමාණයක් මිය ගියා. මේ කලාපය තුළ කාර්යක්ෂම සුළි කුණාටු අනතුරු ඇඟවීම් සේවාවක වැදගත්කම ඒකෙදි හඳුනාගත්තා. එහෙම හඳුනාගෙන ලෝක කාලගුණ විද්‍යා සංවිධානය - WMO - ආසියා සහ පැසිෆික් කලාපයේ ආර්ථික හා සමාජයීය කොමිසම සමඟ එක් වෙලා 1972දී නිවර්තන සුළි කුණාටු පිළිබඳ පැනලය - Panel on Tropical Cyclones - නම් වූ අන්තර් රාජ්‍ය ආයතනයක් ස්ථාපිත කළා. ඒකට අදාළව ඉන්දියානු කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරනු ලබන නවදිල්ලි කලාපීය විශේෂිත කාලගුණ විද්‍යා මධ්‍යස්ථානය - Regional Specialized Meteorological Centre, RSMC - ස්ථාපිත කළා. උතුරු ඉන්දියානු සාගරය හරහා නිවර්තන සුළි කුණාටු නිරීක්ෂණය කිරීම, හඳුනා ගැනීම, පුරෝකථනය කිරීම සහ උපදේශ නිකුත් කිරීම සඳහා වගකිව යුතු මධ්‍යස්ථාන ලෙස ලෝක කාලගුණ විද්‍යා සංවිධානය එය නම් කළා. එම මධ්‍යස්ථානය මඟින් බෙංගාල බොක්ක සහ අරාබි මුහුද කියන ප්‍රදේශ ආවරණය කරනවා. RSMC එක බෙංගාල බොක්ක මුහුදු ප්‍රදේශයේ සහ අරාබි මුහුදේ වර්ධනය විය හැකි වායුගෝලයේ කැළඹිලි සහිත ස්වභාවයන්, ඒ තත්ත්වයන් චන්ද්‍රිකා නිරීක්ෂණ, රේඩාර් දත්ත සහ කාලගුණ අනාවැකි ආකෘති මඟින් නිරන්තර නිරීක්ෂණය කරමින්, ඒවා පීඩන අවපාත දක්වා වර්ධනය වුවහොත් ඒ ගමන් මඟ පථයද නිරීක්ෂණය කරලා ඒවා නිවේදන විධියට ඉදිරිපත් කරනවා. ශ්‍රී ලංකාවේ කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව ඒ දත්ත අරගෙන ඒවා පුරෝකථනය කරලා ඊට පස්සේ ඒවා අදාළ තැන්වලට ලබා දෙනවා. "දිට්වා" සුළි කුණාටු අවස්ථාවේත් වුණේ ඒක තමයි. RSMCවලින් නිවේදන නිකුත් කළ සැනින් කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව අදාළ අනතුරු ඇඟවීම් කළා.

ඒ අනුව අදාළ තාක්ෂණික ආයතන, ආපදා කළමනාකරණ අංශය ක්‍රියාත්මක වී අවශ්‍ය කටයුතු සූදානම් කළා. ඒ නිසා තමයි කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ පුරෝකථන භාවිත කරලා වාරිමාර්ග දෙපාර්තමේන්තුව නොවැම්බර් 25 වැනි දා ගංවතුර සම්බන්ධයෙන් පූර්ව අනතුරු ඇඟවීමක් සිදු කළේ. එහෙම තමයි සාමාන්‍යයෙන් ක්‍රියාත්මක වෙන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, පිලිපීනය වාගේ රටවල සාමාන්‍යයෙන් වසරකට ස්වාභාවික ව්‍යසන 17ක් පමණ සිද්ධ වෙනවා. ඒ රටවල සිටින ජනතාවට ඒ සම්බන්ධව අත්දැකීම් තිබෙනවා. එම අත්දැකීම් එක්ක ඒගොල්ලන් ඒ තැන්වලින් ඉවත් වීමේ ක්‍රමවේද සොයා ගෙන තිබෙනවා. හැබැයි, ලංකාව ගත්තොත් සාමාන්‍යයෙන් එවැනි ව්‍යසන සිද්ධ වෙන්නේ වසර 150ක් වැනි කාලයකදී 20 වතාවක් වාගේ තමයි. ඒ නිසා අපිට ඒ අත්දැකීම් අඩුයි. හැබැයි, අපි එවැනි තත්ත්වයකට මුහුණ දීමට නම්, ඒ සඳහා අවශ්‍ය නවීන යන්ත්‍රෝපකරණ භාවිත කරමින් කාලගුණ දත්ත ලබා ගනිමින් එම තාක්ෂණික කටයුතු දියුණු කරගෙන ඉදිරියට යෑමේ අවශ්‍යතාව තිබෙනවා.

අපි දියුණු රටවල් දෙස බැලුවොත්, බටහිර යුරෝපීය රටක 2021 වසරේදී විශාල ගංවතුර තත්ත්වයක් ඇති වුණා. එම සිදුවීමෙන් මිනිසුන් 220ක් විතර මරණයට පත් වුණා. ඒ රට සංවර්ධිත රටක්. ඔවුන් සතුව නවීන උපකරණ තිබුණා, සියලු දත්ත නිරීක්ෂණය කරන උපකරණ තිබුණා. නමුත් එම ස්වාභාවික ව්‍යසනයෙන් ඒගොල්ලන්ට ගැලවෙන්න බැරි වුණා. ඒගොල්ලොත් දැන් ඒ සම්බන්ධව පවතින දත්ත පරීක්ෂා කරමින් එම තාක්ෂණික කටයුතු වර්ධනය කර ගනිමින් පවතිනවා.

[ගරු රුවන්තිලක ජයකොඩි මහතා]

ස්වාභාවික ව්‍යසන කියන්නේ විශේෂිත වූ අවස්ථාවක්. එවැනි ව්‍යසන ඇති වෙන්න හේතුව තමයි ගෝලීය උණුසුම් තත්ත්වය. විශේෂයෙන්ම පුද්ගල ක්‍රියාකාරකම් එක්ක තමයි කාලගුණ වෙනස්වීම් සිද්ධ වෙන්නේ. ඒ නිසා ලෝකයක් විධියට අපි මේ ගැන හිතන්න ඕනෑ. අපි ලෝකයක් විධියට එකතු වී කාලගුණ විපර්යාස සම්බන්ධයෙන් වැඩ කටයුතු කරන්න ඕනෑ. එහෙම ආයතන තිබෙනවා. නමුත් ඒ සමහර ආයතන ක්‍රියාත්මක වන්නේ නැහැ. ඔවුන් එම කටයුත්තෙන් ඉවත් වෙලා තිබෙනවා. නමුත් ලෝකයක් විධියට අපි සියලු දෙනාම එකතු වුණොත් තමයි එවැනි ආපදා තත්ත්වයන්ගෙන් අපට ගොඩ එන්න පුළුවන් වන්නේ.

පසුගිය දා සිදු වුණු ආපදාවට අපි ආණ්ඩුව විධියට ඉතා ශක්තිමත්ව මුහුණ දුන්නා. එම ආපදාවෙන් ජීවිතක්ෂයට පත් වුණු ජනතාවට නැවත ජීවිතය ලබා දෙන්න අපට බැහැ. නමුත් අපිට කළ හැකි සියලු දේවල් කරලා එම ආපදාවට මුහුණ දුන් ජනතාවගේ ජීවිත නඟාසිටුවන්න අවශ්‍ය වැඩ කටයුතු කරනවා කියන කාරණය සඳහන් කරමින්, මා නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
මීළඟට, ගරු චමින්ද්‍රාණී කිරිඇල්ල මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි 7ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.28]

**ගරු නීතිඥ චමින්ද්‍රාණී කිරිඇල්ල මහත්මිය**
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) சமிந்திராணி கிரிஎல்லே)
(The Hon. (Mrs.) Chamindranee Kiriella, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අද දින සභාව කල් තබන අවස්ථාවේ විපක්ෂය විසින් මෙවැනි යෝජනාවක් ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් ඇත්තටම මම සන්තෝෂ වෙනවා. දිට්වා සුළි කුණාටුව නිසා අපේ රට තුළ විශාල ව්‍යසනයක් සිදු වුණා. එම සිදුවීම වෙලා අද වනවිට මාස එකහමාරකට, දෙකකට ආසන්න කාලයක් ගත වී තිබෙනවා. විශේෂයෙන්ම එම බලපෑමට ලක් වුණු අපේ ආදරණීය ජනතාව වෙනුවෙන් අපි සාධාරණයක් ඉටු කළ යුතු බව තමයි මම විශ්වාස කරන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මගේ කථාව ආරම්භ කරන්නට පෙර මම එක කාරණයක් ගැන සඳහන් කරන්න කැමැතියි. චතුරංග අබේසිංහ නියෝජ්‍ය අමාත්‍යවරයා මේ සභාව තුළ කථා කරනවා, මම දැක්කා. එතුමා වීදුරු ගෙවල්වල ඉඳිමින් ගල් ගහන බවක් තමයි මට ඒ අවස්ථාවේ පෙනී ගියේ. එතුමාට අමතක ඇති, එතුමාගේ පියාත් මේ පාර්ලිමේන්තුවේ කැබිනට් ඇමතිවරයකු වශයෙන් සිටින බව. ඒ වාගේම අපි දන්නවා, අපේ ගරු සභානායකතුමාගේ බිරිඳ මේ පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරියක් බව. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අපි ඡන්දයෙන් පත් වෙලා ආවේ. අපි පවුල් පිටින් මේ පාර්ලිමේන්තුවේ නැහැ. විශේෂයෙන්ම මේ ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන්ගේ කථා දිහා බලනකොට අපට පෙනී යනවා, ඔවුන් පරම්පරාගත දේශපාලනයක් ගැන කථා කරන බවක්. හැබැයි, අපි ඊළඟ වාරයකදී ආණ්ඩුවක් පිහිටුවනකොට අපටත් කියන්න වෙන්නේ, "ඔබ සියලු දෙනාම පවුල් පිටින් ආණ්ඩු කරලාත් හරියට කරගන්න බැරි වුණා" කියන එකයි.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මීට කලින් මහනුවර දිස්ත්‍රික්කයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුත් කථා කළා. ඇත්තටම ඒ අවස්ථාවේ මට පුදුම හිතුණා. මොකද, එතුමා කිව්වා, ගෙවල් ශුද්ධ කිරීම සඳහා ලබා දෙන රුපියල් 25,000ක මුදල ඒ ජනතාවගෙන් සියයට 90කට ලබා දීලා තිබෙනවා කියලා. මම හිතන විධියට එතුමාට අමතක වෙලා, එතුමා නියෝජනය කරන්නේ මහනුවර දිස්ත්‍රික්කය කියලා.

මොකද, මම ඊයේ මහනුවර දිසාපති කාර්යාලයෙන් මීට අදාළ දත්ත ලබා ගත්තා. අද වනකොට රුපියල් 25,000ක මුදල ලබා දීලා තිබෙන්නේ මහනුවර දිස්ත්‍රික්කයෙන් සියයට 65කටයි. "දිට්වා" සුළි කුණාටුවෙන් බලපෑමට ලක් වුණා, පවුල් 38,889ක්. පවුල් 20,000කට අද වෙනකල් රුපියල් 25,000 ලබා දීලා නැහැ. ඊට අදාළ ලේඛනය මම සභාගත කරන්නම්, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. ඒ වාගේම උඩදුම්බර ප්‍රදේශය ගත්තොත් - මට කලින් කථා කළ මන්ත්‍රීවරයා නියෝජනය කරන්නේත් උඩදුම්බර ප්‍රදේශය - ආපදාවට ලක් වුණු 4,315න් 1,645කටයි මූලික රුපියල් 25,000ක -පිරිසිදු කිරීමේ දීමනාව- මුදල ලබා දීලා තිබෙන්නේ.

"දිට්වා සුළි කුණාටුවෙන් ආපදාවට ලක්වූවන් සඳහා සහන සැලසීම 2025" නමැති ලේඛනය සහ ඊට අදාළ තවත් ලේඛනයක් මේ අවස්ථාවේදී මම **සභාගත*** කරනවා, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, දිසාපති කාර්යාලයෙන් සඳහන් කරන්නේ දෙසැම්බර් 31වැනි දාට පස්සේ කිසිම මුදලක් ලැබී නැහැ කියලා. අපි දැක්කා, අය වැය විවාදය කාලයේදී කිව්වා, භාණ්ඩාගාරය පිරී ඉතිරී තිබෙනවාය කියලා. නමුත් අපට ලැබුණු තොරතුරු අනුව දෙසැම්බර් 31වැනි දාට පස්සේ කිසිදු ගෙවීමක් කරලා නැහැ. ඒ නිසායි මම ඊට අදාළ වාර්තාව සභාගත කළේ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඒ වාගේම උපකරණ මිලදී ගැනීමට රුපියල් 50,000ක් දෙනවා කිව්වා. අපි දැක්කා, ජනාධිපතිතුමා "දිට්වා" සුළි කුණාටුවෙන් පසුව පාර්ලිමේන්තුවට ඇවිල්ලා ගොඩක් සුරංගනා කථා කිව්වා; අරක දෙනවා කිව්වා, මේක දෙනවා කිව්වා. හැබැයි අද අර්ධ හානි සහ පූර්ණ හානි සිදු වෙච්ච නිවාස 20,000ක් තිබුණත් 7,000කට අදාළව විතරයි ඒ රුපියල් 50,000 ලබා දීලා තිබෙන්නේ. පාසල් සිසුන්ට දෙනවාය කියපු දීමනාව ගත්තත් එහෙම තමයි. රුපියල් 25,000ක් දෙනවාය කියලා ජනාධිපතිතුමා කිව්වත්, අද වාර්තා වෙලා තිබෙන ආකාරයට රුපියල් 15,000ක් විතරයි පාසල් උපකරණ ලබා ගැනීමට ලබා දීලා තිබෙන්නේ. ඉතුරු රුපියල් 10,000 ජනාධිපති අරමුදලෙන් ලබා දෙනවාය කිව්වාට අද ඒ සම්බන්ධයෙන් කිසිදු කථාවක් නැහැ. අපට ඒ සම්බන්ධයෙන් කිසිදු වාර්තාවක් ලබා ගැනීමට නොහැකි තත්ත්වයක් තිබෙන්නේ. ඒ නිසා ඒ සම්බන්ධවත් මම විශේෂ ඉල්ලීමක් කරනවා. මොකද අපි දන්නවා, මහනුවර දිස්ත්‍රික්කය නියෝජනය කරමින් මන්ත්‍රීවරුන් 9ක් මේ සභාවේ ඉන්නවා; ප්‍රබල ඇමතිවරයෙක් ඉන්නවා; නියෝජ්‍ය අමාත්‍යවරයෙක් ඉන්නවා කියලා. නමුත්, මහනුවර දිස්ත්‍රික්කය නියෝජනය කරමින් විපක්ෂයෙන් ඉන්නේ මන්ත්‍රීවරු තිදෙනායි. ඒ නිසා ඒ වැඩ කටයුතු සාර්ථකව කර දෙන ලෙස මම ඉල්ලා සිටිනවා. මොකද අපි දැක්කා, පසුගිය කාලයේ සමහර නියෝජ්‍ය අමාත්‍යවරුන් බෝක්කුවක් හැදුවත්, හරියට highway එකක් හැදුවා වාගේ තමයි මාධ්‍යයේ එය පළ කරලා තිබුණේ. එවැනි කටයුතු ගැන කථා කරන්න ඉස්සෙල්ලා මම ඉල්ලා සිටිනවා, මහනුවර දිස්ත්‍රික්කයේ ජනතාවට අනිවාර්යයෙන්ම සාධාරණයක් ඉටු කරන්න කියලා.

***** *පුස්තකාලයේ තබා ඇත.*
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඒ වාගේම මම විශේෂයෙන්ම මතක් කරන්න ඕනෑ, උඩුනුවර, වටදෙනිය කොට්ඨාසය ඇතුළු කොට්ඨාස කිහිපයකම ආණ්ඩුවේ නියෝජිතයින් හරහා තමයි මේ සහන ලබා දීමට අවශ්‍ය අයදුම්පත් බෙදා හරින්නේ කියන එක. මම කලින් කියපු විධියට උඩුනුවර, වටදෙනිය කොට්ඨාසයේ ආණ්ඩුවේ නියෝජිතයාගේ නිර්දේශ මත තමයි රුපියල් 25,000 ලබා දීලා තිබෙන්නේ. ඒ වාගේම ආපදා දීමනාව ලබා දීමට අවශ්‍ය අයදුම්පත්‍ර බෙදා දෙන්නේත්, ඒ අදාළ කොට්ඨාසවල ආණ්ඩුවේ නියෝජිතයින්. ඉතින් ඒ සම්බන්ධයෙනුත් අවධානය යොමු කරන්න කියලා මා ඉල්ලා සිටිනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඒ වාගේම මහනුවර දිස්ත්‍රික්කයේ ගොඩක් ප්‍රදේශවලට අදාළ NBRO වාර්තා තවමත් ලැබිලා නැහැ. ඉතින් පවුල් විශාල සංඛ්‍යාවක් දැනටමත් අවදානම් තත්ත්වයක, අවිනිශ්චිත තත්ත්වයක තමයි ජීවත් වෙන්නේ. තමන්ගේ ගෙවල්වල ඉන්නවාද, වෙනත් ස්ථානයකට යනවාද කියලා අවදානම් සහ අවිනිශ්චිත තත්ත්වයක තමයි ඒ අය ඉන්නේ. ඒ නිසා එම NBRO වාර්තා කඩිනමින් ලබා දෙන්න කියලාත් මම ඉල්ලා සිටිනවා. නැත්නම් ඒ ජන ජීවිත යථා තත්ත්වයට පත් කිරීමට නොහැකි වනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ඔබතුමියට වෙන් වූ කාලය අවසානයි, ගරු මන්ත්‍රීතුමියනි.

**ගරු නීතිඥ චමින්ද්‍රාණි කිරිඇල්ල මහත්මිය**
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) சமிந்திராணி கிரிஎல்லே)
(The Hon. (Mrs.) Chamindranee Kiriella, Attorney-at-Law)
ඒ වාගේම මම අද පුවත් පත්වල දැක්කා, ලයිට් බිල සම්බන්ධයෙන් පළ වූ පුවතක්. මම හිතන්නේ "දිට්වා" සුළි කුණාටුව නිසා ලංකා විදුලිබල මණ්ඩලයට රුපියල් බිලියන 20ක පමණ පාඩුවක් සිද්ධ වෙලා තිබෙනවා. ඉතින් ඒක අනිවාර්යයෙන්ම ජනතාවගෙන් අය කිරීමට තමයි ඔවුන් බලාපොරොත්තු වන්නේ කියලා තමයි ඒ පුවත් පත් නිවේදනයේ තිබුණේ. ඉතින් මම ඉල්ලා සිටිනවා, ජනතාවට ඒ බදු බර ලබා නොදෙන්න කියලා.

ස්තුතියි.

**ගරු ඊ.එම්. බස්නායක මහතා**
(மாண்புமிகு ஈ.எம். பஸ்நாயக்க)
(The Hon. E.M. Basnayaka)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, -

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු බස්නායක මන්ත්‍රීතුමා.

**ගරු ඊ.එම්. බස්නායක මහතා**
(மாண்புமிகு ஈ.எம். பஸ்நாயக்க)
(The Hon. E.M. Basnayaka)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මෙතුමිය මේ තොරතුරු කියන්නේ දෙසැම්බර් 31 දිනට නේ. අද ජනවාරි 21. මම කිව්වේ, ජනවාරි මාසයේ 16වැනි දා දක්වා විස්තර. රුපියල් 25,000 හිමි ප්‍රතිලාභීන් සංඛ්‍යාව 39,997යි, ඒ අයගෙන් 38,457දෙනෙකුට මේ මුදල ගෙවා තිබෙනවා. මුදල රුපියල් මිලියන 961,425යි. ප්‍රතිශතය 96.15යි. ගරු චමින්ද්‍රාණි කිරිඇල්ල මන්ත්‍රීතුමිය, ඔබතුමිය ගන්න, ජනවාරි මාසයේ 16වැනි දා දක්වා තොරතුරු.

**ගරු නීතිඥ චමින්ද්‍රාණි කිරිඇල්ල මහත්මිය**
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) சமிந்திராணி கிரிஎல்லே)
(The Hon. (Mrs.) Chamindranee Kiriella, Attorney-at-Law)
හරි.

**ගරු ඊ.එම්. බස්නායක මහතා**
(மாண்புமிகு ஈ.எம். பஸ்நாயக்க)
(The Hon. E.M. Basnayaka)
හරි නම් ඇයි, දෙසැම්බර් 31ට කියන්නේ?

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මම කිව්වේ, ජනවාරි 16වැනි දා දක්වා තොරතුරු. අද ජනවාරි 21වැනි දා. අද වනකොට ගෙවපු ගණන ඊටත් වැඩියි. ඒ වාගේම තමයි රුපියල් 50,000 ලබා දීම. ගරු මන්ත්‍රීතුමිය, ඔබතුමිය දිස්ත්‍රික් ලේකම්තුමාගෙන් හෝ තොරතුරු ගන්න පුළුවන් තැනකින් මේ තොරතුරු ගන්න. ප්‍රතිලාභීන් සංඛ්‍යාව 8,409යි, ගෙවා තිබෙන්නේ 7,083කටයි. ප්‍රතිශතය 84.2යි. මම මේ තොරතුරු ගත්තේ 16වැනි දා දක්වා.

**ගරු නීතිඥ චමින්ද්‍රාණි කිරිඇල්ල මහත්මිය**
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) சமிந்திராணி கிரிஎல்லே)
(The Hon. (Mrs.) Chamindranee Kiriella, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඊයේ මගේ කාර්යාලයෙන් තොරතුරු ගන්න ගියාම මේ සංඛ්‍යා ලේඛන තමයි දුන්නේ. එක වාර්තාවක් ජනවාරි මාසයේ 19 දින. හැබැයි, මුදල් ගෙවා තිබෙන වාර්තාව දෙසැම්බර් 31ට අදාළව තිබෙන්නේ. අපව දැනුවත් කළේ, දෙසැම්බර් 31වැනි දාට පසුව කිසිම මුදලක් ලබා දීලා නැහැ කියලා. එක්කෝ දිසාපති කාර්යාලයෙන් නිලධාරීන්ට උපදෙස් දීලා ඇති, විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට මේ විස්තර දෙන්න එපා කියලා. ඊයේ මගේ කාර්යාලයේ සේවය කරන අය තොරතුරු ගන්න ගියාම updated සංඛ්‍යා ලේඛන කියලා දුන්නේ මේවා තමයි.

**ගරු සමන්මලී ගුණසිංහ මහත්මිය**
(மாண்புமிகு (திருமதி) சமன்மலீ குணசிங்ஹ)
(The Hon. (Mrs.) Samanmali Gunasingha)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, -

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු සමන්මලී ගුණසිංහ මන්ත්‍රීතුමිය.

**ගරු සමන්මලී ගුණසිංහ මහත්මිය**
(மாண்புமிகு (திருமதி) சமன்மலீ குணசிங்ஹ)
(The Hon. (Mrs.) Samanmali Gunasingha)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මම විනාඩියක් ඉල්ලනවා, මේ කාරණය කියන්න.

ගරු චමින්ද්‍රාණි කිරිඇල්ල මන්ත්‍රීතුමිය කිව්වා, පවුලේ දේශපාලනයක් ගැන. එතුමිය මේක හොඳට අහගත්තා නම් හොඳයි. Update නොවන එකයි, තොරතුරු හරියට දැනගෙන හරියට කථා නොකරන එකයි විපක්ෂයේ සාමාන්‍ය දේ වෙලා තිබෙනවා. බොරු කියන්න ලැහැස්ති වෙන්නත් එපා. හරියට දත්ත එකතු කරගෙන එන්න.

මෙතැන ඉන්නවා, අපේ ජාතික ජන බලවේගයේ මහලේකම්තුමා. එතුමා දේශපාලනයට ආවේ එතුමිය ආපු විධියට නොවෙයි. ඒ වාගේම එතුමාගේ පුතා නියෝජ්‍ය ඇමති වෙලා ඉන්නේත් තාත්තාගේ දේශපාලන සම්බන්ධතා නිසා නොවෙයි. එතුමිය මා ගැනත් කිව්වා. මම මෙතැන ඉන්නේ මා කළ

[ගරු සමන්මලී ගුණසිංහ මහතා]

දේශපාලනය හා මට තිබෙන අත්දැකීම් නිසා මිසක්, මගේ තාත්තාගෙන් ලැබුණු බුදලය හා හොරකම් කළ දේවල් හෝ අත්පත් කර ගත් දේවල් නිසා නොවෙයි. අපි මෙතැන කෙළින් හිටගෙන ඉන්නේ, අපේ දේශපාලන පෞරුෂය නිසා. නිවැරදි තොරතුරු නොදැන, හරියට update නොවී, බොරු කියලා මෙතැන කාලය කන්න එපා. ඒ වාගේම අපට ඔය නිකම් ගහන්නම් වාලේ ගහනවා වාගේ අභූත චෝදනා ඉදිරිපත් කරන්නත් එපා. අපේ දේශපාලන පෞරුෂයට හානි කරන්න එපා.

**ගරු නීතිඥ චමින්ද්‍රාණි කිරිඇල්ල මහත්මිය**
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) சமிந்திராணி கிரிஎல்லே)
(The Hon. (Mrs.) Chamindranee Kiriella, Attorney-at-Law)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු චමින්ද්‍රාණි කිරිඇල්ල මන්ත්‍රීතුමිය, ඔබතුමියට විනාඩියක් ලබා දෙන්නම්. අපි විවාදයකට නොයා මෙතැනින් මේ කාරණය අවසන් කරමු.

**ගරු නීතිඥ චමින්ද්‍රාණි කිරිඇල්ල මහත්මිය**
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) சமிந்திராணி கிரிஎல்லே)
(The Hon. (Mrs.) Chamindranee Kiriella, Attorney-at-Law)
එතුමිය කථා කළ එක ගැන මට ඇත්තටම සතුටුයි. මම පත් වුණේ ජනතා ඡන්දයෙන්. මගේ පියාත් අවුරුදු 36ක් ජනතා ඡන්දයෙන් පත් වුණේ. එතුමිය වාගේ කෙනෙක් ජනතා ඡන්දයෙන් පත් වෙලා, අනෙක් කෙනා ජාතික ලැයිස්තුවෙන් ආවේ නැහැ. එම නිසා මම එතුමියට කියන්න කැමැතියි, අප සියලුදෙනා තේරී පත් වුණේ ජනතා ඡන්දයෙන් කියලා. මොකක් හරි ප්‍රශ්නයක් තිබෙනවා නම් ජනතාව අපව ප්‍රතික්ෂේප කරන්න තිබුණා. මේ දෙපළම මෙතැන ඉන්නවා. එක්කෙනෙක් ජනතා ඡන්දයෙන් ඇවිල්ලා, අනෙක් කෙනා ජාතික ලැයිස්තුවෙන් ඇවිල්ලා තිබෙන්නේ.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු අනුෂ්කා තිලකරත්න මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි 08ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.40]

**ගරු නීතිඥ අනුෂ්කා තිලකරත්න මහත්මිය**
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) அனுஷ்கா திலகரத்ன)
(The Hon. (Mrs.) Anushka Thilakarathne, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, දැන් විපක්ෂයෙන් කථා කළ මන්ත්‍රීතුමිය කිව්වා, ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට 2026 වර්ෂයේ මුදල් ලබා දීලා නැහැ කියලා. මේ වන විටත් රුපියල් බිලියන 45.7ක් ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට නිදහස් කරලා තිබෙනවා, ආපදාවට ලක් වුණු ජනතාවට බෙදා දෙන්න. දිස්ත්‍රික් ලේකම් කාර්යාලවලට ඒ සඳහා බලය ලබා දීලා තිබෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ලංකාවට බලපෑ එම ආපදා තත්ත්වය නිසා අපි අත්දැකීමක් ලැබුවා. අපේ ජීවිත කාලය තුළ අප ලැබූ යම් යම් අත්දැකීම් තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, බන්දුල ජයවීර කියන්නේ ප්‍රසිද්ධ කවියෙක්. කොස්ලන්ද-මීරියබැද්ද පැත්තේ මීට අවුරුදු හත අටකට කලින් ලොකු නාය යෑමක් සිදු වුණා.

මේ අත්දැකීම මූලික කරගෙන බන්දුල ජයවීර කියන කවියා, "කඳු නාය යනවා යකෝ - රාජා භවතු ධම්මිකෝ" කියලා කවියක් ලියා තිබෙනවා. ඒ කාලයේ රජවරුන්ට රජකම් කරන්න ආපදා ලොකු පිටිවහලක් වුණා. ඒ නිසායි විපක්ෂයේ ගොඩක් අයට කෑ ගහන්න සිද්ධ වෙලා තිබෙන්නේ. ආපදාව ඇත්තටම ආපදාවක් වෙන්නේ මේ රටේ බහුතරයක් වෙච්ච දුක් විඳින මිනිස්සුන්ට. දරිද්‍රතාවෙන් පෙළෙන, ඉන්න තැනක් නැති, හම්බ කර ගන්න හරිහමන් ව්‍යාපාරයක් නැති සියයට 80ක් වෙච්ච ජනතාවට තමයි ඕනෑම ආපදාවකදී පළමු ආපදාව සිද්ධ වෙන්නේ. ඉතුරු සියයට 20 එක පෙළැන්තියක් නියෝජනය කරන පිරිසක්. ඒගොල්ලන්ට ආපදාව, ආපදාවක් නොවෙයි.

ඒ නිසා මෙදා සැරේ මේ ආපදාවෙන් අපට විශේෂ අත්දැකීමක් ලැබිලා තිබෙනවා. කිසිදු දේශපාලනඥයෙකුට ආපදාවෙන් රජ වෙන්න, "රාජා භවතු ධම්මිකෝ" වෙන්න මේ ආපදාවෙන් ඉඩක් ලැබුණේ නැහැ. ශත 50ක් හොරකම් කරන්න අපි ඉඩ තැබුවේ නැහැ. අපි දන්නවා, හැම දිස්ත්‍රික්කයකම සිටින අපේ දේශපාලන ව්‍යාපාරය නියෝජනය කරන අපේ මන්ත්‍රී සහෝදර සහෝදරියෝ ගමක් ගණනේ ගිහිල්ලා බිම් මට්ටමට බැහැලා වැඩ කරපු බව. මිනිස්සු එක්ක එකතු වෙලා නාය ගියපු තැන් හදන්න, කැඩිච්ච බිඳිච්ච ගෙවල් පිරිසිදු කරන්න, ඒ මිනිස්සුන්ට උදවු කරන්න දේශපාලනය නියෝජනය කරන අපේ මන්ත්‍රී සහෝදර සහෝදරියෝ බිම් මට්ටමට බැස්සා. අන්න, ඒවාට තමයි දේශපාලන අත්දැකීම් කියන්නේ. එහෙම නැතුව ජාතික ලැයිස්තුවෙන් එන එක හෝ ඡන්ද අරගෙන ආපු එක නොවෙයි. ජනතා මතය තිබෙන්නේ එතැන. ඒ ජනතා මතය නියෝජනය කරන්න අපේ සියලු මන්ත්‍රී සහෝදර සහෝදරියෝ සමත් වුණා. ඒ නිසා මේ ආපදාව ඇතුළේ යමක් කරන්න අපි අසමත් වුණා කියලා කවුරු හරි කියනවා නම් නුවරඑළිය දිස්ත්‍රික්කයේ මිනිස්සුන්ගෙන් ඒ ගැන කථා කරලා අහන්න.

මේ ආපදාවෙන් අතිවිශාල බලපෑමක් සිද්ධ වෙච්ච දිස්ත්‍රික්කයක් තමයි, නුවරඑළිය දිස්ත්‍රික්කය. ඒ දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස සියල්ලටම මේ ආපදා තත්ත්වය බලපෑවා. එම දිස්ත්‍රික්කයේ ජීවත් වන හැම මනුස්සයෙක්ම දන්නවා, දේශපාලන ව්‍යාපාරය නියෝජනය කරපු සියලු මන්ත්‍රී සහෝදර සහෝදරියන්, ප්‍රාදේශීය සභාවල ඉන්න අපේ මන්ත්‍රී සහෝදර සහෝදරියන් සියලුදෙනා බිම් මට්ටමට බැහැපු බව. හදන්න බැහැ කියලා අත්හැර දමපු පාරවල් අපි හැදුවා. හදන්න බැහැ කියලා අත්හැර දාපු ඉස්කෝල පිරිසිදු කරලා දරුවන්ට ඉස්කෝලේ යන්න අපි ඉඩ හදලා දුන්නා. අපි ගෙවල්වලට වෙලා හිටියේ නැහැ. ජාතික ලැයිස්තුවෙන් මන්ත්‍රී ධුර සඳහා පත් වෙන්නේ නිකම් නොවෙයි. එතැනත් තිබෙන්නේ ජනතාවගේ ඡන්දය. ඒකෙන් කවුද අපි යවන්නේ කියලා තීරණය කරන්නේ මිනිස්සු එක්ක අපේ මහජන නියෝජිතයින් හිටපු නිසායි. ඒ නිසා නිකම් කටට එන්නන් වාලේ දේවල් කියන්න එපා. වනන්න එපා. තවත් කවියක් තිබෙනවා, "තිබුණා නම් නැටි අපට - වනලා වනලම කැඩිලා මෙලහට" කියලා. ඒ නිසා වනන්න එපා. විපක්ෂයට අපි කියනවා, මේ ආපදාව ඇතුළේ අපට කරන්න පුළුවන් හැම දෙයම අපි කළ බව.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මේ ආපදාව නිසා නුවරඑළිය දිස්ත්‍රික්කයේ සිදු වුණු මුළු මරණ සංඛ්‍යාවෙන් මරණ 55ක් වෙනුවෙන් මේ වනවිට අපි සම්පූර්ණ වන්දි මුදල් ගෙවා අවසන් කර තිබෙනවා. ඒ වාගේම, 8,171කට රුපියල් 25,000 දීමනාව ගෙවා අවසන් කර තිබෙනවා. එමෙන්ම, 1,191කට

රුපියල් 50,000 දීමනාව අපි ගෙවා අවසන් කර තිබෙනවා. ඒ වාගේම, ආපදාවට පත් වූ පවුල්වල දරුවන්ට ලබා දෙන රුපියල් 15,000 දීමනාව දරුවන් 1,320කට අපි ලබා දී තිබෙනවා. නුවරඑළිය දිස්ත්‍රික්කයේ සමහර විපක්ෂයේ මන්ත්‍රීවරු, විපක්ෂය නියෝජනය කරමින් හිටපු මන්ත්‍රීවරු ජනතාව ඇවිස්සුවා. ඒ වාගේම දැන් විපක්ෂය නියෝජනය කරන සමහර කුමාරයෝ කොත්මලේ වාගේ ප්‍රදේශවලට ඇවිල්ලා බොරු වැපිරුවා; මිනිස්සුන්ට බොරු කිව්වා; අපේ ආණ්ඩුව අපහසුතාවට පත් වන ප්‍රකාශ කළා. කොත්මලේ ජලාශය ගැන බොරු, විකෘති අදහස් ඉදිරිපත් කළා. කොත්මලේ ජලාශය හෝ ඒ වේල්ල භාර කිසිම ඉංජිනේරුවරයෙක් අපි අලුතින් පත් කර නැහැ. මම වගකීමෙන් කියනවා, අපේ ආණ්ඩුව යටතේ කිසිම නිලධාරියෙක් අපි පත් කර නැහැ කියන එක. හිටපු නිලධාරින්ම තමයි ඉන්නේ; හිටපු ඉංජිනේරුවන්ම තමයි ඉන්නේ. ඔය කථා කරපු විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට අපි කියනවා, අපේ පක්ෂයේ කවුරු හෝ එහෙම පත් කර තිබෙනවාය කියලා පුළුවන් නම් එළියට ගිහින් නඩු දමන්න කියලා. අපි ලැහැස්තියි, ඒවාට සූදානම් වෙන්න. අපි කිසිම නිලධාරියෙක් පත් කර නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. අපට ඕනෑ දෙයක් කථා කරන්න පුළුවන්. මේ තුළ සමාජ ප්‍රශ්නයක් තිබෙනවා. අපට ඉලක්කම්වලින් මිනිස්සුන්ට උත්තර දෙන්න පුළුවන්; අපට සල්ලි දීලා මිනිස්සුන්ට උත්තර දෙන්න පුළුවන්. හැබැයි, මිනිස්සුන්ට ඇති වෙලා තිබෙන මානසික පීඩාව පිළිබඳව මේ කිසි කෙනෙකුට තේරෙන්නේ නැහැ. ඒ නිසා මේක ඇතුළේ දේශපාලනය කරන්න එපා. දේශපාලනය කරන්න අපට ඕනෑ තරම් වෙලාව තිබෙනවා. අපට දේශපාලනය කරන්න සිද්ධ වෙන වෙලාවල් තිබෙනවා. ඒක අපි ඒ වෙලාවේදී පාවිච්චි කරමු. මේක අපි කවුරු හෝ හිතලා කරපු දෙයක් නොවෙයි. ආපදා කියන දේ කාලගුණ විපර්යාස නිසා වාගේම කාලයක් තිස්සේ පරිසරයට කරපු වෙනත් හානි නිසා ඇති වෙනවා. මේ විපක්ෂය නියෝජනය කරන ගොඩක් දේශපාලනඥයින් නුවරඑළිය වාගේ පැතිවල අනවසර ඉදිකිරීම් සිදු කිරීම සඳහා අක්කර දහස් ගණනින් අත්පත් කරගෙන තිබෙනවා. ඒ අය අම්බුලුවාව, කොත්මලේ වැනි ප්‍රදේශවල පරිසරයට නිදහස් කළ යුතු ඉහළ භූමි අත්පත් කරගෙන තිබෙනවා. මම කලින් කිව්වා වාගේ ඒවායේ අහිසි ප්‍රතිවිපාක විඳින්න වුණේ සියයට 80ක් වෙච්ච මේ රටේ දුප්පත් මිනිස්සුන්ටයි. ඒ නිසා කවුරු හෝ මේක ඇතුළේ දේශපාලනය කරනවා නම් ආයෙත් සැරයක් හිතලා බලන්න, මේ මිනිස්සුන්ගේ ජීවිත එක්ක තමයි ඔවුන් ඒ කටයුතු කරන්නේ කියන එක.

ඒ නිසා අපි ඇත්ත විසඳුම් සොයන්න මහන්සි වෙමු. මේ වන විටත් අපි නුවරඑළිය දිස්ත්‍රික්කය පුරා අක්කර 212ක් සොයමින් සිටිනවා, ඒ මිනිසුන්ට දෙන්න. මේ සභාව නියෝජනය කරන දෙමළ මන්ත්‍රීවරයකු ඉපදුණු ගම වන කොත්මලේ, වැවන්ඩන් වාගේ ප්‍රදේශවල මිනිස්සු ඉන්නේ සත්තු ගාණට. හැබැයි අපි රජයක් හැටියට මැදිහත් වෙලා ඒ අනාථ වෙලා ඉන්න මිනිස්සුන්ව, අසරණ වෙලා ඉන්න මිනිස්සුන්ව මෙච්චර කල් දේශපාලන අධිකාරියේ දේශපාලන රඟ භූමියක් වෙලා තිබුණු තොණ්ඩමන් සංස්කෘතික මධ්‍යස්ථානයේ පදිංචි කළා, තාවකාලික විසඳුමක් විධියට. අපි රජ්ජුරුවෝ නොවෙයි; අපි මිනිස්සුත් එක්ක ජීවත් වෙන මිනිස්සු. ඒ නිසා ආයෙත් මම මේ කාරණය කියනවා. කරුණාකරලා මේ ආපදා ඇතුළේ සෙල්ලම් කරන්න එපා, දේශපාලනය කරන්න ලැහැස්ති වෙන්න එපා; ඒකට වෙනම වෙලාවක් තෝරා ගන්න,කියමින්, මම නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

මීළඟට, ගරු ඒ.එච්.එම්.එච්. අබයරත්න ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 12ක කාලයක් ලැබෙනවා.

Order, please! මේ අවස්ථාවේදී කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙක් මූලාසනය සඳහා ගරු සාගරිකා ආතාවුද මන්ත්‍රීතුමියගේ නම යෝජනා කරන්න.

**ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි මහතා (පරිසර අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) தம்மிக பட்டபெந்தி - சுற்றாடல் அமைச்சர்)
(The Hon. (Dr.) Dammika Patabendi - Minister of Environment)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, "ගරු සාගරිකා අතාවුද මන්ත්‍රීතුමිය දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු සාගරිකා අතාවුද මහත්මිය මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு (திருமதி) சாகரிகா அதாவுத அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. DEPUTY CHAIRPERSON OF COMMITTEES left the Chair, and THE HON.(MRS.) SAGARIKA ATHAUDA took the Chair.*

[අ.භා. 2.48]

**ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා (රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමා)**
(மாண்புமிகு (பேராசிரியர்) ஏ.எச்.எம்.எச். அபயரத்ன - பொது நிருவாக, மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சர்)
**(The Hon. (Prof.) A.H.M.H. Abayarathna - Minister of Public Administration, Provincial Councils and Local Government)**

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අද දවසේ සභාව කල්තබන අවස්ථාවේ යෝජනාව ඉදිරිපත් කළ ගරු මන්ත්‍රීතුමියගේ යෝජනාවේත් තිබුණු, එතුමියගේ කථාවේදීත් සඳහන් කළ කරුණු පිළිබඳව පළමුවෙන්ම යම් අදහසක් ඉදිරිපත් කරන්න කැමැතියි.

එතුමිය සඳහන් කරනවා, "දිට්වා" සුළි කුණාටුව නිසා විශාල හානියක් සිද්ධ වුණා; හැබැයි මේ සුළි කුණාටුව පිළිබඳව පූරෝකථනය කළ කාලගුණ අනාවැකි පිළිබඳව රජය සැලකිල්ලක් දැක්වූවේ නැහැ කියලා. මම ඒ කාරණය ප්‍රතික්ෂේප කරනවා. මම සභාගත* කරනවා, 2025 ජනවාරි 21 වැනි දා - "දිට්වා" එන්නේ නොවැම්බර්- ආරක්ෂක අමාත්‍යාංශය විසින් නිකුත් කළ, ආපදා සහන සේවා මාර්ගෝපදේශ අංක 01/2025.

---

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා]

මොකටද මේක ඉදිරිපත් කරන්නේ? හදිසි ආපදා තත්ත්වයකදී විපතට පත්වන ජනතාවට හා ආපදා අවදානම හේතුවෙන් පදිංචි වාසස්ථානවලින් ඉවත් කරන ජනතාවට සහන සැලසීම, හානියට පත්වන දේපළ යථා තත්ත්වයට පත් කිරීම සහ වන්දි ගෙවීම පිළිබඳවයි. ඒ සම්බන්ධ මාර්ගෝපදේශ තමයි මේ ඉදිරිපත් කර තිබෙන්නේ. "දිට්වා" සම්බන්ධව පමණක් නොවෙයි, ඕනෑම ආපදාවක් සම්බන්ධව අපේ රජය මුලින් සූදානම් වුණා, පෙර සූදානමක් තිබුණා කියන්න මේ ආපදා සහන සේවා මාර්ගෝපදේශ සාක්ෂි දරනවා.

මේ මාර්ගෝපදේශ නිකුත් කරන්න හේතු වුණේ ඇත්තටම එතෙක් පැවති මාර්ගෝපදේශ ප්‍රමාණවත් නොවුණු නිසා. මේ මාර්ගෝපදේශ හේතුවෙන් "දිට්වා" සුළි කුණාටුව අවස්ථාවේදී දිස්ත්‍රික් ලේකම්වරුන්ට, ප්‍රාදේශීය ලේකම්වරුන්ට ක්ෂණිකව තීරණ ගන්න අවස්ථාව ලැබී තිබුණා, රජය මඟින් යම් යම් නියෝග නිකුත් කරන්නත් කලින්. මේ මාර්ගෝපදේශයේ අරමුණු කිහිපයක්ම තිබෙනවා. විශේෂයෙන්, ස්වාභාවික ආපදා හේතුවෙන් විපතට පත් ජනතාවගේ ජීවන තත්ත්වය හා ජන ජීවිතය යථා තත්ත්වයට පත් කිරීම සඳහා අවශ්‍ය සහන කඩිනමින් ලබාදීමට වෙනත් කිසිදු චක්‍රලේඛයක් හෝ ලිපියක් නිකුත් කිරීමට පෙර මැදිහත්වීමට මේ මාර්ගෝපදේශයේ අරමුණුවලින් පුළුවන්කම ලැබුණා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ මාර්ගෝපදේශයේ අන්තර්ගත කරුණු කිහිපයක් පිළිබඳවත් මම සඳහන් කරන්න කැමැතියි. හේතුව, යෝජනාව ඉදිරිපත් කළ ගරු මන්ත්‍රීතුමිය සඳහන් කළා, සමහර දේශපාලන අරමුණු වෙනුවෙන්, ගම්වල ඉන්න අපේ සංවිධායකවරු යම් බලපෑමක් කරනවා කියන කාරණය. මම ඒක සම්පූර්ණයෙන්ම ප්‍රතික්ෂේප කරනවා. එහෙම දෙයක් සිද්ධ වෙලා නැහැ. මේ මාර්ගෝපදේශයේත් සඳහන් කර තිබෙනවා, ග්‍රාමීය ආපදා කළමනාකරණ හා සහන සේවා කමිටුවේ සංයුතිය. ග්‍රාම නිලධාරි - (කැඳවුම්කරු), ආගමික නායකයින්, විදුහල්පති, ආර්ථික සංවර්ධන නිලධාරි, සමෘද්ධි නිලධාරි ආදී වශයෙන් ලොකු කණ්ඩායමක් දාලා රාජ්‍ය නොවන සංවිධාන නායකයින් සහ ස්වේච්ඡා සංවිධාන නායකයින් පවා ඇතුළත් කරලා තිබෙනවා. එතකොට ඕනෑම ස්වේච්ඡා සංවිධානයකටත් මේ කමිටුවට ඇතුළත් වෙන්න කිසිදු බාධාවක් නැහැ. අපි කිසිම ලේඛනයක් නිකුත් කරලා නැහැ අපේ ප්‍රජා කමිටුවල කිසිම කෙනෙක් මේවාට ඇතුළත් කර ගන්න ඕනෑ කියලා.

නමුත්, ස්වේච්ඡා සංවිධානවලට සහභාගිවීමට පුළුවන්කම තිබෙනවා. ප්‍රාදේශීය ආපදා කළමනාකරණ හා සහන සේවා කමිටුවේ සංයුතිය ගත්තොත්, ප්‍රාදේශීය ලේකම්වරයා තමයි සභාපති. ඒකටත් අර කියපු විදියට ආගමික නායකයින්, සහකාර ප්‍රාදේශීය ලේකම්, සහකාර අධ්‍යක්ෂ (සැලසුම්), පළාත් පාලන ආයතන ප්‍රධානියා, සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි වාගේ කණ්ඩායමක් එක්ක රාජ්‍ය නොවන සංවිධාන, ස්වේච්ඡා සංවිධානවලට සහභාගි වෙන්න පුළුවන්. හරි පැහැදිලියි, මේ ඉදිරිපත් කරපු මාර්ගෝපදේශවලම රජයේ නිලධාරින්ට තමයි ප්‍රමුඛතාව දීලා තිබෙන්නේ. ඒ වාගේම, වෙනත් පාර්ශ්වවලට අවශ්‍යතාව අනුව සම්බන්ධ වෙන්නත් යම් ඉඩකඩක් දීලා තිබෙනවා. දිස්ත්‍රික් ආපදා කළමනාකරණ හා සහන සේවා කමිටුවේ සංයුතියත් එහෙමයි. සභාපති හැටියට ඉන්නේ දිස්ත්‍රික් ලේකම්. සාමාජිකයින් වශයෙන් ඉන්නවා, අතිරේක දිස්ත්‍රික් ලේකම්, ආගමික නායකයින්, පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක ඇතුළු කණ්ඩායමක්. ඒ නිසා ඒ කථා කරපු කාරණය මුළුමනින්ම අසත්‍ය වාගේම අභූත චෝදනාවක් හැටියට මම ප්‍රතික්ෂේප කරනවා.

ඒ වාගේම තමයි, මේ යෝජනාව ඉදිරිපත් කරපු ගරු මන්ත්‍රීතුමියගේ කථාවේදී සඳහන් කළා, පාරවල් විනාශ වුණා, ඒ පාරවල් හදලා නැහැ කියලා. සිදු වෙච්ච විනාශයේ තරම දැක්කාම, ඒ පාරවල් මේ මට්ටම හෝ දැනට පවත්වා ගෙන යෑම සම්බන්ධව, ඒවා යථා තත්ත්වයට පත් කරන්න මහන්සි වුණු සියලුදෙනාට ගෞරව කරන්න ඕනෑ. ගොඩක් කණ්ඩායම් ස්වේච්ඡාවෙන් මැදිහත් වෙලා, ඒ පාරවල් තාවකාලිකව ගමනාගමනය සඳහා සකස් කළා. සමහර තැන්වල පාලම් හැදුවා, වාරිමාර්ග හැදුවා. ඒ වාගේම තවම මාස දෙකකුත් සම්පූර්ණ වුණේ නැහැ. නමුත්, ඒ බොහෝ මාර්ග ගමනාගමනයට ගැළපෙන විදියට හදලා තිබෙනවා. හදන්න බැරි වුණු තැන් නැතුව නොවෙයි. ඒ සියල්ල එකවර කරන්න පුළුවන් වෙයි කියලා මම හිතන්නේ නැහැ. ඒ වාගේම තමයි, එතුමිය වැරැදි කාරණයක් සඳහන් කළා, විපක්ෂයේ මන්ත්‍රීතුමන්ලාට දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවලට සම්බන්ධ වෙන්න අවස්ථාව දෙන්නේ නැහැ කියලා. ඒක මම ප්‍රතික්ෂේප කරනවා. එහෙම කිසිම කාරණයක් නැහැ. අපි දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවලට ඒ අදාළ මන්ත්‍රීවරුන්ට සහභාගීවීමේ අවස්ථාව දීලා තිබෙනවා, කිසිම බාධාවක් නැහැ කියන කාරණය මේ අවස්ථාවේදී මම අවධාරණය කරනවා.

ඒ වාගේම, ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ සංගමය ඉදිරිපත් කරපු ලිපියක් පදනම් කරගෙන එතුමිය සඳහන් කළා, ප්‍රාදේශීය ලේකම්වරු මේ සහන සැලසීමේ ක්‍රියාවලියෙන් ඉවත් වීමේ අවදානමක් තිබෙනවා කියලා. නමුත්, අපිත් සමඟ කටයුතු කරන කිසිම ප්‍රාදේශීය ලේකම්වරයෙක්, එහෙම නැත්නම් ඒ සංගමය, එතුමන්ලාගේ වෘත්තීය සමිතිය මේ රාජකාරි කටයුතුවලින් ඉවත් වන බවක් සඳහන් කළේ නැහැ. එතුමන්ලාට යම් යම් පැහැදිලි කර ගැනීම් තිබුණා. ඒ පැහැදිලි කර ගැනීම් පිළිබඳව අපිත් එක්ක සාකච්ඡාවක් තිබුණා. ඒක හරි. මේ විනාශය ඉතා දැවැන්තයි. ඉතිහාසයේ කවදාකවත් මුහුණ නොදුන් තරම් දැවැන්ත විනාශයක්. ඒ වාගේ දැවැන්ත විනාශයකට මුහුණ දීමේදී සෘජුව සම්බන්ධ වන පාර්ශ්වයක් තමයි, ප්‍රාදේශීය ලේකම්වරුන් හා ප්‍රාදේශීය ලේකම්වරියන්. මම ආපදා අවස්ථාවේදී පුත්තලම දිස්ත්‍රික්කයේ රැඳී සිටියා. අපි දැක්කා, දිස්ත්‍රික් ලේකම්තුමා, ඒ වාගේම ප්‍රාදේශීය ලේකම්වරුන් -වැඩිපුර ඉන්නේ ප්‍රාදේශීය ලේකම්වරියන්- දින ගණන් තමන්ගේ ගෙවල්වලට යන්නේ නැතුව, සමහර වෙලාවට එකම ඇඳුමෙන් එක දිගට රාජකාරි කළා. ඒ විදියේ මැදිහත්වීමක්, කැපවීමක් අපි ඒ නිලධාරින්ගෙන් දැක්කා. හැබැයි, ඒ ක්‍රියාවලිය ඇතුළේදීත් යම් යම් කරුණු කාරණා පිළිබඳව අපිත් එක්ක සාකච්ඡා කළා. අපැහැදිලි තැන් තිබෙනවා නම් ඒවා නිරවුල් කරගෙන, වඩාත් නිවැරැදිව මේ කාර්යයන් කරන්නේ කොහොමද කියන කාරණය තමයි එතුමන්ලාගේ පැත්තෙන් මතු වුණේ. ඒ මිසක් මේ රාජකාරිවලින් ඉවත් වෙන බව හෝ මේ වැඩ කරන්න බැහැ කියන කාරණයක් කිසිම අවස්ථාවක සඳහන් වුණේ නැහැ.

ඒ වාගේම තමයි, එතුමන්ලාගේ යෝජනාවක් තිබුණා, තක්සේරු කරන්නේ නැතුව දීමනා ගෙවීමේදී මෙච්චර දීමනාවක් ගෙවීම අවශ්‍යද කියන එක. රජයේ ප්‍රතිපාදන මුදල් ඉතුරු කර ගැනීමේ හැඟීමෙන් තමයි, ඒ යෝජනාව ඇවිල්ලා තිබෙන්නේ. එහෙම නැතුව මේ මුදල් ගෙවන්න බැහැ, මේක වැඩියි, කරන්න බැරි බවක් නොවෙයි සඳහන් කරලා තිබෙන්නේ. ඒ නිසා ඒ ඉදිරිපත් කරපු කාරණය ප්‍රතික්ෂේප කරනවා වාගේම, ඇත්තටම එහෙම තත්ත්වයක් පැන නැඟිලා නැහැ.

ඒ වාගේම මාර්ගෝපදේශ නිවැරැදිව නැහැ කියන කාරණය එතුමිය සඳහන් කළා. සමහර තැන්වල යම් යම් අපැහැදිලි තැන් තිබෙන්න ඇති. නමුත්, මේ වන විට ඉතාම නිවැරැදිව ඒ මාර්ගෝපදේශ ඉදිරිපත් කරලා තිබෙනවා. කිසිම ගැටලුවක් නැතුව, ඒ අවශ්‍ය ප්‍රතිපාදන ජනතාවට ලබා දෙන්න පුළුවන්කම

තිබෙනවා. ඒ වාගේම තමයි, ග්‍රාම නිලධාරි සේවය පිළිබඳවත්, ග්‍රාම නිලධාරිවරුන් පිළිබඳවත් එතුමිය සඳහන් කළා. ඇත්තටම ග්‍රාම නිලධාරි මහත්ම මහත්මීන් මේ ප්‍රශ්නයේදී ඉතා දැඩි දුෂ්කරතාවලට මුහුණ දුන්නා. මම කලින් කිව්වා වාගේ ඒ ග්‍රාම නිලධාරිනුත් ප්‍රාදේශීය ලේකම්වරුන් හා ලේකම්වරියන් වාගේම දින ගණන් කැපවෙලා, මහන්සි වෙලා වැඩ කටයුතු කළා.

ආපදාවට පත් වුණු ජනතාවට හදිස්සියේ අවශ්‍ය කරන ආහාර පාන සම්පාදනය, සුරක්ෂිත මධ්‍යස්ථාන පිළියෙල කිරීම ඇතුළු සියලු කටයුතු ඉතා ලොකු පරිශ්‍රමයකින්, දැඩි කැපවීමකින් යුතුව එතුමන්ලා කළා. තමන්ගේ ගෙදර වතුරෙන් යට වෙලා තිබුණත්, මේ පොදු කටයුතුවලට ඒ ගොල්ලෝ දායක වුණා; රාජකාරියට වඩා ඔබ්බට ගිය දැවැන්ත කාර්ය භාරයක් ඒ ගොල්ලෝ ඉෂ්ට කළා. ඒ ක්‍රියාවලියේදී යම් යම් ගැටලු පැන නැඟුණු එක ස්වාභාවිකයි. ඒ හැමෝටමත් මේ ආපදාව නිසා ඇති වුණු කම්පනය තිබුණා. මොකද, ගොඩක් තැන්වල ඒ අයත් ඒ ආපදාවට ගොදුරු වෙලා හිටියා. ඒ අතර ජනතාවගේ පැත්තෙනුත් යම් යම් අදහස් ඉදිරිපත් කිරීම් සිදු වෙනවා. ඒ සියල්ල එක්ක එකතු වෙලා වැඩ කරන කොට ඒ ගොල්ලන්ට යම් යම් අපැහැදිලි තැන්, ගැටලු සහගත තැන් මතු වුණා. නමුත්, අපිත් එක්ක ඒ පිළිබඳව සාකච්ඡා කළා; ප්‍රාදේශීය ලේකම්වරුන්, දිස්ත්‍රික් ලේකම්වරුන් එක්ක සාකච්ඡා කළා. සමහර අවස්ථාවල අපේ අමාත්‍යාංශයෙන් ද යම් යම් පැහැදිලි කිරීම් කරවා ගත්තා. එසේ පැහැදිලි කිරීම් කරවාගෙන කිසිදු ගැටලුවකින් තොරව එම රාජකාරි කටයුතු කරන්න ඔවුන් මැදිහත් වුණා. ඔවුන්ගේ සේවයට අදාළව යම් යම් ගැටලු තිබුණා නම් ඒවා පිළිබඳවත් අපි මේ අවස්ථාවේ අවධානය යොමු කරලා විසඳුම් ලබා දීම සඳහා කටයුතු කරමින් සිටිනවා.

ඒ වාගේම ඒ ගරු මන්ත්‍රීතුමිය සඳහන් කළා, ජීවිත හානිවලට තවම වන්දි ගෙවලා නැහැ කියන කාරණය. මම ඒ පිළිබඳව රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවෙන් විමසා දැනගත්තා. මේ වනකොට, නීතිමය වශයෙන් තහවුරු කර ගන්න ලැබුණු, මිය ගිය තැනැත්තන් 525දෙනෙකු හඳුනාගෙන මරණ සහතික නිකුත් කර තිබෙනවා. නමුත්, මිය ගිය තවත් පිරිසක් ඉන්නවා, නීතිමය වශයෙන් තහවුරු කර ගන්න හැකියාවක් නොමැති වූ සහ ඒ පවුල්වලින් කවුරුවත් ඉදිරිපත් වෙලා නැති. එබඳු තත්ත්වයක් තිබෙනවා. නමුත්, මේ වන විට මිය ගිය 525දෙනෙකුට අදාළව මරණ සහතික නිකුත් කර තිබෙනවා. ඒ මිය ගිය අය අතරින් විශාල පිරිසකගේ පවුල්වලට වන්දි ලබා දීම සඳහා කටයුතු කර තිබෙනවා. ඒ නිසා මිය ගිය අයට අදාළ වන්දි ගෙවා නැහැ කියන කථාව ගැටලු සහගතයි. හැබැයි, එක කාරණයක් විතරක් කියන්න තිබෙනවා. බදුල්ල දිස්ත්‍රික්කයේ යම් ප්‍රමාණයකට එකී ගෙවීම්වල අඩු වීමක් තිබෙනවා. එයට හේතුව, තහවුරු කර ගැනීම්වල තිබුණු බාධාවයි. නමුත්, බදුල්ල දිස්ත්‍රික් ලේකම්තුමා සඳහන් කළා, මේ වන විට පස්දෙනෙකුට මිලියනය ගණනේ ගෙවා තිබෙන බවත්, සිකුරාදා වනකොට තවත් 14දෙනෙකුට ගෙවන්න සූදානම් කර තිබෙන බවත්. බදුල්ල දිස්ත්‍රික්කයේ පමණයි සාපේක්ෂව ගෙවීම්වල යම් අඩුවක් තිබුණේ. නමුත්, අනෙක් දිස්ත්‍රික්කවල සැලකිය යුතු ප්‍රමාණයකින් ගෙවීම් කර තිබෙනවා.

විපක්ෂයේ ඉදිරිපස වාඩි වෙලා සිටින, හම්බන්තොට දිස්ත්‍රික්කය නියෝජනය කරන ගරු මන්ත්‍රීතුමා සඳහන් කළා, ගරු ජනාධිපතිතුමාගේ පාර්ලිමේන්තු කථාවක් ගැන. ඒ, තහඩුවකට ලක්ෂ 10ක් දෙනවා කියපු කථාව. ඇත්තටම, එතුමන්ලා කනගාටු වෙන්න ඕනෑ, තමන් දීර්ඝ කාලයක් තිස්සේ මේ රට පාලනය කළත්, ජනතාවට තවමත් තහඩු ගෙවල්වල ජීවත් වෙන්න සිදු වීම ගැන. ඒ පිළිබඳව එතුමන්ලා කනගාටු වෙන්න ඕනෑ වාගේම ජනතාවගෙන් සමාව ගන්නත් ඕනෑ. මේ ව්‍යසනයෙන් හානි වුණු නිවාසවලින් වැඩිපුර ප්‍රමාණයක් තිබෙන්නේ, අන්ත අසරණ, දුක්ඛිත තත්ත්වයෙන් ජීවත් වන ජනතාවගේ නිවාසයි. එබඳු ප්‍රජාවක් නිර්මාණය කිරීම පිළිබඳ වගකීම එතුමන්ලාටම තමයි භාර ගන්න වෙන්නේ. තක්සේරු කිරීමකින් තොරව තමයි මේ කියන රුපියල් ලක්ෂ 5 ලබා දෙන්නේ. ඊට වඩා වැඩි හානියක් වෙලා තිබෙනවා නම් තක්සේරු කිරීමකින් පසුව අවශ්‍ය සහන ලබා දීම සඳහා අපි කටයුතු කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට ලැබී තිබෙන කාලය අවසානයි, ගරු ඇමතිතුමා.

**ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஏ.எச்.எம்.எச். அபயரத்ன)
(The Hon. (Prof.) A.H.M.H. Abayarathna)
මම ඉක්මනින් කථාව අවසාන කරන්නම්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි.

නුවරඑළිය දිස්ත්‍රික්කය නියෝජනය කරන අපේ ගරු මන්ත්‍රීතුමා -හිටපු ඇමතිතුමා- කිව්වා, ඒ මිනිස්සු ආපදාවට පත් වුණු තැන්වලම නැවත බලෙන් පදිංචි කරවන්න කටයුතු කරනවා කියලා. එහෙම එකක් නැහැ. ආපදා අවදානමක් තිබෙනවා නම් එතැන මිනිස්සු පදිංචි කරවන්නේ නැහැ. හැබැයි එතුමන්ලාටත් ඒ වගකීම තිබෙනවා. වතුකරයේ සහෝදර දෙමළ ජනතාව මේ තත්ත්වයෙන් ජීවත් වීම සම්බන්ධයෙන් එතුමන්ලාටත් වගකීමක් තිබෙනවා. ඇත්තටම, ඒ ජනතාවගේ ජීවන තත්ත්වය උසස් කිරීමේ වගකීම එතුමන්ලා ඇමති ධුර දැරූ ආණ්ඩු කාලවල ඉෂ්ට කිරීමේ වගකීම එතුමන්ලාට තිබුණා. නමුත්, ඒ වගකීම ඉෂ්ට කරලා නැහැ. අපේ රජය ගරු ජනාධිපතිතුමාගේ මඟ පෙන්වීම යටතේ වතුකරයේ දෙමළ ජනතාවට අවශ්‍ය ඒ සියලු සහන ලබා දීමට අනිවාර්යයෙන් කටයුතු කරන බව මා සඳහන් කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි දෙකක කාලයක් හිමි වෙනවා.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මට මේ අවස්ථාව ලබා දුන්නාට බොහොම ස්තුතියි. මම මේ අවස්ථාවේ එක කාරණාවක් විතරයි කියන්න බලාපොරොත්තු වන්නේ. අපි දැන් කථා කරනවා, "Rebuilding Sri Lanka" Fund එක ගැන; "දිට්වා" සුළි කුණාටුවෙන් විපතට පත් වෙච්ච ජනතාව නැවත පදිංචි කරවීම, ඒ කැඩිච්ච, බිඳිච්ච යටිතල පහසුකම් නැවත හැදීම ගැන. ආණ්ඩුවේ 159දෙනාට මම කියන්න කැමැතියි, එවැනි අරමුදලක් නැති බව. www.rebuildingsrilanka.gov.lk කියන website එකෙන් ගත්තු මේ document එක මම මේ අවස්ථාවේදී **table*** කරනවා.

ගරු ජනාධිපතිතුමාගේ කාර්යාලයට තමයි මේක යන්නේ.

මෙහි සඳහන්ව තිබෙනවා, මෙන්න මෙවැනි දෙයක්, I quote:

> "...the Government has established the Rebuilding Sri Lanka Fund under the Presidential Secretariat,..."

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා]

මේක තමයි ජාත්‍යන්තරයට යන්නේ. මම මේ ආණ්ඩුවේ 159දෙනාටම අභියෝග කරනවා, මේ Fund එක තිබෙනවාද නැද්ද කියා නැඟිටලා කියන ලෙස. මේ වෙලාවේ ගරු සභාවේ ඇමතිතුමා නැහැ, ගරු නියෝජ්‍ය ඇමතිතුමාත් නැහැ. ඉහත උපුටා ගැනීම මම නැවත කියවන්නම්, සිංහලෙන්. ජාත්‍යන්තරයට කියනවා, "රජය විසින් Rebuilding Sri Lanka Fund යනුවෙන් අරමුදලක් ස්ථාපනය කොට ජනාධිපති කාර්යාලයේ ඇත" කියලා. මම කියනවා, එහෙම එකක් නැහැ කියලා. තනි පුද්ගලයකු විධියට මම ආණ්ඩුවේ 159දෙනාටම කියනවා, එහෙම එකක් තිබෙනවා නම් නැඟිටලා කියන්න කියලා. එහෙම එකක් නැහැ. ඒ නිසා ආණ්ඩුව මාරු වුණාම ඔය පුද්ගලයන්ගෙනුත් මේ ප්‍රශ්නය ඇහෙනවා. අතීතයේ වැරැදුණු ඒවා ගැන දැන් ඕනෑ තරම් කථා කරන්න පුළුවන්. හැබැයි, වර්තමානයේත්, අනාගතයේත් මේ වැරැද්ද වෙන්න දෙන්න එපා. රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ සභාපති හැටියටත් මම එය කියනවා. එය ස්ථාපනය කරන්න. මොකද, නිකම් අරමුදල් හදන්න බැහැ, අද රටේ. එය නීත්‍යනුකූල ව්‍යවස්ථාපිත අරමුදලක් විය යුතුයි. එය පාර්ලිමේන්තුවට ගෙනැල්ලා අනුමැතිය ගන්න ඕනෑ. එහෙම නැතිව මේක විගණනය කරන්න බැහැ. මම කියන්නේ නැහැ, ඒ මුදල් කාගේවත් සාක්කුවලට ගියා කියලා. ඒ මුදල් යන්නේ නියෝජ්‍ය ලේකම්, භාණ්ඩාගාර අරමුදලට. හැබැයි, මේ අරමුදල තිබෙනවා කියලා ජාත්‍යන්තරයට කියනවා. මේක විගණනය කරන්න ඕනෑ. නමුත්, දැන් විගණකාධිපතිවරයෙකුත් නැහැ. දිගින් දිගටම රුපියල් බිලියන ගණන් එහෙට මෙහේට යනවා, ඩොලර්වලින්, රුපියල්වලින්. නමුත්, විගණනය කරන්න අරමුදලක් නැහැ. අරමුදල තිබුණත් විගණකාධිපතිවරයෙක් නැහැ. ඉතින්, කොහොමද මේ කටයුතු කරගෙන යන්නේ?

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කාලය අවසානයි, ගරු මන්ත්‍රීතුමා.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
හොඳමයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි.

මට දැන් යන්න තිබෙනවා. මම ගියාට කමක් නැහැ, "මේ කියන අරමුදල තිබෙනවා" කියලා අද දවස ඇතුළත ආණ්ඩුවේ කාට හරි නැඟිටලා කියන්න පුළුවන් නම් කියන්න; ඒ document එක table කරන්න. මම challenge කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අජිත් ගිහාන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.04]

**ගරු අජිත් ගිහාන් මහතා**
(மாண்புமிகு அஜித் கிஹான்)
(The Hon. Ajith Gihan)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අද දින අප කථා කරන "දිට්වා" සුළි කුණාටුව පිළිබඳව වාගේම එයින් සිදු වූ මහා විනාශය පිළිබඳවත් විපක්ෂයේ අය යම් යම් අදහස් ප්‍රකාශ කළා. ඇත්තටම මේ විනාශය සම්බන්ධව නැවත කථා කරද්දී අප කාටත් දැනෙනවා, වර්තමාන ආණ්ඩුව -වර්තමාන රජය- "දිට්වා" සුළි කුණාටුව හේතුවෙන් ආපදාවට ලක් වූ ජනතාව රැක ගන්නත්, ඔවුන්ගේ ජීවිත යථා තත්ත්වයට පත් කරන්නත් කොච්චර සැලසුම් සහගත වැඩ කොටසක් කළාද කියලා. මේ සුළි කුණාටු ආදී ව්‍යසන කවුරුවත් කියලා ගෙන්වා ගන්නේ නැහැ. ඒක ස්වාභාවිකව සිදු වන ක්‍රියාවලියක්. හැබැයි, විපක්ෂය වේවා, ආණ්ඩු පක්ෂය වේවා අප සියලුදෙනාගේ වගකීම තමයි රටක් විධියට මේ තත්ත්වයට මුහුණ දීම.

මේ කුණාටුව සම්බන්ධව අපේ ගරු මන්ත්‍රීතුමන්ලාත් පැහැදිලි කළා. කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ පුරෝකථන හා දත්ත අනුව මේක කලින් හඳුනා ගත්තා. ඊට පස්සේ මේ තත්ත්වයට මුහුණ දෙමින් මේ තත්ත්වයෙන් ජනතාව බේරා ගන්න, විපතට පත් වුණු ජනතාව රැක ගන්න අපි කටයුතු කළා. ඊට පස්සේ අපට කරන්න තිබෙන දේ තමයි ඔවුන්ගේ ජීවිත නඟා සිටුවීම. ආපදාව සිදු වූ මොහොතේ සිට වියළි සලාක, පිසූ ආහාර ආදිය ලබා දීම සිදු කළා. ඊළඟට, ඒ අයට වෙච්ච හානිවලට අදාළ දීමනා ලබා දුන්නා. අපි දැක්කා, විශේෂයෙන් බඩු මලු ලබා දෙනවා. රුපියල් 25,000 ලබා දුන්නා. රුපියල් 50,000 ලබා දෙන්න කටයුතු කරමින් ඉන්නවා. ඊට පසුව කරන්න තිබෙන්නේ ඔවුන්ට අහිමි වුණු නිවාස ගොඩ නැඟීමට කටයුතු කිරීමයි. මේක තමයි අපේ ක්‍රියාවලිය. හැබැයි, පසුගිය කාලයේ පැවැති ආණ්ඩු ආපදා අවස්ථාවලදී මැදිහත් වුණේ කොහොමද කියන එකත් කල්පනා කර බලන්න වෙනවා.

වර්තමාන ආණ්ඩුව විධියට - රජය විධියට - අපි මේකට මැදිහත් වුණේ කොහොමද කියලා කවුරුත් දන්නවා. ජනතාවගේ පැත්තෙන් මේ ගැන විවේචනයක් නැහැ. ජනතාව මේක සුබවාදීව දකිනවා. ආණ්ඩුවක් විධියට මෙහෙම සහන දෙන්නේ කොහොමද කියලා ඔවුන් කල්පනා කරනවා. සමහර අය මේ මුදල් අරගෙන නැවත ආණ්ඩුවට ලබා දුන්නා, මේ ව්‍යසනයට පත් වෙච්ච අයට ලබා දෙන්න කියලා. එහෙම වගකීමකින් යුක්තව කටයුතු කළ ආණ්ඩුව සම්බන්ධව සාධාරණ විවේචනයක් නොවෙයි විපක්ෂයේ ඇතැම් අය කරන්නේ. ඇත්තටම කුහකකමක් හිතේ තියාගෙනයි ඒ අය කථා කරන්නේ. ව්‍යසනයකදී අප කවුරුත් මුහුණ දෙන්න ඕනෑ විධිය අපේ ආණ්ඩුවෙන් ඉගෙන ගන්න කියලා අපි විපක්ෂයේ අයට කියනවා.

මම අද දැක්කා, නාමල් රාජපක්ෂ මන්ත්‍රීවරයා පිළිගෙන තිබෙනවා, ආණ්ඩුව විධියට -රජය විධියට- මේ මැදිහත්වීම නිවැරැදිව කර තිබෙනවා, ජනතාවට සහන ලබා දී තිබෙනවා කියලා. හැබැයි, ඔවුන්ට ප්‍රශ්නය තිබුණේ ඉඩම් සහ නිවාස ලබා දීම පිළිබඳවයි. මේ ක්‍රියාවලියේ අවසාන එක තමයි, අදාළ ස්ථාන හඳුනාගෙන ඉඩම් ලබා දීම සහ නිවාස ලබා දීම. පියවර 4ක් ඔස්සේ අපි ඒ කටයුතු කරමින් ඉන්නවා.

එතුමා පිළිගෙන තිබෙනවා මේ සහන වැඩ පිළිවෙළ ආණ්ඩුව හරියට ක්‍රියාත්මක කරලා තිබෙනවා කියලා. ඔව්, ඉඩම් සම්බන්ධව ගැටලුවක් තිබෙනවා. නිවාස දහස් ගණනක් ලබා දෙන්න වෙලා තිබෙනවා. හැබැයි කොහේද ඉඩම් තිබෙන්නේ? පුත්තලම දිස්ත්‍රික්කය ගත්තොත්, ඇත්තටම ඊයේත් මම මේ ගැන කථා කළා. ඉඩම් කා ගාවද තිබෙන්නේ? ඒ ඉඩම් මංකොල්ල කාලා තිබෙන්නේ. ඉතින් ඉඩම් හොයා ගැනීම ප්‍රශ්නයක් වෙලා තිබෙනවා. පුත්තලම දිස්ත්‍රික්කයේ හිටපු දේශපාලනඥයන් සියලුදෙනා මේ ඉඩම් අත්පත් කරගෙන තිබෙනවා; හොරට ඔප්පු හදාගෙන තිබෙනවා. අපට නම් වශයෙන් ඒවා කියන්න පුළුවන්. පුත්තලම දිස්ත්‍රික්කයේ හිටපු සියලු මැති ඇමතිවරු මේ ඉඩම් මංකොල්ලයේ ඉන්නවා. නමුත් අපි මේ ජනතාවට ඉඩම් ලබා දෙන්න කටයුතු කරනවා.

ඒ වාගේම සින්නනාගු විල්ලුවේ ප්‍රශ්නයක් ගැනත් නිතරම කථා වුණා. අද රටේ ප්‍රධාන මාතෘකාවක් විධියටත් එය පත් වෙලා තිබෙනවා. ඇත්තටම ඒවාට අපි මැදිහත් වුණා. අපේ ගරු ෆයිසාල් මන්ත්‍රීතුමා ඒ මොහොතේම එතැනට ගියා. එතැන විල්ලු තිබෙන්නේ. අපට ඒ වතුර වෙන පැත්තකට ගෙනියන්න බැහැ. මුහුදේ සහ ඒ ප්‍රදේශවල ජල මට්ටම වෙනස්. ඒවා මීට පෙර මෙහෙම ව්‍යසනයට පත් වෙලා නැහැ. එතැන නිවාස 33ක ජනතාව හානියට පත් වෙලා තිබුණා. අපි ඔවුන් කඳවුරුවලට යවලා අවශ්‍ය මැදිහත්වීම කළා; කෑම බීම ලබා දීලා ඒ අවශ්‍ය මැදිහත්වීම් කළා. ඒ වාගේම මේ මොහොතේ සිට මාස හයකට දීමනාවක් ලබා දෙනවා, ඔවුන්ට කුලී නිවෙස්වල ඉන්න. ඔවුන් ඒ තැන්වලට ගිහිල්ලා තිබෙනවා. අපි ඒ පහසුකම් ලබා දෙනවා. ඒ වාගේම අපි අක්කර 100ක් වෙන් කරගෙන තිබෙනවා, ඔවුන්ට ඉදිරියේදී ඒ නිවාස හදා දෙන්න. ඒ අවශ්‍ය මැදිහත්වීම් ටික අපි කරනවා. ඒ නිසා ඇත්තටම මේවා ගැන සොයා බලන්නේ නැතුව විවේචනයක් පමණයි කරන්නේ. ඒ ප්‍රදේශ ස්වාභාවිකව ක්‍රියාවලියක් ඇතුළේ ඒ තැනට පත් වෙලා තිබෙනවා. අපි ඒකට අවශ්‍ය මැදිහත්වීම කරමින් තිබෙනවා. ඉදිරියේදී ඒ ජනතාවට අවශ්‍ය නිවාස ලබා දීමේ කටයුතුවලටත් අපි මැදිහත් වෙමින් තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, පුත්තලම දිස්ත්‍රික්කය මේ ව්‍යසනය නිසා විශාල බලපෑමකට ලක් වුණා. අපේ ග්‍රාම නිලධාරි වසම් 546ක පවුල් 124,553ක් මේ ව්‍යසනයේ බලපෑමට ලක් වෙලා තිබෙනවා. ඒ වාගේම 457,935ක ජනතාවක් ඒ බලපෑමට ලක් වුණා. ඒක පොඩි ප්‍රමාණයක් නොවෙයි. නිවාස හානි ගත්තොත්, පූර්ණ හානි 590ක්, අර්ධ හානි 9,990ක්, මේ ව්‍යසනයට ලක් වෙලා තිබෙනවා. නිවාස විශාල ප්‍රමාණයක් ව්‍යසනයට ලක් වුණා. ඒ නිවාසවල ගෘහ උපකරණ 41,345ක් නැවත ලබා දෙන්න අපට කටයුතු කරන්න වෙලා තිබෙනවා, ඒ සංඛ්‍යා දත්ත එක්ක ගත්තොත්. ඒ වාගේම පාසල් ළමුන් 49,972ක් මේ ව්‍යසනයේදී බලපෑමට ලක් වෙලා තිබෙනවා. ඉතින් මේ දිස්ත්‍රික්කය මෙවැනි තත්ත්වයකට පත්වෙච්ච දිස්ත්‍රික්කයක්. හැබැයි, අපි මැදිහත් වෙලා ඒ ජනතාවට අවශ්‍ය සහන ලබා දීලා, ඔවුන් යථා තත්ත්වයට පත් කරලා ඒ වැඩ කටයුතු කරමින් තිබෙනවා. ඒ පළාත මහා විනාශයකට ලක් වුණා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අපේ දිස්ත්‍රික්කයේ වාගේම ධීවර කර්මාන්තය සහ අපේ රටේ ධීවරයන් ඇතුළු ධීවර ක්ෂේත්‍රයත් මේ නිසා බරපතළ බලපෑමකට ලක් වුණා. හැබැයි, අපි ක්ෂණිකව මැදිහත් වෙලා ඒවාට අවශ්‍ය කටයුතු සම්පාදනය කරලා තිබෙනවා. සමහර අයගේ බෝට්ටු කැඩී බිඳී ගියා; ඔරු ටික ගියා; තෙප්පම් ටික ගියා; දැල් විනාශ වුණා. ඒවා මහා විනාශයකට පත් වුණා. ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව විධියට අපි ඒවාට අවශ්‍ය මැදිහත්වීම කළා. ඒ වාගේම අපේ පුත්තලම දිස්ත්‍රික්කයේ ඉස්සන් කර්මාන්තයත් මේ නිසා බරපතළ විනාශයට ලක් වුණා. නමුත් අපි ඒවාට අවශ්‍ය මැදිහත්වීම් කරලා තිබෙනවා. රුපියල් බිලියන 1.6ක් ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව විසින් වෙන් කරගෙන තිබෙනවා, ඒ ධීවරයන්ට සහන දීම සඳහා; වන්දි ලබා දීම සඳහා. ඒ වාගේම අපේ මීරිදිය ක්ෂේත්‍රයේ ඉස්සන් කර්මාන්තය වාගේ ක්ෂේත්‍රවලටත් විශාල හානියක් වුණා. අපි කෝටි 585ක් ජලජීවී වගා සංවර්ධන අධිකාරියට වෙන් කරලා තිබෙනවා ඒවා යථාවත් කරන්න. ඒ වැව් ටික කැඩිලා ගියා; මාළු ටික එළියට ගියා; දැල් ටික ගියා; ඔරු ටික කැඩිලා බිඳිලා ගියා. අපි ඒවාටත් අවශ්‍ය මැදිහත්වීම කරලා තිබෙනවා. අපි ඒ සහන වැඩ පිළිවෙළ හදලා තිබෙනවා. පූර්ණ වශයෙන් හානි වූ ඔරු සඳහා රුපියල් ලක්ෂයක් ලබා දෙනවා. ඒ සෑම ඔරුවකටම, ඒ හැම ධීවරයෙකුටම ලබා දෙනවා. ඔරු 449ක ප්‍රමාණයකට හානි වෙලා තිබෙනවා. ඒවාට රුපියල් මිලියන 44.9ක් ලබා දෙන්න කටයුතු කරලා තිබෙනවා. ඔරු අලුත්වැඩියාව සඳහා එක ඔරුවකට රුපියල් 50,000ක් දෙනවා. පොඩි ගණනක් වැය වුණත්, ඒ කියන්නේ රුපියල් 5,000ක් ගියත් කමක් නැහැ අපි රුපියල් 50,000ක වන්දියක් ලබා දෙන්නේ ඒවා හදා ගන්න. ඒ වාගේම තමයි දැල්වලටත්. ඔවුන්ට දැල් ලබා ගැනීම සඳහාත් අපි රුපියල් 100,000ක් ලබා දෙනවා. රුපියල් 75,000ක් ලබා දෙනවා. කරදිය ක්ෂේත්‍රයේ නම්, දැල් ගන්න රුපියල් 100,000ක් ලබා දෙනවා. මිරිදිය ක්ෂේත්‍රයේ නම්, රුපියල් 75,000ක්. මෙවැනි සහන ක්‍රියාවලියක් මේ තත්ත්වය තුළ අපි හදලා තිබෙනවා. ඒ නිසා අපට චෝදනාවක් කරන්න බැරි තැනට මේ ආණ්ඩුව, මේ රජය වැඩකටයුතු කරලා තිබෙනවා. අපි දන්නවා, නිලධාරින් අපිත් එක්ක හොඳට වැඩ කළ බව; සහයෝගයෙන් වැඩ කළ බව.

මේ ආපදාව නිසා පුත්තලම දිස්ත්‍රික්කයේ දුම්රිය මාර්ගය කැඩිලා බිඳිලා, පාලම් කැඩිලා බිඳිලා වැටුණා. පුත්තලමට, හලාවතට කෝච්චියට යන්න බැරුව ගියා.

හැබැයි, කඩිනමින් වැඩ පිළිවෙළක් හදලා ඉතා කෙටි කාලයක් ඇතුළත අපි මේවා ප්‍රතිසංස්කරණය කරලා, සංවර්ධනය කළා. මේ වෙද්දී පුත්තලම දක්වා දුම්රියට යන්න පුළුවන් තත්ත්වයට පත් කරගෙන තිබෙනවා. හැබැයි, මෙවැනි මොහොතක විපක්ෂය ආණ්ඩු බලයේ හිටියා නම් කුමක් වෙයිද? හතර ගාතෙන් වැටිලා, කරන්නේ මොකක්ද, යන්නේ කොහේද කියලා හිතා ගන්නවත් බැරි තත්ත්වයකට පත් වෙන්න තිබුණා. අද අපට පෙනෙනවා මේ විසිරුණු සුන්බුන් විපක්ෂය සාධාරණ විවේචනයක්වත් ගෙනෙන්න බැරි තැනකට පත් වෙලා තිබෙන බව. ජනතාවත් එක්ක වැඩ කරන ආණ්ඩුවක් විධියට අපි මේ කටයුතුවලට මැදිහත් වෙලා තිබෙනවා; අවශ්‍ය මැදිහත්වීම නිසි වෙලාවට කරලා තිබෙනවා. දැන් අපට වගකීමක් තිබෙනවා. අපි සියලුදෙනා එකතු වෙලා ඉදිරියේදී ගොඩනැගෙන්න ඕනෑ. ඔව්, බිඳ වැටුණා. හරි, අපි නැඟිටිනවා. අපි නැඟිටිමු. හැබැයි මේ ක්‍රියාවලියේ දී වංචාවක්, දූෂණයක් වෙලා නැහැ. නිලධාරියෙක්වත්, දේශපාලනඥයෙක්වත් මේ කාලය තුළ වංචාවක්, දූෂණයක් කරලා නැහැ. හැම සතයක්ම ජනතාවට දීලා තිබෙනවා; වඩාත් වැඩියෙන් දීලා තිබෙනවා; ලෝභ නැතිව දීලා තිබෙනවා. ප්‍රාදේශීය ලේකම්ලා සහ ඒ නිලධාරින්ගෙන් දැන් ප්‍රශ්නයක් ඇවිල්ලා තිබෙනවා, අර්ධ හානි වූ නිවාස සඳහා රුපියල් ලක්ෂ 5 දෙන්නේ කොහොමද කියලා. අපි ඒ සඳහාත් වැඩ පිළිවෙළක් හදලා තිබෙනවා; ඔවුන් අපහසුතාවට පත් කරන්නේ නැතිව ඒ මුදල් දෙන්නත් ක්‍රමයක් හදලා තිබෙනවා.

ජනතාවගේ ජීවිත ගොඩනඟන්න තමයි අපි කටයුතු කරන්නේ. ඒ නිසා ඇත්තටම ඔබතුමන්ලා කරන්න ඕනෑ මොකක්ද? කරන්න ඕනෑ මේවා විවේචනය කරන එක නොවෙයි. මේක ව්‍යසනයක්. මේ ව්‍යසනයේ දී අපි හැසිරෙන්න ඕනෑ කොහොමද? ලෝකයේ රටවල් මෙවැනි ව්‍යසනවලට මුහුණ දෙනවා, සියලුදෙනා එකතු වෙලා. ජයග්‍රහණ ලබනවා. එහෙම ජයග්‍රහණය කරන කොට රටත් ජයග්‍රහණය කරනවා. මේක දේශපාලනීකරණය කර ගන්න ඕනෑ නැහැ. මේ ව්‍යසනය නිසා සහන දෙන එකෙන් දේශපාලනයක් කරන්න ඕනෑ නැහැ. හැබැයි, අපි සියලුදෙනා එකතු වෙලා මේ පසු ව්‍යසනයට මුහුණ දෙන්න ඕනෑ. ඒ නිසා සාධාරණව විවේචනය කරන්න. සියලුදෙනා එකතු වෙලා මේ තත්ත්වයට මුහුණ දෙමු. අපි වංචා, දූෂණ නැති, සෑම දෙයක්ම ජනතාව වෙනුවෙන් කරන ආණ්ඩුවක්. ඒ නිසා අපි අභියෝග කරනවා, පුළුවන් නම් කියන්න, මේ කටයුතුවලදී මොනවා හෝ බලපෑමක් වෙලා තිබෙනවාද, වංචාවක් වෙලා තිබෙනවා ද කියලා. ඒ කිසිවක් වෙලා නැහැ. අපි හැමෝම එක මිටට ඉඳගෙන ඒ ජනතාවට අවශ්‍ය සහන ලබා දෙන්න කටයුතු කරනවා කියලා කියන්න කැමතියි.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු සුජිත් සංජය පෙරේරා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක් තිබෙනවා.

[අ.භා. 3.14]

**ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා**
(மாண்புமிகு கே. சுஜித் சஞ்ஜய பெரேரா)
(The Hon. K. Sujith Sanjaya Perera)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, "දිට්වා" සුළි කුණාටුව හේතුවෙන් සිදු වූ ආපදා තත්ත්වය පිළිබඳව ගෙන එන ලද සභාව කල් තැබීමේ යෝජනාව ගැන කථා කරන්න ලැබීම පිළිබඳව මම සතුටු වෙනවා. අද උදේ වරුවේ ඉඳන්ම මේ දක්වා මේ ආපදා තත්ත්වය පිළිබඳව ආණ්ඩු පක්ෂයේ මැති ඇමතිවරු කරුණු දැක්වූවා. එතුමන්ලා කියන්නේ නම් ආපදාවට පත් වෙච්ච අයට දෙන්න තිබෙන සහන වලින් මේ වෙනකොට සෑහෙන ප්‍රමාණයක් ලබා දීලා තිබෙනවා කියලා. මට නම් ඒ එක කාරණාවකට විතරයි එකඟ වෙන්න පුළුවන් වෙන්නේ. මොකද, ඔබතුමන්ලා ගංවතුරෙන් හානි වෙච්ච අයට රුපියල් 25,000ක මුදලක් ලබා දෙන්න කටයුතු කරලා තිබෙනවා. ඒ මුදල සියයට 90කට පමණ ගෙවන්න කටයුතු කරලා තිබෙනවා. තවත් මන්ත්‍රීවරයෙක් හෝ ඇමතිවරයෙක් කිව්වා, රුපියල් 50,000 ආධාර මුදල ගැන. ඒ කියන්නේ, මුළුතැන් ගෙයි උපකරණවලට වෙච්ච හානි වෙනුවට මුදල් ගෙවීමේ නම් සියයට 70ක, 75ක ප්‍රගතියක් තිබෙනවා කිව්වා. මම නියෝජනය කරන යටියන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ මම ඒ ගැන හොයා බැලුවා. නමුත් එහෙම ප්‍රගතියක් අත්පත් කරගෙන නැහැ. ඒ නිසා ඔබතුමන්ලා කියන දේවල් ඒ ආකාරයට පිළිගන්න පුළුවන්කමක් නැහැ.

මෙතැනදී තවත් කාරණා කිව්වා. විපක්ෂ නායකතුමාටත් චෝදනා කළා, විපක්ෂයේ මන්ත්‍රීවරුන්ටත් චෝදනා කළා, මේ වැඩ කටයුත්ත කඩාකප්පල් කරන්නත්, ආපදා තත්ත්වය විවේචනය කරන්නත් විතරයි විපක්ෂය කටයුතු කරන්නේ කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මට කියන්න තිබෙන්නේ මේකයි. අපට මතකයි, විපක්ෂ නායකතුමා පළමු දවසේම කිව්වා, මෙවැනි ආපදා තත්ත්වයක් එන්න තිබෙනවා, පූර්ව සූදානමක් වෙන්න කියලා. ඊට පස්සේ, ආපදාව ඇති වුණාට පස්සේ පාර්ලිමේන්තුව එක දිනයක රැස් වුණා. ඒ දිනයේ දී එතුමා කිව්වේ මොකක්ද? අනිවාර්යයෙන්ම රටේ හදිසි තත්ත්වයක් ප්‍රකාශයට පත් කරන්න කටයුතු කරන්න කියලා මුලින්ම කිව්වේ අපේ ගරු විපක්ෂ නායක සජිත් ප්‍රේමදාස මැතිතුමායි. එතුමා තමයි කිව්වේ මේ වැඩකටයුතු ටික කරන්න, තමුන්නාන්සේලා නිලධාරීන්ගේ සහයෝගය ගන්න, හමුදාවල සහයෝගය ගන්න කියලා. අවශ්‍ය ඒ වැඩ පිළිවෙළ සකස් කර ගන්න තමයි එතුමා ඒ යෝජනාව කළේ. ඊට පස්සේ එතුමා කළේ මොකක්ද? මේ තත්ත්වය තුළ රටට විශාල හානියක් වුණා. රජයට විශාල මුදලක් අවශ්‍ය වෙන නිසා එතුමා කළේ තානාපති කාර්යාලවලට ගිහිල්ලා තානාපතිවරු සමඟ ඒ ගැන සාකච්ඡා කළා. ඒ සාකච්ඡා කරලා මොනවාද ඉල්ලුවේ? රට වෙනුවෙන් ඉල්ලුවේ මේ රජයට සහයෝගය දක්වන්න කියලායි. මේ රට විශාල ආපදාවකට පත් වෙලා ඉන්නවා, අපේ රටේ ජනතාව ආපදාවට ලක් වෙලා ඉන්නවා, ඒ නිසා මේ අයට සහන සලසන්න අවශ්‍ය උදව් උපකාර ලබා දෙන්න කියලා තමයි එතුමා එදා ඉල්ලුවේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මම තවත් කාරණයක් මතක් කරන්න ඕනෑ. අපි ඔබතුමන්ලාට යෝජනා කළා, ගරු ජනාධිපතිතුමාට යෝජනා කළා විශේෂයෙන්ම විදේශ රටවල -ඒ කියන්නේ අපට යම් විධියකට උදව් කරන්න පුළුවන් රටවල- ආධාර සමුළුවක් කැඳවන්න කටයුතු කරන්න කියලා. නමුත්, ඔබතුමන්ලා ඒ කටයුතු කරන්න උත්සාහ ගත්තේ නැහැ. දැන් ඔබතුමන්ලා යම් යම් රටවලින් ඉල්ලීම් කළාට දැන් ඒ රටවල් සූදානම් වෙලා නැහැ, ඔබතුමන්ලාට උදව්-උපකාර කරන්න. එහෙම තමයි මේ කටයුත්ත සිද්ධ වුණේ.

මේ ගැන කථා කරද්දී මම මේ කාරණයත් කියන්න ඕනෑ. සමහර මන්ත්‍රීවරු ප්‍රකාශ කළා, "විපක්ෂ නායකතුමා මොකක්ද කළේ, එතුමා සමහර තැන්වලට ගිහිල්ලා නිකම් බලලා ආවා විතරයි" කියලා. නමුත් මම කියන්න ඕනෑ, මේ ගංවතුරෙන් හානි වූ තැන්වලට, ඒ වාගේම නාය ගිය තැන්වලට, අපි නියෝජනය කරන අපේ දිස්ත්‍රික්කය ඇතුළු හැම තැනකටම ගරු විපක්ෂ නායකතුමා පැමිණි බව. ඒ පැමිණිලා, ආපදාවට ලක් වූ අයට මොන ආකාරයේ හානිද සිද්ධ වෙලා තිබෙන්නේ, වෙලා තිබෙන අඩුපාඩුකම් මොනවාද කියන එක ගැනත් එතුමා පෞද්ගලිකව සොයා බැලුවා. ඒ ආකාරයට සොයා බලලා එතුමා ඇවිල්ලා කිව්වේ මොකක්ද? "මේ හැම කෙනාටම පෞද්ගලිකව උදව් කරන්න බැහැ. නමුත් අඩුම තරමින් ඒ ප්‍රදේශවල ජනතාවට විශාල වශයෙන් සේවය සලසන රෝහල්වලට අවශ්‍ය කරන උපකරණ ටිකක් හරි ලබා දෙන්න අපි වැඩ කටයුතු කරන්න ඕනෑ" කියලා තමයි ගරු විපක්ෂ නායකතුමා එදා කිව්වේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඔබතුමියලාත් මාධ්‍ය මඟින් දකින්න ඇති එතුමා කියපු විධියටම, පොරොන්දු වූ විධියටම ආපදාවට ලක්වූ ප්‍රදේශවල හැම රෝහලකටම වාගේ රුපියල් ලක්ෂ 28ක්, ලක්ෂ 30ක් පමණ වටිනා රෝහල් උපකරණ ලබා දෙන්න කටයුතු කළ ආකාරය. ඒවා කළේ රජයේ මුදල්වලින් නොවෙයි. ඒ දේවල් කළේ ඔබතුමන්ලා ලබා දුන් මුදල්වලින් නොවෙයි. එතුමාට ලැබෙන වැටුපත්, ඒ වාගේම එතුමාට හිතෛෂීවන්තයන්ගෙන් ලැබෙන මුදල් පරිත්‍යාගත් අරගෙන තමයි ඒ ආපදාවට ලක් වූ ප්‍රදේශවල රෝහල් ටික පිළිසකර කරන්න, ඒවාට අවශ්‍ය කරන අත්‍යවශ්‍ය උපකරණ ටික ලබා දෙන්න එතුමා කටයුතු කළේ කියන එකත් මම කියන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඔබතුමියත් නියෝජනය කරන්නේ කෑගල්ල දිස්ත්‍රික්කය. කෑගල්ල දිස්ත්‍රික්කයේ අරණායක දැඩි ලෙස ආපදාවට ලක් වුණා. ඒ වාගේම හෙම්මාතගම ප්‍රදේශයේ රෝහල්වලටත් අත්‍යවශ්‍ය උපකරණ ලබා දුන්නා. ඒ වාගේම, කරවනැල්ල රෝහලටත් අපි රුපියල් ලක්ෂ 28ක් පමණ වටිනා උපකරණ විශාල ප්‍රමාණයක් ලබා දුන්නා. මම නියෝජනය කරන දිස්ත්‍රික්කයේ කිතුල්ගල රෝහලටත් රුපියල් ලක්ෂ 33ක වටිනාකමක් තිබෙන රෝහල් උපකරණ ලබා දෙන්න එතුමා කටයුතු කළා කියන එකත් මම මේ අවස්ථාවේදී කියන්න ඕනෑ. අපේ රටේ හිටපු කිසිම විපක්ෂ නායකවරයෙක් මෙවැනි වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරලා නැහැ. මීට පෙරත් අපේ රටේ මෙවැනි ආපදා සිද්ධ වෙලා තිබෙනවා. ඒ කාලවල හිටපු විපක්ෂ නායකවරු එවැනි ආපදා අවස්ථාවලදී මොනවාද කිව්වේ? "අපට කරන්න බැහැ; අපට බලයක් නැහැ; මට අවස්ථාවක් ලැබුණොත් මම උදවු උපකාර කරන්නම්" කියලා තමයි මීට පෙර හිටපු හැම විපක්ෂ නායකවරයෙක්ම කිව්වේ. නමුත්, සජිත් ප්‍රේමදාස මැතිතුමා එහෙම කථා කරපු නායකයෙක් නොවෙයි. එතුමා විපක්ෂ නායකවරයා හැටියට විපක්ෂය නියෝජනය කරනවා වාගේම, විපක්ෂයක් විධියට තමුන්නාන්සේලාගේ වැඩ පිළිවෙළ විවේචනය කරනවා. ඒ වාගේම එතුමාට කරන්න පුළුවන් හැම දෙයක්ම එතුමාගේ පැත්තෙන් කරලා තිබෙනවා. කාල වේලාව ගතවෙන නිසා මම ඒ සම්බන්ධව දීර්ඝ වශයෙන් කථා කරන්නේ නැහැ.

මේ අවස්ථාවේදී මම තව කාරණයක් කියන්න ඕනෑ. ඔබතුමන්ලා බොහෝ දෙනෙක් මේ සම්බන්ධයෙන් කථා කළා. ජනාධිපතිතුමා කියපු පොරොන්දු ගැන මට මේ අවස්ථාවේ කියන්න බැහැ. නිවසක් හදා ගන්න ලබා දෙන රුපියල් ලක්ෂ 50 ගැනත්, ඒ වාගේම ඉඩමක් මිලදී ගන්න ලබා දෙන රුපියල් ලක්ෂ

50 ගැනත් මම මේ අවස්ථාවේදී කථා කරන්නේ නැහැ. නමුත් මේ අවස්ථාවේදී මම කියන්න ඕනෑ, ආපදාවලට ලක් වෙලා අධි අවදානම් කියලා හඳුනා ගත් පවුල් විශාල සංඛ්‍යාවක් සිටින බව. මම දන්නා ආකාරයට කෑගල්ල දිස්ත්‍රික්කයේ එවැනි පවුල් 1,500කට වැඩි සංඛ්‍යාවක් ඉන්නවා. හැම තැනම සමීක්ෂණ කරලා නැහැ. නමුත් පවුල් 1,500කට වැඩි සංඛ්‍යාවක් හඳුනාගෙන තිබෙනවා. මම හිතන විධියට යටියන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ විතරක් පවුල් 600ක, 700ක විතර ප්‍රමාණයක් ඉන්නවා. මේගොල්ලන් දැනට එහි ඉන්නවා. අධි අවදානම් කියලා මේ අයට ඒ තැන්වලින් ඉවත් වෙන්න කියලා තිබෙනවා. ඉවත් වෙන්න කියලා දැන් මාස 2කට ආසන්නයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, දැන් තිබෙන ප්‍රශ්නය මේකයි. මේගොල්ලන් දැනට ඉන්නේ තමන්ගේ හිතවතුන්ගේ ගෙවල්වල. එහෙම නැත්නම් ඥාති හිත මිත්‍රාදීන්ගේ ගෙවල්වල. ඒ ආකාරයට එවැනි තැන්වල ඔවුන්ට දීර්ඝ කාලයක් ඉන්න පුළුවන්කමක් නැහැ. එවැනි අයට රුපියල් 25,000ක් මාස 3කට දෙනවා, මාස 6කට දෙනවා කියලා මෙතුමන්ලා කිව්වාට, එය තවම ප්‍රායෝගිකව යථාර්ථයක් බවට පත් වෙලා නැහැ. ඔබතුමන්ලා මෙතැන කථා කළා වාගේම ඒ දේවල් ප්‍රායෝගිකව මහ පොළොවේ ක්‍රියාත්මක වෙනවාද කියලාත් සොයා බලන්න. මේ මිනිසුන්ට මේ මුදල ලබා දෙන්න යම්කිසි වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරනවා ද කියලා සොයා බලන්න. මේ අයට එක රැයින් ඉඩම් දෙන්න පුළුවන්කමක් නැහැ. ඒක අපි දන්නවා. එක රැයින් ඉඩම් ටික ලබා දීලා, ගෙවල් ටික හදන්න පුළුවන්කමක් නැහැ කියලා අපි දන්නවා. ගරු ආපදා කළමනාකරණ අමාත්‍යතුමනි, ඒ නිසා මේවා ගැන හරියට බලන්න කියලායි ඔබතුමාගෙන් අපි ඉල්ලා සිටින්නේ. ඒගොල්ලන් ගෙවල් ටික සොයා ගන්නකම්, ඉඩම් ටික සොයා ගන්නකම්, ගෙවල් කුලියට ගන්න අවශ්‍ය මුදල් ටික ලබා දෙන්න කටයුතු කරලා තිබෙනවා ද කියලා මම අහන්න කැමැතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මම වතු කම්කරුවන් ගැනත් කියන්න ඕනෑ. ඒ සම්බන්ධයෙන් විශේෂයෙන්ම නොයෙකුත් දෙනා නොයෙකුත් ආකාරයට කථා කළා. වතු කම්කරුවන් සම්බන්ධයෙන් ප්‍රශ්න තිබෙන බව අපි දන්නවා. සමහර අවස්ථාවලදී වතු කම්කරුවන්ට වෙන ආකාරයකට සලකන බවක් පෙනෙමින් තිබෙනවා. මොකද, වතු කම්කරුවෝ සෑහෙන ප්‍රමාණයක් මේකෙන් අවතැන් වෙලා සිටින බව අපි දන්නවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, යටියන්තොට, හල්ගොල්ල වත්තේ විතරක් පවුල් 56ක් අවතැන් වෙලා සිටිනවා. ඒ පවුල් 56 දැනට ඉන්නේ හල්ගොල්ල විද්‍යාලයේ. දැන් ඒ විද්‍යාලය පටන් ගන්න පුළුවන්කමක් නැහැ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා**
(மாண்புமிகு கே. சுஜித் சஞ்ஜய பெரேரா)
(The Hon. K. Sujith Sanjaya Perera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මට තව විනාඩියක් ලබා දෙන්න.

මේගොල්ලන් තාවකාලිකව කුඩාරම්වල නතර කරන්න කියලා තිබෙනවා. නමුත්, ඒ කුඩාරම් ටික ඉදිකරන්න තැනක් නැහැ. වතු අධිකාරිවරුන් එක්ක කථා කරලා ඉඩම් ටික නිදහස් කරගන්න වැඩ පිළිවෙළක් නැහැ. දැන් කියනවා, වත්තෙන්ම ඉඩම් දෙන්න කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, වතු කම්කරුවන්ට වත්තෙන්ම ඉඩම් දෙන්න ඕනෑ කියලා නීතියක් නැහැ. මේගොල්ලන් වත්තේ පදිංචි වෙලා හිටපු බව ඇත්ත. ගමේ මිනිසුන්ට ගමේ ඉඩම් දෙන්න පුළුවන් නම්, වත්තේ ඉන්න මිනිස්සුන්ට ගම්වල ඉඩමක් දෙන්න අයිතියක් නැද්ද? ඒ අයත් මේ රටේ පුරවැසියෝ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, එහෙම භේදයක් කරන්න එපා කියලායි අපි ඉල්ලා සිටින්නේ. වත්තෙන් ඉඩම් ටික දෙනකම් බලාගෙන ඉන්නේ නැතිව, පිටින් හරි කමක් නැහැ ඉඩම් ටික සොයලා ඒ වතුවල මිනිසුන්ටත් ඒ ඉඩම් ටික ලබා දීමේ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න. ඒක තමයි අපි ඉල්ලා සිටින්නේ. ඒ අනුව තමුන්නාන්සේලා කටයුතු කරයි කියලා අපි බලාපොරොත්තු වෙනවා. ඒ බලාපොරොත්තුව ඇතිව මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු දම්මික පටබැඳි ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 12ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.22]

**ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි මහතා (පරිසර අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) தம்மிக பட்டபெந்தி - சுற்றாடல் அமைச்சர்)
(The Hon. (Dr.) Dammika Patabendi - Minister of Environment)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අද දින සභාව කල් තබන අවස්ථාවේ ඉදිරිපත් කරන ලද යෝජනාව සම්බන්ධයෙන් කථා කිරීමට අවස්ථාව ලබා දීම ගැන ඔබතුමියට ස්තුතිවන්ත වෙනවා. විශේෂයෙන්ම මම කථාව ආරම්භ කරන්න සතුටුයි, අපේ සුජිත් සංජය පෙරේරා මැතිතුමා කියපු පට්ටපල් බොරුවක් ගැන සඳහන් කරමින්. මා නියෝජනය කරන දිස්ත්‍රික්කයම නියෝජනය කරමින් එතුමා කිසිදු දත්ත, තොරතුරු නැතුව නිකම් ඔහේ දේවල් ටිකක් කියාගෙන ගියා. ගරු මන්ත්‍රීතුමනි, ඔහොම කළොත් ඔබට ඡන්දය දීපු අතලොස්සක් පිරිසටත් ඔබ කරන්නේ අවමානයක්. ඔබතුමා කිව්වා, යටියන්තොට ප්‍රදේශයේ ජනතාවට මුළුතැන්ගෙයි උපකරණ ලබා ගැනීම සඳහා දෙන රුපියල් 50,000 හරියට ගෙවලා නැහැ කියලා. මම ඔබට ඉදිරිපත් කරන්නම් 2026 ජනවාරි මාසයේ 07වැනි දා දත්ත. අද 21වැනි දා. මේ දත්ත 07වැනි දා. යටියටන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මුළුතැන්ගෙයි හානි වීම් සම්බන්ධයෙන් රුපියල් 50,000 ලැබිය යුතු පිරිස 1,083යි. එයින් 1,075කට ගෙවලා තිබෙනවා; රුපියල් මිලියන 53කට වැඩි ප්‍රමාණයක් ගෙවලා තිබෙනවා; සියයට 99කට ගෙවලා තිබෙනවා, ගරු මන්ත්‍රීතුමනි. කෑගල්ල දිස්ත්‍රික්කය ගත්තොත්, මේ සංඛ්‍යාව සියයට 93.59ක්. මේ ආණ්ඩුව විසින් ඒ ප්‍රමාණයට ගෙවන්න සමත් වෙලා තිබෙනවා. 8,388කට ලැබිය යුතුව තිබෙනවා. 7,850කට ඒක දැනට ගෙවලා තිබෙනවා. තව ගෙවීමට ඉතුරුව තිබෙන්නේ 538කට විතරයි. මේවා ජනවාරි මාසයේ 07වැනි දා දත්ත බව මතක තියා ගන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව ගෙනාපු මන්ත්‍රීවරිය කොහේ හිටියාද කියලා පුදුම හිතෙනවා, මේ යෝජනාව ඉදිරිපත් කරලා තිබෙන විධිය බැලුවාම. "... සිදු වූ ව්‍යසනය පිළිබඳව ව්‍යසනයට පෙර ව්‍යසනය සිදු වූ මොහොත සහ පශ්චාත් ව්‍යසන කළමනාකරණය පිළිබඳව මේ මොහොත වන විට පැහැදිලි දත්ත හෝ වැඩ පිළිවෙළක් ඉදිරිපත් කිරීමට රජය අපොහොසත් වී ඇත" කියලා එතුමිය කියනවා. මේ කාලය තුළ මේ වාගේ යෝජනාවක් ඉදිරිපත් කිරීමට සිත් පහළ වීම සම්බන්ධයෙන් මේ මන්ත්‍රීතුමිය කොහේ සිටියාද කියලා හොයා බැලුවා නම් හොඳයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. අපි රජයක් හැටියට මේ ආපදාව සිදුවන මොහොතකට කලිනුත් ඒ සඳහා අවශ්‍ය පියවර ගත්තා. මීට කලින් කථා කරපු මන්ත්‍රීවරුන් ඒ සම්බන්ධයෙන් දත්ත පැහැදිලි කළා.

[ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි මහතා]

ඒ විතරක් නොවෙයි, ඊට පස්සේත් අපි මේ සඳහා විශේෂ මැදිහත් වීමක් කළා. විශේෂයෙන් පරිසර අමාත්‍යාංශය විධියට අපි මේ ව්‍යසනය සිදු වුණාට පසුව මෙමඟින් සිදු වූ පරිසර හානිය සම්බන්ධයෙන් තක්සේරුවක් කර ගැනීම සඳහා කටයුතු කළා. දෙසැම්බර් 11වැනි දා ඒ වෙනුවෙන් නව දෙනෙකුගෙන් යුත් කමිටුවක් පත් කළා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අන්න ඒ කමිටුවේ වාර්තාව අපි මේ වෙනකොට ඉදිරිපත් කරලා තිබෙනවා. එය සති දෙකක වාර්තාවක්. ඒ සති දෙකක වාර්තාවෙන් පස්සේ, මාස හයක් ඇතුළත අපේ රටේ පරිසරයට සිදු වෙච්ච හානිය පිළිබඳ සම්පූර්ණ වාර්තාවක් සකස් කිරීම සඳහා අපි එම කමිටුවට බලය පවරා තිබෙනවා. ඒ සති දෙකේ වාර්තාව අනුව ගංවතුර, නායයාම් සහ අධික වර්ෂාව නිසා අපේ රටේ පරිසර පද්ධතීන්ට හානි පැමිණිලා තිබෙනවා. විශේෂයෙන්ම තෙත් කලාපයේ අත්තනගලු ඔය, කැලණි ගඟ සහ කළු ගඟ ආශ්‍රිතවත් වියළි කලාපයේ මල්වතු ඔය, මහවැලි ගඟ සහ වී ඔය, කලා ඔය ආශ්‍රිතවත් ජෛව විවිධත්වය අනතුරට ලක් වෙලා තිබෙනවා කියන එක එම වාර්තාවේ සඳහන් වෙනවා. ඒ වාගේම නායයාම් නිසා අපේ රටේ කඳුකර වනාන්තර - මිනිපේ, කොත්මලේ, අරණායක ප්‍රදේශවලත්, බදුල්ල සහ මාතලේ දිස්ත්‍රික්කවල යම් ප්‍රදේශවලත් - පද්ධතියට හානි පැමිණිලා තිබෙනවා. එසේ හානි පැමිණිලා තිබෙන කඳුකර වනාන්තර පද්ධතින් අතරින් සියයට 34ක් විතර ස්වාභාවික වනාන්තර ගණයේ කඳුකර වනාන්තර කියලා හඳුනාගෙන තිබෙනවා.

ඒ වාගේම වෙරළ තීරයේ වෙරළ ඛාදනයන් නිරීක්ෂණය වෙලා තිබෙනවා, විශේෂයෙන්ම පේදුරුතුඩුව, වලිකාමම් උතුර, කල්මුණේ නින්දවූර් සහ කින්නියා කියන ප්‍රදේශවල. ඊළඟට, මුතුපන්තිය සහ ආරච්චිකට්ටුව කියන ප්‍රදේශවල කළපු ආශ්‍රිත කඩොලාන පරිසර පද්ධතීන්ට හානි පැමිණිලා තිබෙනවා. ඉක්මනින් වඩාත් සවිස්තර තක්සේරුවක් මේ සම්බන්ධව සිදු කරන්නටත්, හඳුනා ගත් විශේෂ ස්ථාන කිහිපයක් යථාවත් කිරීම සඳහා කඩිනම් ක්‍රියාමාර්ග ගන්නත් මේ වාර්තාවෙන් නිර්දේශ කරලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මම මේ අවස්ථාවේ එම වාර්තාව **සභාගත*** කරනවා.

මෙම විවාදයේදී කරුණු දක්වපු එක් මන්ත්‍රීවරයෙක් මහනුවර දිස්ත්‍රික්කය සහ කෑගල්ල දිස්ත්‍රික්කය මායිමේ පිහිටා තිබෙන අම්බුලුවාව තුළ සිදු වෙලා තිබෙන තත්ත්වය ගැනත් සඳහන් කළා. ඒ තුළ අපි දැක්කා, ඒ සම්බන්ධයෙන් කන්කෙඳිරි ගාන ස්වභාවයක්. අම්බුලුවාව ප්‍රදේශය ගත්තොත්, විශේෂයෙන්ම ආපදාවට කලින් සිටම එම ප්‍රදේශය භූ විද්‍යාත්මකව සංවේදී ප්‍රදේශයක්. මේ ආපදාව තුළදී ඒ ප්‍රදේශය නාය යෑමට ලක් වුණා. ඒ වාගේම එයතවමත් අවදානම් තත්ත්වයක තිබෙන ප්‍රදේශයක්. ආපදාවට ලක් වුණු මෙවැනි තැන්වල, නාය ගිය තැන්වල NBRO වාර්තාවක් - NBRO report එකක් - නැතිව යළි ඉදිකිරීම් කරන එක අපි දැන් නවත්වා තිබෙන්නේ. නමුත්, නිර්දේශ නොමැතිව පසුගිය දවස්වල මේ ප්‍රදේශයේ කේබල් කාර් ව්‍යාපෘතියට අදාළ ගොඩනැඟීම් සිදු කරනවා කියලා අපට වාර්තා වුණා. එම නිසා පරිසර අමාත්‍යාංශය විධියට අපි මධ්‍යම පරිසර අධිකාරියට දැන්වූවා, එවැනි ඉදිකිරීම් සිදු වනවා නම් විධිමත් පරීක්ෂණයකින් අනුමත කරන තුරු ඒ ඉදිකිරීම් වහාම තාවකාලිකව නවත්වන්න කියලා. දැන් ඒ සම්බන්ධයෙන් කලබල වෙලා තිබෙනවා. මම කැමැතියි, අම්බුලුවාව කේබල් කාර් ව්‍යාපෘතිය පිළිබඳව සහ අම්බුලුවාවට අදාළ විස්තර ටිකක් මේ සභාවට ඉදිරිපත් කරන්න. ඒ විස්තර ඇතුළත් ලේඛන මේ අවස්ථාවේදී මම **සභාගත*** කරනවා.

---

**** පුස්තකාලයේ තබා ඇත.***

** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*

* *Placed in the Library.*

අම්බුලුවාව සහ එම කේබල් කාර් ව්‍යාපෘතියේ නෛතික තත්ත්වය සම්බන්ධයෙන් විගණකාධිපතිතුමා ලබා දුන් නිරීක්ෂණ ඇතුළත් ලේඛනයක් තිබෙනවා. මා එහි සඳහන් කරුණු කිහිපයක් කියන්නම්.

"මෙම අරමුදලේ 2024 වසරට අදාළව විගණකාධිපති දෙපාර්තමේන්තු වාර්තාවේ මතභේදයට තුඩු දෙන ගනුදෙනු යටතේ මෙසේ සඳහන් කර තිබේ.

'2023 ජුනි 10 දින පවත්වන ලද භාරකාර මණ්ඩල රැස්වීමේදී රුපියල් බිලියන 1.2ක ඇස්තමේන්තුවක් අනුව කේබල් කාර් ව්‍යාපෘතියක් කිරීමටත්, එය ඉදිකර පවත්වාගෙන යාමට වෙනම සමාගමකට බදු දීමටත්, ඇස්තමේන්තු මුදලින් සියයට 16ක් භාරය විසින් දැරීමටත් තීරණය කර තිබූ අතර, ප්‍රසම්පාදන කැඳවීමකින් තොරව, භාරකාර මණ්ඩල රැස්වීම පවත්වා දින 06කට පසු, එනම් 2023 ජුනි 16 දින ලියාපදිංචි කළ සමාගමක් සමඟ ව්‍යාපෘතිය ඉටු කිරීමට ගිවිසුම්ගත වී තිබුණි. එම ව්‍යාපෘතිය සඳහා සමාලෝචිත වර්ෂය තුළදී වවුචර් 19ක් මඟින් එකතුව රුපියල් මිලියන 93.15ක් වැය කර තිබුණු අතර, එය කුමන කාර්යයකටද යන්න සනාථ කර ගැනීමට ගෙවීම් වවුචරය සමඟ උපලේඛන විගණනයට ඉදිරිපත් නොවීය. කේබල් කාර් ව්‍යාපෘතියේ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සඳහා රුපියල් මිලයන 250.3ක ඇස්තමේන්තුවක් පිළියෙළ කර එයින් සියයට 37ක මුදලක් මේ වන විට භාරයෙන් දරා තිබුණි.' "

විගණකාධිපතිවරයාගේ නිර්දේශය වන්නේ, මෙම ව්‍යාපෘතිය සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් පවත්වා අවිධිමත් පරිදි කටයුතු කළ පාර්ශ්ව වෙත පියවර ගත යුතුය යන්නයි.

එම නිසා සැක සහිත, අවිධිමත් ගනුදෙනු සහිත අවිධිමත් ව්‍යාපෘතියක් හැටියට තමයි මෙම ව්‍යාපෘතිය ගැන සඳහන් වන්නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. අම්බුලුවාව භාරකාර මණ්ඩලය ගත්තොත්, ඒ භාරකාර මණ්ඩලයේ සාමාජිකයින් හත්දෙනෙක් ඉන්නවා. ඒ හත්දෙනාගේ නම් මෙන්න මෙහෙමයි තිබෙන්නේ.

1. දිසානායක මුදියන්සේලාගේ අනුරාධ ලංකා ප්‍රදීප් ජයරත්න (සභාපති)
2. සමරවික්‍රම මුදියන්සේලාගේ ඉන්දික ප්‍රසාද්
3. ගොඩමුන්න වෙදගෙදර චන්ද්‍රරත්න
4. සිවන් ඥාණසේකරන්
5. මීවතුරේ වජිරඥාන හිමි
6. එන්. අසාත් සාලි
7. ජේ.එම්. සේනානායක බණ්ඩාර

අම්බුලුවාව භාරකාර මණ්ඩලය විසින් කේබල් කාර් ව්‍යාපෘතිය පිරිනැමූ ඇම්බර් ඇඩ්වෙන්චර් සමාගමේ ආරම්භක අධ්‍යක්ෂ මණ්ඩලය ලියාපදිංචි වුණේ 2023 ජූනි 16වැනි දා. එම අධ්‍යක්ෂ මණ්ඩලය මෙසේයි.

1. හුආං යුපින්
2. සමරසිංහ හේරත් බන්දුල කරුණාරත්න (අම්බුලුවාව භාරකාර මණ්ඩලයේ සභාපති අනුරාධ ජයරත්න මහතාගේ බිරිඳගේ පියා)
3. ජයසේකර මුදියන්සේලාගේ සේනානායක බණ්ඩාර (අම්බුලුවාව භාරකාර මණ්ඩලයේ සාමාජික)
4. සුබසිංහ මුදියන්සේලාගේ සුරේෂ් දීපාල් සුබසිංහ (අම්බුලුවාව භාරකාර මණ්ඩලයේ සභාපති අනුරාධ ජයරත්න මහතාගේ සහෝදරියගේ සැමියා)

අම්බුලුවාව භාරකාර මණ්ඩලය විසින් කේබල් කාර් ව්‍යාපෘතිය පිරිනැමූ ඇම්බර් ඇඩ්වෙන්චර් සමාගමේ කොටස් හිමියන්ගේ ලැයිස්තුවත් මම ඉදිරිපත් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි.

1. හුඅං යුපිං - කොටස් 36

   මේ ව්‍යාපෘතිය චීන ව්‍යාපෘතියක් හැටියට සඳහන් කළාට මේ පුද්ගලයා විතරයි චීන ජාතිකයෙකුට ඉන්නේ. එම නිසා ඒ සම්බන්ධයෙනුත් සැක පහළ වනවා.

2. ජයසේකර මුදියන්සේලාගේ සේනානායක බණ්ඩාර - කොටස් 14

   ඔහු අම්බුලුවාව භාරකාර මණ්ඩලයේ සාමාජිකයෙක්.

3. ආර්ට් ඩෙකරේෂන් ඉන්ටර්නැෂනල් පෞද්ගලික සමාගම - කොටස් 16

4. ට්‍රැන්කොලිටි එස්ටේට් පෞද්ගලික සමාගම - කොටස් 34

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අම්බුලුවාව කේබල් කාර් ව්‍යාපෘතිය, අම්බුලුවාව භාරකාර මණ්ඩලය සහ මේ ක්‍රියාවලිය පිළිබඳවත් මැදිහත් වෙන්න අපි තීරණය කරලා තිබෙනවා. විශේෂයෙන්ම පරිසර අමාත්‍යාංශය විධියට අපි පෙබරවාරි 4වැනි දා ඒ ප්‍රදේශය නිරීක්ෂණය කරලා තාවකාලිකව ඉදිකිරීම් නවත්වා තිබෙන ගොඩනැඟිලි යළි ඉදිකිරීම සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් කරන්න තීරණය කරලා තිබෙනවා. ඒ අනුව අපට පුළුවන්, මේ සම්බන්ධයෙන් වාර්තාවක් ඉදිරිපත් කරන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, පරිසර අමාත්‍යාංශය විධියට අපි මේ ආපදාව කළමනාකරණය කිරීමේදී විශේෂයෙන් සැලකිල්ලක් දක්වපු කරුණක් තිබෙනවා. විශේෂයෙන්ම මේ කාල වකවානුව සංචාරකයෝ අපේ රටට එන කාල වකවානුවක්. මේ සිද්ධිය නිසා සංචාරක පැමිණීම අඩු කර ගැනීම වෙනුවට ඔවුන්ට අවශ්‍ය කරන පහසුකම් සැලසීම ගැන තමයි අපි වැඩිපුර කල්පනා කළේ. ඒ නිසා අපි ඉතා ඉක්මනින්ම පරිසර අමාත්‍යාංශය යටතේ තිබෙන සංචාරක කර්මාන්තයට වැදගත් වන ආයතන විවෘත කරන්න කටයුතු කළා.

පරිසර අමාත්‍යාංශය යටතේ තිබෙන ජාතික උද්‍යාන, ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවට අයත් ආයතන, ඒ වාගේම ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවට අයත් ආයතන බොහොමයක් ආපදාවට ලක් වුවත්, අපි ඉතාම කෙටි කාලයක් තුළ එම ආයතන සංචාරකයින් සඳහා විවෘත කරන්න සමත් වුණා. ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවේ දෙහිවල, පින්නවල සහ රිදියගම යන ස්ථානත්, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව යටතේ තිබෙන නකල්ස් හැර ඉතිරි සංචාරක ගමනාන්තත් අපි දෙසැම්බර් 1වැනි දා වනකොට සංචාරකයින් සඳහා විවෘත කරන්න සමත් වුණා. දෙසැම්බර් 3වැනි දා වනකොට කුමන, හෝර්ටන් තැන්න, මින්නේරිය, විල්පත්තු සහ යාල යන ජාතික වනෝද්‍යානවල සංචාරක බංගලා සංචාරකයින් වෙනුවෙන් විවෘත කරන්න අපි සමත් වුණා. ඒ වාගේම ඔබතුමන්ලා දන්නවා, මේ ආපදා තත්ත්වය නිසා පේරාදෙණිය උද්භිද උද්‍යානයටත් විශාල හානියක් සිදු වුණු බව. නමුත්, අපි දෙසැම්බර් 6වැනි දා වනකොට පේරාදෙණිය උද්භිද උද්‍යානය සංචාරකයින් සඳහා විවෘත කරන්න සමත් වුණා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට වෙන් වූ කාලය අවසන්, ගරු අමාත්‍යතුමනි.

**ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි මහතා**
(மாண்புமிகு (வைத்தியர்) தம்மிக பட்டபெந்தி)
(The Hon. (Dr.) Dammika Patabendi)
මට තව විනාඩියක කාලයක් ලබා දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි.

දෙසැම්බර් 10වැනි දා වනකොට අපි ලංකාවේ වෙරළ තීරයේ පිරිසිදු කිරීමේ කටයුතු ආරම්භ කළා. අපි හඳුනාගෙන තිබුණා, වෙරළ තීරයේ කිලෝමීටර 140.3ක ප්‍රමාණයකට හානි සිදුවෙලා තිබෙනවා, පිරිසිදු කටයුතු කරන්න සිදු වනවා කියලා. ඒ සඳහා මිනිස් පැය 5,280ක් අවශ්‍යයි කියලා අපි ගණනය කළා. එම නිසා අපි වෙරළ පිරිසිදු කිරීමේ කටයුතු දෙසැම්බර් 10වැනි දා ආරම්භ කරලා 19වැනි දා දක්වා සිදු කළා. හග්ගල උද්භිද උද්‍යානයේ කොටසක් දැනටත් වහලා තිබෙන්නේ. නමුත් එහි සංචාරකයින් සඳහා විවෘත කළ හැකි කොටස දෙසැම්බර් 12වැනි දා වනකොට විවෘත කිරීමට අපි සමත් වුණා. එම නිසා සභාව කල් තබන අවස්ථාවේ යෝජනාවේදී මේ කරුණ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම ඉතාම වැරදි සහගතයි. අපි රටක් හැටියට මේ රජය යටතේ තිබෙන සියලු අමාත්‍යාංශ හරහා, සියලු කාර්යභාරයන් කරමින් ඉතාම කෙටි කාලයක් තුළ විශාල මැදිහත් වීමක් කර තිබෙන බව ප්‍රකාශ කරමින් මම නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු බී. ආරියවංශ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 3.36]

**ගරු බී. ආරියවංශ මහතා**
(மாண்புமிகு பி. ஆரியவங்ஷ)
(The Hon. B. Ariyawansha)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, "දිට්වා" සුළි කුණාටුව නිසා මේ රටේ සිදු වුණු ව්‍යසනය පිළිබඳව පක්ෂ, විපක්ෂ මන්ත්‍රීතුමන්ලා සහ මන්ත්‍රීතුමියලා අද දින පාර්ලිමේන්තුවේදී අදහස් ප්‍රකාශ කළා. අපි දන්නවා, පසුගිය නොවැම්බර් මාසය තුළ අපේ රට තුළ විශාල හානි සිදු වුණු බව. ජීවිත 700කට ආසන්න ප්‍රමාණයක් සහ දේපළ හානිත් සිදු වුණා. කුඹුරු අක්කර 530,000ක් පමණ විනාශ වුණා වාගේම, පෞද්ගලික දේපළ, කඩ සාප්පු, ව්‍යාපාර විනාශ වෙලා ගියා. මම රත්නපුර දිස්ත්‍රික්කය නියෝජනය කරන මන්ත්‍රීවරයෙකු නිසා මම දන්නවා, ඒ අවස්ථාවේ රත්නපුර දිස්ත්‍රික්කය තුළත් පවුල් 19,042ක්, ඒ වාගේම ග්‍රාම නිලධාරි වසම් 489ක 74,088දෙනෙක් ආපදාවට ලක්වුණු බව. ඒ අය සිටි ප්‍රදේශ මධ්‍ය අවදානම් සහ අධි අවදානම් ප්‍රදේශ ලෙස හඳුන්වනවා. ඒ වාගේම සමහර ස්ථානවල කඳු නාය ගියා. උදාහරණයක් විධියට ගත්තොත්, කොලොන්න ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පුපුලකැටිය කියන ග්‍රාම නිලධාරි වසමේ කැලිකන්ද කියන ගමේ නාය යෑමක් සිදු වුණා. නමුත්, ඒ නාය යෑම නිසා ජීවිත හානි සිදු වුණේ නැහැ. නිවාස කිහිපයක් කැඩුණා. මේ නිසා පවුල් 16ක් පමණ අවතැන් කඳවුරකයි හිටියේ. මේ වනකොට ඒ අයගෙන් පවුල් තුනක් පමණයි අධි අවදානම් කලාපයට අයත් වන බව සඳහන් කර තිබෙන්නේ. ඉතිරි පවුල් 13ම අධි අවදානම් කලාපයට අයත් වන්නේ නැහැ. ඒ අයට කියලා තිබෙනවා, මධ්‍ය අවදානම් කලාපයක් නිසා වැස්සක් ආවොත්, එහෙම නැත්නම් හදිසි තත්ත්වයක් ඇති වුණොත් එතැනින් අයින් වෙන්න කියලා. අනික් පවුල් තුනට වාගේම ඒ අයටත් යම් ක්‍රමවේදයක් සකස් කරන්න ඕනෑ. මොකද, ඔවුනුත් ඉන්නේ අධි අවදානම් කලාපයක. නමුත් NBRO එකෙන් ඇවිල්ලා පරීක්ෂණ කරලා පවුල් තුනයි තෝරාගෙන තිබෙන්නේ.

ඒ වුණාට ඒ විශාල කන්ද නාය ගියොත් අනෙක් පවුල්වල නිවාස සියල්ලත් යට වෙනවා. අධිඅවදානම් කියා නම් කර තිබෙන පවුල් තුන පදිංචි වෙලා ඉන්න තැනට විතරක් ඇවිත් ඒ විනාශය නතර වෙන්නේ නැහැ. එහෙම වුණොත් ඒ නිවාස ඔක්කොම කඩාගෙන යනවා. ඒ නිසා මේ කාරණය පිළිබඳව විශේෂ අවධානය යොමු කරන්න කියලා මම ඉල්ලා සිටිනවා.

[ගරු බී. ආරියවංශ මහතා]

ඒ වාගේම ඔබතුමන්ලා සඳහන් කළා, මේ ආපදාව නිසා නිවසක කීට් එකක් ගියත් රුපියල් ලක්ෂ 10ක් දෙනවා කියලා. උදාහරණයක් විධියට ගත්තොත්, පුපුලකැටිය ග්‍රාම නිලධාරි වසමේ, මකුළුතොට කියන ප්‍රදේශයේ පදිංචි විජේරත්න මහත්මයාගේ නිවසින් භාගයක්ම මේ ආපදා තත්ත්වය හේතුවෙන් කැඩිලා ගියා. මේ වෙනකොට රුපියල් 25,000 විතරයි ඔහුට ලබා දීලා තිබෙන්නේ. මම ඒ අයගෙන් මේ පිළිබඳව ඇහුවා. නමුත්, තවම කිසිම දෙයක් ඒ අයට ලැබිලා නැහැ.

ඒ වාගේම ගොඩකවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මාදම්පේ වත්තේ පවුල් 20කට වැඩි ප්‍රමාණයක් මේ අවදානම් තත්ත්වය නිසා ඒ ස්ථානවලින් අයින් කරලා තිබුණා. මේ වෙනකොට එතැනින් සුළු පිරිසක් තමයි අධිඅවදානම් කියලා තෝරා ගෙන තිබෙන්නේ. මධ්‍ය අවදානම් කියලා අනෙක් අයව නැවත ඒ ස්ථානවලම මේ වනකොට පදිංචි කරවලා තිබෙනවා. රුපියල් 25,000 දීමනාව පමණයි ඒ අයටත් ලබා දීලා තිබෙන්නේ.

ඊළඟට, ඕපනායක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පිහිටි ඕපාත ප්‍රදේශයේ අධිඅවදානම් කියලා පවුල් 15ක් නම් කරලා තිබෙනවා. අපි ඒ ගම්වලට ගියා. ඒ ප්‍රදේශයේ ඊට වඩා පවුල් ප්‍රමාණයක් ආපදාවට පත් වෙලා ඉන්නවා. එක අධිඅවදානම් ප්‍රදේශයක පවුල් 15ක්, 20ක් ඉන්නවා. හැබැයි, ඒ පවුල් අතුරින් පවුල් දෙක තුනක් තමයි අධිඅවදානම් කියලා හඳුනාගෙන තිබෙන්නේ. එහෙම පවුල් දෙක තුනක් පමණක් අධිඅවදානම් කියලා හඳුනා ගත්තාට හදිසි ආපදා අවස්ථාවකදී කඳු නාය යෑමට ලක් වුණොත් සියලු දෙනාම හානියට පත් වෙනවා. ඒ නිසා මේ සඳහා විශේෂ වැඩ පිළිවෙළක් සකස් කරලා, ඒ අයට අවශ්‍ය කරන ඉඩම් ඒ ප්‍රදේශයේ තිබෙන වතුවලින් හෝ පෞද්ගලිකව ලබා ගන්න අවස්ථාවක් උදා කරලා දුන්නොත් එය ඉතාම වැදගත් වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, විපක්ෂය වශයෙන් මම සඳහන් කරන්න ඕනෑ විශේෂ කාරණයක් තිබෙනවා. මේ ආපදා තත්ත්වය සිදු වුණු අවස්ථාවේදී විපක්ෂ නායකතුමා ඇතුළු සියලු දෙනාම ඒ වැඩේට බැහැලා ඒ වෙනුවෙන් උදවු කළා. ඒ වාගේම අපි සියලු දෙනාට උපදෙස් ලබා දුන්නා. මේ වෙනකොට අපේ ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමන්ලා 1,700කට වැඩි ප්‍රමාණයක් ඉන්නවා. මේ අයත් ගම්වලට ගිහිල්ලා තමන්ට පුළුවන් ආකාරයෙන් ඒ අයට උදවු උපකාර කළා. රජයක් විධියට, ආණ්ඩුවක් විධියට ඒ ආපදා අවස්ථාවේදී විශාල වශයෙන් උදවු කළා වාගේම විපක්ෂයක් වශයෙන් අපිත් කරන්න පුළුවන් උදවු ටික ඉටු කළා. විපක්ෂ නායකතුමා දීර්ඝ කාලයක් තිස්සේ කරගෙන ආපු "හුස්ම" කියන වැඩසටහන තුළින් රෝහල් 15කට මේ වනකොට අවශ්‍ය කරන වෛද්‍ය උපකරණ ලබා දීලා තිබෙනවා. ඒ අනුව, පසුගිය සතියේ කොලොන්න මූලික රෝහලටත් රුපියල් ලක්ෂ 28ක් වටිනා වෛද්‍ය උපකරණ ලබා දුන්නා. එතුමා විපක්ෂ නායකවරයා වශයෙන් විශාල වැඩ කොටසක් මේ රටේ ජනතාව වෙනුවෙන් ඉටු කරනවා. ආණ්ඩු පක්ෂයේ අය කියනවා, "විපක්ෂය මොකුත් කළේ නැහැ, ඒ අය විතරයි කළේ" කියලා. ඒ වුණාට පාර්ලිමේන්තුවේ සිටින අපේ මන්ත්‍රීවරු වාගේම අපේ ආසන සංවිධායකවරු, පළාත් සභාවල හිටපු මන්ත්‍රීවරු, ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරු ඇතුළු සියලු දෙනාම මේ "දිට්වා" සුළි කුණාටුවෙන් ආපදාවට පත් වුණු අය වෙනුවෙන් වැඩ කළා. ආපදාවට පත් වෙලා තිබුණු ඒ ගම්වලට ගියා. ඒ අයට ආහාර ගෙනිහිල්ලා දුන්නා. කෑම උයලා දුන්නා. වියළි ආහාර ගෙනිහිල්ලා බෙදුවා. පුළුවන් ආකාරයට ඒ අයට උදවු උපකාර කළා. "දිට්වා" සුළි කුණාටුව ඇති වුණු අවස්ථාවේදී පමණක් නොවෙයි, ඊට කලින් ආපදා සිදු වුණු සෑම අවස්ථාවකදීමත් විපක්ෂයේ ඉන්න සියලුම මන්ත්‍රීතුමන්ලා ඒ අය වෙනුවෙන් උදවු උපකාර කරලා තිබෙනවා.

ඔබතුමන්ලා අද ආණ්ඩුවේ ඉන්නවා. නමුත්, ඔබතුමන්ලා එදා විපක්ෂයේ සිටියදී කොහේවත් ගිහිල්ලා බඩු බෙදනවා අපි දැකලා නැහැ. එහෙම නැත්නම් ඔබතුමන්ලා විපක්ෂයේ සිටි කාලයේ ගම්වලට ගිහිල්ලා ඒ අයට උදවු උපකාර කරනවා අපි දැකලා නැහැ. හැබැයි, අද ඔබතුමන්ලා ආණ්ඩු පක්ෂයේ ඉඳගෙන විපක්ෂයට දොස් කියන එක තමයි කරන්නේ.

"දිට්වා" සුළි කුණාටුව නිසා මේ රටේ විශාල ව්‍යසනයක් සිදු වුණා. ඉන් ආපදාවට ලක් වූ සියලු දෙනාට සාධාරණය ඉටු කරන්න වැඩ පිළිවෙළක් සකස් කරන්න ඕනෑ. මොකද, නැවත මෙවැනි වැස්සක් ආවොත්, මෙවැනි සුළි කුණාටු තත්ත්වයක් ඇති වුණොත් එයින් විපතට පත් වන පවුල් නැවත රැඳවුම් මධ්‍යස්ථානවලට යවලා ඒ අයට උදවු උපකාර කරන තත්ත්වයට පත් නොකර මේ ලැබෙන මුදල්වලින් ඉදිරි කාලය තුළ ඒ අයට අවශ්‍ය නිවාස සකස් කරන්න, ජීවන රටාව පවත්වාගෙන යන්න පුළුවන් තත්ත්වයෙන් තමන්ගේ ව්‍යාපාර කටයුතු දියුණු කරගන්න, එහෙම නැත්නම් රැකී රක්ෂාවලට යන්න පුළුවන් වන තත්ත්වයට ඔවුන් පත් කිරීමට කටයුතු කරන්න කියලා අපි විපක්ෂය වශයෙන් ඔබතුමන්ලාගෙන් මේ අවස්ථාවේදී ඉල්ලා සිටිනවා.

ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු (වෛද්‍ය) සෙල්ලතම්බි තිලකනාදන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි නවයක කාලයක් ලැබෙනවා.

[பி.ப. 3.43]

**ගරු (වෛද්‍ය) සෙල්ලතම්බි තිලකනාදන් මහතා**
(மாண்புமிகு (வைத்தியர்) செல்லத்தம்பி திலகநாதன்)
(The Hon. (Dr.) Sellaththamby Thilaganathan)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர்அவர்களே, கடந்த ஆண்டின் இறுதிப் பகுதியில் 'தித்வா' புயலினால் இலங்கை முழுவதுமே கடும் பாதிப்புக்குள்ளானது. இருந்தபோதும் ஏற்பட்ட அனர்த்தத்திலிருந்து மீள்வதற்காக எமது ஜனாதிபதியினுடைய நேரடிக் கண்காணிப்பின்கீழ் மிக விரைவாகவும் பாதிப்புகளை இயன்றளவில் குறைக்கும் வகையிலும் நாம் செயற்பட்டதன் காரணமாக நாடானது அதிலிருந்து விடுபட்டுள்ளது.

உண்மையிலேயே மலையகப் பகுதிகள்தான் இந்த 'தித்வா' புயலினால் பெருமளவு பாதிக்கப்பட்டன. அங்கே எமது உறவுகள் பலர் உயிர் நீத்தனர். அதேபோல், எமது வடக்கு மாகாணத்திலும், குறிப்பிட்டுச் சொன்னால் முல்லைத்தீவு மாவட்டத்திலே கடற்படைச் சகோதரர்கள் ஐவர் கடற்கரைக்கு அண்மையில் மக்களை மீட்கும் பணியில் ஈடுபட்டிருந்தபோது உயிரிழந்தார்கள். அதை நினைக்கும்போது உண்மையிலேயே மனவேதனையாக இருக்கின்றது. தெற்கிலிருந்து வடக்கிலுள்ள மக்களை மீட்பதற்காக வந்து அங்கு அவர்கள் உயிர்நீத்தது மிகவும் துயரச் சம்பவமாகும். அதேபோல வடக்கு மாகாணத்திலே, வன்னிப் பிரதேசத்திலே - வவுனியா, மன்னார், முல்லைத்தீவு போன்ற பகுதிகளிலே - பல்வேறுபட்ட அனர்த்தங்கள் ஏற்பட்டன. அதன்போது அரச அதிகாரிகள், இராணுவத்தினர், கடற்படையினர், விமானப் படையினர் போன்றோர் மிகவும் விரைவாகச் செயற்பட்டு பாதிக்கப்பட்ட மக்களை மீட்டெடுத்தனர். இதற்கு நான் அவர்களுக்கு நன்றிகூறக் கடமைப்பட்டுள்ளேன். அதேபோல, இந்த 'தித்வா' புயலினால் ஏற்பட்ட ஏனைய பாதிப்புகளையும் எமது அரசாங்கம் மிக விரைவில் நீக்கும் என்பதைக் கூறிக்கொள்ள விரும்புகின்றேன்.

உண்மையிலே, வட பகுதியிலே பல்வேறுபட்ட பிரச்சினைகள் பல ஆண்டு காலமாக நீடித்துக் கொண்டிருக்கின்றது. அவ்வாறான பிரச்சினைகளை எமது அரசாங்கம் தற்போது நிவர்த்தி செய்துகொண்டு வருகின்றது. குறிப்பிட்டுச் சொல்வதென்றால், 'தித்வா' புயல்போல் வடக்கிலே கல்வித் துறையிலும் புயலொன்று அடித்துக் கொண்டிருக்கின்றது. உண்மையிலேயே நேற்றைய தினம் இந்தப் பாராளுமன்றத்தில் வடக்கிலிருந்து வந்த பாராளுமன்ற உறுப்பினர் ஒருவர் கூறிய கருத்துகளை நினைத்து நான் மனவேதனையடைகின்றேன். உண்மையிலேயே, கல்வியின் பயன் என்பது ஒழுக்கம்! ஒழுக்கமில்லாக் கல்வியும் விளைச்சலில்லா வயலும் வீண்! அந்த வகையில், வடக்கைப் பிரதிநிதித்துவப்படுத்துபவரால் பயன்படுத்தப்பட்ட அந்தத் தகாத வார்த்தைப் பிரயோகத்திற்குக் கல்வியின் வீழ்ச்சிதான் ஒரு காரணமாக இருக்கின்றது. கடந்த காலத்தில் வடக்கு மாகாணம் கல்வியில் உயர்ந்த நிலையில் காணப்பட்டது. தற்போது இலங்கையின் கல்வி மட்டத்தில் ஒன்பதாவது இடத்தில் - கடைசி மட்டத்தில் - காணப்படுகின்றது. இதற்கெல்லாம் அங்கிருக்கின்ற கல்வி அதிகாரிகள்தான் காரணம் என நான் நினைக்கின்றேன்.

எமது மாண்புமிகு சனாதிபதி அவர்களும், கௌரவ பிரதமர் அவர்களும் வடக்கு மாகாண கல்வி வளர்ச்சிக்குத் தேவையான பல்வேறுபட்ட வசதிகளை - மாணவர்களுக்குத் தேவையான விளையாட்டு மைதானமோ சரி, பாடசாலைக் கட்டிடங்களோ சரி, ஆசிரிய வளங்களோ சரி, எல்லாவற்றையும் - தாராளமாக வழங்கிக் கொண்டிருக்கின்ற வேளையிலே, அந்த வளங்களைச் சமமாகப் பகிர்ந்தளிக்க முடியாத சில அதிகாரிகள் காணப்படுகின்றார்கள். உதாரணத்துக்கு கூறப்போனால், கடந்த வருடம் யூன் மாதம் வன்னிப் பிரதேசத்தில் ஆசிரியர் இடமாற்றம் நடைபெற்றது. அதன்போது, with replacement - பதிலீட்டுடன்தான் ஆசிரியர்கள் விடுவிக்கப்பட்டார்கள். ஆனால், அங்கிருந்து விடுவிக்கப்பட்ட ஆசிரியர்களுக்காகப் பதிலீடு செய்யப்பட்ட ஆசிரியர்களில் 40 சதவீதமானோர் வன்னிப் பிரதேசத்துக்கு வரவில்லை. இதனால் அங்குள்ள மாணவர்கள் பெருமளவில் பாதிப்புக்குள்ளாகி உள்ளனர்.

உண்மையிலேயே, வன்னிப் பிரதேசத்தில் யுத்தத்தினால் தாய், தந்தையை இழந்து, உடைமைகளை இழந்து பாதிக்கப்பட்டிருக்கின்ற அந்தச் சமுதாயத்துக்குத் தேவையான கல்வியை வழங்குவதற்கு வடக்கு மாகாணத்தில் இருக்கின்ற கல்வி அதிகாரிகள் அக்கறை கொள்ளவில்லை; உதாசீனம் செய்கின்றார்கள். நான் பல தடவை மாவட்ட ஒருங்கிணைப்புக் குழுக் கூட்டங்களில் இந்த விடயம் தொடர்பாகக் கேட்டபோது, ஆசியர்களை வழங்குகின்றோம், அனுப்புகின்றோம் என்று பல்வேறுபட்ட நொண்டிச் சாட்டுகளைச் சொல்லி, வன்னிப் பிரதேசத்துக்குப் பொருத்தமில்லாத ஆசிரியர்களை அங்கு நியமித்ததோடு, "நீங்கள் வன்னிப் பிரதேசத்துக்குப் பொருத்தமற்றவர்கள். ஆகவே, வழக்குத் தாக்கல் செய்யுங்கள்!" என்று அவர்களுக்குப் புத்திமதிகூறி, பற்றிக் நிரஞ்சன் என்ற அதிகாரி கபடத்தனமாக நடந்துகொண்டதன் காரணமாக வன்னிப் பிரதேசமானது கல்வியில் பின்தங்கிக் காணப்படுகின்றது. உண்மையிலேயே சரியான பதிலீட்டு ஆசிரியர்களை நியமிக்காதது ஒரு குற்றம். அதனைச் செய்தவர் நிச்சயமாக ஒரு குற்றவாளியாகக் காணப்படுகின்றார். அவ்வாறான குற்றவாளிகளைக் கல்விப் புலத்திலிருந்து அகற்றி, சிறந்த அதிகாரிகளை எதிர்வரும் காலங்களில் நியமித்து, கல்வியினூடாக வடக்குப் பிரதேசத்தை, அதன் பொருளாதாரத்தை அபிவிருத்தி செய்வோம் என்று கூறி, எனது உரையை நிறைவு செய்கின்றேன். நன்றி!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු ගමගෙදර දිසානායක නියෝජ්‍ය අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.50]

**ගරු ගමගෙදර දිසානායක මහතා (බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு கமகெதர திசாநாயக்க - புத்தசாசன, சமய மற்றும் கலாசார அலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. Gamagedara Dissanayake - Deputy Minister of Buddhasasana, Religious and Cultural Affairs)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අද උදෑසන "දිට්වා" සුළි කුණාටුව සම්බන්ධව ඉදිරිපත් වෙච්ච සභාව කල් තබන අවස්ථාවේ යෝජනාවේදී අපි දැකපු විශේෂත්වය තමයි, විපක්ෂය පැත්තෙන් යම් යම් කරුණු කාරණා ඉදිරිපත් කරලා, යම් යම් විවේචන ඉදිරිපත් කරලා ඊළඟ මොහොතේම මෙතැනින් එළියට පැනලා යන එක. හැබැ අර්ථයෙන්ම එතුමන්ලාට මේ වාගේ යෝජනාවක් ගේන්න වුවමනාව තිබුණේ, ව්‍යසන තත්ත්වයෙන් ආපදාවට පත් වෙච්ච ජනතාවට සහන සලසන්න නම් අඩුම තරමින් මේ යෝජනාව ඉදිරිපත් කරපු කෙනාවත් මේ සභාවේ රැඳිලා මේ පිළිබඳව කරුණු කාරණා ටිකක් අවබෝධ කරගන්න වගකීමක් තිබෙනවා කියලා මා හිතනවා.

අපි කවුරුත් දන්නවා, අපේ රටේ සිද්ධ වෙච්ච ඉතාම බරපතළම ව්‍යසනය තමයි, පසුගිය දවස්වල සිද්ධ වෙච්ච ඒ ව්‍යසනය. මීට පෙරාතුව තිබිච්ච ආපදා, ව්‍යසන එක්ක කිසිදු ආකාරයකින් සංසන්දනය කරන්න පුළුවන් ව්‍යසනයක් නොවෙයි ඒ සිද්ධ වුණේ. අපි දැක්කා, ඒ ව්‍යසනය වෙච්ච වෙලාවේ අපේ රටේ රාජ්‍ය සේවය ඉතාම උනන්දුවෙන් තමන්ගේ රාජකාරී සීමාවෙන් ඔබ්බට ගිහිල්ලා මේ කටයුත්තට මැදිහත් වුණ ආකාරය. ඒ වාගේම, අපේ රටේ රාජ්‍ය අංශයේ ආරක්ෂක සේවාවල අය ඉතාම උනන්දුවෙන් මේ කටයුත්තට මැදිහත් වුණා. ඒ වාගේම, ස්වේච්ඡා සංවිධාන විවිධාකාරයෙන් මේ කටයුත්තට දායක වුණා, මේ තත්ත්වයෙන් ගොඩ ඒම සඳහා. හැබැයි ඒ පාර්ශ්ව ඒ විධියට මැදිහත් වෙනකොට කුජීත වෙච්ච මේ විපක්ෂයේ සමහර අය ඒ වෙලාවේ කටයුතු කරපු ආකාරය ඉතාම ලජ්ජාසහගතයි. දැන් රාජ්‍ය යන්ත්‍රණයේ මැදිහත්වීම පිළිබඳව විවේචන ඉදිරිපත් කරන මේ නෝනලා, මහත්වරු ඒ වෙලාවේ හැසිරිච්ච විධිය ලජ්ජාසහගතයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මට මතකයි, ඔය සිදුවීම සිද්ධ වෙලා දවස් කිහිපයක් ගත වුණාට පස්සේ සිකුරාදා දවසක ගරු ජනාධිපතිතුමා පාර්ලිමේන්තුවට ඇවිල්ලා ප්‍රකාශයක් කළා, ආපදාවට පත් වෙච්ච සියලුදෙනා වෙනුවෙන් රුපියල් 25,000ක දීමනාවක් ලබා දෙනවාය කියලා. ඒ ප්‍රකාශය කරන්නේ සිකුරාදා. ඊට පහුවදා සෙනසුරාදා, ඊට පහුවදා ඉරිදා. මේ සමහර නායකයෝ සඳුදා උදේම කඳවුරුවලට ගිහිල්ලා ෆයිල් අරගෙන ලියමින් අහනවා, රුපියල් 25,000 හම්බ වුණාද කියලා. ලජ්ජයි. ඒ තරම් සක්‍රිය වෙච්ච යන්ත්‍රණයක් තිබෙන්නේ කොහොමද? එහෙම ළාමක වෙච්ච, බොළඳ වෙච්ච විපක්ෂයක් අද මේ වාගේ යෝජනාවක් ඉදිරිපත් කිරීම මොන වාගේ අරමුණකින් කළාද කියන එක හිතාගන්න අමාරුයි.

මෙතුමන්ලා බලාගෙන හිටියා, මේ ආපදා තත්ත්වය හමුවේ ආණ්ඩුව බිඳ වැටෙයි කියලා. එතුමන්ලාගේ මනෝ ලෝකයේ තිබුණේ ඒක. මේ ආපදා තත්ත්වය කළමනාකරණය කරගන්න බැරුව ආණ්ඩුව අසීරුතාවට පත් වෙලා, සම්පූර්ණ ක්‍රියාවලිය බිඳ

[ගරු ගමගෙදර දිසානායක මහතා]

වැටීමෙන් පස්සේ අත්වෙන වාසිය පදනම් කරගෙන ඉක්මනින් ආණ්ඩුවක් හදන්න පුළුවන් වෙයි කියලා තමයි එතුමන්ලා කල්පනා කළේ. මොකද, අපිට මතකයි, පසුගිය දෙසැම්බර් මාසය වෙනකොට ජනාධිපතිවරු දිවුරුම් දෙන්නත් මෙතුමන්ලා මීට කලින් සැලසුම් කරලා තිබුණු බව. අවසානයේදී සිද්ධ වෙලා තිබෙන්නේ මොකක්ද? ආණ්ඩුවක් හැටියට අපි මේ ආපදා තත්ත්වය හරියට කළමනාකරණය කරගෙන ඉතාම නිවැරදිව මේ වැඩ පිළිවෙළ ඉදිරියට කරගෙන යනවා. එතුමන්ලාට මේක දරාගන්න බැහැ. දරාගන්න බැරි නිසා තමයි විවිධ මතවාද හදන්නේ, විවිධ වැරදි චිත්‍ර සමාජයට දෙන්න උත්සාහ කරන්නේ.

අද දින මෙම යෝජනාව ඉදිරිපත් කරපු මන්ත්‍රීතුමිය අමු පට්ටපල් බොරු ගණනාවක් කිව්වා. එතුමිය රට සම්බන්ධව අසත්‍ය කිව්වා වාගේම දිස්ත්‍රික්කය ගැනත් අසත්‍ය කිව්වා. මාතලේ දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 11න්, 10ක්ම මෙම ආපදාවෙන් බරපතළ විධියට හානියට පත් වුණා. එතුමිය නම් කරලාම කිව්වා, රත්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අලකොලම්බ ප්‍රදේශයේ වුණු සිද්ධියක් ගැන. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඔය කියන ස්ථානය නාය ගිහිල්ලා 5දෙනෙක් මිය ගියා. ඒ සිරුරු ටික මෙහා පැත්තට ගන්න වග කිවයුතු කෙනෙකුගේ මැදිහත්වීම නැතුව තිබුණේ. ඒ වෙලාවේ ජීවිත අවදානමත් නොතකා ඒ නාය ගිය ස්ථානයෙන් එගොඩ වෙලා අදාළ ස්ථානයට දේශපාලනඥයෙක් හැටියට මුලින්ම ගියේ මමයි. එසේ ගිහින් අදාළ නිලධාරින්ට උපදෙස් දීලා ඒ සිරුරු භූමදානය කිරීමට අවශ්‍ය කරන කටයුතු අපි සූදානම් කළා. ඒ සියල්ල සිද්ධ වුණාට පසුව මේ සමහරු ගිහිල්ලා ඒ නාය ගිය ස්ථානයේ ෆොටෝ ගහලා ඊළඟ තත්පරයේ Facebook එකේ දැම්මා, මැදිහත්වීමක් ගැන සඳහන් කරමින්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේවාට කියන්න තිබෙන්නේ ලජ්ජයි කියන එක විතරයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, රටේම ජනතාව දන්නවා, ලංකා ඉතිහාසයේ වැඩිම වර්ෂාපතනයක් වාර්තා වුණේ අඹන්ගඟ කෝරළේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ගම්මඩුවෙන් බව. එයින් ඒ ප්‍රදේශයට විශාල හානියක් සිද්ධ වුණා. කළමනාකාරීත්වයක් නැහැ, වැඩ පිළිවෙළක් නැහැ කියලා දැන් චෝදනා කරන්නේ, ඒ අඹන්ගඟ කෝරළේ ප්‍රාදේශීය සභාවේ බලය හොබවන අයයි. අඹන්ගඟ කෝරළේ ප්‍රාදේශීය සභාවේ බලය තිබෙන්නේ සජබයට. ඉතින් ඔවුන් සතුව වැඩ පිළිවෙළක් තිබෙනවා නම්, සැලැස්මක් තිබෙනවා නම්, කාර්යක්ෂමතාවක් තිබෙනවා නම්, අත්දැකීමක් තිබෙනවා නම් මේ ව්‍යසනය සිදු වුණු අවස්ථාවේ එම කටයුතු කළමනාකරණයට ප්‍රාදේශීය සභාව විධියට මැදිහත් වීමෙන් ඒ දේවල් පෙන්වන්න තිබුණා නේ. හැබැයි, මොකක්ද වුණේ? ඒ අවස්ථාවේ අපේ දිස්ත්‍රික්කයට අයත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 11හි ඉතාම අක්‍රිය තත්ත්වයේ පැවතුණු එකක් තමයි අඹන්ගඟ කෝරළේ ප්‍රාදේශීය සභාව. ආණ්ඩුවක් හැටියට අපි එතැනට මැදිහත් වුණා. අදටත් එම ප්‍රාදේශීය සභාවට අයත් බල ප්‍රදේශයේ කටයුතුවලට මැදිහත් වෙමින්, ඒ අවශ්‍ය දායකත්වය ලබා දෙන්නේ ආණ්ඩුවක් හැටියට අපියි. මම හිතන විධියට, ඒ ප්‍රාදේශීය සභාව නියෝජනය කරන සභාපතිතුමාත් ඒකට සාක්ෂි දරනවා ඇති. නමුත් මේ කට්ටිය කල්පනා කළේ, එම ව්‍යසනය පාවිච්චි කරලා ආණ්ඩුව වට්ටන්නේ කොහොමද කියන එක ගැන විතරයි.

දැන් සිහින ලෝකයේ ජනාධිපතිවරයෙක් ඉන්නවා නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. ඒ සිහින ලෝකයේ ජනාධිපතිවරයා 2029දී ජනාධිපති වෙන්න සූට් මහගෙනයි ඉන්නේ. හැබැයි, මෙතැනට ඇවිල්ලා පට්ටපල් කෙබර ඇද බානවා. එම ව්‍යසනය සිදු වෙලා මාස 3ක් ගත වෙලාත් ඒ අවතැන් වුණු, එහෙම නැත්නම් ආපදාවට ලක් වුණු මිනිස්සුන්ට ගෙවල් ටික හදා දෙන්න අපි ආණ්ඩුවක් විධියට අසමත් වුණා ලු. කවුද, මේ කියන්නේ? 2029දී ජනාධිපති වෙන්න සූට් මහගෙන ඉන්නා සිහින ජනපති. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, එතුමන්ලාගේ පාලන කාලයේ -2012 වර්ෂයේ- අපේ දිස්ත්‍රික්කයට ගංවතුරක් ආවා. ඒ අවස්ථාවේ අපේ එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක පවුල් 16ක් විතර ආපදාවට ලක් වුණා. ඒ වෙලාවේ ජාතික ගොඩනැඟිලි පර්යේෂණ ආයතනයෙන් ස්ථාන පරීක්ෂණයක් සිදුකර කිව්වා, තවදුරටත් එම ස්ථානයේ රැඳී සිටීම අනතුරුදායකයි, ඒ නිසා එම පිරිස එතැනින් ඉවත් කිරීම තමයි කළ යුත්තේ කියලා. මොකක්ද, වුණේ? මම මේ කියන්නේ 2012 වසරේ වුණු දෙයක් ගැන. 2012 වසරේ දුන් ඒ තීන්දුව ක්‍රියාත්මක කරන්න අද විපක්ෂයේ සිටින මෙතුමන්ලාට බැරි වුණා, පසුගිය කාලයේ ආණ්ඩු කරලාත්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, 2012 ඉඳලා අද වනවිට අවුරුදු කීයක් ගත වෙලාද? එදා පවුල් 16ක් තමයි ආපදාවට ලක් වුණේ. නමුත් පසුගිය දිනක ඇති වුණු ව්‍යසනය එහෙම තත්ත්වයක් නොවෙයි. රටේම ඇති වුණු බරපතළ තත්ත්වයක් මේක. මෙම ව්‍යසනයෙන් දහස් ගණනකට නිවාස හදා දෙන්න මේ කෙටි කාලය ගත වුණු එක තමයි මේ අයට දැන් ලොකුම අමාරුව වෙලා තිබෙන්නේ. නමුත් වත්මන් විපක්ෂයේ කෙරුවාව ගැන, මේ වාගේ ව්‍යසන සිදු වුණු අවස්ථාවලදී ඒ කට්ටියගේ පාලන කාලය තුළ කටයුතු කළ විධිය ගැන මේ රටේ ජනතාවට අදහසක් තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, "දිට්වා" ව්‍යසනයෙන් ආපදාවට ලක් වුණු ජනතාවගේ වුවමනා ඉටු කරන්න අපි මැදිහත් වෙනවා. ඒ වාගේම විශේෂයෙන්ම අපි මේ වෙලාවේදී සිහිපත් කරන්න ඕනෑ, එම ව්‍යසනයට හසු වුණු, ආපදාවට පත් වෙච්ච අපේ රටේ වෙහෙර විහාරස්ථාන ඇතුළු ආගමික සිද්ධස්ථාන විශාල ප්‍රමාණයක් අමාත්‍යාංශයක් හැටියට අපි හඳුනා ගෙන තිබෙන බව.

අමාත්‍යාංශය හැටියට අපි ආපදාවට ලක් වෙච්ච ආගමික සිද්ධස්ථාන - පන්සල්, පල්ලි, කෝවිල්, දේවාල - 1,300කට වැඩි ප්‍රමාණයක් හඳුනාගෙන තිබෙනවා. ඒ වෙනුවෙන් අපි වැඩ පිළිවෙළක් සකස් කරලා, ආපදාවට ලක් වෙච්ච එම වෙහෙර විහාරස්ථාන ඉතාම ඉක්මනින් නැවත ගොඩනඟන්න අවශ්‍ය කරන වැඩ කටයුතු සූදානම් කර තිබෙනවා. මේ වන විටත් අපි ඒ වෙනුවෙන් ක්‍රියාමාර්ග ගණනාවක් ගෙන තිබෙනවා. 1,300කටත් වඩා වැඩි ඒ ආගමික සිද්ධස්ථාන අතර පන්සල් තිබෙනවා, කෝවිල් තිබෙනවා, දේවාල තිබෙනවා, පල්ලි තිබෙනවා. ඒ සියල්ල තිබිච්ච තත්ත්වයට නැවත ගෙන ඒම සඳහා වන වැඩ පිළිවෙළ අපි සකස් කර තිබෙනවා. පූර්ණ වශයෙන් හානියට පත් වෙච්ච පන්සල් ඇතුළු ආගමික සිද්ධස්ථාන සංඛ්‍යාව, අර්ධ වශයෙන් හානියට පත් වෙච්ච සිද්ධස්ථාන සංඛ්‍යාව හරියට හඳුනාගෙන අපි ඒ වැඩ පිළිවෙළ ආරම්භ කරනවා. ගරු ජනාධිපතිතුමාගේ මැදිහත් වීමෙන් ලබන 27වන දා, ඒ විනාශයට පත් වෙච්ච ආගමික සිද්ධස්ථාන නැවත ගොඩනැඟීමට අදාළ කරන වැඩ පිළිවෙළ ආරම්භ කරන්න අපි සියලු කටයුතු සූදානම් කර තිබෙනවා. අපි ඒ වෙනුවෙන් උපරිමයෙන් මැදිහත් වෙනවා. ඒ වාගේම විපතට පත් වෙච්ච සියලු ජනතාව වෙනුවෙන් කෙටි කාලයක් තුළ අපි අපේ මැදිහත් වීම ලබා දෙනවා. එතකොට මේ විපක්ෂය තව තවත් ආපදාවට ලක් වෙනවා කියන කාරණය මතක් කරමින් මම නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු රෝහණ බණ්ඩාර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.00]

**ගරු රෝහණ බණ්ඩාර මහතා**
(மாண்புமிகு ரோஹண பண்டார)
(The Hon. Rohana Bandara)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, "දිට්වා" සුළි කුණාටුවෙන් වෙච්ච හානිය සහ එතැනින් පස්සේ ආපදාවට පත් වූ අයගේ ජීවන තත්ත්වය නැවත ගොඩ නඟන්න රටක් විදියට අප ගත්තු ක්‍රියාමාර්ග පිළිබඳව, එහි ගුණ අගුණ පිළිබඳව කථා කරන මොහොතක්, මෙය.

ආණ්ඩුව පැත්තෙන් කියනවා ආණ්ඩුව එය බොහොම හොඳට කළමනාකරණය කර ගත්තා, තවමත් ඒ කටයුතු කරගෙන යනවා කියන කාරණය. ඒක හොඳයි. ආණ්ඩුව ඒක කරන්න ඕනෑ. විපක්ෂයට නොවෙයි නේ රාජ්‍ය බලය තිබෙන්නේ; මූල්‍ය බලය තිබෙන්නේ; පිරිස් බලය තිබෙන්නේ. ඒ සියල්ල තිබෙන්නේ ආණ්ඩුවට. ඒක ආණ්ඩුව විසින් කළ යුතුමයි. ඒක ඔබතුමන්ලාගේ ගෙවල්වලින් ගෙනැල්ලා කරනවා නොවෙයි; පැලවත්තේ අරමුදලෙන් ගෙනැල්ලා කරනවා නොවෙයි. ඒක කරන්න ඔබතුමන්ලා බැඳී ඉන්නවා, දිවුරුම් දීලා. ඒ නිසා ඒ කටයුත්ත ඔබතුමන්ලා කළ යුතුයි. ඒ වාගේම ඔබතුමන්ලාට පුළුවන්ද, නැති වෙච්ච අයගේ ජීවිත ලබා දෙන්න? ඔබතුමන්ලාට පුළුවන්ද ඒ කාර්යය කරන්න? ඒකත් කරන්න පුළුවන් නම් කරන්න. එහෙම නම් ඔබතුමන්ලා හරි.

නිසි කළමනාකාරිත්වයක් නැතිකම නිසා, කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවෙන් ලබා දුන් අනාවැකිවලට ඇහුම්කන් නොදුන් නිසා, ඒවා තුට්ටුවකට මායිම් නොකළ නිසා, ජලාශවල, වැව්වල ජලය අඩු කර ගන්න කටයුතු කරන්නේ නැතුව, එම ජලය දෝරේ ගලාගෙන ගිහින්, පිටවාන්වලින් උතුරලා පිට වෙලා කඩාගෙන යනකල් හිටපු නිසා මේ විනාශය වුණා. දැන් සල්ලිවලින් ඔක්කෝම වහගන්නද ඔබතුමන්ලා හදන්නේ?

තහඩුවක් ගියාම රුපියල් ලක්ෂ 10ක් දෙන්නම් කිව්වත් දැන් එය රුපියල් ලක්ෂ 5ට බැහැලා. ඒවා දෙන්න අවශ්‍ය චක්‍රලේඛ ටික හරියාකාරව නිකුත් කර ගන්න බැහැ. ඒ නිසා අපේ ග්‍රාම නිලධාරි මහත්වරු, ප්‍රාදේශීය ලේකම්වරු හිර වෙලා. ඒ ගැටලු ටික විසඳීම ඔබතුමන්ලා තමයි කරන්න ඕනෑ. ඒ ටික හරියට කරලා ඒ මුදල් ටික දෙන්න කටයුතු කරන්න.

මෙහිදී ආණ්ඩුව පැත්තෙන් කථා කරපු කථිකයෝ ගණනාවක් ඇතැම් රූපවාහිනී නාළිකාවලට බැණ්ණා; "නයි නාළිකාව" ආදිය කියලා. ඒවායෙන් තොරතුරු එළියට ආපු නිසා තමයි ජනතාව දැනුවත් වුණේ. එහෙම නොවුණා නම් ඔබතුමන්ලාගේ අර පව යුටියුබ්කාරයෝ ටික දමාගෙන ඇත්ත වහගෙන ඉන්න තිබුණා, "අපි හොඳටම කළා" කියලා. හැබැයි "නයි නාළිකාව" ආදිය කියමින් ඔබතුමන්ලා බැණින නාළිකා ඒ ඇත්ත ප්‍රචාරය කළ නිසා ඔබතුමන්ලාගේ පවය දිගට ගෙන යන්න බැරි වුණා. ඒ නිසා ඔබතුමන්ලා හිර වෙලා, ලාම්පුතෙල් ගෑවුණා වාගේ දඟලන ගමන් තමන්ගේ නොහැකියාව වසා ගන්න දැන් කථා කරනවා. එම නිසා ආපදාවට පත් ඒ ජනතාවට ඔබතුමන්ලා වන්දි දිය යුතුමයි; ඔබතුමන්ලා ඒ කටයුතු කළ යුතුමයි.

මාතලේ දිස්ත්‍රික්කයේ ගරු නියෝජ්‍ය ඇමතිතුමා දැන් කථා කරද්දී කිව්වා, එතුමා ගිහිල්ලා එක තැනකින් මිනී පහක් ගෙනාවා කියලා. අපේ අඹන්ගඟ කෝරලේ ප්‍රාදේශීය සභාව අක්‍රියයි කියලාත් එතුමා කිව්වා. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, හැබැයි ඔබතුමන්ලා මොනවාද එතැනට දුන්නේ? මොනවා හරි දෙන්න ඔබතුමන්ලාට පුළුවන් වුණාද? හැබැයි අපි පෞද්ගලිකව අපේ පක්ෂයේ අරමුදලෙන් සල්ලි යවලා, වාහන යවලා ඒ කටයුතු සංවිධානය කරලා දුන්නේ නැද්ද? එතකොට ඔබතුමාද ගියේ, අර නාගල ක්‍රිස්තියානි පල්ලියේ හිර වෙලා හිටපු 90දෙනා බේරා ගන්න? ඔබතුමා ගියාද? ඔබතුමා මිනී පහ ගන්න ගියේ ඒ මිනිස්සු පස්දෙනා මැරුණාට පස්සේ. හැබැයි අර හිර වෙලා හිටපු 90දෙනා බේරා ගන්න ඔබතුමාට යා ගන්න පුළුවන් වුණාද? ඒ කට්ටිය බේරා ගත්තේ කවුරු ගිහිල්ලාද? විපක්ෂයෙන් ගිහිල්ලා තමයි ඒ කට්ටිය බේරා ගත්තේ. ඒ 90දෙනාගෙන් 60දෙනෙක් අරගෙන ආවේ, විපක්ෂයේ මන්ත්‍රීවරු ගිහිල්ලා; අපේ මන්ත්‍රීතුමිය ඇතුළු කණ්ඩායම ගිහිල්ලා. ඒ නිසා කට තිබුණු පලියට තමන්ගේ නොහැකියාව වහගන්න, තමන්ගේ අසමත්වීම් වහගන්න විවිධ ප්‍රචාර සිදු කරන්න එපා. මේ වෙලාවේ කවුරුත් එකතු වෙලා වැඩ කරන්න ඕනෑ.

ගරු විපක්ෂ නායකතුමා තවමත් ඔබතුමන්ලාට බැරි වෙච්ච කාර්යයන් ටික කරනවා. එතුමා "හුස්ම" වැඩසටහන අරගෙන රට වටේ යනවා; රෝහල්වලට ගිහිල්ලා ඒවාට අවශ්‍ය පහසුකම් ටික දෙනවා. ඒ සියල්ල කරනකල් ඔබතුමන්ලා තමන්ගේ නොහැකියාව ප්‍රදර්ශනය කරමින් ඉන්නවා.

රාජාංගනයේදී බස් එක ගහගෙන ගිය තැන විනාඩි ගණනක් ඇතුළත ඒ බස් එකේ වහලය මට්ටමට එන තරමට වතුර මුදා හැරියේ කවුද? රාජාංගනය ජලාශයේ පිටවානෙන් කවදාවත් වතුර පිට වෙලා නැහැ. එහි අඩි තුනකට වඩා පිටවානෙන් යනකල්ම හිටියා; ඒ ජලය කළමනාකරණය කරගෙන පිට කර ගන්න බැරි වුණා. ඒ නිසා රාජාංගනයේදී එක මොහොතෙන් -විනාඩි ගණනක් ඇතුළත- ඒ බස් එක ගසාගෙන ගියා. ඒ මිනිස්සු වහලයක් උඩට නැගලායි බේරුණේ. විනාඩි ගණනක් ඇතුළත වතුර විශාල ප්‍රමාණයක් මුදා හැරපු නිසායි එහෙම වුණේ. ඒ නොහැකියාව ඔබතුමන්ලා ළඟ තිබුණා. කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා හංගලා, නිවාස අඩස්සියේ තියලා, ආරක්ෂක ලේකම්වරු ඒ අයට තර්ජනය කරලා ඇත්ත යටපත් කරන්න හැදුවා.

ඔබතුමන්ලා ඒ සියල්ල කළාට මේ රටේ ජනතාව ඇත්ත දන්නවා. අපට හදිසියක් හෝ කලබලයක් නැහැ. දෛවයේ සරදමකින් ඔබතුමන්ලාට මේ ආණ්ඩු බලය දුන්නා, ඔබතුමන්ලාගේ කෙරුවාවල් බලන්න; අවුරුදු 70 ගණනක් තිස්සේ විපක්ෂයේ ඉඳගෙන ගහපු කයිවාරු ක්‍රියාවෙන් ඔප්පු කරලා පෙන්වන්න. අපට හදිසියක් නැහැ, දෙසැම්බර්වල ජනාධිපති වෙන්න. ජනතාව නිසි වෙලාවට අපට බලය ලබා දෙයි, ඔබතුමන්ලාගේ කෙරුවාවල් දිහා බලලා. අද සමුපකාර ටිකට අත් වන ඉරණම පෙනෙනවා නේ. අපට කලබලයක්, හදිස්සියක් නැහැ. ඔබතුමන්ලාට තව ටිකක් මේක භාන්න ඇරලා ගත්තාම තමයි කරදරයක් නැතුව ආණ්ඩුව කරගෙන යන්න අපට පුළුවන් වෙන්නේ. විපක්ෂය හැටියට කළ යුතු දේ අපි කරනවා. විපක්ෂයේ ඉඳගෙන ශාප කර කර ඉන්නේ නැතුව, දොස් කිය කියා ඉන්නේ නැතුව, අපේ ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන්ගේ ඉඳලා අපේ සෑම මන්ත්‍රීවරයෙක්ම, සෑම ක්‍රියාකාරිකයෙක්ම විපක්ෂයේ වගකීම ඉටු කරනවා. අපට ඔබතුමන්ලාට වාගේ භාණ්ඩාගාරයේ සල්ලි හසුරවන්න හැකියාවක් නැහැ. අප ළඟ තිබෙන මුදල්වල ප්‍රමාණය අනුව අපි අහිංසක මිනිසුන්ගේ ජීවිත ගොඩනඟන්න උදවු කරලා තිබෙනවා. අපේ ගරු විපක්ෂ නායකතුමාගේ ඉඳලා අපි සියලුදෙනා ඒ ශක්තිය ලබා දීලා තිබෙනවා. අදටත් ඔබතුමන්ලා, "Please, එපා!" කියලා කියන කොටත්, කොළ අරගෙන ගිහින් දෙන්න එපා කියලා කියන කොටත්, අපේ ගරු විපක්ෂ නායකතුමා සියලු තානාපතිවරුන් හම්බ වෙලා විපක්ෂයේ ඉඳගෙන කියන්නේ, "අපේ රට ගොඩ නඟන්න ආධාර කරන්න" කියලායි. අපි කාලකණ්ණි විපක්ෂයක් බවට පත් වෙලා නැහැ. විපක්ෂයේ කාර්යභාරය අපි හරියට ඉෂ්ට කරලා තිබෙනවා. ඔබේ නොහැකියාව මේකෙන් වහ ගන්න බැහැ කියන එක මතක තබා ගන්න.

[ගරු රෝහණ බණ්ඩාර මහතා]

ගරු රෝහිණී කුමාරි විජේරත්න මන්ත්‍රීතුමිය අද සභාව කල් තැබීමේ යෝජනාව ඉදිරිපත් කරලා හැංගිලා ලු. එහෙම නැහැ. ඔබතුමන්ලාත් අවුරුද්දකට වැඩි කාලයක් දැන් මන්ත්‍රීවරුන් වශයෙන් පාර්ලිමේන්තුවේ ඉන්නවා නේ. මේ සභා ගර්භය ඇතුළේ විතරද මන්ත්‍රීවරුන්ට ඉන්න තිබෙන්නේ? පාර්ලිමේන්තුව තුළ මේ වනකොට කමිටු කීයක් නම් ක්‍රියාත්මක වෙනවාද? ඒවායේ ඉන්න බැරිද, රෝහිණී කුමාරි විජේරත්න මන්ත්‍රීතුමියට? යෝජනාව ඉදිරිපත් කරලා ගලක් තිබ්බා වාගේ මෙතැනම වාඩි වෙලා ඉන්න ඕනෑ කියලා එකක් තිබෙනවාද? දැන් මෙතැන ඔබතුමන්ලාගේ කථිකයෝ කීදෙනෙක් ඉතුරු වෙලා ඉන්නවාද? නිකම් බොරු තර්ක ඉදිරිපත් කරන්න එපා, ඇමතිතුමා. තර්කානුකූලව ප්‍රායෝගික කාරණා ඉදිරිපත් කරන්න.

අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ගැනත් කියන්න ඕනෑ. දැන් අපි තමයි ඒකට වැරැදිකාරයෝ. ඔබතුමන්ලාගේ කණ්ඩායම ඊයේ පෙරේදා උද්ඝෝෂණයක් කරන්න අනුරාධපුරයට ආවා. ඒකට 20දෙනෙකු එකතු කර ගන්න බැරිව කුරුණෑගලින් කට්ටිය එනකල් බලාගෙන හිටියා. ඊට පස්සෙයි ඒ කට්ටිය උද්ඝෝෂණ කරන්න ලෑස්ති වුණේ. අධ්‍යාපන ප්‍රතිසංස්කරණ හරියට අප නතර කළා වාගෙයි දැන් කථාව. මොඩියුලවලට මොන මඟුලකටද කුණුහරුප ඇතුළත් කළේ. ඒක ඇතුළත් නොකර තිබුණා නම් අද ඒ මොඩියුල ක්‍රියාත්මක වෙනවා නේ. දැන් පරණ එකත් නැහැ. අපේ 6වන ශ්‍රේණියේ දරුවන්ට අද පෙළ පොත් ටික නැහැ, අලුත් පාසල් වාරයේ වැඩ පටන් ගන්න. අධ්‍යාපන ප්‍රතිසංස්කරණ නතර කරන්න කියලා අපි කිව්වාද? ඒ කුණුහරුප ටික ඇතුළත් කරන්නේ නැතිව, ඒ මොඩියුල සකස් කරන්න තිබුණා. 2021 අවුරුද්දේයි ඒ කටයුතු ආරම්භ කළේ. 2021දී ආරම්භ කරලා කොවිඩ් වසංගතය නිසා 2022දී තාවකාලිකව නවතා තිබුණු එම කටයුත්ත ඔබතුමන්ලා ක්‍රියාත්මක කරන්න ගිහින්, ඒක අස්සට එබුවා කුණුහරුප ටිකක්. එහෙම කුණුහරුප ඔබන්නේ නැතුව තිබුණා නම් අද 6වන ශ්‍රේණියේ දරුවන්ට නව අධ්‍යාපන ක්‍රමයට අනුව ඉගෙන ගන්න තිබුණා. ඒකත් විනාශ කළේ ඔබතුමන්ලායි. ඔබතුමන්ලා ඒක විනාශ කරලා විපක්ෂය එය කළා වාගේ දැන් ඇවිල්ලා උද්ඝෝෂණය කරනවා. ඒකද කළ යුත්තේ?

අනෙක් අතට, ඔබතුමන්ලා හැම දෙයකටම දේශපාලනය රිංගවනවා. දැන් බාලදක්ෂ ව්‍යාපාරයටත් දේශපාලනය රිංගවලා. මෙතුවක් කාලයක් බාලදක්ෂ ව්‍යාපාරය ස්වාධීනව කටයුතු කළා. ස්වාධීන බාලදක්ෂ ව්‍යාපාරයක් ආරම්භ කරන්න ඕනෑ කියලා අවසර ඉල්ලපු, එනම් පවතින බාලදක්ෂ ව්‍යාපාරයට විරුද්ධව තව ව්‍යාපාරයක් ආරම්භ කරන්න අවසර ඉල්ලූ කෙනාට, ඔබතුමන්ලාගේ යූටියුබ්කාරයෙකු වෙච්ච කෙනාට, ඔබතුමන්ලාගේ අරගළයේ නියමුවෙකු වෙච්ච නිසා බාලදක්ෂ ව්‍යාපාරය පාවා දීලා තිබෙනවා.

ඔබතුමන්ලා ඇතැම් රූපවාහිනී නාළිකාවලට "නයි නාළිකා" කිව්වාට, ඔබතුමන්ලා දැන් රජයේ මාධ්‍ය ආයතන ටික පාලනය කරන විදිය අපට පෙනෙනවා. ඔබතුමන්ලා විපක්ෂයේ හිටපු කාලයේ ඔබතුමන්ලාටත් අවස්ථාව දීලා කටයුතු කළ ජාතික රූපවාහිනියේ "කරට කර" දේශපාලන වැඩසටහන ක්‍රියාත්මක වීම දෙසැම්බර් මාසයේ ඉඳලා නතර කර තිබෙනවා. ඒ ඇයි? විපක්ෂයෙන් ඇවිල්ලා ඔබතුමන්ලාව විවේචනය කරන කොට දරා ගන්න බැරි හින්දා. ඔබතුමන්ලා රජයේ මාධ්‍ය ආයතන ඔක්කෝම පාලනය කරන්න හදනවා. "දෙරණ" නාළිකාවට බණිනවා. "හිරු" නාළිකාවට බණිනවා. එම නාළිකාවලට බැණ බැණ, රාජ්‍ය නාළිකාවල දේශපාලන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම අත්හිටුවන තැනට අද පත් කරලා තිබෙනවා. ජාතික රූපවාහිනියේ "කරට කර" දේශපාලන වැඩසටහන සම්පූර්ණයෙන් අත්හිටුවා තිබෙනවා. ඇයි? විපක්ෂයේ අයට ඇවිල්ලා කථා කරන්න තිබෙන අවස්ථාව නැති කරන්නයි. හැබැයි, ඔබතුමන්ලා විපක්ෂයේ ඉන්න කොට "කරට කර" වැඩසටහනට ඇවිල්ලා ආණ්ඩුවට බණින්න ඕනෑ තරම් අවස්ථාව එදා තිබුණා. අද එය අනික් අය කරන්න යනකොට, වර්තමාන විපක්ෂයේ කට්ටියට ඒ අවස්ථාව ලැබෙන කොට ඒක වළක්වන්න ඔබතුමන්ලා ඒ වැඩසටහන අත්හිටුවන්න කටයුතු කළා. ඔබතුමන්ලා යමක් කරනවා නම් විනිවිදභාවයක් ඇතිව කරන්න. මොකද, සියල්ල රටේ ජනතාවට දැන ගන්න පුළුවන්. අද මාධ්‍ය දියුණුයි. එම නිසා ඔබතුමන්ලා කටින් කයිවාරු ගැහුවාට විතරක් ප්‍රයෝජනයක් නැහැ. ඒවා මේ රටේ ජනතාව වෙනුවෙන් ප්‍රායෝගිකව ඉටු කරන්න.

"දිට්වා" සුළි කුණාටුව නිසා අපේ කෘෂිකර්ම ක්ෂේත්‍රයේ විශාල භූමි ප්‍රමාණයක් විනාශ වුණා. තවමත් ඔබතුමන්ලාට පුළුවන් වුණාද, ඊට අදාළ වන්දි ටික දීලා ඉවර කර ගන්න? මෙතැනදී ඇහුවාම නම්, ප්‍රගතිය සියයට 80යි, 90යි කියලා කියනවා. අනුරාධපුරයේ හෙක්ටෙයාර පන්දහස් ගණනක් විනාශ වුණාම ඒකෙන් හෙක්ටෙයාර දෙදහස් ගණනක් වෙනුවෙන් විතරයි තවමත් වන්දි ගෙවලා තිබෙන්නේ. අර්ධ හානි වුණු වගාවන් වෙනුවෙන් කිසි කෙනෙකුට වන්දියක් දෙන්නේ නැහැ කියලා ඔබතුමන්ලා ප්‍රකාශ කරනවා. දැන් වී අස්වනු නෙළමින් යනවා. වී මිල දී ගැනීමට ඔබතුමන්ලා ලෑස්තිද? වී ගබඩාවක්වත් ඇරලා තිබෙනවාද? පසුගිය යල කන්නයේ දුන්නාට වඩා නාඩු වී කිලෝවකට රුපියල් 5ක්වත් වැඩි කළාද? මොකද, මේ කන්නයේ වැඩිපුර තිබෙන්නේ නාඩු. මෙවර වී අස්වැන්න විශාල වශයෙන් පහළ ගිහින් තිබෙන්නේ වර්ෂාව නිසා. මේ කන්නයේ වීවලින් ගොවියාට ලාභයක් ගන්න පුළුවන් විදියට ඔබතුමන්ලා කටයුතු කරනවාද?

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, කථාව අවසන් කරන්න.

**ගරු රෝහණ බණ්ඩාර මහතා**
(மாண்புமிகு ரோஹண பண்டார)
(The Hon. Rohana Bandara)
හොඳමයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි.

ඔබතුමන්ලාට පොහොර සහනාධාරය දීලා ඉවර කර ගන්න පුළුවන් වුණාද? අනුරාධපුරයේ හෙක්ටෙයාර 125,000 ගණනකින් තවත් 80,000කට දෙවන පොහොර සහනාධාරය දී ගන්න බැරි වෙලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි. අනුරාධපුර දිස්ත්‍රික්කයේ හෙක්ටෙයාර 10,000කට පළමු පොහොර සහනාධාරයවත් තවම ලැබිලා නැහැ. "අපි තමයි කෙරුවෝ, අපි තමයි හොඳටම කළේ" කියපු ජනාධිපතිවරුත් හිටියා. ඒ අයට යන්න වුණු විදිය දන්නවා නේ. ඒ අයට යන්න වුණු විදියට ඔබතුමන්ලා යන්න ලෑස්ති වෙන්න එපා. ඔබතුමන්ලා මේක තව අවුරුද්දක් හෝ දෙකක් හාන්න. හාලා ඉවර වුණාම ඔබතුමන්ලාට ජනතාව ඡන්දයකින්ම ප්‍රතිඵල දෙයි. ඔබතුමන්ලාට සියයට 3වත් අරගන්න හැකියාව ලැබෙයිද කියලා එතකොට බලා ගන්න පුළුවන් වෙයි.

හිටපු ජනාධිපතිවරයකුගේ පුතෙකුට අද බැණ්ණා. ඒ පුතාගේ තාත්තා ජනාධිපති කළේ කවුද? ඒ තාත්තා ජනාධිපති කරන්න කර දීපු, උර දීපු, ඒ වෙනුවෙන් මහන්සි වුණු උදවිය අද පුතාට ශාප කරනවා, තමන්ගේ ජනාධිපති කෙනෙක් ඉන්න නිසා.

තාත්තලා ජනාධිපති කරවලා පුත්තුන්ට සාප කරන්න එපා, මන්ත්‍රීවරු, ඇමතිවරු විදියට ඔබතුමන්ලා. එහෙම සාප කරනවා නම් ඒ සාපයේ කොටසක් ඔබතුමන්ලාටත් හිමියි කියන කාරණය මතක් කරමින්, "දිට්වා" සුළි කුණාටුවෙන් පීඩාවට පත් වෙච්ච ජනතාව ගොඩනඟන්නට ඔබතුමන්ලාට ශක්තිය ලැබේවා කියා ප්‍රාර්ථනා කරමින් කරමින් මා නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි, අවස්ථාව ලබා දුන්නාට.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු ආර්.එම්. ජයවර්ධන නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් තිබෙනවා.

Order, please! ඊට ප්‍රථම, කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙකු මූලාසනය සඳහා ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

**ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஏ.எச்.எம்.எச். அபயரத்ன)
(The Hon. (Prof.) A.H.M.H. Abayarathna)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, "ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මම යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු සාගරිකා අතාවුද මහත්මිය මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මහතා මූලාසනාරූඪ විය.***
*அதன்பிறகு, மாண்புமிகு (திருமதி) சாகரிகா அதாவுத அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு (பேராசிரியர்) சேன நாணாயக்கார அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon THE HON. (MRS.) SAGARIKA ATHAUDA left the Chair and THE HON. (PROF.) SENA NANAYAKKARA took the Chair.*

[අ.භා. 4.10]

**ගරු ආර්.එම්. ජයවර්ධන මහතා (වෙළෙඳ, වාණිජ සහ ආහාර සුරක්ෂිතතා නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஆர்.எம். ஜயவர்தன - வர்த்தக, வாணிப மற்றும் உணவுப் பாதுகாப்புப் பிரதி அமைச்சர்)
(The Hon. R.M. Jayawardhana - Deputy Minister of Trade, Commerce and Food Security)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, "දිට්වා" සුළි කුණාටුව නිසා ඇති වුණු ආපදාවෙන් පසු මේ වන විට පවතින තත්ත්වය පිළිබඳව සාකච්ඡා කිරීමට අද දවසේ මේ යෝජනාව ඉදිරිපත් කර තිබෙනවා. ඒ පිළිබඳව යම් අදහසක් ඉදිරිපත් කරන්නට අවස්ථාවක් ලැබීම පිළිබඳව විශේෂයෙන් මා සතුටු වෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අපි දන්නවා මේ සුළි කුණාටුව අපේ රටට විතරක් නොවෙයි බලපෑවේ කියලා. ලෝකයේ රටවල් ගණනාවකටම පසුගිය කාල සීමාව තුළ වෙනත් කුණාටුවලින් බලපෑම් සිද්ධ වුණා.

ලෝකයේ අනෙක් රටවලට ඒ කුණාටුව ආවාට පස්සේ ඒ රටවල් ආපදාවට මුහුණ දුන්නු විධියත්, ලංකාවේ ආණ්ඩුව සහ රටේ පුරවැසියන් ඒ ආපදාවට මුහුණ දුන්නු විධියත් ගැන බොහොම ලස්සනට කථා කළා. අද උදේ විපක්ෂ නායකතුමා කිව්වා, අපි එකමුතුකම ගැන විතරයි කථා කළේ කියලා. නමුත් ලෝකයේ එක ප්‍රසිද්ධ නායකයෙක් කිව්වා, "ශ්‍රී ලංකාව වාගේ දුප්පත්, අර්ථික වශයෙන් පීඩාවට පත් වෙලා සිටින රටක් මෙවැනි බරපතළ කුණාටුවට මුහුණ දීපු විධිය ආර්ථික හැකියාවක් තිබෙන අපි වාගේ රටකටවත් කරන්න බැහැ" කියලා. ඒ කථාවේ පරිවර්තනය හරියට සොයා බලා කියන්න කියලා මම විපක්ෂ නායකතුමාට කියනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ මොනරාගල දිස්ත්‍රික්කයට මේ කුණාටුවෙන් එතරම් බරපතළ හානියක් සිද්ධ වුණේ නැහැ. බරපතළ හානියක් සිදු නොවුණත්, අපේ දිස්ත්‍රික්කය තුළත් ගෙවල් 38ක් සහමුලින්ම විනාශ වෙලා, ගෙවල් 542ක් අර්ධ හානි වෙලා, මිනිස් ජීවිත 4ක් අහිමි වුණා. ඒ වාගේම අනෙකුත් දේපොළ ගණනාවක් විනාශයට පත් වුණා. අපේ දිස්ත්‍රික්කයේ ගංගා ගණනාවක් තිබෙනවා. ඒ ගංගා පිටාර ගලලා ඒ මඟින් ආපදාවට ලක් වූ ප්‍රමාණයක් තිබෙනවා. එක පැත්තකින් ගල්ඔය, අනෙක් පැත්තෙන් හැඩඔය, කුඹුක්කන්ඔය, මැණික් ගඟ, කුඩාඔය, කිරිඳිඔය වාගේ ගංගා ගණනාවක් අපේ දිස්ත්‍රික්කය හරහා ගලා බසිනවා. ඒවා පිටාර ගැලුවා. ඒ පිටාර ගලන වෙලාවේ අපි ඒකට මුහුණ දුන්නු විධිය ගැන විපක්ෂය කියනවා, ඒකට මොකුත් කර ගන්න බැරි වුණා, සූදානම් වුණේ නැහැ කියලා. ඒ වාගේ බොහෝ කථා කියනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි බලමු "දිට්වා" සුළි කුණාටුවේ පැමිණීම පිළිබඳව කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව මොන විධියටද දැක්කේ කියලා. අපේ රට පිහිටා තිබෙන්නේ බෙංගාල බොක්ක ආශ්‍රිත කලාපයේ, දූපතක් විධියට මුහුදින් වටවෙලා. ඒ වාගේම නොවැම්බර් මාසය කියන්නේ බෙංගාල බොක්ක ආශ්‍රිතව කුණාටු වර්ධනය වෙන කාලයක්. ඒ හා සමානවම අරාබි මුහුදේත් කුණාටු තත්ත්ව වර්ධනය වෙනවා. මේ කුණාටු තත්ත්ව වර්ධනය වීම පිළිබඳව අපේ රටේ කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව නිසි අවධානයක් යොමු කරමින් කටයුතු කරනවා. ඒ මොහොතේත් කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව නිසි අවධානයක් යොමු කරමින් කටයුතු කරමින් සිටියා. ඒ අය ලෝකයේ දියුණුම තාක්ෂණය තිබෙන ආයතන සමඟ සම්බන්ධ වෙමින්, ඒ වෙනස්වීම් පිළිබඳව සාකච්ඡා කරමින් සිටියා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙවැනි කුණාටු එනවා. කුණාටුවක් එන්න පුළුවන් අවපීඩනය තිබෙනවා, ඒ අවපීඩනය කුණාටුවක් දක්වා වර්ධනය වෙන්න පුළුවන් කියලා කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව මීට කලින් හැම අවුරුද්දේම සමහර කාලවල නිවේදන නිකුත් කරලා තිබෙනවා. මෙහිදීත් නොවැම්බර් මාසයේ 01වෙනි දා ඉඳලා අවස්ථා 3ක එවැනි නිවේදන නිකුත් කර තිබෙනවා. විපක්ෂයේ සමහර කට්ටිය පසුගිය දවස්වල කිව්වා, 12වෙනි දා "මාර අප්සට්" කියලා. 12වෙනි දා මාර අප්සට් කියලා කියපු අයට අපි කියන්න ඕනෑ, 12වෙනි දා ආපු එක 18වෙනි දා වෙනකොට ඉවරයි, 18වෙනි දා ආපු එක 23වෙනි දා වෙනකොට ඉවරයි කියලා. මේ කලාපයේ කුණාටු ආරම්භ වෙනවා, නමුත් කොයි මොහොතේ හරි ඒක ඉක්මනින් වෙනස් වෙලා යනවා. ඒ තත්ත්වය ක්ෂණිකව වෙනස් වෙන කලාපයක තමයි අපි ජීවත් වෙන්නේ. ඒ නිසා මේ කලාපය තුළ ඇතිවෙන කුණාටු පිළිබඳව අපට වෙනම අදහසක් තිබෙනවා. ඒ වෙනස්වීම් කෙටි කලක් තුළ වෙන්න පුළුවන්.

මේ "දිට්වා" සුළි කුණාටුව පුදුම වෙනසක් තිබුණු එකක් කියනවා. පැය 12ක් ඇතුළත තිබුණු තත්ත්වය සහමුලින් වෙනස් වුණාය කියනවා. පැය 12ක් ඇතුළත එහෙම වෙනස් වෙන්න පුළුවන් නම්, ඒ වෙනසට මුහුණ දීම සඳහා මොකක්ද කරන්න පුළුවන්? ඒක කියන්න. නමුත් මහා ලොකු දේවල් කියලා, ඒකට අපි සූදානම් වුණේ නැහැ කියනවා. 26වෙනි දා තමයි ඒ වැස්ස වහින්න පටන් ගත්තේ. 26වෙනි දා දවසම වහිද්දී, අපි හැන්දෑවේ 6.00 වෙනකොට දිසාපතිතුමා එක්ක කථා කරලා ඇති වෙන්න පුළුවන් ආපදා පිළිබඳව දැනගෙන, 27වෙනි දා උදේ 9.00 වෙනකොට දිස්ත්‍රික්කයේ නිලධාරීන් එක්ක සාකච්ඡා කළා. 27වෙනි දා උදේ වෙනකොට වැස්ස වැහැලා ගංවතුර ගලනවා, ඇළ දොළ පිරිලා යනවා, ගංගා පිටාර ගලනවා, ගෙවල් යට වෙනවා. අපි 27වෙනි දා අපේ දිස්ත්‍රික්කයේ කමිටුව කැඳවනකොට, අපේ ජනාධිපතිතුමා 27වෙනි දා පාර්ලිමේන්තුවේත් කමිටුවක් කැඳෙව්වා. ඒ කෙසේ වෙතත්, අපේ දිස්ත්‍රික්කයේ ආපදා අවම කර ගන්න අපි සමත් වෙනවා. අපේ දිස්ත්‍රික් ලේකම්තුමා, ප්‍රාදේශීය ලේකම්තුමන්ලා, ග්‍රාම නිලධාරි මහත්වරු, අනෙකුත් රජයේ ආයතන, පොලීසිය, හමුදාව ඇතුළු සියලුදෙනා එකට එකතු වෙලා ඒ අර්බුදය කළමනාකරණය කරලා දේපොළ සහ ජීවිත හානි අවම කර ගන්න සමත් වුණා.

[ගරු ආර්.එම්. ජයවර්ධන මහතා]

ඒ නිසා විපක්ෂය නියෝජනය කරන සමගි ජන බලවේගයේ මහ ලේකම්තුමාගෙන් මම අහනවා, එතුමා දිස්ත්‍රික්කයේ කොහේද හිටියේ කියලා. මට මතකයි, අපි අය වැය විවාදය අතරතුර දවස් දෙකක් මේ පිළිබඳ විවාද කළා. අය වැය විවාදය අතරතුර මේ ගැන විවාද කරනකොට, විපක්ෂයේ මොනරාගල දිස්ත්‍රික්කය නියෝජනය කරන මන්ත්‍රීතුමා මෙතැනට ඇවිල්ලා මහ ලොකු දේවල් ටිකක් කිව්වා. එතුමා බුත්තල කොට්ඨාසයෙන් පිට කිසි දෙයක් දන්නේ නැති කෙනෙක්. අපි දිස්ත්‍රික්කය ඇතුළේ කරපු දේවල් පිළිබඳව දශමයක අවබෝධයක් එතුමාට නැහැ. එතුමා කිසිම ඒ කමිටුවකට, සාකච්ඡාවකට සම්බන්ධ වුණේ නැති කෙනෙක්. මේ යෝජනාව ඉදිරිපත් කරපු මන්ත්‍රීතුමියත් එහෙමයි. ඒ අයට පණිවුඩ දෙනවා, ලියුම් යවනවා, සහභාගි වෙන්න කියනවා. නමුත් ඒවාට සහභාගි වෙන්නේ නැතුව, එළියේ ඉඳගෙන මොනවා හරි කියලා තමයි මෙතැනට ඇවිල්ලා මෙහෙම කථා කරන්නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මේ "දිට්වා" සුළි කුණාටුවෙන් විපතට පත් වුණු මිනිස්සුන්ට කරන්න පුළුවන් සේවාව අපි හොඳටම කරමින් තමයි ඉන්නේ. මන්ත්‍රීවරුන් කිහිපදෙනෙක් විවිධ දේවල් කිව්වා. ඒ කියන දේවල් දැක්කාම අපට පුදුම හිතෙනවා. 2029දී ජනාධිපති වෙන්න හිතාගෙන ඉන්න කුමාරයා කිව්වා, මේ ආපදාව කළමනාකරණය කර ගන්න බැරි වුණා කියලා. ඒ සම්බන්ධයෙන් මොනවත් කළේ නැහැ කිව්වා. එතුමාට අපි මේ ටික කියන්න ඕනෑ. 2004දී සුනාමිය ආපු වෙලාවේ මුහුදු තීරයේ ප්‍රදේශ විතරයි යට වුණේ. මුහුදු තීරයේ ප්‍රදේශ යට වූ වෙලාවේ ඒක කළමනාකරණය කර ගන්න පුළුවන් වැඩ පිළිවෙළක් එදා තිබුණේ නැහැ. ඒ වෙලාවේ අපි විපක්ෂයේ හිටපු පක්ෂයක් විධියට ආණ්ඩුවට චෝදනා කර කර හිටියේ නැහැ; ආණ්ඩුවට බැණ බැණ හිටියේ නැහැ. ආණ්ඩුවෙන් අපට එන්න කිව්වේ නැහැ කියලා අපි බලාගෙන හිටියේ නැහැ. අපි පක්ෂයක් විධියට තනියෙන් ගිහිල්ලා මාස තුනක් එක දිගට ඒ වැඩ කළා.

ඊට පස්සේ ගංවතුරක් ආවා. මට මතක විධියට ඒ 2003දී. ඒකෙන් යට වුණේ රත්නපුර, කළුතර, ගාල්ල, මාතර කියන නගර හතර. ඒ නගර හතර යට වෙච්ච වෙලාවේ පැය 4යි වැස්සේ. පැය 4ක් වැහැලා වැස්ස නතර වුණා; වතුර ගැලුවා; ගංවතුර ආවා. කොහොමද, ඒක කළමනාකරණය කරගන්න පුළුවන්ද වුණාද? අපි 5,000ක් එක දවසේ බැස්සා ඒ ආපදාවට මුහුණ දීපු මිනිස්සු ගලවා ගන්න. මෙතැන හිටපු රත්නපුරයේ මන්ත්‍රීතුමා කිව්වා, බඩු බෙදනවා දැක්කේ නැති ලු. අපි බඩු බෙදන්න යන්නේ නැහැ. අපි කෙසෙල් ගෙඩියේ ලේබල් එක ගහලා බෙදුවේ නැහැ; අපි බත් පාර්සලයේ නම ගහලා බෙදුවේ නැහැ. අපි මොනවාවත් එහෙම බෙදලා ෆේස්බුක් දැම්මේ නැහැ. හැබැයි අපි විපක්ෂයේ ඉඳගෙන 5,000ක් එක්ක ගිහිල්ලා, සති ගණන් වැඩ කරලා ඒ ආපදාවට මුහුණ දීපු මිනිස්සු ප්‍රකෘති තත්ත්වයට පත් කරන්න වැඩ කළා.

ඒ විතරක් නොවෙයි, මගේ මතකයේ හැටියට 2016දීත් ගංවතුරක් ආවා. ඒ ගංවතුර වෙලාවේත් මිනිස්සු ගලවා ගන්න අපි කොහොමද ගියේ? අපි විපක්ෂයේ ඉඳගෙනත්, අපට තිබෙන හැකියාව පාවිච්චි කළා; අපි ඒවාට ගියා. මෙතැනදී සමහර අය කිව්වා, රෝහල්වලට බඩු බෙදුවා කියලා. අපට පුළුවන් කාගෙන් හරි සල්ලි ටිකක් අරගෙන බෙදන්න. හැබැයි, අපි එහෙම බෙදන්න යන්නේ නැහැ. මෙවර අපි බඩු බෙදුවේ කොහොමද? බඩු එකතු කරපු අයට අපි ඉතාම පැහැදිලිව කිව්වා,-*[බාධා කිරීමක්]* කොහේටද බඩු දෙන්න කිව්වේ? දෙන්න කිව්වා, *[බාධා කිරීමක්]* බොරු කථා නොවෙයි. මොනවද බොරු කථා? *[බාධා කිරීමක්]* ඔව්, බඩු බෙදපු විධිය අපි කියන්නම්. *[බාධා කිරීමක්]*

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු ආර්.එම්. ජයවර්ධන මහතා**
(மாண்புமிகு ஆர்.எம். ஜயவர்தன)
(The Hon. R.M. Jayawardhana)

ගොන් කථා නොවෙයි. අපි දන්නවා, මේ ඉස්සරහ ඉඳගෙන ගොන් කථා ඔක්කොම කිව්වේ කවුද කියලා. ගොන් කථා කිව්වා. ගොන් කථාවක් බව ඔප්පු වුණා, මේ මොහොතේ කියපු කථාවෙන්ම. ඒවා ගොන් කථා කියලා ඔප්පු වුණා. අපි දන්නවා, සමහර අයට පුළුවන්කම තිබෙනවා, බඩු ටික බෙදලා ෆොටෝ එක ෆේස්බුක් එකේ දමාගන්න. මීගමුවට ගිය වෙලාවේ අපි දැක්කා වෙච්ච දේ. *[බාධා කිරීමක්]* විපතක් වෙච්ච වෙලාවේ ඒ කටයුතු කරගෙන යන්න අපට ශක්තිය තිබෙනවා. අපි ඒ වැඩේ කළා. අපට පුළුවන්; අපි ඒ වැඩේ කළා; ඉදිරියටත් කරනවා. අපේ දිස්ත්‍රික්කයේ ජනතාවගේ සියලු ගෙවීම් - සියයට 99ක් සහ සියයට 100ක් - කර තිබෙනවා. රුපියල් 25,000, රුපියල් 50,000 වශයෙන් සියයට 100ක්ම ගෙවලා තිබෙනවා. පාසල් දරුවන්ට ලබා දෙන රුපියල් 15,000ත් සියයට 100ක්ම දීලා තිබෙනවා. අපේ දිස්ත්‍රික්කවල ඒ සියලු කටයුතු කර තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා මට මේ කාලය ලබා දීම වෙනුවෙන්.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු (වෛද්‍ය) පී. සත්‍යලිංගම් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි අටක කාලයක් ලැබෙනවා.

[பி.ப. 4.20]

**ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා**
(மாண்புமிகு (வைத்தியர்) பத்மநாதன் சத்தியலிங்கம்)
(The Hon. (Dr.) Pathmanathan Sathiyalingam)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, 'தித்வா' புயலுக்குப் பிந்திய நாட்டின் நிலைமை தொடர்பாக இங்கு வாதப் பிரதிவாதங்கள் நடைபெற்றுக்கொண்டு இருக்கின்றது. எத்தகைய அனர்த்தங்களை எதிர்கொள்ளும் போதும் பல குறைபாடுகள் ஏற்பட்டிருப்பதை நாங்கள் ஏற்றுக்கொள்ளத்தான் வேண்டும். அதற்காக நாங்கள் இந்தப் பாராளுமன்றத்திலே எங்களுடைய நேரத்தைச் செலவழித்து முட்டி மோதுவதனால் மக்களுக்கும் இந்த நாட்டுக்கும் எந்தவித நன்மையும் கிடைக்கப் போவதில்லை. ஆகவே, இதை நாட்டினுடைய பிரச்சினையாக எண்ணி, நாங்கள் அனைவரும் ஒன்று சேர்ந்து இந்தப் பிரச்சினையை எதிர்கொள்ள வேண்டிய சூழல் இருக்கின்றது. அந்த வகையிலே இந்த 'தித்வா' புயல் சம்பந்தமாக அரசாங்கம் எடுத்த நடவடிக்கைகள் சம்பந்தமாகக் குறை கூறாமல், இங்கு குறைபாடுகள் இருந்திருக்கின்றது என்பதைச் சுட்டிக்காட்ட நான் ஓர் உதாரணத்தை மாத்திரம் சொல்ல விரும்புகிறேன்.

வவுனியாவைச் சேர்ந்த தணிகாசலம் பத்மநிகேதன் என்பவர் இராஜாங்கனையில் வெள்ளத்திலே சிக்குண்டு உயிரிழந்தார். அவர் Nations Trust Bankஇலே கடமைபுரிந்தவர். ஒரு நேர்முகத் தேர்வுக்காகக் கொழும்புக்குச் செல்லும்போது, அவர் சென்ற பஸ்

வெள்ளத்தில் சிக்குண்டே அவர் உயிரிழந்தார். அவர் கொல்லப்பட்டதாகத்தான் அந்த பஸ் சாரதிக்கு எதிராக இராஜாங்கனைப் பொலிஸார் வழக்குத் தாக்கல் செய்திருக்கிறார்கள். "ஒரு கொலையும், 64 பேர்மீது கொலை முயற்சியும்" என்று அந்த பஸ் சாரதிக்கு எதிராக வழக்குத் தாக்கல் செய்யப்பட்டிருக்கின்றது. ஏன், அவர்கள் இதைக் கொலை என்று சொல்கிறார்கள்? அந்தச் சம்பவத்துக்கு அந்த பஸ் சாரதி மட்டுமா பொறுப்புக் கூற வேண்டும்? உரிய நேரத்தில் அறிவித்தல் கொடுக்காமல் அதிகளவான நீரைத் திறந்துவிட்ட நீர் முகாமைத்துவ அதிகாரிகளுக்கு எதிராக நடவடிக்கை எடுப்பதா? அல்லது அந்த roadஐ cross பண்ணி பெருமளவு நீர் ஓடுகின்றது என்று தெரிந்தும் அந்த பஸ்ஸைத் தடுத்து நிறுத்தாத பொலிஸாருக்கு எதிராக வழக்குத் தாக்கல் செய்வதா? அல்லது நாட்டிலே இவ்வாறான பாரிய அனர்த்தம் ஏற்பட்டிருக்கின்ற வேளையில் யாழ்ப்பாணத்திலே இருக்கின்ற ஒரு நபரை - ஒரு குடும்பத் தலைவனை - நேர்முகத் தேர்வுக்காகக் கொழும்புக்கு அழைத்த அந்த வங்கி முகாமைத்துவம்மீது நடவடிக்கை எடுப்பதா? அல்லது இவற்றையெல்லாம் கட்டுப்படுத்துகின்ற அனர்த்த முகாமைத்துவத் திணைக்களத்தின்மீது நடவடிக்கை எடுப்பதா? என்பதை இந்தப் பாராளுமன்றமும் அரசாங்கமும் தீர்மானிக்க வேண்டும். ஏன் நான் இதைச் சொல்கிறேன் என்றால் பிழைகள், தவறுகள் நடந்திருக்கின்றன. அதுபோல் எதிர்காலத்திலே இவ்வாறான தவறுகள் ஏற்படாமல் இருப்பதற்காக நாங்கள் அனைவரும் ஒன்றிணைந்து பயணிக்க வேண்டுமென்பதை இங்கு கூறிக்கொள்ள விரும்புகிறேன்.

இந்தச் சந்தர்ப்பத்தில் எனது மாவட்டம் தொடர்பாக ஒரு முக்கியமான பிரச்சினையை இங்கே முன்வைக்கின்றேன். வவுனியா மாவட்டத்தில் 'கிவுல்ஓயா' நீர்த்தேக்கக் கருத்திட்டத்தை மீண்டும் ஆரம்பிப்பதற்கு நேற்று முன்தினம் அமைச்சரவை அங்கீகாரம் வழங்கியிருக்கின்றது. உங்களுக்குத் தெரியும், 1964-1968ஆம் ஆண்டுகளில் மகாவலி 'L' வலயத்தை அமைப்பதற்காக UNDP, FAO ஆகிய நிறுவனங்கள் இணைந்து ஒரு திட்டத்தைத் தயாரித்து, 1983ஆம் ஆண்டு அந்த மகாவலி 'L' வலயத்திலே சிங்கள மக்களைக் கொண்டுவந்து குடியமர்த்தினார்கள் என்பது. ஒரு பாரிய நீர்த்தேக்கத்தை அமைத்து, அவ்வாறு மகாவலித் தண்ணீரின் ஊடாகப் பாரியதொரு திட்டத்தைக்கொண்டு வந்தபோது, அந்தப் பிரதேசத்திலே வாழுகின்ற மக்களைக் குடியமர்த்தாமல், நாட்டினுடைய ஏனைய பகுதிகளில் இருந்த சிங்கள மக்களைக் கொண்டுவந்து குடியமர்த்தினார்கள். இவ்வாறு குடியமர்த்துவதற்காகவே அதற்கு "மகாவலி 'L' வலயம்" என்ற பெயர் சூட்டப்பட்டது. அப்போது அவர்களுக்குத் தெரியும், அந்தப் பிரதேசத்துக்கு மகாவலித் தண்ணீரைக் கொண்டுவர முடியாது என்பது. ஆனால், அந்த நேரத்திலே, 1983ஆம் ஆண்டு, குடியேற்ற நோக்கத்துக்காக, "NCP canalஇன் ஊடாக மகாவலித் தண்ணீரை வவுனியாவுக்குக் கொண்டு வருவோம்" என்று கூறி, வவுனியாவின் ஒரு பகுதியையும் முல்லைத்தீவின் ஒரு பகுதியையும் உள்ளடக்கி "மகாவலி 'L' வலயம்" என்று குறிப்பிட்டு 200,000 ஹெக்டயர் நிலத்தை அபகரித்து, அரசாங்கம் அங்கு குடியேற்றத்தைச் செய்தது.

1983ஆம் ஆண்டு குடியமர்த்தப்பட்ட மக்கள் இனம்பெருகி பல ஆயிரக்கணக்கான குடும்பங்கள் தற்போது அங்கு வாழ்ந்து வருகின்றனர். இப்பொழுது அவர்களுக்கு நீர்ப் பற்றாக்குறை இருக்கின்றது. அதனை மகாவலித் திட்டத்தின்மூலம் தீர்க்க முடியாது என்ற காரணத்தால், 2011ஆம் ஆண்டு 'கிவுல் ஓயா' திட்டத்தை அப்போதைய அரசாங்கம் அறிமுகப்படுத்தியது. ஒரு paper திட்டமாக - நடைமுறைக்கு வராத திட்டமாக - இருந்த இந்தத் திட்டத்தைத் தற்போதைய NPP அரசாங்கத்தினர் 2,500 மில்லியன் ரூபாயை இவ்வருடப் பாதீட்டில் ஒதுக்கி, மொத்தமாக 27,000 மில்லியன் ரூபாயைச் செலவழித்து நடைமுறைக்குக் கொண்டுவர எத்தனிக்கின்றார்கள். ஏற்கனவே அங்கேயிருக்கின்ற 700 ஹெக்டயர் நிலப்பரப்பில் இரண்டு போகம் செய்வதற்கான நீரைப் பெறுவதற்கும், புதிதாக 1,700 ஹெக்டயர் நிலத்தை வயல் நிலமாக மாற்றி, மீண்டும் குடியேற்றத்தைச் செய்வதற்குமான ஒரு திட்டமாக இந்த 'கிவுல் ஓயா' திட்டம் கொண்டுவரப்பட்டிருப்பதாக இந்தத் திட்ட முன்மொழிவில் சொல்லப்பட்டிருக்கின்றது.

இந்த 'கிவுல் ஓயா' திட்டத்தை நடைமுறைப்படுத்துவதாக இருந்தால், எங்களுடைய மாவட்டத்தில் பாரிய பிரச்சினைகள் ஏற்படும். அதாவது, 'கிவுல் ஓயா' திட்டத்தின் நீரேந்து பகுதி வவுனியா வடக்கு பிரதேச செயலாளர் பிரிவுக்குள்ளே வருகின்றது. அதற்காக 2021ஆம் ஆண்டு ஏற்கனவே மகாவலி 'L' வலயத்துக்கு ஒதுக்கப்பட்ட காணிகளுக்கு மேலதிகமாக 6,000 ஹெக்டயர் நிலப்பரப்பை வனவளத் திணைக்களம் மகாவலி அபிவிருத்தி அதிகார சபைக்கு விடுவித்துக் கொடுத்திருக்கின்றது. ஆனால், அங்கு பூர்வீகமாக வாழுகின்ற மக்கள் தங்களுடைய சொந்தக் காணிகளுக்குச் செல்வதற்கு வனவளத் திணைக்களம் தடை விதித்துள்ளது. 2014இல் Google Mapஇன் ஊடாகப் பிரகடனப்படுத்தப்பட்டு வன வளத் திணைக்களத்துக்குச் சொந்தமான காணி என்று சொல்லப்படுகின்ற மக்களுடைய சொந்த நிலத்தின் ஓர் ஏக்கர் காணியைக்கூட துப்புரவு செய்ய விடாத வனவளத் திணைக்களம், ஒருவரும் கைவைக்காத 13,000 ஏக்கர் காட்டை இந்த 'கிவுல் ஓயா' திட்டத்துக்காக வழங்கியிருக்கின்றது. ஆகவே, இங்கு பாகுபாடு பார்க்கப்படுகின்றது.

இந்த 'கிவுல் ஓயா' திட்டத்தின் நீரேந்து பகுதி, வவுனியா வடக்கில் பல பூர்வீக நிலங்களையும் குளங்களையும் வயல்களையும் ஆக்கிரமிக்க இருக்கின்றது. ஆனால், பயன்பெறப் போகின்றவர்கள் இந்தக் குடியேற்றவாசிகள். ஆகவே, எங்களுடைய வவுனியா, முல்லைத்தீவு மாவட்டத்தில் நீர்ப் பிரச்சினை உள்ளவர்களாக - அதிகளவு நீர் தேவைப்படுபவர்களாக - மகாவலி 'L' வலயத்தில் இருப்பவர்களை மாத்திரம் சொல்கின்றார்கள். அங்கு பூர்வீகமாக வாழுகின்ற மக்களுக்கு நீர் இல்லை; அதனைக் கவனிப்பதற்கு ஆட்கள் இல்லை. ஆகவே, நான் இந்த அரசாங்கத்திடம் சில கேள்விகளைக் கேட்க விரும்புகின்றேன்:

- ஜனாதிபதி தேர்தலில் நீங்கள் முன்வைத்த தேர்தல் அறிக்கையில் "இனப்பரம்பலை மாற்றும் செயற்பாடுகளுக்கு முற்றுப்புள்ளி வைக்கப்படும்" என்ற உங்கள் வாக்குறுதியை மீறுகின்றீர்களா?
- எண்ணிக்கையில் சிறுபான்மையாக இருக்கும் மக்களின் வாழ்வுரிமையைப் பறிக்க கடந்த அரசாங்கங்கள் எடுத்த நடவடிக்கைகளை நீங்களும் தொடர விரும்புகிறீர்களா?
- நாட்டின் உற்பத்திப் பொருளாதாரத்தில் சிறுபான்மை மக்களின் பங்களிப்பு வேண்டாமென எண்ணுகிறீர்களா?
- பாரிய நீர்ப்பாசனத் திட்டங்களை நடைமுறை ப்படுத்தும்போது சிறுபான்மை மக்கள் புறக்கணிக்கப் படுவதையும் சிங்கள மக்கள் மட்டும் அங்கு குடியேற்றப்படுவதையும் நீங்களும் தொடர விரும்புகிறீர்களா?

[ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා]

- இந்த நாட்டில் இனவாதம், மதவாதம், ஊழல் இல்லாத ஓர் ஆட்சியை நீங்கள் கொண்டுவருவீர்கள் என்ற எங்களுடைய நம்பிக்கையை நீங்கள் வீணடிக்கப் போகின்றீர்களா?

இந்தக் கேள்விகளைக் கேட்டுக்கொண்டு, 'கிவுல் ஓயா' திட்டம் சம்பந்தமான ஆவணத்தையும் நான் சபைக்குச் ***சமர்ப்பிக்கின்றேன்**. நன்றி!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු ෆස්මින් ෂරීෆ් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි අටක කාලයක් ලැබෙනවා.

[பி.ப. 4.29]

**ගරු ෆස්මින් ෂරීෆ් මහතා**
(மாண்புமிகு பஸ்மின் ஷரீப்)
(The Hon. Fasmin Sharif)
බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

உண்மையில், 1974ஆம் ஆண்டுக்குப் பிறகு ஏற்பட்ட இயற்கை அனர்த்தங்களில் 'தித்வா' புயலால் மோசமாகப் பாதிக்கப்பட்ட ஒரு பிரதேசமாக கம்பளை விளங்குகின்றது. பொருளாதார ரீதியாக மிகுந்த வலிமையுடன் முன்னேற்றமடைந்திருந்த கம்பளைப் பிரதேசம், 'தித்வா' புயலால் கடுமையாகச் சேதமடைந்து, அழிவுக்குட்பட்டு, பொருளாதார ரீதியாகப் பாதிக்கப்பட்டபோதிலும், இலங்கையில் வாழும் அனைத்து இனத்தவரின் உதவியினால் இன்று மீண்டும் எழுச்சிபெற்று, அங்கு மக்கள் உயிர்வாழ்ந்து கொண்டிருப்பது உங்களுக்குத் தெரியும். அப்படியாக உதவி செய்த அவர்களுக்கு நாங்கள் நன்றி சொல்லக் கடமைப்பட்டுள்ளோம். ஜஸாக்கல்லாஹு ஹைர்!

முக்கியமாக, ஸ்ரீ லங்கா ஜமாஅத்தே இஸ்லாமி, ஸ்ரீ லங்கா தௌஹீத் ஜமாஅத், ஸ்ரீ லங்கா ஜமாஅத்-இ-இஸ்லாமி, நபவிய்யா இஸ்லாமிய இளைஞர் இயக்கம் மற்றும் இலங்கையில் இருக்கக்கூடிய NGOs உட்பட அனைத்து மக்களும் எங்களுக்கு உதவி செய்தார்கள். அனைத்து இனத்தவர்களும் குறிப்பாக, சிங்களவர், தமிழர், கிறிஸ்தவர் என அனைவரும் உதவி செய்தார்கள். அதாவது, வடக்கு, கிழக்கில் வாழக்கூடிய மக்கள் உட்பட இலங்கையில் வாழக்கூடிய அனைத்து மக்களும் உதவி செய்தார்கள். அதேபோன்று, பன்சலைகள், பள்ளிகள், கோவில்கள், churches என அனைத்து மதத் தலங்களும் உதவி செய்ததன் மூலம்தான் எங்கள் கம்பளைப் பிரதேசத்தை மீண்டும் கட்டியெழுப்பக்கூடியதாக இருந்தது.

அதேபோன்று, முக்கியமான விடயம் ஒன்றை இங்கே குறிப்பிட வேண்டும். எங்கள் கம்பளைப் பிரதேசத்தைப் பிரதிநிதித்துவப்படுத்தக்கூடிய பாராளுமன்ற உறுப்பினர் ஒருவர், நாங்கள் கம்பளையில் எதனையும் செய்யவில்லை என்று பாரியதொரு குற்றச்சாட்டை இங்கே முன்வைத்தார். அதுபற்றி நாங்கள் பல இடங்களில் அரசியல் ரீதியாகப் பல பதில் உரைகள்மூலம் விளக்கமளித்ததுடன், முன்னைய பாராளுமன்ற அமர்வுகளிலும் பேசினோம். அது சம்பந்தமாகச் சில YouTubers, குறிப்பாக எதிர்க்கட்சியினுடைய பணத்துக்கு அடிமையாகக்கூடிய சில YouTubers என் மீதும் கௌரவ உறுப்பினர் முஹம்மட் பைசல் அவர்கள் மீதும் பாரியதொரு குற்றச்சாட்டை முன்வைத்தார்கள். அந்தக் குற்றச்சாட்டில் உண்மை இல்லை என்பதை நான் இங்கு சொல்லிக்கொள்ள வேண்டும். அத்துடன், உண்மையிலே எமக்கு உதவியவர்களுக்காக நான் இந்தச் சபையிலும் வெளி இடங்களிலும் நன்றி சொல்லியிருக்கின்றேன்; நன்றி சொல்லக் கடமைப்பட்டும் இருக்கின்றேன்.

ඒ වාගේම මම තව කාරණයක් කියන්න ඕනෑ. දෙමළ ජනතාව දෙවියන්ට දෙන පොංගල් ගැන වැරදි අවබෝධයක් ඇති වන විධියට වැරදි තොරතුරක්, ඇත්තටම කිව්වොත් කුණුහරුපයක් කියලා ඊයේ මෙතැනදී මන්ත්‍රීතුමෙක් යම් ප්‍රකාශයක් කළා. කුණුහරුපෙන් කිව්වා, දෙමළ ජනතාව ජනාධිපතිතුමාට මොනවාද දුන්නා කියලා. ඒ වචනය මට මෙතැන කියාගන්න බැහැ. මම කියන්න ඕනෑ, අපේ ජනාධිපතිතුමා ගැන. ඇත්තටම දෙමළ ජනතාව එතුමා ගැන ගෞරවයෙන් තමයි ඉන්නේ. එදා අපේ ජනාධිපතිතුමා පොංගල් උත්සවයට යාපනයේ ගිහිල්ලා පවත්වපු රැස්වීමට දහස් ගණන් දෙමළ ජනතාව සහභාගි වුණා. ඔවුන් ජනාධිපතිතුමාත් එක්ක ෆොටෝ ගන්න පොරකෑවේ කොහොමද කියලා අපි දැක්කා. ගම්පොල ප්‍රදේශයට විරුද්ධ පක්ෂයේ නායකතුමා ආවා. එතැන ෆොටෝ ගන්න කී දෙනෙක්ද හිටියේ? අන්තිමට එතුමා සෙල්ෆි ගැහුවා. එක තැනකට යන්න කිව්වාම මොනවාද කිව්වේ? මට වමනය යනවා, ඔළුවේ කැක්කුමයි කියලා හැරිලා ආවා.

චමින්ද්‍රාණි කිරිඇල්ල මන්ත්‍රීතුමියත් නුවර දිස්ත්‍රික්කය ගැන වැරදි තොරතුරු ටිකක් අද ලබා දුන්නා. අපි සියයට 60කට සල්ලි දීලා තිබෙනවා කිව්වා. අපි රුපියල් 50,000, රුපියල් 25,000 සියයට 90ක්, 95ක් නොවෙයි, මම දන්නා විධියට අද වනකොට සියයට 98කට විතර දීලා තිබෙනවා කියලා වගකීමෙන් කියන්න පුළුවන්. ඒ මන්ත්‍රීතුමිය ඇත්තටම කිසිම දෙයක් දන්නේ නැතුව තමයි කථා කළේ. එතුමිය චතුරංග අබේසිංහ නියෝජ්‍ය ඇමතිතුමා ගැනත් කිව්වා. පුතා නියෝජ්‍ය ඇමති, තාත්තා කැබිනට් ඇමති කියලා කිව්වා. ඒකවත් දන්නේ නැති, මොනවත් දන්නේ නැති කෙනෙක් තමයි එතුමිය. එතුමිය ජනතා ඡන්දයෙන් පත් වුණා කිව්වා. ඇත්තටම, ජනතා ඡන්දයෙන් තමයි එතුමිය පත් වුණේ. එතුමියගේ මනාප කීයද කියලා එළියට කියාගන්න බැහැ. මම හිතන විධියට මෙතැන ඉන්න අපේ 159දෙනාම එතුමියට වඩා දහස් ගණන් ඡන්ද අරගෙන තමයි මහජන නියෝජිතයින් වශයෙන් පත් වෙලා ඉන්නේ. ඒ අය ඡන්ද ගත්තේ කොහොමද කියලා අපට වගකීමෙන් කියන්න පුළුවන්.

ඒ වාගේම ගම්පොල ප්‍රදේශයේ තවත් මන්ත්‍රී කෙනෙක් කථා කළා. ජනතාව වෙනුවෙන් කථා කරනවාට වඩා එතුමා කථා කළේ අම්බුලුවාව ගැන විතරයි. එතුමාගේ හිතේ තිබ්බේ අම්බුලුවාව ගැන විතරයි. ඒ වාගේම අද අම්බුලුවාව ගැන විතරයි හුඟක් අය කථා කළේ. එතුමා කිව්වා, අම්බුලුවාවෙන් අපට ඩොලරයක්වත් ගේන්න බැරි වෙයි කියලා. අපි අනිවාර්යයෙන්ම ඒක රජයට පවරා ගන්නවා. පවරා ගන්නවා විතරක් නොවෙයි, ඒකෙන් එන ආදායමෙන් ජනතාව වෙනුවෙන් ඉදිරියටත් වියදම් කරනවා. ඒ වාගේම එතුමා ගෙනාවා වාගේ දහ ගුණයක් වැඩියෙන් අපි ඩොලර් ගේනවා. අම්බුලුවාව සංවර්ධනය කරලා ජනතාව වෙනුවෙන් ඒ වැඩ කටයුතු ටික අපි කරනවා. ඒ වාගේම කිව්වා, අම්බුලුවාව හින්දා කිසිම හානියක් නැහැ කියලා. අම්බුලුවාව කන්ද පාමුල තිබෙන ගමේ ගෙවල් 20ක්, 25ක් අද ඉවත් කරන්න වෙලා තිබෙනවා. ඒක ගැන ඒ මන්ත්‍රීතුමා මොනවාද කියන්නේ කියලා අපට හිතාගන්න බැහැ.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ඒ වාගේම මම තව දෙයක් කියන්න ඕනෑ. ගම්පොල නගරය ගැන ඇත්තටම අපි කථා කළොත්, අද වනකොට අපි මැදිහත් වෙලා සැහෙන ප්‍රමාණයක් -සියයට 90ක් විතර- එම ප්‍රදේශයේ තිබුණු කුණු අයින් කරලා තිබෙනවා. ඒත් තව සියයට 10ක් විතර කුණු ඉතිරිව තිබෙනවා. මම අද දිස්ත්‍රික් කොමසාරිස්තුමියටත් call එකක් දීලා මේ ගැන විස්තර කිව්වා. මොකද, සමහර කානුවල තිබෙන කුණු තවම අයින් කරලා නැහැ. ඒ තැන්වල කුණු ටික තවම ඒ විධියටම තමයි තිබෙන්නේ.

ඇත්තටම කියන්න ඕනෑ, මොනවා කිව්වත් අපේ ඉරුක නගරාධිපතිතුමා අපිත් එක්ක එකතු වෙලා වැඩ කළ බව. එතුමාට අපි ස්තුති කරන්න ඕනෑ. හැබැයි, උඩපළාත ප්‍රාදේශීය සභාවේ සභාපතිතුමා ඒ ප්‍රාදේශීය සභාව දවස් 5ක් වහලා තිබුණා. ඒ සම්බන්ධව කථාවකුත් යනවා. එතුමා ගැන inquiry එකකුත් තිබෙනවා. ඒ වුණත් ඒවාත් දැන් වැඩ ටික කරගෙන යනවා. ගම්පොල තව වැඩ ටිකක් ඇත්තටම තිබෙනවා. ඇත්තටම කියනවා නම්, සජබ පාලනය තිබෙන සභා දෙකක් වුණත් අපි ඇත්තටම ඒ අයට හුඟක් උදව් කළා. ඒ උදව්වට ඒ නගරාධිපතිතුමා අපට ස්තුති කරලා තිබුණා. ඒ වාගේම මම කියන්න ඕනෑ, ලංකාවේ ඉන්න සියලුදෙනා අපට උදවු කළා කියන කාරණය.

නමුත් රජය වශයෙන් අපි මොනවත් කරලා නැහැ කියනවා. ඇත්තටම කියනවා නම්, අපි ගෙවල් හෝදාගන්න රුපියල් 25,000ක් දුන්නා. ගෙවල්වල මූලික බඩු ගන්න රුපියල් 50,000ක් දුන්නා. එළුවා නැති වුණත් සල්ලි දුන්නා. කුකුළා නැති වුණත් සල්ලි දුන්නා. ඒ වාගේම ව්‍යාපාරිකයින්ටත් අපි රුපියල් ලක්ෂ 2 බැගින් ලබා දෙන්න කටයුතු කරනවා. ඒ වාගේම සම්පූර්ණ හානි වූ ගෙයකට රුපියල් ලක්ෂ 50ක් දෙනවා. අර්ධ හානි වූ ගෙයකට රුපියල් ලක්ෂ 5ක් දෙනවා. ඉදිරියේදී ඒ සියලු වැඩකටයුතු කරන්න අපි බලාපොරොත්තු වනවා. ඇත්තටම අපි සමහර තැන්වල පක්ෂ, පාටවත් බැලුවේ නැහැ. අපි ජනතාව වෙනුවෙන් පෙනී හිටපු එක තමයි ඇත්තටම කළේ. ඇත්තවශයෙන්ම කියනවා නම්, අපි කාටවත් ඇඟිලි දිගු කළේ නැහැ. නමුත් වැරදි තොරතුරු මෙතැනට අරගෙන ඇවිල්ලා, ඒ නිලධාරින් එහෙම කිව්වා, මෙහෙම කිව්වා කියලා කියන්න බැහැ. යම් මන්ත්‍රීතුමියක වුණත්, මන්ත්‍රීතුමෙකු වුණත් වගකීමෙන් මෙතැන ඒ ගැන ප්‍රකාශ කරන්න ඕනෑ. ජනතාවට පේන්න මෙතැන මහ වීරයෝ වාගේ කථා කරමින් වැරදි තොරතුරු පාර්ලිමේන්තුවේදී කියනවා.

**ගරු නීතිඥ චමින්ද්‍රානී කිරිඇල්ල මහත්මිය**
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) சமிந்திராணி கிரிஎல்லே)
(The Hon. (Mrs.) Chamindranee Kiriella, Attorney-at-Law)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමිය.

**ගරු නීතිඥ චමින්ද්‍රානී කිරිඇල්ල මහත්මිය**
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) சமிந்திராணி கிரிஎல்லே)
(The Hon. (Mrs.) Chamindranee Kiriella, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙතුමා මගේ නම සඳහන් කළා. මම කියන්න කැමැතියි, මගේ කථාවේ කිව්ව විධියට ඊයේ මගේ කාර්යාලයෙන් දිසාපති කාර්යාලයට ගිහිල්ලා තමයි මට මේ තොරතුරු ලබා දුන්නේ කියන එක. මම ඒවා සභාගත කළා. මොකද, මෙතැනට ඇවිල්ලා අසත්‍ය තොරතුරු ඉදිරිපත් කරනවා නම්, මම ඒවා මෙතැන සභාගත කරන්නේ නැහැ නේ. මට එහෙම අසත්‍ය තොරතුරු සභාගත කරන්න අවශ්‍යතාවක් නැහැ. අපට දුන් තොරතුරු තමයි මම සභාගත කළේ. මම දන්නේ නැහැ, දිසාපති කාර්යාලය උපදෙස් දීලා තිබෙනවාද කියලා විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට වැරදි documents ටිකක් දෙන්න කියලා.

ඒ වාගේම මෙතුමා මගේ ඡන්ද සංඛ්‍යාව ගැනත් කිව්වා. මම හිතන විධියට, එතුමාට කිසිම අයිතියක් නැහැ, ඒ ගැන කථා කරන්න. මොකද, මට ඡන්දය දුන් ජනතාව හෑල්ලු කිරීමක් තමයි මෙතුමා කරන්නේ. මෙතුමාත් ගම්පොල නියෝජනය කරන මන්ත්‍රීවරයෙක්. එතුමාට මට වැඩිය වැඩි ඡන්ද ලැබුණා කියලා එතුමාට මට වැඩිය වටිනාකමක් තිබෙනවා කියලා මම හිතන්නේ නැහැ. අපි බලමු, ඊළඟ මැතිවරණය. මොකද මම හිතන්නේ නැහැ, මෙතැනට ආපු භාගයකටවත් ඊළඟ මැතිවරණයේදී ඔය ලබා ගත් ඡන්දවලින් සියයට 5ක්වත් ලබා ගන්න පුළුවන් කියලා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
හොඳයි, ගරු මන්ත්‍රීතුමිය කාරණය පැහැදිලියි.

**ගරු ෆස්මින් ෂරීෆ් මහතා**
(மாண்புமிகு பஸ்மின் ஷரீப்)
(The Hon. Fasmin Sharif)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ලබන මැතිවරණයේදී ඇත්තටම කවුද එන්නේ කියලා බලාගන්න පුළුවන්. එතකොට, චතුරංග අබේසිංහ නියෝජ්‍ය ඇමතිතුමාගේ තාත්තාත් කැබිනට් ඇමති කියලා මේ රජයේ නිලධාරින්ද ඇත්තටම එතුමියට තොරතුරු ලබා දීලා තිබෙන්නේ? මෙතැන ඕනෑකමින් මේ වාගේ ප්‍රකාශ කරලා රජය අපහසුතාවට පත් කරන්න එපා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ජේ.සී. අලවතුවල මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 4.39]

**ගරු ජේ.සී. අලවතුවල මහතා**
(மாண்புமிகு ஜே.சீ. அலவத்துவல)
(The Hon. J.C. Alawathuwala)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද මේ විවාදය කරන්නේ ඇත්තටම අපේ රටේ වෙච්ච ව්‍යසනයක් ගැන. ඉතින් මෙහිදී ජනතාවට කරපු කාර්යයන් මොනවාද කියලා ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන් තමන් කරපු වැඩ ටික කියන්න ඕනෑ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හැබැයි දැන් අපි දැක්කේ මොකක්ද? ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීතුමන්ලාගෙන් කථා කරපු ගොඩක් දෙනෙක්, මන්ත්‍රීවරුන් විතරක් නොවෙයි, ඇමතිවරුනුත් මේ ව්‍යසනය තුළ තමන් කරපු කාර්යයන් පිළිබඳව නොවෙයි කිව්වේ. එතුමන්ලා විපක්ෂයට චෝදනා කරනවා; නොයෙකුත් දේවල් කියනවා. මට පෙනෙන විධියට ආණ්ඩු පක්ෂය තවම ඉන්නේ විපක්ෂයේද? ඒක තමයි අපට අහන්න තිබෙන්නේ. ආණ්ඩුවක් හැටියට තමුන්නාන්සේලා වැඩකටයුතු ගණනාවක් ඉෂ්ට කළා නම්, ඒ වැඩ ටික කියන්න, මෙන්න මේ වැඩ අපි කළා, මේ ටික අපි ලබා දුන්නා කියලා. ඒක නේ, අවශ්‍ය වෙන්නේ. ආණ්ඩු පක්ෂයේ කිහිපදෙනෙක් ඇරෙන්න මන්ත්‍රීවරුන් වැඩි දෙනෙක් අද කථා කළේ මොනවාද? ඒ සියලුදෙනාම කථා කළේ විපක්ෂයේ නොයෙකුත් දේවල් ගැන. එක මන්ත්‍රීවරයෙක් කිව්වා, -මම හිතන විධියට නියෝජ්‍ය ඇමතිවරයෙක්- විපක්ෂ නායකතුමා ගිහිල්ලා අරහෙන් අරන් මෙහෙන් දෙනවා කියලා.

[ගරු ජේ.සී. අලවතුවල මහතා]

මම මේ කාරණය කියන්න ඕනෑ. මම මේවා ගැන සඳහන් කරන්න නොවෙයි හිටියේ. නමුත්, මේ ගැන පැහැදිලිවම මම කියන්න ඕනෑ. අරහෙන් අරන් මෙහෙන් දෙන එක කොහේටද දුන්නේ කියන එක පැහැදිලිව කියන්න ඕනෑ. මේ අයට මේ වාගේ දෙයක්වත් අගය කරන්න බැරි නම්, කුහකත්වය නම් තිබෙන්නේ, ඇත්තටම ඒ ගැන කියන්නත් කනගාටුයි.

"දිට්වා" සුළි කුණාටුව හේතුවෙන් ඇති වූ ගංවතුර තත්ත්වයට අහු වුණු රෝහල් ගැන බලන්න. විශේෂයෙන්ම පුත්තලම රෝහලට, නාත්තන්ඩිය රෝහලට, මාරවිල රෝහලට සහ හලාවත රෝහලට විපක්ෂ නායකතුමා රුපියල් ලක්ෂ 46ක් වටිනා වෛද්‍ය උපකරණ ගිහිල්ලා දුන්නා. හලාවත මූලික රෝහලට මේ ආපදා තත්ත්වය හේතුවෙන් රුපියල් කෝටි ගණනක හානියක් සිද්ධ වුණා. අපි දැන් ආණ්ඩුවෙන් අහනවා, මේ වනකල් මොනවාද කරලා තිබෙන්නේ කියලා. සෞඛ්‍ය අමාත්‍යාංශය තිබෙනවා. ඒ වාගේම එතුමා මාරවිල මූලික රෝහලට රුපියල් ලක්ෂ 46ක් වටිනා උපකරණ ලබා දුන්නා.

ගම්පොල රෝහල කියන්නේත් විශාල වශයෙන් හානියට පත් වුණු රෝහලක්. ගම්පොල මන්ත්‍රීවරයෙකු තමයි කලින් කථා කළේ. එතුමා මොකක්ද කියන්නේ? එතුමා කියනවා, කුණු ටික ඇදලා නැහැ කියලා. එතුමා කුහකත්වයෙන් කථා කරන්නේ. මොකද, නගර සභාවේ බලය තිබෙන්නේ සමගි ජන බලවේගයට. නගරාධිපතිතුමා පාන්දර 3.00ටත් ගිහිල්ලා ජනතාවගේ ප්‍රශ්න විසඳා තිබෙනවා. එහෙනම් ඇයි, මෙහෙම කථා කරන්නේ? ඒ තත්ත්වය තුළ මෙතුමන්ලාට මේ කිසි දෙයක් ගන්න බැහැ. තමන් කරපු කාර්යය කියනවා වෙනුවට එතුමන්ලා අද ඇවිල්ලා විපක්ෂයට චෝදනා කරනවා.

විශේෂයෙන්ම විපක්ෂ නායකතුමා ඉතාම හොඳ වැඩසටහනක් තමයි ඒ ආපදා අවස්ථාවේදී ක්‍රියාත්මක කළේ. ඒ වැඩසටහන යටතේ එතුමා ගම්පොල රෝහලට රුපියල් ලක්ෂ 46ක් ලබා දුන්නා. ඒ වාගේම මහනුවර රෝහල, දඹදෙණිය මූලික රෝහල, කෑගල්ල රෝහල, මාවනැල්ල රෝහල, පොළොන්නරුව මහ රෝහල, කලාවැව රෝහල, නුවරවැව ප්‍රදේශය ආශ්‍රිත රෝහල, කොලොන්න මූලික රෝහල සහ යටියන්තොට රෝහල කියන මේ හැම රෝහලකටම අවශ්‍ය උපකරණ එතුමා ලබා දුන්නා. එතුමා "හුස්ම" කියන වැඩසටහන යටතේ විශේෂයෙන්ම සුළි කුණාටුව හේතුවෙන් හානි වුණු එක රෝහලකට රුපියල් ලක්ෂ 46කට වඩා ලබා දී තිබෙනවා. ඒක විශාල මුදලක්. දැන් මේ වාගේ දේවල්වලට මොකක්ද කියන්නේ? එතැනින් අරගෙන මෙතැනට දෙනවා කියලා නියෝජ්‍ය ඇමතිවරයෙකු කිව්වා. ලජ්ජා වෙන්න ඕනෑ, එතුමා එහෙම කථා කරපු එක ගැන. එතුමන්ලා සතුටු වෙන්න ඕනෑ, මෙවැනි ව්‍යසනයක් තුළ විපක්ෂයක් හැටියට අපි මේ ආකාරයෙන් කටයුතු කිරීම ගැන. මේවා රජයේ මුදල් නොවෙයි. ජනතාව එකතු කරගෙන, ව්‍යාපාරිකයින් එකතු කරගෙන මෙවැනි සහයෝගී වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කළ එක ගැන මේ අය සතුටු වෙන්න ඕනෑ. මේ අයට යන්න බැරි වුණු තැන්වලට අපි ගිහිල්ලා ඒ ජනතාව වෙනුවෙන් අවශ්‍ය දේවල් ලබා දුන්නා.

සමහර ගම්වල කිසිම සන්නිවේදන පහසුකමක් තිබුණේ නැහැ. කුරුණෑගල දිස්ත්‍රික්කයේ දොඩන්ගස්ලන්ද, මාවතගම ප්‍රදේශවල දින කිහිපයක් යනකල් පාරවල්වල යන්න බැරි වුණා. ඒ තැන්වලට අපි ගිහිල්ලා ඒ ජනතාවට අවශ්‍ය ආහාර පාන වාගේම අවශ්‍ය සහයෝගය ලබා දුන්නා. මේවා අපි Facebook එකේ දමන්නේ නැහැ. අපි Facebook එකෙන් දේශපාලනය කරන්නේ නැති බව මතක තබා ගන්න. ලජ්ජා නැතුව මෙතැන ඇවිල්ලා කථා කරනවා. සමහර අය ජනතාව ළඟට ගියාම එළවන හැටි අපි දැක්කා නේ. ඒ, අනුන්ගේ දේවල් තමන්ගේ කියලා පෙන්වන්න ගිහිල්ලා. මෙතැන තිබෙන්නේ තමුන්නාන්සේලාට විපක්ෂයට ඇඟිල්ල දිගු කරන්න නොවෙයි, මෙවැනි ව්‍යසනයක් වුණාම ආණ්ඩුවක් හැටියට ගත යුතු ක්‍රියාමාර්ග අරගෙන ඒවා ඉෂ්ට කරන්න.

ඒ ගරු මන්ත්‍රීතුමාම කියනවා, මේ සුළි කුණාටුව එනකොට කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව නිවේදන ගණනාවක් නිකුත් කළා ලු. කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව නිවේදන ගණනාවක් නිකුත් කළා කියලා අපි කවුරුත් දන්නවා. නමුත්, සුළි කුණාටුව මෙවැනි ව්‍යසන තත්ත්වයක් දක්වා ගමන් කරනවා කියලා ජාත්‍යන්තර මාධ්‍ය තුළින් නොවැම්බර් 25වැනි දාට ඉස්සෙල්ලා කිව්වා. ඒ ගැන BBC එක වාගේම CNN එක කිව්වා. මිලිමීටර් 400ක, 500ක වර්ෂාපතනයක් ලැබෙනවා කියාත් ඒ අය පැහැදිලිව කිව්වා. අපි දන්නවා, ඊට දවස් දෙකකට කලින් කොත්මලේ ජලාශයේ ජල කළමනාකරණය කළා නම් මෙවැනි ජීවිත හානි, ඒ වාගේම දේපළ හානි සිද්ධ වෙන්නේ නැහැ කියලා. දැදුරු ඔය ජලාශයේ වාන් දොරටු නොවැම්බර් 27වැනි දාත් පහුවෙලා තමයි විවෘත කළේ. ඒ හේතුවෙන් නිකවැරටිය සිට පුත්තලම දිස්ත්‍රික්කය දක්වා විශාල විනාශයක් සිදු වුණා. එහෙනම් මේවා සම්බන්ධයෙන් සොයා බලන්න ඕනෑ. අපෙන් මොකක්වත් වැරැද්දක් වුණේ නැහැ කියලා නේ කියන්න හදන්නේ. නමුත්, කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව පැහැදිලිව කියනවා, ඒ අය මේ ගැන කලින් දැනුම් දුන්නා කියලා. නමුත්, රජය ඒකට අවශ්‍ය පියවර ගත්තේ නැතුව වෙනත් දේශපාලන කටයුතුවල නියැළිලා හිටියා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කථා කරන්න හිටපු කාරණාවලට වඩා වෙනස්ම කාරණා පිළිබඳව තමයි මට අද කථා කරන්න සිද්ධ වුණේ. මේ අවස්ථාවේදී මම පැහැදිලිව කියනවා, ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීතුමන්ලා අද මෙතැනට ඇවිල්ලා, අවුරුදු ගණනාවක් ඒ අය කළා වාගේම විපක්ෂයට චෝදනා කරමින් ආණ්ඩු පක්ෂයක් විධියට නොවෙයි හැසිරෙන්නේ විපක්ෂයක් හැටියටයි කියන එක. ජනතාවට සිදු වෙලා තිබෙන මේ හානි සම්බන්ධයෙන් රුපියල් ලක්ෂ ගණනක් දෙනවා කියලා ජනාධිපතිතුමා මෙතැනට ඇවිල්ලා පොරොන්දු ගණනාවක් ලබා දුන්නා. එම නිසා ඒ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්න, ඒ ගැන කථා කරන්න කියලා යෝජනා කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු (වෛද්‍ය) මධුර සෙනෙවිරත්න නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 4.46]

**ගරු (වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා (අධ්‍යාපන සහ උසස් අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) மதுர செனெவிரத்ன - கல்வி, உயர் கல்விப் பிரதி அமைச்சர்)
(The Hon. (Dr.) Madhura Senevirathna - Deputy Minister of Education and Higher Education)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "දිට්වා" සුළි කුණාටුවත් එක්ක රටේ ජන ජීවිතයට දැඩි ලෙස හානි සිදු වෙලා, මිලියන 2.2කට අධික ජනතාවක් පීඩාවට පත් වෙලා සිටිනවා. මේ ආපදාවෙන් අපේ රටට ලොකු හානියක් සිදු වුණා. ඒ ආපදා තත්ත්වය සම්බන්ධයෙන් අද පවත්වන විවාදයේදී සභාවේ මතු වෙච්ච යම්කිසි කාරණා කිහිපයකට මුලින්ම උත්තර දීලා

හිටියොත් හොඳයි කියලා මට හිතෙනවා. මේ ආපදාවට කලින් සූදානම් වීම සම්බන්ධයෙන් අපට යම්කිසි කථා ටිකක් විපක්ෂය පැත්තෙන් නැඟෙනවා. අපි මේ සුළි කුණාටුවෙන් පස්සේ ප්‍රාමාණික විද්වතුන් එක්ක සාකච්ඡා වට කිහිපයක් පැවැත්වූවා, මොකක්ද මේ වුණේ කියලා ලිහා ගන්න. එහිදී මතු වෙච්ච කාරණාවලින් එකක් තමයි, නිසි ඉඩම් පරිහරණ සැලැස්මක්, ප්‍රතිපත්තියක් තිබුණා ද කියන එක. ඊට පස්සේ ඉහළ කඳුකර ප්‍රදේශවල ජනාවාස ඉදිකිරීම, පස නිරාවරණය වීම, ජල ප්‍රවාහයන් වසා දැමීම යනාදී ප්‍රධාන කාරණා තුනක් මතු වුණා. මෙන්න මේ කාරණාත් එක්ක තමයි මේ නාය යෑම් වර්ධනය වෙන්නේ. නිසි ඉඩම් පරිහරණ සැලැස්මක් නැතුව දීර්ඝ කාලීන පෙර සූදානම් වීමක් ගැන අපිට චෝදනා කරනවා. අපි කියනවා, ඉදිරියට සිදු කරන සියලු පදිංචි කිරීම්, නැවත පදිංචි කිරීම් සියල්ල සිද්ධ කරන්නේත්, හැම ගෙයක්ම හදන්නේත් නිසි ඉඩම් පරිහරණ සැලැස්මක් අනුව නැවත නාය යෑම් නොවන ප්‍රදේශවලයි කියන එක.

ඒ වාගේම ආපදා සහන ලබා දීම් සම්බන්ධයෙන් අපට ජාත්‍යන්තර වශයෙන් ලොකු විශ්වාසයක් හැදිලා තිබෙනවා. අපට cash buffer for disaster recovery තිබෙනවා; අතිරික්ත අරමුදලක් තිබුණා. ඒ නිසා තමයි අපට ණය ගන්නේ නැතුව, ජනතාවගේ බදු මුදල් වැඩි කරන්නේ නැතුව රුපියල් බිලියන 5,000ක් මේ වෙනුවෙන් යොදා ගන්න පුළුවන් වුණේ. මෙන්න මේවා තමයි පෙර සූදානම්. මේවා තමයි අපි ජනතාවට කියන්නේ. පොඩ්ඩක් මේ ගැන කල්පනා කරලා බලන්න. මේවා තමයි අපිට තිබුණු සැලසුම්. වෙනස් වන කාලගුණයත් එක්ක අපි මෙතැනින් ඉස්සරහට යන්නේ කොහොමද කියලා ප්‍රතිපත්තිමය තීරණ ගත යුතුයි. නමුත්, එහෙම තත්ත්වයක් අපි දැක්කේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අධ්‍යාපන ක්ෂේත්‍රය ගත්තොත්, මේ ආපදා තත්ත්වය හේතුවෙන් අපේ රටේ පාසල්වලින් සියයට 16කට හානි සිදු වෙලා තිබෙනවා. ඒ කියන්නේ, පාසල් 1,682ක්. මේ පාසල්වලින්, පාසල් 137ක් දැඩි හානියට පත් වෙලා තිබෙනවා. ඒ පාසල්වලින් වැඩි හරියක් තිබෙන්නේ මධ්‍යම සහ ඌව පළාත්වල. සිසුන් 822,000ක විතර ප්‍රමාණයකුත්, ගුරුවරු සහ අනෙකුත් කාර්ය මණ්ඩලය 48,700 ගණනකුත් මේ නිසා පීඩාවට පත් වෙලා ඉන්නවා. ඒක විශාල ප්‍රමාණයක්. ඒ වාගේම මේ ආපදා තත්ත්වය නිසා පෙර පාසල් 2,700ක් විතර ප්‍රමාණයකට හානි වෙලා තිබෙනවා; ඒ කියන්නේ, ලංකාවේ පෙර පාසල්වලින් සියයට 15ක්, සියයට 20ක් විතර ප්‍රමාණයක්. මේ ආපදා තත්ත්වය නිසා අපේ අධ්‍යාපන ක්ෂේත්‍රය එවැනි තත්ත්වයකට තමයි පත් වුණේ. මේ ආපදා තත්ත්වයත් එක්ක අපිට ලොකු අරගළයක් කරන්න සිදු වුණා. උසස් පෙළ විභාගය පැවැත්වෙන අතරතුර තමයි, මේ "දිට්වා" සුළි කුණාටුව ආවේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි මේ සැලසුම් හදන්නේ ක්ෂණිකවයි. ඒවාට විසඳුම් හදන්නේ මධ්‍ය කාලීන හා දීර්ඝ කාලීන සැලසුම් විධියටයි. එහෙම තමයි අපි සැලසුම් හදන්නේ. මුලින්ම අපි සැලසුම් කළේ ශිෂ්‍යයින්ට ඉගෙනුම් අඛණ්ඩව පවත්වා ගෙන යන්න රුපියල් 15,000 සිට රුපියල් 25,000ක් දක්වා මුදලක් ලබා දීමයි. ඊළඟට, ව්‍යසනයකදී කටයුතු කළ යුතු ආකාරය සම්බන්ධව සිසුන් දැනුවත් කළා. ඒ වාගේම ශිෂ්‍යයින්ට අඛණ්ඩව අධ්‍යාපනය ලබන්න හැකි පරිදි සුරක්ෂා මධ්‍යස්ථානවල පවා අධ්‍යාපනය ලබන්න අවස්ථාව ලැබුණා. ප්‍රවාහන පහසුකම් නැති ශිෂ්‍යයින්ට ළඟම තිබෙන පාසලට ගිහිල්ලා අධ්‍යාපනය ලබන්න මේ තුළින් අවස්ථාව ලැබුණා.

ගුරුවරුන්ට සහ අනෙකුත් කාර්ය මණ්ඩලයට ළඟම තිබෙන තැන්වලට යන්න පුළුවන් වුණා. මේවාත් එක්ක තමයි ආපදාවලට ලක් වෙච්ච ශිෂ්‍යයන්ට සහ ගුරුවරුන්ට, අනෙකුත් කාර්ය මණ්ඩලයට කෙටි කාලීනව සහන සලසන්න කටයුතු කළේ. නේවාසිකාගාර පහසුකම් තිබෙන පාසල්වල ඒ නේවාසික පහසුකම් ලබා ගැනීමේ අවස්ථාවකුත් ඒ ශිෂ්‍යයන්ට ලැබුණා. මේවාත් එක්ක කෙටි කාලීනව අපට පුළුවන් වුණා, ශිෂ්‍යයන්ගේ අධ්‍යාපනය අඛණ්ඩව පවත්වා ගන්න. විභාග කටයුතු අපි අවුරුද්දකට වෙනස් කළා 6 වසරේ සිට අනෙකුත් පන්තිවල. ඊට පස්සේ 11 වසර විභාගයට අපි සැලසුම් සහගතව කටයුතු කළා. ශිෂ්‍යයන්ට අවස්ථාවක් ලැබිලා තිබෙනවා, පෙරහුරු වැඩසටහනක් විධියට සැලසුම්ගතව විභාගයට සහභාගි වෙන්න.

තව සැහැල්ලු කිරීමක් කළා. ආපදාවට මුහුණ දුන් පළාත්වල දරුවන්ට නිල ඇඳුමින් නැතුව වෙනත් ඇඳුමකින් පැමිණීමට අවස්ථාව ලැබුණා. අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ e-තක්සලාව කියලා වැඩසටහනක් තිබෙනවා. e- තක්සලාවට අපිට පාඩම්, පෙළපොත් සහ අනෙකුත් විභාග කටයුතු සඳහා අවශ්‍ය දේවල් දෙන්න පුළුවන්කම ලැබුණා. අපි මේ සැලැස්ම හදලා තිබෙනවා, 2026 ජනවාරි සිට මාර්තු දක්වාත්, අප්‍රේල් සිට 2026 වසරේ අවසානය දක්වාත්; මොකක්ද කරන්නේ කියන එක ගැන. මේ වනවිට ශිෂ්‍යයන් වෙනුවෙන් ක්ෂණිකව කරන්න ඕනෑ වැඩ කොටස් ඉවරයි. ඊටපස්සේ මධ්‍ය කාලීනව අඛණ්ඩතාවක් සහිතව මේ පාසල් පද්ධතිය පවත්වාගෙන යන්න අවශ්‍යයි. එහිදී අපි 80,000ක් ශිෂ්‍යයන්ට වතුර බෝතල්, පොත් බෑග් සහ අධ්‍යාපනය පවත්වාගෙන යන්න අවශ්‍ය සියලු දේවල් ලබා දෙන්න අවස්ථාව හදලා තිබෙනවා.

ඊට අමතරව ගුරුවරුන් සඳහා අපි විශේෂ වැඩ පිළිවෙළකුත් කරන අතරතුර ඩිජිටල් ඉගෙනුම් පද්ධතිය සම්බන්ධයෙන් විශේෂ සැලකිල්ලක් දක්වනවා. මේ පද්ධතිය අපි ටික කාලයක් ගෙන යනවා. එතකොට අවශ්‍ය ශිෂ්‍යයන්ට ඒ කටයුතු කර ගන්නත් පුළුවන්. ඊට පසු දීර්ඝ කාලීනව පාසල් 101ක් සංවර්ධනය කරන්න අපි plan කරලා තිබෙනවා. දැඩි ලෙස හානි වුණු පාසල් 36ක් අපි සංවර්ධනය කරනවා. ඒ වාගේම අමතක කරන්න නරකයි, උසස් අධ්‍යාපන ආයතනවලට සිදුවුණු හානිය. පේරාදෙණිය විශ්වවිද්‍යාලයට හානි වුණා. පේරාදෙණිය විශ්වවිද්‍යාලයට අවශ්‍ය පහසුකම් දුන්නා. ඉන්දියානු ආධාර ඇතුව පුස්තකාල සහ විද්‍යාගාර පහසුකම් වැඩිදියුණු කරන්න වැඩසටහනකුත් අපි කරගෙන යනවා.

ඊට අමතරව වෘත්තීය අධ්‍යාපන ආයතන ගත්තොත්, වෘත්තීය අධ්‍යාපන ආයතන 30ක් විතර ප්‍රතිසංස්කරණය කරමින් පවතිනවා. මීට අමතරව අපට පුළුවන් වෙලා තිබෙනවා, පේරාදෙණිය විශ්වවිද්‍යාලයට ඉන්දියානු ආධාර ලබා ගන්න. මෙහිදී අපි දැකපු විශේෂ කාරණයක් තිබුණා. විශ්වවිද්‍යාල ශිෂ්‍යයෝ මේකට ක්‍රියාකාරිව සහභාගි වුණා. විශේෂයෙන් මොරටුව සහ කොළඹ විශ්වවිද්‍යාලවල ශිෂ්‍යයන් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයත් එක්ක සම්බන්ධ වුණා. ඒ වාගේම පේරාදෙණිය විශ්වවිද්‍යාලය පිරිසිදු කිරීම සහ නැවත ගොඩනැඟීම සඳහා ශිෂ්‍යයන් ක්‍රියාකාරිව සහභාගි වුණා. අපි විශේෂයෙන් ස්තුතිවන්ත වෙනවා, ශිෂ්‍යයන්ට ඔවුන් සහභාගී වීම පිළිබඳව. මේ කටයුතුවලදී ප්‍රජාව එක්ක සම්බන්ධ වෙලා පුළුල් ක්‍රියාකාරිත්වයක් ලබා ගන්න අපි බලාපොරොත්තු වෙනවා. පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ භූ විද්‍යා අංශයේ ශිෂ්‍යයන් ගොඩනැඟිලි පර්යේෂණ ආයතනයේ කටයුතුවලටත් සම්බන්ධ වුණා. විශේෂයෙන් ගොඩනැඟිලි පර්යේෂණ ආයතනයටත් ලොකු බරක් ආවා, ස්ථාන විශාල ප්‍රමාණයක් බලන්න තිබුණා. ඒ සම්බන්ධයෙනුත් අපේ ශිෂ්‍ය ප්‍රජාව දායක වුණු බව අපි සතුටින් කියන්න කැමැතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු (වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு (வைத்தியர்) மதுர செனெவிரத்ன)
(The Hon. (Dr.) Madhura Senevirathna)
මට තව තත්පර 30ක් දෙන්න.

ඊට අමතරව විභාග දෙකක් විතර තිබුණා. ඒ විභාග පවත්වා ගෙන යන්න විශේෂයෙන් විභාග දෙපාර්තමේන්තුව විශාල මැදිහත් වීමක් කළා. මේ කාලය ඇතුළත අපට පුළුවන් වුණා, එක ප්‍රශ්න පත්‍රයකටවත්, එක උත්තර පත්‍රයකටවත් හානි නොවන විධියට විභාග කටයුතු පවත්වාගෙන යන්න. නිලධාරින්, ජනතාව, දේශපාලන අධිකාරිය කියන සියල්ල එකතු වෙලා තමයි මේ ක්‍රියාවලිය සිදු කළේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කාලය ලබා දුන්නාට ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු බිමල් රත්නායක ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 14ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 4.54]

**ගරු බිමල් රත්නායක මහතා (ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க - போக்குவரத்து, நெடுஞ்சாலைகள் மற்றும் நகர அபிவிருத்தி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Bimal Rathnayake - Minister of Transport, Highways and Urban Development and the Leader of the House of Parliament)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව තුළ සාකච්ඡා වෙන්නේ "දිට්වා" සුළි කුණාටුව නිසා ඇති වූ තත්ත්වය ගැනයි. මම දැක්කා, ඒ යෝජනාවේ එක කොටසක තිබෙනවා, පූර්ව දැනුම්දීම් කර තිබියදී ඒවා කළේ නැහැ කියන එක. විපක්ෂයේ අය ඒ ගැන මතු කළා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සාමාන්‍යයෙන් සාම්ප්‍රදායික විපක්ෂයට කරන්න පුළුවන් එකම දේ ඒක තමයි.

විශේෂයෙන් ආපදාවක් කියන්නේ සාමාන්‍ය තත්ත්වයක් නොවෙයි නේ. ආපදාවක් කියන්නේම සාමාන්‍ය තත්ත්වයක් ඇතුළේ තිබෙන ස්ථාවරභාවය, සාමාන්‍ය තත්ත්වයක් ඇතුළේ තිබෙන සේවා සැපයීම, ඒ සියල්ලම වෙනස් වෙනවා, බිඳ වැටෙනවා. ඕනෑම ආපදාවකදී දැනුවත් වෙලා සිටියත් විනාශයක් වෙනවා නේ. කලින් දැනුවත් වෙලා සිටියා වුණත් විනාශය අවම කර ගන්න හෝ අඩු කර ගන්න හැකි වෙනවා මිසක්, ඒක නතර කරන්න බැහැ නේ. "දිට්වා" ට යන්න කියන්න බැහැ. දැනුවත් කර තිබුණත් කියන්න පුළුවන් දේ තමයි, "මෙච්චර කියලා තිබ්බාත් මෙහෙම වුණා නේ" කියන එක. පසුගිය කාලයේ මේ පිළිබඳව රට තුළ බරපතළ සාකච්ඡාවක් ඇති වුණා. *[බාධා කිරීමක්]* මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ සභාව තව ටිකක් සාමකාමී කරලා දෙන්න පුළුවන් නම් හොඳයි. රැස්වීම් දෙකක් - පාර්ලිමේන්තු දෙකක්- එකවර කරන්න අමාරුයි නේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කරුණාකර සභාව නිශ්ශබ්ද වෙන්න.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
අපි ඔබතුමන්ලාට කියන්නේ මෙකයි. ආපදාවක් වෙලා මුල් දවස් කිහිපයේ විපක්ෂයට අවස්ථාවක් එනවා, ඕනෑම ආණ්ඩුවකට විවේචන එල්ල කරන්න. මොකද, ආපදාවක් පිළිබඳව කොතරම් දැනුවත් වෙලා සිටියත් යම්කිසි දෙයක් සිදුවන නිසා. නමුත්, මෙතැන තිබෙන දේ තමයි, මේ පිළිබඳව කිව්වේ එහෙම නොවෙයි. විශේෂයෙන්ම, ජාත්‍යන්තර මාධ්‍ය කිව්වාය කිව්වා, ලංකාවේ මාධ්‍ය කිව්වාය කිව්වා, එහෙම කියලා තිබියදීත් පියවරක් ගත්තේ නැහැ කිව්වා. අන්තිමට, විපක්ෂයට වැඩිපුර බර එක්තරා මාධ්‍ය නාළිකාවක ඒ පිළිබඳව පුළුල් විවාදයක් පැවැත්වුවා. අපේ නලින්ද ජයතිස්ස ඇමතිතුමා ඒ විවාදයට සම්බන්ධ වුණා. මම හිතන විධියට ඒ විවාදය තුළින් ඒ නාළිකාවට "දිට්වා" හම්බ වුණා. ඒ මතය දරපු කට්ටියටත් "දිට්වා" හම්බ වුණා. අපි පැහැදිලිව පෙන්නුවා, ජාත්‍යන්තර මාධ්‍යවලින් ඒ විධියේ නිශ්චිත පූර්ව අනතුරු ඇඟවීමක් කරලා තිබුණේ නැහැ කියලා.

අපි කැමැතියි, ඒක දැනගන්න. ඇත්තටම පූර්ව දැනුම් දීමක් කරලා තිබුණා නම්, ඒ අනුව කටයුතු කරන්න බැරි වුණා නම්, ඒක ප්‍රශ්නයක් තමයි. නමුත්, ඒක හදපු මතයක්. එහෙම තමයි මේගොල්ලෝ දේශපාලනය කරන්නේ. සද්භාවයෙන් දේශපාලනය කිරීමක් නැහැ නේ. ඒගොල්ලන්ට යම්කිසි මතයක් හදාගන්න හැකියාව තිබෙනවා, ඒ අයට තිබෙන channels නිසා සහ ටිකක් පරණ දේශපාලනඥයින් ටිකදෙනෙක් සිටින නිසා. අපේ කට්ටිය අලුත් නේ. තවම මුහුණ දන්නේ නැහැ. එම නිසා ඒකත් පාවිච්චි කරගෙන, තාත්තලාගේ, අම්මලාගේ හයියෙන් දේශපාලනය කරන ටික දෙනෙකුත් ඉන්නවා. ඒගොල්ලෝ මතයක් හදනවා. ඒ නිසා මම අභියෝගයක් කරනවා. දැන් ඔය මතය කියද්දීම තමයි ඇමෙරිකාවටත් floods ආවේ. මෙහේ ලොකු ටෝක් දිදී සිටියා, අපිට මෙච්චර කියලා තිබියදීත් කළේ නැහැ කියලා. ඇමෙරිකාවට floods ආවාම මොකක්ද කළේ? ඇමෙරිකාවට floods ආවාමත් ඔය ටිකම වුණා. ඇමෙරිකාවේ ජලාශ ඇරලා වතුර යැව්වේ නැහැ නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාත් දකින්න ඇති, "දිට්වා" සුළි කුණාටුවෙන් පස්සේ මෑතකදී මේගොල්ලෝ කිව්වා නේ, ජලාශ ඇරලා තිබුණා නම් හොඳයි කියලා. ලංකාවේ හිටපු වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල්තුමියක් social mediaවල ලියපු ලිපියක් මම දැක්කා. එතුමිය මම හඳුනන කෙනෙක් නොවෙයි. එතුමිය අහලා තිබුණා, "ඒ විධියට ජලාශ අරින්න පුළුවන්ද?" කියලා. මේ ළඟදී තවත් සුළි කුණාටුවක් එනවා කියලා කිව්වා නේ. ඒ සුළි කුණාටුව එයි කියලා ජලාශ ඇරියා නම් මොකක්ද වෙන්නේ? මේ ළඟදීත් සුළි කුණාටුවක් එනවා කිව්වා, ඒක ලංකාව ඇතුළට එනවා කිව්වා, ඒකේ eye එක තිබෙන්නේ පොතුවිල්වල කිව්වා. අන්තිමට මොකක්ද වුණේ? ඒක එනවා කිව්වත් ආවේ නැහැ. බලාගෙන සිටියා, ආවේ නැහැ. අපි බලාගෙන සිටියා, එයි කියලා. *[බාධා කිරීමක්]* හෙක්ටර් අප්පුහාමි මන්ත්‍රීතුමා බලාගෙන සිටියාද?

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
එතුමාගේ නිවස යට වුණා නේ.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ආ, නිවස යට වුණා. අලුත් එකේදි නොවෙයි, කලින් එකේදී. "දිට්වා" සුළි කුණාටුවේදී, the second most economical damage එක තිබෙන්නේ පුත්තලම දිස්ත්‍රික්කයට. නමුත්, දෙවැනි එක ආවේ නැහැ. ඒ වෙලාවේ ජලාශ හිස් කළා නම් මොකද වෙන්නේ? මේවා විද්‍යාත්මක දේවල්. මම කියන්නේ, අපි ප්‍රතිපත්ති සම්පාදකයෝ හැටියට විද්‍යාවට භය වෙන්න අවශ්‍ය නැහැ කියන එකයි. නමුත්, අපි විද්‍යාත්මක කරුණු ගැන කථා කරනවා නම්, එහි ඇති විද්‍යාත්මකභාවය ගැන දැනගෙන කථා කරන්න ඕනෑ. ප්‍රතිපත්ති සම්පාදකයෝ හැටියට අපට ඕනෑම දෙයක් කථා කරන්න පුළුවන්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අවසානයේ ගත්තොත් ජලාශයක් අරිනවාද, වහනවාද කියන එක, ඒකට ගනු

ලබන action එක මොකක්ද කියන එක තනිකර technical කාරණයක් නොවෙයි. Technical, political, social යන තුනම එකතු කරලා තමයි තීන්දුව ගන්නේ. ලංකා ඉතිහාසයේ මීට කලින් එහෙම කරලා නැහැ. මම කියන්නේ, එතුමියගේ ලිපියේ තිබෙන දේ. එතුමිය කවුද කියලා මම දන්නේ නැහැ. මම කියන්න හදන්නේ මේකයි. ලෝකයේ මේ අලුතින්ම ගංවතුර එනවා නොවෙයි, අලුතින්ම සුළි කුණාටු එනවා නොවෙයි. මේවාට යම්කිසි අධ්‍යයනයක් සහිත ක්‍රමයක් තිබෙනවා. ඒ ක්‍රමය ඇතුළේ තමයි ලංකාවේ නිලධාරින් වැඩ කරලා තිබෙන්නේ. දැන් desperate වෙලා මොකුත් කර කියා ගන්න බැරුව ඉන්නේ. ජනාධිපති මාරු වුණේත් නැහැ නේ. ගරු අලවතුවල මන්ත්‍රීතුමා, මේ මාස ටිකට ඔබතුමන්ලාගේ ජනාධිපතිවරු කී දෙනෙක් සිටියාද? මාස 14ට ජනාධිපතිවරු 4දෙනෙක් විතර පත් වෙන්න බලාගෙන සිටියා නේද? ඇයි, කබීර් හෂීම් හිටපු ඇමතිතුමා නේ කිව්වේ. ඔබතුමන්ලාගේ ජනාධිපතිවරු පත් වුණේත් නැහැ. ඊට පස්සේ ඔබතුමන්ලා බලාගෙන හිටියා, ආර්ථිකය කඩා වැටෙයි කියලා. හර්ෂ ද සිල්වා මැතිතුමා කිව්වා, භාණ්ඩාගාරය උතුරනවා කියලා. ඊට පස්සේ බලාගෙන හිටියා, ට්‍රම්ප්ට පින් සිද්ධ වෙන්න මොනවා හරි අලකලංචියක් වෙයි කියලා. එහෙම නේද? ඒක වුණේත් නැහැ. ඒ නිසා දැන් මේගොල්ලෝ බල බලා ඉන්නවා මොකක් හරි දෙයක් අල්ලාගෙන තමන්ගේ දේශපාලනය කරන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒකේ ප්‍රශ්නයක් නැහැ. හැබැයි, රටට හානි කරන්න එපා. මම කියන්නේ ඒකයි. පෑලියගොඩ traffic එකක් ඇති වුණත්, ඒකත් අපේ ප්‍රශ්නයක් විධියට දානවා. එහෙම විශේෂ පූර්ව දැනුම් දීමක් තිබුණේ නැහැ. ගරු නලින්ද ජයතිස්ස ඇමතිතුමා ඒ කාරණය ජාතියටම පෙන්නුවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2005දී වාගේ පත් කරපු සුනාමි Select Committee එකේ මම හිටියා. ඇත්තටම ඒක ඉතාම බැරෑරුම් ලෙස පවත්වාගෙන ගිය විශේෂ කාරක සභාවක්. මට තවම මතකයි, එතැනට කාලගුණ විද්‍යාඥයන්, විවිධ scientistsලා ආවා. ඒගොල්ලන් කිව්වා, ලංකාව ඉන්දියානු සාගරයේ විශේෂ ස්ථානයක පිහිටා තිබෙන නිසා, ලංකාව වැනි රටවලට අදාළව කාලගුණ අනාවැකි ඉතා නිවැරැදිව කියන්න ඉතාම දුෂ්කර බව. ඒ නිසා මම ඒ ගැන කියන්න කාලය නාස්ති කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. දේශපාලන විවේචනයක් ගොඩ නඟා ගන්න දෙයක් නැතිම නිසා මේ වාගේ දෙයක එල්ලුණාට කමක් නැහැ. නමුත් අපේ නලින්ද ජයතිස්ස සහෝදරයා විපක්ෂයේ ඒ තර්කය flat කරලායි තිබෙන්නේ. පැරදුණු ඒවා ඔසවාගෙන ආයෙත් ඒවා ගැන කියන එකේ තේරුමක් නැහැ, ඔබතුමන්ලාගේ වටිනා කාලය නාස්ති කරන්න.

ජලාශවල වාන් දොරටු ඇරීම ගත්තත් එහෙමයි. දැනුත් එක්කෙනෙක් කියනවා මම දැක්කා, ජලාශ ඇරියා කියලා. ඔබතුමන්ලා ලජ්ජා වෙන්න ඕනෑ. මේ සමහරු වැදගත් දේශපාලනඥයෝ නේ. එහෙම ජලාශ අරින්නේ නැහැ. එහෙම නම් ඇමෙරිකාවේත් ජලාශ අරින්න තිබුණා නේ. එහෙම අරින්න බැහැ. අරින්න පුළුවන් විධියක් තිබෙන්න පුළුවන්. නමුත් එහෙම වෙලා නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊට පස්සේ බලමු, මේ ආපදාව සම්බන්ධයෙන් අපි මොකක්ද කළේ කියලා. අපේ රටට මේ විනාශය වුණා; ඒකෙන් විශාල කම්පනයකුත් රටට ඇති වෙලා තිබෙනවා. ඒකේ ප්‍රධානම දේ ගැන අපි ඇති වෙන්න කථා කරලා තිබෙනවා. අපි දැන් rescue operationsවලින් ඇවිත් තිබෙනවා රට ගොඩ නඟන තැනට. විපක්ෂයේ සමහර පාර්ලිමේන්තු මන්ත්‍රීවරු, බිම් මට්ටමේ ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරු ඉතාම වැදගත් දේශපාලන නායකයන් විධියට මිනිසුන්ට උදවු කරගෙන වැඩ කළ බව අපි දන්නවා. දිසාපතිවරුන්ට තර්ජනය කළ, ඒ විධියට ඉතාම නපුරු විධියට රටට විනාශය ගෙනෙන්න කටයුතු කළ පුද්ගලයන් වාගේම ඉතාම අවංකව වැඩ කරපු මන්ත්‍රීතුමන්ලාත් විපක්ෂයේ ඉන්නවා. නමුත් අපි ආණ්ඩුවක් වශයෙන් කියන්න කැමැතියි, මේ

'දිට්වා" සුළි කුණාටුව අවස්ථාවේ අපි අපේ උපරිම මැදිහත්වීම කළා කියලා. ඒ විෂය අපි දන්නවා. ගංවතුර අවස්ථාවල කෙසෙල් ගෙඩි බෙදපු සමහර අය දැනුත් මට පේනවා. අපි එහෙම නැහැ. හරිද? අපි දේශපාලන වාසි ගන්න ආපදා පාවිච්චි කරන්නේ නැහැ. ඒ නිසා අපි සමත් වුණා, ජනතාවයි, ආණ්ඩුවයි, ත්‍රිවිධ හමුදාවයි, රජයේ නිලධාරිනුයි ඔක්කොම එකතු කරගෙන කටයුතු කරන්න. එක චෝදනාවක්වත් ආවේ නැහැ, බඩු බෙදද්දී. සාමාන්‍යයෙන් මෙවැනි අවස්ථාවක කොච්චර විවේචන එනවාද? සාමාන්‍යයෙන් මෙවැනි මහා පරිමාණ විනාශයකදී, ලංකා ඉතිහාසයේ මෑත භාගයේ සිදු වුණු මේ ලොකුම විනාශයේදී අක්‍රමිකතා සම්බන්ධයෙන් කොයි තරම් නම් චෝදනා එන්න ඕනෑද? අසාධාරණකම් සම්බන්ධව කොයි තරම් නම් චෝදනා එන්න ඕනෑද? එහෙම ඒවා නැති තරම්. තිබෙන ඒවාත් එක්කෝ fabricate කරපු ඒවා. එහෙම නැත්නම් තිබුණු පොඩි දෙයකට රම්පේ, කරපිංචා, ලූනු, මිරිස්, අජිනෝමොටෝ ඔක්කොම දාලා ලොකු කරලායි තිබෙන්නේ; තිබුණාට වඩා ලොකු කරලායි තිබෙන්නේ.

දැන් ග්‍රාම නිලධාරින් ස්ට්‍රයික් කරනවා කියලා කියනවා. ග්‍රාම නිලධාරින්ගේ සංගම් ගණනාවක් තිබෙනවා. ඒවායෙන් එකයි මේ දවස්වල එවැනි මොකක් හරි කරමින් තිබෙන්නේ. ඒකේත් සමහරු දේශපාලනයට සම්බන්ධයි. අපේ රටේ තත්ත්වය ලෝකයේ තිබෙන සියලුම ජාත්‍යන්තර ආයතන පිළිගත්තා. ලංකාවේ ඉන්න UN Resident Coordinator කිව්වේ මොකක්ද? එතුමා කිව්වා, එතුමාගේ රටට වඩා හොඳට ලංකාවේ අපි කටයුතු කළා කියලා. එතුමා ඉතාම දියුණු රටක පුද්ගලයෙක්. ඒ නිසා තමයි අන්තර්ජාතික වශයෙන් අපට මේ පිළිගැනීම ලැබිලා තිබෙන්නේ. ආණ්ඩුව සල්ලි නාස්ති කරන්නේ නැහැ; හොරකම් කරන්නේ නැහැ කියලා ජනතාව තුළ විශ්වාසයක් ඇති වෙලා තිබෙන බව අපට පෙනෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පෙරේදා වනකොට "Rebuilding Sri Lanka" ක්‍රියාවලිය වෙනුවෙන් ජනතාව රුපියල් බිලියන 8.6ක මුදලක් බැංකුවට දාලා තිබුණා. අද වනකොට ඒක තව පොඩ්ඩක් වැඩි වෙලා ඇති. ඒ කියන්නේ රුපියල් මිලියන දසලක්ෂ අටදහස් හයසියයක් වනවා, බැංකුවට දාලා තිබෙන මුදල. මීට අමතරව, සමහරු ඉඩම් පවා පරිත්‍යාග කළා. කවදාද ඉඩම් පරිත්‍යාග කළේ? මීරියබැද්ද නාය ගියා, ඔබතුමන්ලා රට පාලනය කරද්දී. කවුරුවත් ඉඩම් පරිත්‍යාග කළාද? මීරියබැද්දේ මිනිසුන්ට ගෙවල් හැදුවේත් මේ සමන්ත ඇමතිතුමන්ලා ගිහිල්ලා. මේ ළඟදී ගරු මංජුල සුරවීර මන්ත්‍රීතුමා මුල්ගල් තිබ්බා අවුරුදු 10කට කලින් නාය ගිය ගමක ජනතාවට ගෙවල් හදන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

විපක්ෂය පැත්තේ මන්ත්‍රීවරයෙක් මට කිව්වා, අපි විපක්ෂයේ වාගේ ඉන්නවා කියලා. ඇත්තටම අපි ආණ්ඩු පක්ෂයේ ඉන්නේ. විපක්ෂයේ ඔබතුමන්ලා තමයි ආණ්ඩු පක්ෂයේ මානසිකත්වයෙන් ඉන්නේ. ඔබතුමන්ලාට මේක උහුලාගන්න බැහැ. ඒකයි වෙලා තිබෙන්නේ. ඒක එච්චර හොඳ නැහැ, blood pressure වැඩි වෙනවා නම්. ඔබතුමන්ලාගේ සමහරෙකුට මේක උහුලාගන්න බැහැ. එක්කෙනෙක්, දෙදෙනෙක් ඉන්නවා, නිහතමානී මන්ත්‍රීවරු. මෙතැන ඉන්න සමහර මන්ත්‍රීවරුන්ට තිබෙන ප්‍රශ්නය ඒකයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සමහරුන්ට තිබෙන ප්‍රශ්නය, තමන් විපක්ෂයේ ඉන්න එකටත් වඩා අප වාගේ පිරිසක් ආණ්ඩුවේ ඉන්න එක. ඒවාට ඉතින් ගිහිල්ලා බෙහෙත් ගන්න ඕනෑ. ඒවාට ඉන්නවා වෛද්‍යවරු. ඔබතුමන්ලා තමයි "දිට්වා" වෙලා තිබෙන්නේ. ජනතාව පසුගිය ඡන්දවලදී ඔබතුමන්ලා "දිට්වා" කරලායි තිබෙන්නේ. අද මේ Adjournment Motion එක ගෙනැල්ලා ඔබතුමන්ලා නැවත "දිට්වා" වෙලා තිබෙනවා.

අධ්‍යාපන ප්‍රතිසංස්කරණවලට විරුද්ධව කුණු කථා කියලා මේ වටිනා අගමැතිතුමියට කරන්න තිබෙන තිරශ්චීන; ගැහැනියකට තියා පිරිමියෙකුටවත්, සතෙකුටවත් කියන්න බැරි තරම් තුච්ඡ කථා කියපු ඔබතුමන්ලාට අද අධ්‍යාපන ප්‍රතිසංස්කරණ

[ගරු බිමල් රත්නායක මහතා]

විරෝධයත් "දිට්වා" වෙලායි තිබෙන්නේ. ඔබතුමන්ලා රටේ "දිට්වා" වෙලායි තිබෙන්නේ. ඔබතුමන්ලා තමයි රටේ "දිට්වා". මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හොඳ දෙයක් තිබෙනවා නම්, ඒ හැම හොඳ දේටම වෛර කරනවා, මෙතුමන්ලාගේ හුහක් අය. යමක් හොඳයි නම්, යමක් ලස්සනයි නම්, යමක් පිළිවෙළයි නම්, යමක් පිරිසිදුයි නම් වෛර කරනවා. ඒක තමයි වෙලා තිබෙන්නේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු සභානායකතුමනි, ඔබතුමාට තවත් විනාඩි දෙකක කාලයක් තිබෙන්නේ.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
හොඳමයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

යමක් හොඳයි නම්, පිරිසිදුයි නම්, පිළිවෙළයි නම්, ජනතාවාදී නම්, වෛර කරනවා; බොරු කියනවා. රට කාපු රාජපක්ෂලාගේ දේශපාලන සංස්කෘතිය බෝ කරගෙන අද ඒක පස්සේ තමයි දුවන්නේ. අද සජබයේත් බහුතරයක් එහෙම තමයි. අද හර්ෂ ද සිල්වා මහත්මයා දිගටම කියනවා මම දැක්කා, "'Rebuilding Sri Lanka' කියලා අරමුදලක් පටන් ගෙන නැහැ, ඒක බොරු" කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒක එක පැත්තකින් අර්ධ සත්‍යයක්. අපි භාණ්ඩාගාරයේ ගිණුමක් ආරම්භ කරලා තිබෙනවා, "දිට්වා" සුළි කුණාටුව නිසා විනාශ වෙච්ච මේ රට ගොඩනැඟීම සඳහා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අමාත්‍යතුමනි, ඔබතුමාට අවශ්‍ය වෙලාවක් ගන්න පුළුවන්.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව විනාඩි දෙකතුනක් ඇති, ගොඩක් වෙලාව ගන්න ඕනෑ නැහැ.

භාණ්ඩාගාරය නිල අරමුදලක් හදලා තිබෙනවා. ඒ අරමුදලට තමයි ජනතාව සල්ලි එවන්නේ. ඒක නීත්‍යනුකූලයි. විපක්ෂයේ මන්ත්‍රීතුමන්ලා මොකක්ද මේ කියන්න හදන්නේ? "දිට්වා" වෙනුවෙන් අරමුදලක් නැහැ කියලා කියන එකෙන් මොකක්ද මේ කියන්නේ? රටට සල්ලි එවන්න එපා කියලායි කියන්නේ. අරමුදලක් නැත්නම් සල්ලි එවන්න බැහැ නේ. ඒකයි මේ කියන්නේ. හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමාලා ආර්ථිකය සම්බන්ධව කථා කරන අය නේ. එහෙම කෙනෙක් එවැන්නක් කිව්වාට පස්සේ මොකද වෙන්නේ? මම ඒකයි කියන්නේ මෙතුමන්ලා තමයි රටට "දිට්වා" කට්ටිය කියලා. හැබැයි මෙතුමන්ලා එහෙම කියද්දීත් ජනතාව සල්ලි එවනවා. පිටරටවල ඉන්න චූටි පැටව් කැටේ කඩලා පවුම් 10 එවනවා. චන්ද්‍රිකා බණ්ඩාරනායක හිටපු ජනාධිපතිතුමිය දුන්නේ එතුමියගේ පෞද්ගලික සල්ලි නොවෙයි. එතුමිය තීන්දු කරනවා, එතුමිය සභාපති තනතුර දරන ආයතනයෙන් ආණ්ඩුවට සල්ලි දෙන්න. රාජපක්ෂලා බලයේ හිටියා නම්, සජබය බලයේ හිටියා නම් එතුමිය සල්ලි දෙනවාද? එතුමිය එහෙම දෙන්නේ අපි මේ හැම ශතයක්ම හරියට පාවිච්චි කරනවා කියලා දන්නා නිසායි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා දන්නවා මේ කාරණය මොකක්ද කියලා. අපි ඊයේ පෙරේදා කැබිනට් මණ්ඩලයේ අනුමත කළා, "Rebuilding Sri Lanka" අරමුදලක් පිහිටුවීම. අපි ඒක පනතකින් පිහිටුවන්න ඕනෑ. කැබිනට් මණ්ඩලයෙන් අනුමැතිය ලැබුණා, ඒක කරන්න. අපි පනතකින් ඒක පිහිටුවනවා. එය පනතකින් පිහිටුවන්න කොච්චර දවස් යනවාද? අඩුම ගණනේ මාසයක්, දෙකක් යනවා. එතකල් අපි Treasury එක යටතේ නීත්‍යනුකූල account එකක් හදලා තිබෙනවා, රට හදන්න සල්ලි එවන්න. පනත එනකල් සල්ලි එවන්න එපා කියලාද කියන්නේ? ලජ්ජයි, ඔබතුමන්ලා ගැන! ඒකයි මම කියන්නේ, මේක "දිට්වා" නොවෙයි "දූෂ්ටා" කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ කාරණයත් කියලා මම කථාව අවසන් කරන්න කැමැතියි. මේ ව්‍යසනයට පත් අය වෙනුවෙන් අපි කරපු ප්‍රධානම දේ මොකක්ද? මේ ව්‍යසනයෙන් පූර්ණ හානි වුණු ගෙවල් වෙනුවෙන් අපි රුපියල් ලක්ෂ 50 දෙන්න පටන් අරගෙන තිබෙනවා; දැන් ගෙවල් හදන්න පටන් අරගෙන තිබෙනවා. ඒක බොරුද? මේ ව්‍යසනය සිදු වෙලා දින 40ක් යනකොට ගෙවල් හදන්න පටන් අරගෙන තිබෙනවා. ඊට පස්සේ අපි තීන්දු කළා, සමහර කඳුකර ප්‍රදේශවල ගෙවල් හදන්න බැරි නිසාත්, ඒ වෙනුවෙන් තවම ඉඩම් හොයාගන්න බැරි නිසාත් ඒ ජනතාවට rent එකට ඉන්න සල්ලි දෙන්න. Rent එකට ඉන්න අපි මාසිකව දෙනවා, රුපියල් 25,000 බැගින්. එහෙම කවදාවත් දීලා නැහැ. අද විපක්ෂයේ ඉන්න මෙතුමන්ලාත් රට පාලනය කරපු කට්ටිය. ගෙයක් හදනකල් මිනිසුන්ට කුලියට ඉන්න ඔබතුමන්ලා සල්ලි දුන්නේ කවදාද? පවුලේ අයට ජීවත් වෙන්න මාසයකට රුපියල් 50,000 බැගින් සහ කුලියට ඉන්න මාසයකට තවත් රුපියල් 25,000 බැගින් දුන්නේ කවදාද? මොන ආණ්ඩුවද? ගෙවල් හදන්න කාලයක් යනවා නේ, ගරු මන්ත්‍රීතුමා. ඔබතුමන්ලාට ගෙවල් මවන්න බැහැ නේ. මොන ආණ්ඩුවද, ගෙවල් හදනකල් ගෙවල් කුලිය සඳහා මසකට රුපියල් 25,000 බැගිනුයි, ජීවත් වෙන්න එක ගෙදරකට මසකට රුපියල් 50,000 බැගිනුයි දුන්නේ? එක මන්ත්‍රීවරයෙකුට දුක හිතුණා නේ, විපක්ෂ නායකතුමා දුන්නු දේ ගැන කිව්වේ නැහැ කියලා. එතකොට අපි මේ දීපු ඒවා මොනවාද? මේවා ඔයගොල්ලන් කරන්න හිතලාවත් නැති දේවල්. අපි අද වෙනකොට ඒ වැඩසටහන් පටන් ගෙන තිබෙනවා. දැන් අපි ඒ rent එකත් දෙන්න පටන් ගෙන තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ වාගේම Rebuilding Sri Lanka Presidential Task Force එක අගමැතිතුමියගේ මූලිකත්වයෙන් පිහිටුවලා, ඒ යටතේ subcommittees 8ක් පටන් අරගෙන තිබෙනවා. ඒකේ පක්ෂ සහ පාක්ෂික නොවන විවිධ වෘත්තිකයන්, ව්‍යාපාරිකයන් ඉන්නවා. ඒ වාගේම අපි බලාපොරොත්තු වෙනවා, donor conference එකක් කරන්න. නමුත් කිසිම donor conference එකකින්, - ඔබතුමන්ලා search කරලා බලන්න- ආපදාවක් සිදු වූ අවස්ථාවකදී ලෝකයේ කිසිම රටකට අඩු ගණනේ ආපදා හානියෙන් සියයට 10ක්වත් සම්පූර්ණ වන විධියට ආධාර ලැබී නැහැ; ලෝකයේ කිසිම රටකට ලැබිලා නැහැ. පිලිපීනය, ඇෆ්ගනිස්ථානය, ඇමෙරිකාව වැනි කිසිම රටකට ලැබිලා නැහැ. නමුත් අපිත් donor conference එක කරනවා. ඒකෙන් යම් කිසි මුදලක් ලැබෙයි. මේ රට හදන්න අවශ්‍ය අරමුදල අපි සම්පාදනය කරගෙන තිබෙනවා. මම ඒකයි කලිනුත් කිව්වේ, බිලියන 8.7ක මුදලක් මේ වෙනුවෙන් ලැබී තිබෙනවා කියලා.

ඊළඟට, ප්‍රවාහන කටයුතු සඳහා අවශ්‍ය මහාමාර්ග පැත්ත ගත්තොත්, දුම්රිය මාර්ග පැත්ත ගත්තොත් අපි ඉතාම වේගයෙන් ඒ කටයුතු සිදු කර තිබෙනවා. අපිම හදපු පාලම්වලින් තමයි මෙතුමාගේ ආසනයේ ඉඳලා මෙතුමා එන්නේත්. එහෙම තමයි එන්නේ. ඒකට කමක් නැහැ. මොකද, ඒවා රටේ පාරවල් නේ. නමුත් අපි ඒ වැඩ කටයුතු කර තිබෙනවා. ඒවා ගැන අන්තර්ජාතික වශයෙනුත් අපි පැසසුමට ලක් වෙලා තිබෙනවා. නමුත් අද මෙතැන තිබෙන්නේ මොකක්ද? මෙතැන තිබෙන්නේ හසු වෙන ඕනෑම දෙයකින් ආණ්ඩුවට ගහලා දවස ගෙවා ගන්නා දේශපාලනයක්. ඔබතුමන්ලා කරන්නේ ඒක.

අවසාන වශයෙන් මට කියන්න තිබෙන්නේ, අපි ආපදාවේ අවධිය අවසන් කර තිබෙනවා කියන එකයි. අපි දැන් රට ගොඩ නැඟීමේ අවධියට යමින් තිබෙන්නේ. අපි රාජ්‍ය නිලධාරින් ගැන විශ්වාස කරලා වැඩ කරගෙන යනවා. ඔවුන්ට අවශ්‍ය සියලු උපදෙස් ලබා දීලා තිබෙනවා. ජනාධිපතිතුමා සැලකිය යුතු අවස්ථා ප්‍රමාණයකදී ඒ නිලධාරින් මුණ ගැසී තිබෙනවා. අත්‍යවශ්‍ය සේවා කොමසාරිස් ජනරාල්වරයා අනතුරට පත් හැම දිස්ත්‍රික්කයකටම ගියා. දැන් අපි ඉඩම් හඳුනාගෙන තිබෙනවා මිනිසුන්ට ගෙවල් හදා දීමට. පාරවල් සම්බන්ධයෙන් ගත්තොත්, කැඩිච්ච "A" සහ "B" පාරවල් සියල්ලම මාර්තු 31 වෙනකොට estimate කර අවසන් කරනවා. අපි ඒ හැම එකක්ම තිබුණාට වඩා හොඳට හදනවා. ඒවා හදනකම් ඔබතුමන්ලාට පොඩි විනෝදයක් ගන්න පුළුවන්.

අපි ඔබතුමන්ලාට කියන්නේ මේකයි. ආපදාවක් කියන්නේ, ආපදාවක්. එහිදී තිබෙන තත්ත්වයේ බිඳ වැටීමක් වෙනවා. ඒ හැම දෙයක්ම ආණ්ඩුවේ වැරදි නිසාම වෙන දේවල් නොවෙයි. ඒ නිසා ජනාධිපතිතුමාත් කිව්වා වාගේම, අපි ඉතාම වුවමනාවෙන් මේ රටේ ජනතාවට කියන්න කැමැතියි, ආපදාවට පත් සියලු ජනතාවට අපි අනිවාර්යයෙන්ම උදවු කරන බව. ඒ වාගේම අපි මේ රට තිබුණාට වඩා හොඳ තැනකට ගෙනියනවා. ඊට අදාළ සම්පූර්ණ විශ්වාසයත්, සැලසුමත් අපට තිබෙනවා. අද ඔබතුමන්ලා බලන්න, බදුල්ලේ, නුවරඑළියේ කරන මහා ශ්‍රම මෙහෙයුම ගැන. කවදාද ඒ වාගේ දේවල් වුණේ? මම ඒකයි කිව්වේ. දැන් මෙතැන ලොකු කථා කියනවා. එදා මීරියබැද්ද නාය ගියේ අද විපක්ෂයේ සිටින ඔබතුමන්ලාගේ පාලනය පැවැති කාලයේ. නමුත් ඒ මිනිස්සුන්ට අවශ්‍ය ගෙවල් ටික හදන්නේ දැන් සමන්ත විද්‍යාරත්න ඇමතිතුමා. ඒකයි ඇත්ත. හෙක්ටර් අප්පුහාමි මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ ආසනය වන පුත්තලමේ කොන්ක්‍රීට් පාලම කඩාගෙන ගියා. ඒ තරම් විශාල ගංවතුරක් ආවේ. දැන් ඒ පාලම හදාගෙන යනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි හැම විටම අපේ හෘදය සාක්ෂියටත්, ජනතාවටත් තමයි වග කියන්නේ. අවසාන වශයෙන් අපට කියන්න තිබෙන්නේ මේකයි. 'දිට්වා"ට අපේ රටේ ඔක්කෝම විනාශ කරන්න පුළුවන් වුණාට, "දිට්වා"ට අපේ ධෛර්යයවත්, ජනතාව වෙනුවෙන් අපට තිබෙන වගකීමවත් විනාශ කරන්න බැහැ. ඒ නිසා "දිට්වා" කුණාටුවෙන් වැටුණු "ෂොට්" එක අපි නැවත ශක්තිය ගන්නා මාවතක් බවට පත් කරගෙන වැඩ කරගෙන යනවා. අපි කනගාටු වෙනවා, "දිට්වා" ගැන විවේචනය කරන්න ඇවිල්ලා අද විපක්ෂයට "දිට්වා" හම්බ වෙච්ච එක ගැන. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට වැඩිපුර වේලාව ලබා දුන්නාට ඔබතුමාට බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු හෙක්ටර් අප්පුහාමි මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 5.14]

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සභානායකතුමා මටම බැණලා, බැණලා දැන් සභාවෙන් පිටව යනවා. කමක් නැහැ.

පසුගිය දිනවල අපේ රටට බලපෑ සුළි කුණාටුව සහ ගංවතුර ආපදාව කියන කාරණා සම්බන්ධවයි අද සභාව කල් තබන අවස්ථාවේ මේ විවාදය කරන්නේ. නමුත් දැන් ප්‍රශ්නයක් තිබෙනවා. අපි ඒකයි ඔබතුමන්ලාට කියන්නේ විපක්ෂයද, ආණ්ඩුවද කියන එක ඔබතුමන්ලා හරියට තෝරා ගන්න කියලා. මොනවාද කරන්නේ කියන එක ගැන අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍යවරයා ඉතාම වැදගත් විධියට කරුණු ඉදිරිපත් කළ ආකාරය අපි දැක්කා. විපක්ෂයක් ආණ්ඩුවකින් බලාපොරොත්තු වෙන්නේ ඒකයි. විපක්ෂය තමයි ආණ්ඩුවක් විවේචනය කරන්නේ. ඒක අපේ අයිතිය. ඒක තමයි ජනතාව ඡන්දය දීලා අපව මෙතැනට එවා තිබෙන්නේ.

සුනාමිය ආපු වෙලාවේත්, ඊළඟට මේ රටට දිගින් දිගටම ආපු ප්‍රශ්නවලදී ජනතා විමුක්ති පෙරමුණ එදා විපක්ෂයේ ඉන්නකොට විදේශගත ශ්‍රී ලාංකිකයන්ට කිව්වේ නැද්ද, රටට -ලංකාවට - සල්ලි එවන්න එපා කියලා? එහෙම ප්‍රකාශයක් කළා එදා. රට බංකොලොත් වෙච්ච වෙලාවේ එහෙම කිව්වා. හැබැයි අපි මොනවාද කළේ? විපක්ෂ නායකතුමා මොනවාද කළේ? විපක්ෂ නායකතුමා ලෝකයේ හැම රටකටම කථා කරලා, තානාපතිවරු හම්බ වෙලා හැම මොහොතකම කිව්වේ මොකක්ද? අපේ රටට ආධාර කරන්න කිව්වා. ඒ වාගේම ආධාර සමුළුවක් කැඳවන්න කිව්වා. විදේශ රටවල ඉන්න ශ්‍රී ලාංකිකයන්ට කථා කරලා කිව්වා, පුළුවන් තරම් උදව් කරන්න කියලා. විදේශ රටවල ඉන්න ශ්‍රී ලාංකිකයන්ට කථා කරලා, ලංකාවේ අයත් ඒකට එකතු කරගෙන තමයි අද විශාල වශයෙන් ප්‍රශ්නවලට මුහුණ දීලා තිබෙන රෝහල් පද්ධතියට විපක්ෂ නායකතුමා උදව් උපකාර කරන්නේ. නියෝජ්‍ය අමාත්‍යවරයෙක් විපක්ෂ නායකතුමා ඒ කරන දේ විවේචනය කළ නිසා තමයි අපි මේවා කථා කළේ. අර මන්ත්‍රීතුමා අපේ මන්ත්‍රීතුමිය කියපු කථා විවේචනය කළ නිසායි අපි මේවා කථා කළේ. අප විවේචනය කරන එක නොවෙයි ඒගොල්ලන්ගේ රාජකාරිය. ඒගොල්ලන් කළේ මොනවාද කියලා මෙතැනට ඇවිල්ලා කියන එක තමයි රාජකාරිය. රුපියල් 25,000යි, 50,000යි දීපු එක හරි. ඒ ගැන අපි කියන්නේ නැහැ. හැබැයි මතක තියා ගන්න, අපට ඔප්පු කරලාත් පෙන්වන්න පුළුවන්, වතුර ආපු නැති තැන්වලටත් සමහර අය රුපියල් 25,000යි, 50,000යි අරගෙන තිබෙන බව.

ඔබතුමන්ලා ගමේ හදපු අර සංවිධානයත් එක්ක එකතු වෙලා වතුර ආපු නැති සමහර තැන්වලටත් ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරු මුදල් අරගෙන තිබෙනවා. ඔබතුමන්ලාට ඕනෑ නම්, ඔබතුමන්ලා ඉල්ලනවා නම්, ඒ ලියුම් ටිකත් එක්ක ඒ විස්තර ලබා දෙන්න පුළුවන්. ඒ නිසා මතක තියා ගන්න, එහෙම කොටසකුත් ඉන්නවා කියලා. ඊළඟට, මේ රුපියල් 25,000ට, 50,000ට එහාට ගිය කොටස, මේ රටේ ව්‍යාපාරික ක්ෂේත්‍රය, කර්මාන්ත ක්ෂේත්‍රය සහ අනෙකුත් ක්ෂේත්‍ර ටික ගත්තාම, ඒ ටික- *[බාධා කිරීමක්]* මම සභාගත කරන්න ඕනෑ නැහැ. මට අවශ්‍ය දේ මම කරන්නම්. තමුන්නාන්සේ කට වහගෙන ඉන්න, මගේ කථාව කරන්න ඉඩ දීලා. කියවනවා! හැම එකටම කියවන්න හදන්න එපා. උද්ධච්චකම, අහංකාරකම තියා ගන්න ගෙදර ගිහිල්ලා. ඒවා ගෙදර නෝනාට පෙන්වන්න. මේක උත්තරීතර පාර්ලිමේන්තුව. මතක තියා ගන්න ඒක. මේ පාර්ලිමේන්තුවේ අපි කථා කරන්නේ, ජනතාවගේ ප්‍රශ්න. අපි කථා කරන්නේ අපට ජනතාව දීලා තිබෙන ප්‍රශ්න ටික. ඒවා කථා කරන්න තමයි අපි මෙතැනට එන්නේ. එහෙම නැතුව පොල් ගාන්න නොවෙයි. ඒක මතක තියා ගන්න.

ඒ නිසා අපි විශේෂයෙන්ම මතක තබා ගත යුතු කාරණාවක් තිබෙනවා. ඉදිරියටත් රටට මේ වාගේ ව්‍යසනයක් ආවොත් මොනවාද කරන්නේ කියලා සැලැස්මක් හදලා, ඒ සැලැස්ම ඉදිරිපත් කරන්න මේ පාර්ලිමේන්තුවට. ඒකයි ඔබතුමන්ලාගේ වගකීම. හැබැයි, ඒ වෙනුවට ජනතාව හැල්ලු කරනවා. ඊළඟට, මන්ත්‍රීවරු හැල්ලු කරනවා. සමහර වෙලාවට මන්ත්‍රීවරුන්ගේ පෞද්ගලික දේවල් කථා කරනවා. ඒකද තමුන්නාන්සේලාගේ අයිතිය? ඒක නොවෙයි අයිතිය. ඒ වාගේම තමුන්නාන්සේලා මතක තියා ගන්න, මේ වාගේ ආපදාවලදී අපි ඕනෑ වෙලාවක

[ගරු හෙක්ටර් අප්පුහාමි මහතා]

සුදානම්, සහයෝගය දෙන්න. අධ්‍යාපන ප්‍රතිසංස්කරණ පිළිබඳ ප්‍රශ්නයේදී වුණත් එහෙමයි. අපි මොනවාද 6 වැනි ශ්‍රේණියේ මොඩියුලය ගැන කථා කළේ? අපි කථා කළේ අර website එක ගැන විතරයි. අපි කිව්වේ නැහැ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ කරන්න එපා කියලා, කවදාවත්. හැබැයි, තමුන්නාන්සේලා මොනවාද කළේ? තමුන්නාන්සේලා ඒක කරලා, ඒකේ වැරදි සිද්ධ වුණාය කියලා ඒක නතර කරලා, තමුන්නාන්සේලාගේ ගෙවල්වල ඉන්න නෝනලා එච්චා, තමුන්නාන්සේලාට සම්බන්ධ නැති නෝනලා එච්චා, උද්ඝෝෂණය කරලා ආපසු ඒක දෙන්න කියලා ඉල්ලන්න. මොන විහිළුවක්ද ඒක? මොකක්ද ඒකේ තේරුම? ඒ නිසා දෙයක් කරනකොට අඩු ගණනේ තෝරා බේරාගෙන හරි දේ කරන්න. ඒකවත් කරන්න බැහැ.

දැන් බලන්න, පාස්කු ඉරු දින ප්‍රහාරය පිළිබඳ කාරණය. සාරා ජස්මින් ඉන්නවා කිව්වා. දැන් සාරා ජස්මින් අල්ලන්නේ නැද්ද? මහ මොළකරු අල්ලන්නේ නැද්ද? ඒ මහ මොළකරු අල්ලන්නේ නැහැ. ඊට පස්සේ කන්ටේනර් 323ක ප්‍රශ්නයක් ආවා. ඒකේ මහ මොළකාරයා කෝ? තවම මේ පාර්ලිමේන්තුවට ඒ කරුණු ඉදිරිපත් කළාද? ඒ ගැන කථා කළාද? දැන් ඒවා ඔක්කෝම හංගාගෙන කථා කරනවා.

ඒ විතරක් නොවෙයි, බෙහෙත් සම්බන්ධ කාරණය බලන්න. අපි දිගින් දිගටම කිව්වා, ඉන්දියාවෙන් බාල බෙහෙත් ගෙනැල්ලා මන්නාරමෙන්, කල්පිටියෙන් බානවා කියලා. ඒ විතරක් නොවෙයි. Airport එකෙනුත් ගෙනෙනවා සමහර බෙහෙත්. NMRA එකේ සභාපතිවරයාද දන්නේ නැහැ ඒකේ මහ මොළකරු හැටියට ඉන්නේ කියලා අපට ප්‍රශ්නයක් තිබෙනවා. හැබැයි අදටත් ඒවා නතර කරලා නැහැ. නතර වෙන්නේ නැත්තේ ඇයි? නතර වෙන්නේ නැත්තේ, ආණ්ඩුවේ සහයෝගය නිසා. මතක තියා ගන්න, මේ රටේ ජනතාව මැරෙනවා රෝහල්වලින් බෙහෙත් ගන්න ගිහිල්ලා. බෙහෙත්වල හිඟය නිසා මැරෙන අය ඉන්නවා. ඒවා දන්නේ නැහැ මේ සමහර අය. ඒවා එළියට එන්නේ නැහැ. ඒ නිසා ඉස්සර වෙලා ඒවා බේරලා ඉන්න.

ඒ වාගේම අපි අහනවා, 6 ශ්‍රේණියේ මොඩියුල සම්බන්ධව. ඒකේ මහ මොළකාරයා කවුද? අපි නම් කවුරුවත් අග්‍රාමාත්‍යවරියට අපහාස කරන්න ගියේ නැහැ; කවුරුවත් අග්‍රාමාත්‍යවරියට අපහාස කළේ නැහැ. හැබැයි මතක තබා ගන්න, අපහාස කරන්නේම, එම වැඩසටහන තිබෙන්නේම තමුන්නාන්සේලාගේ පක්ෂය ඇතුළේ බව. එය කෙරෙන්නේම JVP එක ඇතුළෙන්. තමුන්නාන්සේලාගේ සමහර ෆේස්බුක් කණ්ඩායම් විසින් social media හරහා තමයි ඒ අපහාසය කරන්නේ. ඒක පැලවත්තෙන් සිද්ධ වෙන්නේ. ඒක හංගන්න සූදානම් වෙන්න එපා. ඒක තමයි ඇත්ත කථාව. හැබැයි, එහෙම වෙද්දි අනෙක් අයට ඇඟිල්ල දිගු කරන්න, මඩ ගහන්න සූදානම් වෙන්න එපා.

දැන් බාල ගල් අඟුරු සම්බන්ධව බරපතළ ප්‍රශ්නයක් තිබෙනවා. නොරොච්චෝලෙ ගල් අඟුරු බලාගාරය හදද්දි කල්පිටිය ජනතාවට විශාල අසාධාරණයක් කළා. විශේෂයෙන්ම ධීවරයන්ට අසාධාරණයක් වුණා. ඒ වාගේම ගොවීන්ට අසාධාරණයක් වුණා. එම ප්‍රදේශයේ ජීවත් වන ජනතාවට පාරිසරික වශයෙන් විශාල අසාධාරණයක් වුණා. ඊළඟට, තලවිල දේවස්ථානය ආශ්‍රිතව ජීවත් වන කතෝලික ජනතාවටත් ලොකු ප්‍රශ්නයකට මුහුණ දෙන්න සිදු වුණා. දැන් බාල ගල් අඟුරු ගෙනැල්ලා තිබෙනවා. මතක තියා ගන්න, ඒවා නම් නොරොච්චෝලෙ බලාගාරයේ දහනය කරන්න සූදානම් වෙන්න එපා. ඒවා දහනය කරන්න ගිහිල්ලා පිට වන විෂ වායුව නිසා එම ප්‍රදේශයේ ජනතාවට තවත් හානි වුණොත්, අපි ජනතාවත් එක්ක පාරට බහිනවා. ජනතාවගේ අයිතිය අපි ආරක්ෂා කරනවා. මොකද හේතුව, එම බලාගාරය එම ප්‍රදේශයේ හදන්න එපා කියලා මිනිසුන් මැරුණා. මිනිසුන් දිවි පිදුවත් අන්තිමට එය හැදුවා. ඒ ප්‍රශ්නයටත් කල්පිටිය ප්‍රදේශයේ ජනතාව මුහුණ දුන්නා. දැන් ජාවාරමක් කරලා බාල ගල් අඟුරු ගෙනැල්ලා තිබෙනවා. ඒවා දහනය කරලා අහිතකර වායුවක් පිට වුණොත්, විශේෂයෙන්ම අළු පිට වෙලා ඒවායෙන් එම ප්‍රදේශයේ ජනතාවට හානියක් සිදු වුණොත් ඒ සියලු දේවල්වල වගකීම තමුන්නාන්සේලා භාර ගන්න ඕනෑ. අපි එම ජනතාවට අසාධාරණයක් වන්න ඉඩ දෙන්නේ නැහැ. ඒවා සිද්ධ වෙන්නේ කොහොමද කියලා අපට අනිවාර්යයෙන්ම පරිසර වාර්තාවක් අවශ්‍යයි.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර නියෝජ්‍ය අමාත්‍යතුමා. ඔබතුමාට පස් වරු 5.30 දක්වා කාලය තිබෙනවා.

[අ.භා. 5.22]

**ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා (ආරක්ෂක නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) அருண ஜயசேகர - பாதுகாப்புப் பிரதி அமைச்சர்)
(The Hon. Major General (Rtd.) Aruna Jayasekera - Deputy Minister of Defence)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "දිට්වා" සුළි කුණාටුවෙන් පසුව රටේ වත්මන් තත්ත්වය සම්බන්ධව විපක්ෂයෙන් ගෙනාපු සභාව කල් තබන අවස්ථාවේ යෝජනාවට සහභාගි වෙමින් ආණ්ඩු පක්ෂයේ මැති ඇමතිවරු, මන්ත්‍රීවරු සියලුදෙනා අද දවස පුරාම ආණ්ඩුවේ විධිමත් වැඩ පිළිවෙළ දත්ත සහිතව, සවිස්තරාත්මකව ඉදිරිපත් කළා. යෝජනාව ඉදිරිපත් කළ මන්ත්‍රීතුමිය ආණ්ඩුවේ වැඩ පිළිවෙළ විවේචනාත්මකව ගෙන හැර දැක්වූවා. "දිට්වා" සුළි කුණාටුවෙන් සිදු වූ හානි සම්බන්ධව දත්ත එකතු කරලා නැහැ, පීඩවට පත් ජනතාවට වන්දි මුදල් හරියට දීලා නැහැ යනාදි වශයෙන් එතුමිය සඳහන් කළා. නමුත් "දිට්වා" සුළි කුණාටුවෙන් සිදු වූ ආපදාවල බරපතළකම වැඩි වුණේ දශක ගණනාවක ක්‍රියාත්මක වුණු අවිධිමත් රාජ්‍ය කළමනාකරණයක ප්‍රතිඵලය නිසා කියලා අපට පෙනෙනවා. එය විශේෂයෙන්ම පරිසරයට කරන ලද දැඩි හානිවල ප්‍රතිඵලයක්. දශක ගණනාවක් රාජ්‍යකරණය කළ ආණ්ඩුවලින් දේශපාලනික වශයෙන් ගත් අබුද්ධිමත් තීරණවල ප්‍රතිඵල ගොන්නක් තමයි අපි දැක්කේ. අපේ ආණ්ඩුව බලයට පත් වුණාට පසුව ඒ ඒ විෂයයන් ගැන දැනුම, හැකියාව, බුද්ධිය සහ අත්දැකීම් තිබෙන ඇමතිවරු අමාත්‍යාංශවලට පත් කරලා තිබෙනවා. ඒ අනුව තමයි පරිසර, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග හා මහාමාර්ග සහ නාගරික සංවර්ධන කියන අමාත්‍යාංශවලට විශේෂ හැකියාවක් තිබෙන, අත්දැකීම් තිබෙන අමාත්‍යවරු අපි පත් කරගෙන තිබෙන්නේ. ඔවුන් එම විෂය සම්බන්ධව විශේෂ අධ්‍යයනයක් කරලා, විශේෂිත වූ දැනුම අරගෙන, උපදෙස් අරගෙන, හොඳ අවධානයක් යොමු කරලා තමයි කටයුතු කරන්නේ. "දිට්වා" සුළි කුණාටුව නිසා රටේ ඇති වුණු තත්ත්වය ඔවුන් ප්‍රායෝගිකව විශ්ලේෂණය කරලා, ප්‍රාදේශීය මට්ටමේ සිට ජාතික මට්ටම දක්වා අවධානය යොමු කරලා අවශ්‍යතා අනුව කටයුතු කර තිබෙනවා. ඉතින්, ඒක පැහැදිලිව පෙනෙනවා. තමන් නියෝජනය කරන ප්‍රදේශවලට ගිහින් බැලුවාම ඒ දත්ත කොච්චර දුරට නිවැරදි ද කියන එක සනිටුහන් වෙනවා. ඒ ඒ ක්ෂේත්‍රවලට අදාළ අමාත්‍යාංශවලට ප්‍රතිපත්තිගරුක නීති තිබෙනවා. ඒ නීතිවලට

අනුකූලව තමයි එම කටයුතු සිද්ධ කරන්න ඕනෑ. ඒවා පිළිපදිමින් තමයි කටයුතු කරන්න ඕනෑ. පැහැදිලි දත්ත හෝ වැඩ පිළිවෙළක් ඉදිරිපත් කර නැහැ කියලා තමයි මූලික වශයෙන් දැනුම් දුන්නේ.

මම විශේෂයෙන්ම කියන්න ඕනෑ, අපේ ජාතික ආපදා කළමනාකරණ සභාව මේ "දිට්වා" සුළි කුණාටුව ආවාට පස්සේ විටින් විට රැස්වෙලා ප්‍රතිපත්තිමය වශයෙන් තීන්දු තීරණ ගත් බව. ඒ පිළිබඳව පාර්ලිමේන්තුවත් දැනුවත් කළා. කාරක සභාවලදීත් සාකච්ඡා පවත්වා ඒ ගැන දැනුවත් කළා. ඒ අනුව පීඩාවට පත් ජනතාවට ඉදුරාම ලැබිය යුතු සහන, එහෙම නැත්නම් සහනාධාර ලබා දෙන්න තමයි දීර්ඝ වැඩ පිළිවෙළක් ඔස්සේ මේ කටයුතු කරගෙන යන්නේ. Post-disaster Needs Assessment කියලා ක්‍රමවේදයක් තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ අනුව ලෝක සංවිධාන නියෝජනය කරන ලංකාවේ ස්ථාපිත කර තිබෙන ආයතන ලෝකයේ පිළිගත් ක්‍රමවේදයන්ට අනුව ඒ assessment එක කරලා තමයි අපි මේ කටයුතු සිද්ධ කරන්නේ. ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය, ජාතික ආපදා කළමනාකරණ සහන සේවා මධ්‍යස්ථානය, ඒ වාගේම ජාතික ගොඩනැඟිලි පර්යේෂණ ආයතනය සහ සියලුම අමාත්‍යාංශ, රාජ්‍ය ආයතන ඒකට මූලික වනවා. ඒ අනුව සැලසුම් සකස් කරලා තමයි අපි මේ වැඩ පිළිවෙළ ඉදිරියට ගෙනැවිත් තිබෙන්නේ.

මේ "දිට්වා" සුළි කුණාටුව ඇවිල්ලා දැනට සති 7ක් පමණ වෙනවා. ඒ සති 7 ඇතුළත අපි කොපමණ කටයුතු ප්‍රමාණයක් කර තිබෙනවාද කියන එක ගත්තොත්, ඒක හරිම සරලයි. දිසාපතිවරුන්ට, ප්‍රාදේශීය ලේකම්වරුන්ට, රජයේ අනෙකුත් නිලධාරින්ට ඒ වැඩකටයුතු පහසු කරගන්න අපි චක්‍රලේඛම කීයක් නිකුත් කර තිබෙනවාද? ඒ අනුව තමයි කටයුතු කරන්නේ. සිදු වූ ජීවිත හානි හැර අනෙකුත් වටිනාකම් යළි පිහිටුවීම තමයි අපේ රජයේ වගකීම කියන එක අපි විශේෂයෙන්ම සඳහන් කරන්නට ඕනෑ. එය රජයේ වගකීමක් හැටියට අරගෙන, අපි ඒ සියලුම ආයතන එක්ක සම්බන්ධ වෙලා, හානි වූ දේපළ සහ ජීවිතවලට වන්දි ගෙවීම ඉතාම ක්‍රමානුකූලව සිදු කරනවා. අපට එය සියයට සියයක්ම සාර්ථක කරගන්න බැරි වෙන්න ඇති. යම්කිසි ප්‍රමාණයක ප්‍රමාදයක්, අඩුපාඩුවක් ඇති. අපි ඒවාත් කළමනාකරණය කරගෙන, නැවත ඒ සම්බන්ධව සාකච්ඡා කර කටයුතු කරගෙන යනවා. මම විශේෂයෙන්ම කියන්න ඕනෑ, ජාතික ගොඩනැඟිලි පර්යේෂණ ආයතනයට ඒ කටයුතු කිරීම සඳහා කාර්ය මණ්ඩලයත් අඩුයි කියන එක. නමුත්, ප්‍රධාන නායයෑම් ආශ්‍රිත ප්‍රදේශවල සම්පූර්ණයෙන්ම හානියට පත් නිවාස 24,930ක -ඒ කියන්නේ 25,000කට කිට්ටු ප්‍රමාණයක- පරීක්ෂණ කටයුතු අවසන් කරලා ඒ ඒ දිස්ත්‍රික් ලේකම්වරුන්ට, ප්‍රාදේශීය ලේකම්වරුන්ටත් දීලා තිබෙනවා. දැන් මෙතැන උදේ ඉඳලා විපක්ෂයේ මන්ත්‍රීවරු ගෙනහැර දැක්වූවා, ජාතික ගොඩනැඟිලි පර්යේෂණ ආයතනය ඒ සම්බන්ධ කටයුතු නිසි පරිදි සිදු කර නැහැ කියලා. 25,000ක් කියන්නේ, ඔය සති 7ක කාලය ඇතුළත සිදු කරපු ප්‍රමාණය. ඔවුන්ට කාර්ය මණ්ඩලයත් නැහැ. ඔවුන් විශ්වවිද්‍යාලවලින් විශේෂඥ ඥානය අරගෙන ඒ කටයුතු කරලා තිබෙනවා. ඒ අනුව අපි මේ "Rebuilding Sri Lanka" කියන සංකල්පය ගොඩනඟාගෙන, ජාතික වශයෙන් විශේෂ ජනාධිපති කාර්ය සාධක බලකායක් පිහිටුවා දැනට ඒ කටයුතු සිද්ධ කරගෙන යනවා.

මේ සම්බන්ධව කටයුතු කරපු සියලුම පාර්ශ්වයන්ට අපි විශේෂයෙන් ස්තුතිවන්ත වෙනවා. විපක්ෂයෙන් මොන අභියෝග ගෙනාවත්, මොන දේවල් ගෙනාවත් ආණ්ඩුවක් හැටියට අපි ඕනෑම දෙයකට මුහුණ දෙන්න ඉතාම හොඳින් සූදානම් වෙලා ඉන්නවා. ඕනෑම දෙයක් ගෙනෙන්න, අපි ඒවාට මුහුණ දෙන්න විශේෂයෙන් සූදානමින් සිටිනවා. උත්තර දෙන්නත් පුළුවන්, වැඩ කරන්නත් පුළුවන්. අපි බිමට ගිහින් ප්‍රායෝගිකව වැඩ කරලාත් පෙන්වනවා. 2040 වෙනතෙක් අපි මේ වැඩකටයුතු කරලා පෙන්වනවා කියලාත් කියන්න කැමැතියි.

බොහොම ස්තුතියි.

***එකල්හි වේලාව අ.භා. 5.30 වූයෙන් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.***

***පාර්ලිමේන්තුව ඊට අනුකූලව, 2026 ජනවාරි 22වන බ්‍රහස්පතින්දා පූ.භා. 9.30 වන තෙක් කල් ගියේ ය.***

*அப்பொழுது, பி.ப. 5.30 மணியாகிவிடவே மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள் வினா விடுக்காமலேயே பாராளுமன்றத்தை ஒத்திவைத்தார்.*

*அதன்படி பாராளுமன்றம், 2026 சனவரி 22, வியாழக்கிழமை மு.ப. 9.30 மணிவரை ஒத்திவைக்கப்பட்டது.*

*It being 5.30 p.m., THE HON. PRESIDING MEMBER adjourned Parliament without Question put.*

*Parliament adjourned accordingly until 9.30 a.m. on Thursday, 22nd January, 2026.*

**සැ.යු.**

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

**குறிப்பு**

உறுப்பினர் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களைத் தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

**NOTE**

Corrections which Members suggest for the Final Print should be clearly marked in their copy and sent to the Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

---

**Contents of Proceedings :**

**Final set of manuscripts Received from Parliament :**

**Printed copies dispatched :**

හැන්සාඩ් වාර්තා
**කොළඹ 5, පොල්හේන්ගොඩ, කිරුළපන පාර, අංක 163 දරන ස්ථානයෙහි පිහිටි රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ගත හැක.**

**මෙම හැන්සාඩ් වාර්තාව www.parliament.lk වෙබ් අඩවියෙන් බාගත හැක.**

ஹன்சாட் அறிக்கையின் பிரதிகளை
இல. 163, கிருலப்பனை வீதி, பொல்ஹேன்கொட, கொழும்பு 5இல் அமைந்துள்ள அரசாங்க தகவல் திணைக்களத்தின் அரசாங்க வெளியீடுகள் அலுவலகத்தில் பணம் செலுத்திப் பெற்றுக்கொள்ளலாம்.

இந்த ஹன்சாட் அறிக்கையை www.parliament.lk எனும் இணையத்தளத்திலிருந்து பதிவிறக்கம் செய்ய முடியும்.

Hansard Reports can be purchased from the Government Publications Bureau at the Department of Government Information, No. 163, Kirulapone Avenue, Polhengoda, Colombo 5.

This Hansard Report can be downloaded from www.parliament.lk

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.